සැරියුත් මහ රහතන් වහන්සේගේ අවසන් අවවාදය

ඇවැත්නී මේ සසර බොහොම දුක් සහිතයි.

"උභයෙනම්දං මරණමේව"- දෙපසින්ම මරණයයි. මැරිලා ඉපදෙනවා. ඉපදිලා මැරෙනවා.

"නාමරණං පච්ඡා වා පුරේ වා"- නොමැරීමක් පෙරවත් පසුවත් දෙකෙන් එකකවත් නැහැ.

"පටිපජ්ජථ"-අප්‍රමාදීව මේ ධර්මයේ හැසිරෙන්න.

"මා විනස්සථ"- විනාශ වෙන්න එපා.

"ඛණෝ වො මා උපච්චගා ති"- මේ ක්ෂණ සම්පත්තිය අත්හැරගන්න එපා කියලා අවවාදයක් කලා.

එහෙම අවවාදයක් කරලයි ඒ මාහෝත්තමයාණන් වහන්සේ පිරිනිවනට වැඩියේ.

මාන්කඩවල සුදස්සන ස්වාමීන් වහන්සේගේ
දේශනාවක් ඇසුරෙන්

නිමිති අනුනිමිති නොගන්නට නම්?

රූපකාණ්ඩ හා පටිසම්භිදාමග්ග විවරණයක්



පූජ්‍ය කොත්මලේ කුමාරකස්සප හිමි

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ විශාලා නුවර ගොතමක චෛත්‍යයෙහි වාසය කළ සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට ආමන්ත්‍රණය කළ සේක.

"මහණෙනි, මම ප්‍රත්‍යක්ෂකොට දැන ධර්මය දේශනා කරමි. ප්‍රත්‍යක්ෂ වශයෙන් නොදැන නොවේ. මහණෙනි, කරුණු සහිතව ධර්ම දේශනා කරමි. කරුණු රහිතව නොවේ. විරුද්ධ කරුණු දුරු කරමින්ම ධර්ම දේශනා කරමි. විරුද්ධ කරුණු දුරු නොකරමින් නොවේ. මහණෙනි, ප්‍රත්‍යක්ෂ නොකොට නොව ප්‍රත්‍යක්ෂ කොටම දැන ධර්මය දේශනා කරන්නාවූ, කරුණු නැතුව නොව, කරුණු සහිතවම ධර්ම දේශනා කරන්නාවූ, විරුද්ධ කරුණු දුරු නොකොට නොව, විරුද්ධ කරුණු දුරු කොටම ධර්ම දේශනා කරන්නාවූ,

මාගේ අවවාදය කළ යුතුය! මාගේ අනුශාසනය කළ යුතුය!

"මහණෙනි, තොපට තුටුවීමට සුදුසුය. සතුටු සිත් ඇතිවීමට සුදුසුය. සොම්නස් වීමට සුදුසුය. භාග්‍යවතුන් වහන්සේ සම්‍යක් සම්බුද්ධයහ. ධර්මය ස්වාක්ඛාතය. සංඝයා සුප්‍රතිපන්නය."

"භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක. ඒ භික්ෂූහු සතුටු සිත් ඇත්තාහු, භාග්‍යවතුන් වහන්සේ ගේ වචනයට සතුටුවූහ.

මේ දේශනාව කරණ කල්හි දස දහසක් චක්‍රවාළ කම්පා විය.

ගොතමක චෙතිය සුත්තං

(අඞ්ගුත්තරනිකාය » තිකනිපාතපාළි » (13) 3. කුසිනාරවග්ගො)

මේ සාංචියේ චේතියගිරි මහා විහාරයේ වැඩ සිටින සැරියුත් මහ රහතන් වහන්සේ ගේ අස්ථි ධාතුන් වහන්සේලා ය.

මේ බුද්ධංගල ආරණ්‍ය සේනාසනයේ ධාතු ස්තූපය තුළ වැඩ සිටින බුද්ධ ප්‍රමුඛ අග්‍ර ශ්‍රාවක ධාතුන් වහන්සේලා ය. මෙහි ඉහළ නෙලුම් මලේ මැද සර්වඥ ධාතුන් වහන්සේලා තුන් නමක් වැඩ සිටිති. වම්පස නෙලුම් මලේ මැද සැරියුත් මහ රහතන් වහන්සේ ගේ ද දකුණුපස නෙලුම් මලේ මැද මුගලන් මහ රහතන් වහන්සේ ගේ ද අස්ථි ධාතුන් වහන්සේ වැඩ සිටිති.

අග්‍ර ශ්‍රාවක ධාතු විස්තරය- ගයාන වානුක විදානපතිරණ මහත්මාගේ පොතෙන් උපුටා ගන්නා ලදී.

පණ්ඩිතෝති සමඤ්ඤාතෝ සාරිපුත්තෝ අකෝධනෝ/අප්පිච්ඡෝ සෝරතෝ දන්තෝ සත්ථුවණ්ණාභතෝ ඉසීති.

"මහා බුද්ධිමතෙක් හැටියට ප්‍රකට වුණ සාරිපුත්තයන් වහන්සේ ක්‍රෝධ රහිත කෙනෙක්. අල්පේච්ඡ කෙනෙක්. කීකරු කෙනෙක්. දමනය වුණ කෙනෙක්. ශාස්තෘන් වහන්සේ විසින් වර්ණනා කරපු කෙනෙක්. ඉසිවරයෙක්.

(සංයුත්ත නිකාය සගාථ වග්ගෝ 2.3.9. සුසීම සුත්තං)

පණ්ඩිතෝ භික්ඛවේ සාරිපුත්තෝ, මහාපඤ්ඤෝ භික්ඛවේ සාරිපුත්තෝ, පුථුපඤ්ඤෝ භික්ඛවේ සාරිපුත්තෝ, හාසුපඤ්ඤෝ භික්ඛවේ සාරිපුත්තෝ, ජවනපඤ්ඤෝ භික්ඛවේ සාරිපුත්තෝ, තික්ඛපඤ්ඤෝ භික්ඛවේ සාරිපුත්තෝ, නිබ්බේධිකපඤ්ඤෝ භික්ඛවේ සාරිපුත්තෝ. සාරිපුත්තෝ භික්ඛවේ, අද්ධමාසං අනුපදධම්මවිපස්සනං විපස්සති. තත්‍රිදං භික්ඛවේ සාරිපුත්තස්ස අනුපදධම්මවිපස්සනාය හෝති.// යං ඛෝ තං භික්ඛවේ, සම්මා වදමානෝ වදෙය්‍ය - 'භගවතෝ පුත්තෝ ඕරසෝ මුඛතෝ ජාතෝ ධම්මජෝ ධම්මනිම්මිතෝ ධම්මදායාදෝ නෝ ආමිසදායාදෝ' ති, සාරිපුත්තමේව තං සම්මා වදමානෝ වදෙය්‍ය - 'භගවතෝ පුත්තෝ ඕරසෝ මුඛතෝ ජාතෝ ධම්මජෝ ධම්මනිම්මිතෝ ධම්මදායාදෝ නෝ ආමිසදායාදෝ' ති. / සාරිපුත්තෝ භික්ඛවේ, තථාගතේන අනුත්තරං ධම්මචක්කං පවත්තිතං සම්මදේව අනුප්පවත්තේතීති.

"පින්වත් මහණෙනි, සාරිපුත්තයන් යහපත් කුසල් ගුණයෙන්...මහා ප්‍රඥාවකින්....ඉතා පළල් වූ ප්‍රඥාවකින්.....සතුට උපදවන ප්‍රඥාවකින් ....අතිශය වේගවත් ප්‍රඥාවකින්.....තීක්ෂණ ප්‍රඥාවකින් .....අවබෝධයක් තුළින් නොඇලෙන ප්‍රඥාවකින් යුක්තයි. පින්වත් මහණෙනි, සාරිපුත්තයන් අඩමසක් පුරාවට අනුපිළිවෙලින් ධර්ම විදර්ශනාව විදර්ශනා කරනවා. පින්වත් මහණෙනි, මෙන්න මේ විදිහටයි සාරිපුත්තයන්ගේ අනුපද ධර්ම විදර්ශනාව තියෙන්නේ. // ඒ වගේම පින්වත් මහණෙනි, භාග්‍යවතුන් වහන්සේගේ අනුජාත පුත්‍රරත්නය, ලය මඩලෙහි උපන් පුත්‍රරත්නය, මුවින් පහළ වූ පුත්‍රරත්නය, ධර්මයෙන් හටගත්, ධර්මයෙන් නිර්මිත වූ, ධර්ම දායාදය වූ, ආමිස දායාද නොවූ පුත්‍රරත්නය යැයි කියා යම් කෙනෙකුට කියයි නම් එය මනාකොට පවසන්නේ සාරිපුත්තයන් ගැනමයි. භාග්‍යවතුන් වහන්සේගේ ලය මඩලෙහි උපන්, මුවින් පහළ වූ, ධර්මයෙන් උපන්, ධර්මයෙන් නිර්මිත, ධර්ම දායාදය වූ, ආමිස දායාදය නොවූ පුත්‍රයා වනාහී සාරිපුත්තයන්මය./ පින්වත් මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් ප්‍රවර්තනය කරන අනුත්තර වූ ධර්ම චක්‍රය මනාකොට ඒ අනුවම ප්‍රවර්තනය කරන්නේ සාරිපුත්තයන් ය.

(මජ්ඣිම නිකාය උපරි පණ්ණාසකෝ 3.2.1. අනුපද සුත්තං)

ආයස්මතා භන්තේ, සාරිපුත්තේන සීහනාදෝ නදිතෝ. පුබ්බේ අප්පටිසංවිදිතං මං ආවුසෝ, භගවා පඨමං පඤ්හං අපුච්ඡි. තස්ස මේ අහෝසි දන්ධායිතත්තං. යතෝ ච ඛෝ මේ ආවුසෝ භගවා පඨමං පඤ්හං අනුමෝදි, තස්ස මයහං ආවුසෝ ඒතදහෝසි.// දිවසඤ්චේපි මං භගවා ඒතමත්ථං පුච්ඡෙය්‍ය අඤ්ඤමඤ්ඤේහි පදේහි අඤ්ඤමඤ්ඤේහි පරියායේහි, දිවසම්පහං භගවතෝ ඒතමත්ථං බ්‍යාකරෙය්‍යං අඤ්ඤමඤ්ඤේහි පදේහි අඤ්ඤමඤ්ඤේහි පරියායේහි.

"ස්වාමීනී, ආයුෂ්මත් සාරිපුත්තයන් වහන්සේ විසින් සිංහනාදයක් නද දුන්නා. 'ප්‍රිය ආයුෂ්මත්වරුනි, භාග්‍යවතුන් වහන්සේ මගෙන් අසා වදාළේ මං කලින් හිතුපු නැති ප්‍රශ්නයක්. ඉතින් ඒ වේලාවේ මට පොඩි පසුබෑමක් නම් ඇතිවුණා. නමුත් ප්‍රිය ආයුෂ්මත්වරුනි, ඒ පළමු ප්‍රශ්නයට මං දීපු පිළිතුර භාග්‍යවතුන් වහන්සේ අනුමෝදන් වී වදාළා නේ. එතකොට ප්‍රිය ආයුෂ්මත්වරුනි, මට මේ විදිහට හිතුණා.//ඉදින් භාග්‍යවතුන් වහන්සේ දහවලක් පුරාවට වෙනස් වෙනස් කියුම් වලින්, වෙනස් වෙනස් ක්‍රමවලින් ඔය අර්ථය මගෙන් විමසනවා නම් ඒ දහවල පුරාවටම මටත් වෙනස් වෙනස් කියුම්වලින්, වෙනස් වෙනස් ක්‍රමවලින් උත්තර දෙන්න පුළුවනි කියලා.

රත්තින්දිවං චේපි මං භගවා ....(පෙ).... ද්වේ රත්තින්දිවානි චේපි මං භගවා ....(පෙ).... තීණි රත්තින්දිවානි චේපි මං භගවා ....(පෙ).... චත්තාරි රත්තින්දිවානි චේපි මං භගවා ....(පෙ).... පඤ්ච රත්තින්දිවානි චේපි මං භගවා ....(පෙ).... ඡ රත්තින්දිවානි චේපි මං භගවා ....(පෙ).... සත්ත රත්තින්දිවානි චේපි මං භගවා ඒතමත්ථං පුච්ඡෙය්‍ය අඤ්ඤමඤ්ඤේහි පදේහි අඤ්ඤමඤ්ඤේහි පරියායේහි, සත්ත රත්තින්දිවානිපහං භගවතෝ ඒතමත්ථං බ්‍යාකරෙය්‍යං අඤ්ඤමඤ්ඤේහි පදේහි අඤ්ඤමඤ්ඤේහි පරියායේහි ති.

ඉදින් භාග්‍යවතුන් වහන්සේ රෑ දහවල් පුරාවට වෙනස් වෙනස් කියුම් වලින්, වෙනස් වෙනස් ක්‍රමවලින් ඔය අර්ථය මගෙන් විමසනවා නම් ඒ රෑ දහවල පුරාවටම මටත් වෙනස් වෙනස් කියුම්වලින්, වෙනස් වෙනස් ක්‍රමවලින් උත්තර දෙන්න පුළුවනි කියලා. ඉදින් භාග්‍යවතුන් වහන්සේ රෑ දහවල් තුනක් පුරාවට ....(පෙ).... රෑ දහවල් හතරක් පුරාවට ....(පෙ).... රෑ දහවල් පහක් පුරාවට ....(පෙ).... රෑ දහවල් හයක් පුරාවට ....(පෙ).... රෑ දහවල් හතක් පුරාවට වෙනස් වෙනස් කියුම් වලින්, වෙනස් වෙනස් ක්‍රමවලින් ඔය අර්ථය මගෙන් විමසනවා නම් ඒ රෑ දහවල හතක් පුරාවටම මටත් වෙනස් වෙනස් කියුම්වලින්, වෙනස් වෙනස් ක්‍රමවලින් උත්තර දෙන්න පුළුවනි කියලා."

(සංයුත්ත නිකාය නිදාන වග්ගෝ 1.4.2. කළාර සුත්තං)

යෝ ධම්මසේනාපති සුපූජිතෝ , පඤ්ඤාය පාරමිං ගතෝ , ගම්භීරපඤ්ඤෝ මේධාවී , මග්ගාමග්ගස්ස කෝවිදෝ, තං වීතරාගං සුසමාහිතින්ද්‍රියං , වන්දාමි පරිනිබ්බුත සාරිපුත්තං!

මහා අගසව් රහත් උතුමෙක් , සුපූජිත වූ දහම් සෙනෙවිව , මුදුන්පත් වී මහා ප්‍රඥාවෙන් ගැඹුරු නුවණින් මහා නුවණින්, මග නොමග නිසි ලෙස දකින්නට මහා දස්කම් පෑවෙද , ඒ වීතරාගී සමාහිත ඉඳුරන් ඇති අමා නිවනට වැඩිය අපගේ , උතුම් සැරියුත් රහත් මුනිඳුට – වඳිමි මම සාදරයෙන්!



සමණානඤ්ච දස්සනං එතං මඞ්ගලමුත්තමං

නිමිති අනුනිමිති
නොගන්නට නම්?

රූප කාණ්ඩ හා පටිසම්භිදාමග්ග විවරණයක්

පූජ්‍ය කොත්මලේ කුමාරකස්සප හිමි

ප්‍රකාශනය 2021

පිරිසිදු ධර්ම දානයකි.
නොමිලයේ බෙදාහැරීම පිණිස පමණි.

ප්‍රස්තාවනාව

නමො තෙ පුරිසාජඤ්ඤ! නමො තෙ පුරිසුත්තම! බහුජ්ජනං තාරයසි, දෙසෙන්තො අමතං පදං!

බෞද්ධයා රූපවාහිනී නාලිකාව තුළ විකාශනය වූ ධර්ම දේශනා පෙලක් ඇසුරු කර ගෙන ලබුනෝරුවකන්ද ආරණ්‍යය සේනාසනයේ අවසරය සහිතව මේ පොත සකස් කර ගෙන ඇත. මේ ධර්ම දානයෙන් ජනිත වන සියලු කුසල් දේශකයාණන් වහන්සේටත්, දේශකයාණන් වහන්සේගේ ගුරුවරයන්ටත් , බෞද්ධයා නාලිකාව තුළ ඒ ඒ දේශණ වලට අනුග්‍රහය දැක්වූ සියල්ලන්ටමත්, කාර්ය මණ්ඩලයටත් අනුමොදන් වෙවා! තව කැමති සියලු සත්වයින් මේ පින් අනුමොදන් වේවා!

දේශනා විලාසයේ එන හඬ හැසිරුම් කියවීමේ දී හමු නොවන බැවින් ඇති විය හැකි ගැටළු සහගත ස්ථාන අප විසින් අර්ථය නො වෙනස් වන සේ සංශෝධනය කිරීමට උත්සහා ගෙන ඇත. සිදු වී ඇති යම් කිසි දෝෂයක් ඇතහොත් කරුණාවෙන් අපට දැනුම් දෙන්න. උතුම් රත්නයක් බඳු වූ මේ දේශනා ඇතුළත් පොත ඉතා ඕනෑ කමින් අවදානයෙන් යුතුව කීපවරක් කියවා අවබෝධ කරගන්නා ලෙසත් ඒ තුළින් ප්‍රයෝගිකව අත්හදා බලා ධර්මයේ සන්දිට්ඨික ගුණය අත්දකින ලෙසත් ඉල්ලා සිටිමු.

අපගේ පැතුම- මේ පොත කියවීමෙන් තවත් 'පසුර කරේ තබා ගත්ත' හිස් පුද්ගලයෙකු බිහි නොවේවා ! සතර ඉරියව්වෙන්ම ජාගරියානුයෝගීව ධම්මානුපස්සනාවේ යෙදන ප්‍රතිපත්ති පූජා ඇත්තන් තව තව බිහිවෙවා! ඉන්ද්‍රය සංවර සීලය සුරක්ෂිත කිරීමට සුතමය ඥනය මින් වඩත්වා! ආර්ය විනයේ අනුත්තර වූ ඉන්ද්‍රිය භාවනාවට කර්මස්ථාන මින් ගොනු කර ගනිත්වා!

චිරං තිට්ඨතු සද්ධම්මෝ!

මීට ධර්මදාන සාමාජික දෙපල
dhammadana3200@gmail.com

පටුන

1. මේක දර්ශන භූමියෙන් ප්‍රහාණය විය යුත්තක්.....10

2. එක දිහට ජීවත්වන පුද්ගලයෙක් ඉන්නවා ද?.....28

3. කෙසේ නම් අධ්‍යාත්ම ධර්මයන් මෙනෙහි කිරීමෙහි ප්‍රඥාව වස්තුනානත්ව ඥාන නම් වන්නේද?.....45

4. කෙසේ නම් බාහිර ධර්මයන් මෙනෙහි කරන්නාවූ ප්‍රඥාව ගොචර නානත්ත ඤාණය නම් වේද?.....65

5. අනුත්පාදය තමයි නිවන.....84

6. ඉච්ඡාව ද අස්මි මානය ද ප්‍රශ්නේ වුනේ? සැබෑ නිස්සරණය කුමක්ද?.....102

7. දුක වශයෙන් මෙනෙහි කරන්නේ සැපවශයෙන් නොමෙනෙහි කරන්නේ කෙසේද?.....120

8. නො ඇලෙයි,නිරුද්ධ කරයි,නොඋපදවයි, අත්හරියි.....139

9. පසුවදන.....156

1 පරිච්ඡේදය

මේක දර්ශන භූමියෙන් ප්‍රහාණය විය යුත්තක්

නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස////

ශ්‍රද්ධා සම්පන්න කාරුණික පින්වතුනි, හැම කෙනක්ම අද දවසේදි බොහෝම ශ්‍රද්ධාවෙන් තමන්ගේ ජීවිතයේ යථාර්ථාවබෝධය පිණිස බුදු පියාණන් වහන්සේ දේශනා කළ ඒ ධර්මය ජීවිතයට ප්‍රායෝගිකව භාවිත කරන්නේ කොහොමද? කියන ඒ ධර්ම මාර්ගය පැහැදිලි කර ගන්නට සූදානම් වන මොහොත. හැම වෙලාවකදීම ධර්ම කාරණයක් කියලා කියන කොට ඒක අපේ ජීවිතය තුළින් දකින්න පුළුවන් කමක් තිබුණොත් තමයි ඒක වැදගත් වෙන්නේ. අපේ ජීවිතෙන් පරිබාහිර දෙයක් වුනොත් ජීවිතය තුළ යෙදෙන්නේ නැති දෙයක් වුනොත් ඒක ඒතරම්ම අපිට අදාල වෙන්නේ නැති දෙයක්. එහෙමත් නැතිනම් ඒක පාඩමක් විතරක් වෙන දෙයක්. බුදුරජාණන් වහන්සේ අපිට පෙන්නුවේ අප පුද්ගල බවකින් කටයුතු කරන තැනක තියෙන යථාර්ථය පිළිබඳවයි.

ඒ යාථාර්ථය අපේ ජීවිතයට යොදා ගන්නකොට, ඒකම තමයි භාවනාව කියලා කියන්නේ. භාවනාවක් කියන කොට අද අපි භාවනා සංස්කෘතියක් ඇති කරගෙන තියෙනවා. ඒ භාවනා සංස්කෘතිය තුළ අපි මේ විදියට භාවනා කරන්න ඕනෙ! ඉඳගෙන මේ විදියට අපි වඩන භාවනාවක් මේ විදිහයි! කියලා දවස් තුනේ, හතරෙ,සතියේ, මාසේ දෙකේ අපේ භාවනා වැඩසටහන් හෝ භාවනා ක්‍රමවේද හදාගෙන ඉන්නවා. මේක වැරදියි කියලා කියනවා නෙමයි. නමුත් ධර්මය කියන එක එතනින් එහාට ගියපු අපේ ජීවිතය පිලිබඳව ප්‍රායෝගික අවබෝධයක් ලබා දෙන පැතිරුණ නොනවතින නුවණ උපදවන දෙයක් විය යුතුයි. ඒක තමයි මේ ශාසනයේ පෙන්වන ප්‍රඥාවේ වැඩීම වෙන්නෙ. අපි අද කරන භාවනාවක් දිහා බැලුවොත් අපි සතියක් භාවනා වැඩසටහනක් කරලා අපහු ගෙදර ඇවිල්ලා දවස් දෙකක් ගෙදර කටයුතු කරන කොට අර සතියකින් උපදවාගත් දේ අපිට අහිමි වෙලා ගිහිල්ලා. ඉතුරු වෙන්නේ සතියක් භාවනා කරපු මාව විතරයි.

ඒක නිසා ඒ සංස්කෘතිය ඒතරම්ම නිර්වාණ විශයෙහි වැදගත් වෙනවාද? කියන එක අපි විසින්ම තීරණය කරගත යුතු දෙයක්. නිර්වාණගාමිණී ප්‍රතිපදාව අපේ ජීවිතය තුළ වැඩෙන්න ඕන නුවණ සම්මා දිට්ඨියෙන් පටන් අරගෙන, යහපත් දර්ශනයෙන් පටන් අරගෙන, සම්මා ඥාන සම්මා විමුක්ති හෙවත් මැනවින් දැනගෙන, මැනවින් මිදෙනවා කියන තැනින් අවසන් වෙන දෙයක්.

ඒක නිසා අපේ ජීවිතයේ දැන් මේ දර්ශනයක් ඇති කර ගන්න කොට ඒ දර්ශනය තුළ දුරුවන කෙලේසයක් තියෙන්න ඕන. ඒ දර්ශනය තුළ ආශ්‍රව දුරුවන බව තමන්ට පේන්නට ඕන. ඒ ආශ්‍රව දුරුවන බව තමන්ට නොපෙනෙනවා නම් ධර්මය දැන ගත් පුද්ගලබව වැඩි කර ගත් තවත් එක් පුද්ගලයෙක් ලෝකයට බිහි වෙයි මිසක, සද්ධර්මය උපකාර කරගෙන "කුල්ලූපමං" නැතිනම් පසුරක් බඳු කර ගත්ත කෙලෙස් දුරු කරගත්ත බවක් නම් ලෝකයේ හට ගන්නේ නැති වෙයි.ඒක නිසා වැදගත්ම දේ තමයි අපි මේ කතා කරන්නේ. මේ කතා කරන්නේ භාවනාව. මේ කතා කරන්නේ ප්‍රතිපදාව.

අපි කුමණ ආකාරයකින් කතාකළත් අපිට ඕනම සූත්‍රයක් තුළ ඕනම අභිධර්ම න්‍යායක් තුළ ලෝකයෙන් එතෙර වීම පිණිස හේතුවන, භාවනාවකින් අපිට ඇතිවිය යුතු නුවණ පිළිබඳවයි අපි කතා කරගෙන යන්නේ. මේ නුවණ අපේ ජීවිතයේ මේ කාරණාව අහගෙන ඉන්න මොහොතෙදි ඔබට සමහර විට වැටහෙනවා ඇති මේකෙ තියන අනාත්ම ලක්ෂණය. ඒ අනාත්ම බව පෙනෙන බව තමයි නුවණ කියලා කියන්නේ. හැබැයි ඒ නුවණ එලඹ සිටින මට්ටමක නැති වෙන්න පුළුවන්. අපහු අතහැරෙන්න පුළුවන්. නමුත් එතන ඉඳලා ඒක අල්ලගෙන ඒක වඩන්න පුළුවන් පටන් ගන්න පුළුවන් මට්ටමක තියෙනවා. ඒක නිසා මේ කාරණා ටික විමසන කොට මේ තුළ ඇතිවන නුවණ කියන දේ තමයි වැදගත්ම දේ වෙන්නේ. ඒක නිසා තමන්ගේ ජීවිතය තුළට දමමින් විමසමින් මේ කාරණාව ග්‍රහණය කරගන්න උත්සාහාවත් වෙන්න. ඒක තමයි වැදගත්ම දේ වෙන්නේ.

එතකොට අපි කතා කළ, රූප කාණ්ඩයේ දුක මාතිකාවල "අත්ථි රූපං උපාදා. අත්ථි රූපං නො උපාදා" කියන කොටස. උපාදා රූපය කියලා කිව්වේ *"වත්තාරො ච*

මහාභූතා, චතුන්නඤ්ච මහාභූතානං උපාදාය රූපං". සතර මහා ධාතුවත් ,සතර මහා ධාතුව නිසා පවතින රූපත් කියන එක. ඒ 'නිසා පවතින රූප' ටික බොහොම වැදගත්. ඒ 'නිසා පවතින' කියපු සතර මහා ධාතුව නොවන සතර මහා ධාතුව 'නිසා පවත්නා' රූපය අපි ප්‍රධාන වශයෙන් මාතෘකා ඔස්සේ කතා කළා.

ඔවුනොවුන්ගේ විෂය අනුභව කරන්නේ නැහැ

මීට පෙර *"යං චක්ඛු චතුන්නං මහාභූතානං උපාදාය පසාදො අත්තභාවපරියාපන්නො"* කියන කාරණය අපි විග්‍රහ කළා. ඒ මීට පෙර සිදුකළ විස්තරයේදී "*පසාදො*" කියන එකෙන් අපි ඔපවත් බව, ඇහේ ප්‍රසාදවත් බව කියා හඳුනා ගත්තා. "*අත්තභාව පරියාපන්න*" කියන එකෙන් "ආත්මභාවය අනුව ගිය" ලක්ෂණය. ඒ කාරණාවේදී විග්‍රහ කරගත්තා අනාත්මයි කියලා කියන කාරණය. කුමන හේතුවක් නිසාද අනාත්මයි කියලා කියන්නේ , ආත්මයක් නැ කියන එක නෙමයි. හැම වෙලාවකදීම එක දිගට තියෙන ඇහැක් පනවන්න විදිහක් නැත්නම් ඒ ඇස අනුව ගියපු, ප්‍රසාදය අනුව ගියපු, ආත්මභාවයක් ගැන කවර කථාවක්ද? එක දිගට පනවන්න පුළුවන් කමක් ඇත්තේ නැහැ. ඒ වගේම ආයතන *"න අඤ්ඤමඤ්ඤ විසයං පච්චනු භොන්ති"* ඔවුනොවුන්ගේ විෂය අනුභව කරන්නේ නැහැ එකට. මනායතනයේ දේ චකඛායතනයෙන් අනුභව කරන්නේ නැහැ. ඒවාගේම චකඛායතනයේදේ මනායතනයෙන් අනුභව කරන්නෙත් නැහැ. එතකොට *"න අඤ්ඤමඤ්ඤ විසයං පච්චනු භොන්ති"* කියන කොට, ඔවුනොවුන්ගේ විෂය එකට යෙදෙන්නේ නැහැ. හැම වේලාවකදීම දැන් එකකට එකක් ආයතනයක් ඒකට සම්බන්ධ වෙන්නෙ නෑ. ඇස හටගෙන ඉතුරු නැතුව නිරුද්ධවන කොට ඇස සම්බන්ධ වුණ සියලු ආත්මභාවය අනුව ගිය ලක්ෂණ ටිකක් තිබුනානම් ඒ ටිකද ඉතුරු නැතුවම නිරුද්වෙලා. ඊලඟ ආයතනය හැදෙනවිට අලුතින්ම හැදෙනවා. කලින් තිබුන එක නැවත හැදෙන්නේ නැහැ. මේ විදියට හේතු ඵල දහමක ස්වභාවයක්.

<u>දකින්න පුළුවන් කමක් ඇත්තේ නැහැ</u>

ඊට පස්සේ *"අනිදස්සනො සප්පටිඝො"*. අනිදස්සනයි කියලා කියන කොට මේකේ දකින්න පුළුවන් කමක් ඇත්තේ නැහැ. ඒ වගේම තව අර්ථයක් යෙදනවා, අපිට නිදර්ශන වශයෙන් දක්වන්න දෙයක් ඇත්තේ නැහැ කියලා. අපිට නිදර්ශනයකට දෙන්න පුළුවන් කම තියෙන්නේ අපි දැකපු, දකින්න පුළුවන් දේ. දකින්න බැරි දෙයකට නිදර්ශනයක් අපිට දෙන්න පුළුවන්කමක් නැහැ. ඒක නිසා "අනිද්ස්සනො" කියන කොට එකක් තමයි අපිට දකින්න පුළුවන්කමක් ඇත්තෙ නැහැ. ඒ වගේම අනිත් එක, නිදර්ශනයක් සපයන්න පුළුවන් කමක් ඇත්තෙ නැහැ. රූපය හැම වෙලාවකදීම සනිදස්සනයි. ඇස අනිදස්සනයි. සනිදස්සනයි කියනකොට දැකීම් සහිතයි. 'පෙනීම කියන කෘත්‍යය' නිදර්ශනයකට දක්වන්න පුළුවන් රූපය පැත්තෙන් ඇහැට යෙදෙන කොට. මෙතන කාරණා දෙක අපට විග්‍රහ කර ගන්න වෙනවා. අනිදස්සන හා සනිදස්සන බව. ඇස කියන එක අනිදස්සනයි. රූපය කියන එක සනිදස්සනයි.

ඇසට නිදර්ශන දක්වන්න පුළුවන් කමක් නැහැ. රූපය දකින බව නිසාම නිදර්ශන දක්වන්න පුළුවන් කමක් තියෙනවා. මේ 'දේ' මේ 'වගෙ' කියලා. එතකොට සනිදස්සනයි කියනවා දැකීම් සහිත බව. රූපය හැම වෙලාවකදීම දර්ශනය කර ගන්න පුළුවන් දේ. ඇස කියනදේට කියනවා අනිදස්සනයි කියලා. ඇස දකින්න බැරි බවින් යුක්තයි.

උදාහරණයක් කිව්වොත් පිහියෙ මුවහතින් ඕන දෙයක් කපන්න පුළුවන්කම තියෙනවා. හැබැයි පිහියෙ මුවහතට පිහියෙ මුවහත කපන්න බැහැ වගේ ඇහැට ඕන දෙයක් දකින්න පුළුවන්කම තියෙනවා. හැබැයි 'ඇහැට ඇහැ' දකින්න පුළුවන් කමක් ඇත්තේ නැහැ. අද අපි ඇස පිළිබඳව දකිනවා නම් දැකළා තියෙන්නේ අපේම ඇස පිළිබඳව නෙමෙයි. 'රූපයයි' කියන්නේ ඔන්න ඔය හේතුව නිසා. අපි ඕකෙදි උදාහරණයක් කිව්වොත් කළුවර වෙලාවකදී කණ්නාඩියක් ඉස්සරහට ගිහිල්ලා ඇස බලන්න ගියොත් අපිට ඇස පේන්නේ නැහැ. ටෝච් එකක් අරගෙන අපි කණ්නාඩියට ගහලා බැලුවොත් ඒත් ඇස පේන්නේ නැහැ. අපිට සිද්ධ වෙනවා ටෝච් එළිය ඇස පැත්තට ගහගෙන ඇහේ ඡායාව කණ්නාඩියට පතිත කරලා ඒ එන පරාවර්තන ආලෝකය නැවත ඇහැට පතිත කරගෙන ඇස දකින්න.

අපි ඇස දකින්න ඔච්චර රවුමක් ගියේ 'ඇහැ' කියලා අද අපි දන්න 'නිමිත්ත' අරගත්තේ අර වණී සටහනකින් ආපු එළියෙන්. ඒ එළිය ගෝචර කරගන්න බව තමයි හැම වෙලාවකදීම මේ ශාසනයේදී 'ඇහැ' කියලා කතා කරන තැන. ඒ එළියට කියන්නේ 'රූපායතනය මිසක ඇස කියලා නෙමෙයි. ඒක නිසා තමයි ඇහැට කියන්නේ අනිදස්සනයි කියලා. ඒක දකින්න බැරි දෙයක් හැටියට. ඇසෙන් කවදාවත් අපිට ඇස දකින්න' පුළුවන්කමක් ඇත්තේ නැහැ. ඒක නිසා ඇස අනිදස්සනයි. අනිදස්සනවූ ඇස කොයිම මොහොතකවත් නැවත දකිනවා කියනදේ අපිට කරන්න පුළුවන්කමක් යෙදෙන්නේම නැහැ. ඕකෙදි මතක් කරන්නේ අපි කලින් කතා කළා අපි ඇහේ ප්‍රසාදය බිඳුන ලක්ෂණ ටික දැන ගන්නවා මිසක කවදාවත් රූපය දැන ගෙන නැහැ කියන එක.

ඔතනදී උදාහරණයක් මම මතක් කරන්නම්. අපි මේ පුංචි ඇස කොහේ දකින්නද? අපි මූණවත් දකින්නේ නැතිකොට? අපි දකින්නේ හැම වෙලාවකදීම මූණ කියලා දන්නේ කණ්නාඩියේ තියන ඡායවක්. එහෙම නැත්නම් කණ්නාඩියෙන් පිළිබිඹු කරන කණ්නාඩියේ තියන හැකියාවක්. කණ්නාඩි පහකින් බැලුවොත් මූණවල් පහක් බලා ගන්න පුළුවන්. එකකින් ටිකක් පළල්, එකකින් ටිකක් දිගටියි, එක එක හැඩයේ මූණවල් බලන්න පුළුවන්. හැබැයි කොයි කණ්නාඩියේ මූණද දැන් හරිම මූණ? අපිට හරිම මූණ ගැන කතා කරන්න වෙන්නේ නැහැ. හේතුව අපි හරිම මූණ දැකළා නැති නිසා. අපිට හැම වෙලාවකදීම අපි දැන ගෙන තියෙන්නේ මූණ දකිනවා කිව්වට කණ්නාඩියේ හැකියාව.

තව ටිකක් එතනින් එහාට ගියොත් අපි කණ්නාඩිය දකිනවා කියලා කිව්වට අපි දැකළා තියෙන්නේ චක්ඛු ප්‍රසාදයේ හැකියාව. ඇහේ හැකියාව දැන ගන්න එකයි. ඒක නිසා අපිට කවදාවත් ඇස කියනදේ දැන ගන්න පුළුවන් දෙයක් නෙමෙයි. අන්න ඒ හේතුව නිසාම ඇහැට කියනවා අනිදස්සනයි කියලා. ඒක දකින්න බැහැ. දකින්න බැරි නිසාම ඇස මෙන්න මේවගේ දෙයක් කියලා නිදර්ශන දෙන්න පුළුවන් කමක් නැහැ. අපි දකින රූපායතනයට නම් අපිට මෙන්න මේවගෙයි ඇස කියලා නිදර්ශනයක් දෙන්න

පුළුවන්. හැබැයි අපි නොදකින ඇහැට අපිට නිදර්ශන දෙන්න පුළුවන් කමක් ඇත්තේ නැහැ. ඒක නිසා අනිදස්සනයි.

ඒ වගේම "*සප්පටිඝං*". පටිඝ කියන්නේ ගැටෙන බවට. සප්පටිඝං කියන්නේ ගැටීමෙන් යුක්තයි කියලා. මේ ඇස කියන එක දකින්න බැහැ (අනිදස්සනය) හැබැයි ගැටෙන ස්වභාවයකින් යුක්තයි. ඇහැට අනිත් බාහිර අරමුණු පතිත වෙනවා, වර්ණ සටහන් පතිත වෙනවා. එතකොට මේ ඇස කියන එක බිඳෙන ගැටෙන ස්වභාවයෙන් යුක්තයි. ඒ නිසා කිව්වා "සප්පටිඝං" කියලා.

දැන් අපි ප්‍රධාන වචන කීපයක් කථා කළා. "*පසාදෝ*" , සතර මහා ධාතු ඇසුරු කර ගත්ත ප්‍රසාදවත්බව. "*අත්තභාව පරියාපන්නෝ*" ආත්ම භාවය අනුව ගියපු කම. ඒ වගේම "*අනිදස්සනෝ*" දකින්න බැරිකම, නිදර්ශන වශයෙන් දෙන්න පුළුවන්කමක් නැතිබව. ඊට පස්සේ "*සප්පටිඝෝ*" ගැටීම් සහිත ස්වභාවය. මෙන්න මේ කාරණා ටික. අපි ඇහේ ස්වභාවයන් හැටියට කතා කළා "*පසාදෝ අත්තභාව පරියාපන්නෝ අනිදස්සනෝ සප්පටිඝෝ*" කියන මේ කාරනා හතර පිළිබඳව. මේ තමයි ඇහේ තියන යථාර්ථ ස්වභාවය.

ඊට පස්සේ කියනවා " *යෙන චක්ඛුනා අනිදස්සනෙන සප්පටිඝෙන රූපං සනිදස්සනං*" යම් දකින්න බැරි; ගැටෙන ස්වභාවයෙන් යුක්ත ඇසකින්, "*රූපං සනිදස්සනං සප්පටිඝං*" , දකින්න පුළුවන් ගැටෙන ස්වභාවයෙන් යුක්ත රූපය. රූපය කියන කොට ඇස ගැන කතා කරන කොට ගන්නේ වර්ණ රූපය. "*පස්සී වා*" අතීතේ දැක්කා නම්. පස්සී කියන්නේ පාලි අතීත රූපය. දැක්කා නම්. "*පස්සති වා*" වර්තමානයේ මේ මොහොතේ දකිනවා නම්. "*පස්සිස්සති වා*" අනාගතයට දකින්නේ නම්. "*පස්සේ වා*" දකින බවක් තියෙනවා නම්. "*චක්ඛුං පේතං*" මෙන්න මේක තමයි ඇස කියලා කිව්වේ. "*චක්ඛායතනං පේතං*" චක්ඛායතන කියලා කිව්වේත් මේකට. "*සමුද්දෝ පේසෝ*" සමුද්ද කියලා කිව්වා. "*චක්ඛුධාතු පේසෝ*" චක්ඛුධාතු කියලා කිව්වා, චක්ඛු ඉන්ද්‍රිය කියලා කිව්වා. ඒ වගේම "*ලෝක...., ද්වාර...., සමුද්ද....,පණ්ඩර...., ඛෙත්ත...., වත්ථු...., නෙත්ත...., නයන...., ඕරිම තීර...., සුඤ්ඤෝ ගාමෝ...., ඉදං තං රූපං චක්ඛායතනං*".

ඇහැට කියන පරියාය පද සමූහයකින් කියනවා මෙන්න මේක තමයි `ඇහැ` කියලා කියන්නේ. මේක තමයි චක්ඛායතනය කියලා කියන්නේ. චක්ඛුධාතුව කියලා කියන්නේ. චක්ඛු ඉන්ද්‍රිය කියලා කියන්නේ. ද්වාර, සමුද්ද, පණ්ඩර, ඛෙත්ත, වත්ථු, නෙත්ත., නයන, ඕරිම තීර සුඤ්ඤෝ ගාම (හිස් ගම) කියලා. දැන් මේකට යෙදන පරියාය පද, සමාන වචන ටිකක් සංග්‍රහ කරලා පෙන්වූවා. දැන් සමහර වෙලාවට ලෝකය තුළ විවිධ අර්ථකථන සපයන්න උත්සහවත් වෙනවා. මේ `ඇහැ` කියන්නේ වෙනම එකක්, `චක්ඛායතනය ` කියන්නේ වෙනම එකක් කියලා, චක්ඛුව වෙනයි චක්ඛායතනය වෙනයි කියලා. දැන් "යං චක්ඛුං" කියලා, යම් ඇසක් තියෙනවා කියලා 'මේ ඇස' ගැනමයි විස්තර කරන්න පටන් ගත්තේ. විස්තර කරන්න පටන් අරගෙන "චක්ඛායතනං", චක්ඛායතනය කියන්නේ මේ චක්ඛුවම තමයි. චක්ඛු ධාතු කිව්වත් මේකමයි. චක්ඛු ඉන්ද්‍රිය කිව්වත් මේකමයි. ඇස ගැන යම් වචන ටිකක් තියෙනවනම් ඒ සියලු වචන ටික පෙන්නලා කියනවා මේක තමයි ඇස කියන්නේ කියලා. මොකද සමහරෙක් ලෝකය තුළ විවිධ අර්ථකථන සපයන්න අවශ්‍ය වුනාම, අර සම්මුති ව්‍යවහාරයෙන් කියෙනවා නම් `කන්න ඕන වුනාම කබරගොයාත් තලගොයා බවට පත් කර ගන්නවා වගේ මේ කාරණා ටික සමහර වෙලාවට නොතේරෙනකම නිසා විපරීත කරනවා. විකෘති කරනවා, `ඇහැ` කියන්නේ වෙනම එකක් `චක්ඛායතනය` කියන්නේ වෙනම එකක් කියලා. එතකොට හැම වෙලාවක්දීම චක්ඛායතනය කියන කොට වැරදි විදියට මේ කෙලස් සහිත් මට්ටමකින් පන්වනවා. එතකොට මේ වගේ තැන් දෙකක් ගැන වැරදි විදියට කතා කරනවා.

නමුත් බුදුරජාණන් වහන්සේ දේශනා කළ මේ විග්‍රහය තුළ `ඇහැ` කියන්නේ එකම තැනකට. "*චක්ඛායතනය*" කියන්නෙත් එතනටමයි. ඒ වගේම "*චක්ඛු ධාතු*" කියන්නෙත් ඒකටමයි. "*චක්ඛු ඉන්ද්‍රිය*" කියන්නෙත් ඒකටමයි. ඒ වගේම "චක්ඛු ද්වාරය" කියන්නෙත් ඒකටමයි. ඒවගේම "*ලෝක, සමුද්ද.,ඛෙත්ත, වත්ථු, නෙත්ත, නයන, සුඤ්ඤෝ ගාම.*." මේ මොන පදයකින් විග්‍රහ කළත්, යටත් පිරිසෙන් අපි සූත්‍රයන්ගේ සාකච්ඡා කරන්නේ "*ඕරිම තීර*" එනම් ඕරිම තීරයට යනවා කියලා, මේ මොන මොන න්‍යායන්ගෙන් විග්‍රහ කරගෙන ගියත් අපිට කතා කරන්න වෙන්න එකම තැන තමයි `ඇහැ` කියන ස්වභාවය. එතකොට `ඇහැ` කියන ස්වභාවය මෙතනදී

බොහොම වැදගත් විග්‍රහයක්. "*යෙන චක්ඛුනා අනිදස්සනෙන සප්පටිඝෙන රූපං සනිදස්සනං සප්පටිඝං පස්සි*". යම් අනිදර්ශන සප්පටිඝ එනම් දකින්න බැරි , ගැටීම් සහිත ඇහැකින් ; දකින්න පුළුවන් `ගැටීම් සහිත රූපය` දැක්කා නම් දැන් මේ දකිනබව ගැන කතා කරනාවා. ඒ කියන්නේ දැක්කා නම් අතීතේ, ඒ වගේම වර්තමාන මොහොතෙ දකිනවානම්, අනාගතයට දකිනවානම්, කොටින්ම මේ දකිනබවක් තියෙනවා නම් මෙන්න මේ දකිනබව හදන එකට කියනවා, නැතිනම් මේ දර්ශන කෘත්‍ය ඇති කරන එකට කියනවා චක්ඛුව කියලා. ඇස කියලා. මේ චක්ඛුවට, මේ ඇහැට හැම වේලාවකදීම අපගේ අවධානය යොමු වෙන්න ඕන මෙතන තියන ලක්ෂණ ටික මොකද්ද කියලා විමසන්න. චක්ඛායතන කියලා කතා කරන කොට මෙතන තියන ලක්ෂණය තමයි සම්පූර්ණම අනාත්ම ස්වභාවය.

එහෙම නැතිනම් පෙර නොතිබීම හටගෙන ඉතුරු නැතිව නිරුද්ධ වෙන ස්වභාවය. මේ ඇස කියන ස්වභාවය පිළිබඳ අපිට කතා කරන්න පුළුවන් කමක් ඇත්තේ නැහැ රූපය නැතුව, රූපය තොරව. ඒක නිසා තමයි මේ යම් ඇසකින් අනිදස්සන රූපය 'දකිනවා නම්, දැක්කා නම්, අනාගතයට දකිනවා' කියලා මේ තුන් කාලයටම පෙන්වන්නේ. මේකයි ඇස කියලා කියන්නේ. අතීතයේ යම් රූපයක් දැක්කා නම්, රූපය දකින මොහොතෙ ඒ තිබෙන ස්වභාවයට තමයි ඇස කියලා කියන්නේ. වර්තමාන මොහොතෙත් ඒ තියන ස්වභාවයටයි ඇස කියලා කියන්නේ. අනාගතයටත් යම් දකින බවක් තියෙනවනම් ඒ ස්වභාවයටයි ඇස කියලා කියන්නේ. මේ ලෝකයේ අවුරුදු කල්ප ලක්ෂ ගානක් අතීතයට ගියත්, කල්ප ලක්ෂ ගානක් අනාගතයට ගියත්, මේ මොහොතට ගියත් ඇස සහ රූපයේ ධර්මතාවය වෙනසක් වෙන්නේ නැහැ. ඇස සහ වර්ණ සටහනේ වෙනසක් වෙන්නේ නැහැ. ඇස කියන ස්වභාවය හැම වෙලාවකදීම එකම මට්ටමකින් පවතින්නේ.

මේ චක්ඛායතන රූපය කියන තැන රූපයෙන් තොරව වෙනම පැනවීමක් කරන්නේ නැහැ, රූපය ඇති කල්හිම ඇහැ, ඇස ඇති කල්හිම රූපය. හැම වෙලාවකදීම බොහොම වැදගත් වෙනවා මේ කාරණය තේරුම් ගන්න එක. අපි පළවෙනියටම විග්‍රහ කලේ "*කතමං තං රූපං චක්ඛායතනං*" කියලා එනම් මොකද්ද ඒ ඇස කියන්නෙ කියලා. මේකෙ බොහොම ලස්සන විග්‍රහයක්. "*යෙන චක්ඛුනා අනිදස්සනෙන*

සප්පටිඝෙන රූපං සනිදස්සනං සප්පටිඝං පස්සිවා" මෙතන අපි කෙටියෙන් ගත්තොත් මතක තබා ගන්න ඇහෙන් රූපය 'දකිනවා නම්, දැක්කා නම්, දකිනව නම්, දකින්නේ නම්, දකින බවක් තියෙනවා' නම් ඒක තමා ඇස කියන්නේ.

ඊට පස්සේ, ආපහු අහනවා චක්ඛායතන රූපය කියන්නේ මොකද්ද? කියලා අයෙත් අහලා "*පසාදො අත්තභාවපරියාපන්නො අනිදස්සනො සප්පටිඝ*" කියන ටික කියලා කියනවා "*යම්හි චක්ඛුම්හි අනිදස්සනම්හි සප්පටිඝම්හි රූපං සනිදස්සනං සප්පටිඝං පටිහඤ්ඤි වා පටිහඤ්ඤති වා පටිහඤ්ඤිස්සති වා පටිහඤ්ඤෙ වා, චක්ඛුං පෙතං චක්ඛායතනං පෙතං චක්ඛුධාතු පෙසා චක්ඛුන්ද්‍රියං පෙතං ලොකො පෙසො ද්වාරා පෙසා*". දැන් ආපහු අර කාරණයම නැවත විග්‍රහ කරනවා. කොහොමද , දැන් ඉස්සෙල්ලා කතාව කිව්වේ ඇහෙන් රූපය දකිනවානම්. දැන් කියනවා ඇසෙහි රූපය ගැටෙනවානම්. අරකෙ (ඉස්සෙල්ලා) පුද්ගලබවකින් කිව්වා 'ඇසෙන් රූපය දකිනවා නම්' කියලා, දැන් කියනවා 'ඇසෙහි රූපය ගැටෙන බවක්' තියෙනවා නම්. ඇසෙන් රූපය ඇස කරණකොට බලන බවක් තියෙනවා නම් එතන යථාර්ථය. ඒ වාගේම ඇසෙහි රූපය ගැටෙන් බවක් තියෙනවානම් එතන තියන ඇත්තත්. මේ එකම තැන. මෙන්න මේකට තමයි ඇස කියලා කියන්නේ. ඇසෙන් රූපය දකිනවා නම්, ඇසෙහි රූපය ගැටෙනවා නම්, වර්තමාන මේ මොහොතේ ගැටුනා නම් , ඒ වගේම අනාගතයේ ගැටෙන බවක් තියෙනවා නම්. පළවන එක "*පස්සති*' කියලා කිවුවේ එනම් දකිනවානම්. මේකට කියනවා ගැටෙනවා නම් කියලා. පළමුව එක කිව්වා ඇසෙන් රූපය දකිනව කියලා. දැන් මේකෙ කියනවා ඇසෙහි රූපය ගැටෙනවා කියලා.

ඊට පස්සේ තුන්වැනි එක "*යං චක්ඛු චතුන්නං මහාභූතානං උපාදාය පසාදො අත්තභාව පරියාපන්නො අනිදස්සනො සප්පටිඝො*" කියලා "*යං චක්ඛුං අනිදස්සනො සප්පටිඝො, යම්හි චක්ඛුම්හි අනිදස්සනම්හි සප්පටිඝම්හි රූපං සනිදස්සනං සප්පටිඝං පටිහඤ්ඤි වා පටිහඤ්ඤති වා පටිහඤ්ඤිස්සති වා*". "*යං චක්ඛුං අනිදස්සනං*", යම් අනිදර්ශන එනම් දකින්න බැරි ඇහැක් තියෙනවා නම් මේ ඇස රූපයෙහි ගැටෙයි. දැන් ඊට කලින් එක කිව්වා ඇසෙහි රූපය ගැටෙයි. දැන් මේකෙ කියනවා 'රූපයෙහි ඇස' ගැටෙයි. 'ඇහෙන් රූපය' දකියි කිව්වා. ඊට පස්සේ 'ඇසෙහි රූපය' ගැටෙයි කිව්වා. දැන්

කියනවා 'රූපයෙහි ඇස' ගැටෙයිනම්. අන්න ඒ ගැටෙන බවට කියනවා "චක්ඛුං පේතං" එනම් 'ඇහැ' කියලා. "*චක්ඛායතන.. චක්ඛුධාතු..චක්ඛු ඉන්ද්‍රිය....*" කියලා.

දැන් මෙන්න මේ විදිහට ඇස කියන එක ගැන මේ කාරණා ටික ඔක්කොගෙන්ම බොහොම වටිනා විග්‍රහයක් කළා. ඒ වගේම නැවතත් පෙන්වනවා "*යං චක්ඛු චතුන්නං මහාභූතානං උපාදාය පසාදො අත්තභාවපරියාපන්නො අනිදස්සනො සප්පටිඝො, යං චක්ඛුං නිස්සාය රූපං ආරබ්භ චක්ඛුසම්ඵස්සො උප්පජ්ජි වා*". යම් ඇසක් අරඹයා "*චක්ඛුං නිස්සාය*" 'ඇසක් නිසා රූපයක් අරඹයා' චක්ඛු සම්පස්සයක් හට ගත්තා නම්. දැන් මේ කාරණා කීපයක් යටතේ පෙන්වනවා. අපි මුල් ටික කතා කරගෙන ඉමු.

මෙතනදි විග්‍රහ කරන දේ තමයි මේ ඇසෙන් රූපය දකී නම්, ඇසෙහි රූපය ගැටේ නම්, රූපයෙහි ඇස ගැටේ නම් ඔවුනොවුන්ට *අඤ්ඤමඤ්ඤව* දෙපැත්තටම පෙන්වමින් මේ කාරණාව විග්‍රහ කරනවා. හේතුව ඇස නැති නම් රූපය ගැන පැනවීමක් කරන්නේ නැහැ. රූපය නැති නම් ඇස ගැන පැනවීමක් කරන්නේ නැහැ. ඇස ඇති කල්හිමයි රූපය, රූපය ඇති කල්හිමයි ඇස. ඒක තමයි සාමන්‍යයෙන් තියන යාථාභූත ස්වභාවය නමුත් එය අපිට හසු වන්නේ නැහැ.

අපි හිතාගෙන ඉන්නවා අපි උපදින්න කලින් මේ ලෝකෙ තිබුනා, ඒ වගේම තියන ලෝකේ අපි ජීවත් වෙනවා, ඒ වගේම මේ ලෝකේ තියන කොට අපි මැරිලා යනවා. ඕක තමයි අපේ තියන සාමන්‍යය දර්ශනය. ඔය දර්ශනය මත පිහිටලා තමයි අපි ලෝකේ අනෙක් හැම කටයුත්තක්ම සිදුකරන්නේ. හොඳ නරක සිද්ධ කරන්නේ, කුසලය අකුසලය සිද්ධ කරන්නේ, ඒ වාගේම ලෝකයේ දුක අයින් කරලා සැප බලාපොරොත්තු වෙන්නේ. තියන ලෝකෙන් සැප බලනවා, තියෙන ලෝකෙන් සතුටු වෙනවා, තියෙන ලෝකෙන් දුක් විඳිනවා, තියෙන ලෝකෙන් හඬනවා වැලපෙනවා. මේ සියලුම දේවල් වලට පොදු ලක්ෂණය තමයි බාහිරව, භෞතිකව, ලෝකය තියෙනවා කියන සංකල්පය. මේකෙන් කියන්නේ එලියෙ මොකුත් නෑ කියලා නෙවේ.

කෙනක් නෑ කියන්න ගියොත් ඒ නැත්තේ මොකද්ද? මේ ලෝකය. නැති ලෝකෙය ගැන කතා කරන්න වෙනවා. 'නැති ලෝකය' තියෙනවා එයාට. ඒකට අපි මුලින්ම කිව්වා ශාස්වත-උච්ඡේදවාදය කියලා. නැති ලෝකෙ තියනවා. නැති ලෝකෙ තියෙන කෙනාට කියන්න ඕනේ ලොකුම බොරුකාරයෙක් කියලා. ඇයි සාමාන්‍ය බොරුකාරයා රැවටීම නිසා තියනවා කියන කොට මේක ලොකුම බොරුකාරයා තියෙනවා කියන ඒක මත පිහිටලා නැහැ කියනවා. අපි ලෝකෙ නැහැ කියලා කියන්න ගියොත් අපිට කියන්න වෙනවා නැති ලෝකේ තියන කෙනෙක්. මේ නැති ලෝකේ තියන කතාවක් නෙමෙයි මේ කතා කරන්න යන්නේ . හැම වෙලාවකදීම මේක හටගත්ත පැත්ත ගැන පෙන්නන්න අවශ්‍ය නිසා කරන කතාවක්.

මේ ලෝකය තියෙනවා කියන සංකල්පය පදනම් වෙලා තමයි හැම දෙයක්ම ගොඩ නන්වාගෙන තියෙන්නේ. එතකොට හැම දෙයක්ම ගොඩගන්වා ගත්තේ ඇතිබව මත. මේකට අපි තව වචනයකින් කිවුවොත් අපි කියනවා භවය කියලා. භව සංඥාව කියලා. 'තියෙනවා' කියලා අපිට ඇති ගතියට. මේ දේ මත තමයි සියලු අශ්‍රව ටික අපි ගොඩනඟලා තියෙන්නේ.

අපි ඇස ගැන අවබෝධ කරගන්න කොට අවබෝධ කරගන්න දේමයි අනෙක් ආයතනයන්ට. දැන් මෙතනදි එක එක වචනෙන් වචනයට විග්‍රහ කරන්න ගියොත් අපිට වෙනමම ඒකට කාලයක් ගත වෙනවා. ඒ නිසා පොදුවේ අපි කතා කරන එක වැදගත් වෙනවා. දැන් ලෝකය කියලා කියන කොට ඇහැට කියනවා "*ලෝකෝ පේසෝ*", ලෝකය කියන්නේ ඒකටම තමයි. සෝතය කියන කොට ලෝකය කියන්නේ මේකටම තමයි. ඝානය කියන කොට ලෝකය කියන්නේ මේකටම තමයි. ගන්ධය , රසය, ස්පර්ෂය විදින මට්ටම ගැන කියන කොටත් මේකටම තමයි ලෝකය කියන්නේ. දැන් ලෝකය කියලා කියනකොට අපේ සමස්ත ලෝකයම අපි විඥානන ලෝකය අපි අල්ලගෙන තියෙන්නේ, හසු කරගෙන තියෙන්නේ භෞතිකව ඇති බවට ගත්ත තියෙන සංකල්පනාව මත පිහිටපු ලෝකයක්. ඒ තියෙනබව අපිට ඇවිල්ලා තියෙන්නේ කොහෙන්ද? හැම වේලාවකදීම මේ ආයතන ටික හරහා ආපු අත්දැකීම මත. අපි ඇත්තටම ලෝකෙ තියෙනවා කියලා හිතන්නේ. හැබැයි අපි තියෙනවා කියලා නිශ්චය කරගන්නේ අපේ ආයතන ටික. එලියේ අපි දැකපු දෙයක් අපි වැඩකරපු දෙයක්, අපි කලින් දැකපු පුද්ගලයෙක් හරි ලෝකයේ ඉන්නවා. ඒ ඉන්න

කෙනා එහෙ ඉන්නවා කියන එක තුළ අපි කියන්නේ ඒ දැකපු ඇහැත් ලෝකෙ තියෙනවා. ඇස කියන එක "*අත්තභාව පරියාපන්න*" ඒ ආත්මභාවය ගෝචර කරගත්ත කෙනත් ලෝකය තුළ ඉන්නවා.

දැන් මේ සම්පූර්ණව පුද්ගලභාවය අනුව ගියපු පුද්ගලභාවය ප්‍රතිබද්ධ වුණ දර්ශනයක් ඇතිබවට ගොඩනැගිල තියෙනවා. මේ කාරණාවේදී අපිට මේ ධර්මතා ටික ගැන කතා කරන කොට පාර වදින්නට ඕනේ අන්න ඒ අපේ තියන භව සංඥාවට. එහෙමත් නැතිනම් තියෙනවා කියලා දෘෂ්ටිගත වෙච්ච තැනට. මේක දිට්ඨියක්. මේක දිට්ඨි සහගත මට්ටමක්. මේක දර්ශන භූමියෙන් ප්‍රහාණය විය යුතු තැනක්. ඒ දිට්ඨිය මත ගොඩ නැගුන ආශ්‍රව ටිකක් තියෙන්න පුළුවන්. හැබැයි දිට්ඨිය තමයි බොහොම බරපතලම දේ. මේකට කියනවා අනිත්‍යයේ නිත්‍යයයැයි කියන විපල්ලාස සංඥාව. ඒ විපල්ලාස සංඥාව අද දිට්ඨි මට්ටමෙන් තියෙන්නේ. අනාත්මදේ ආත්මයි කියා ගත්ත ඒ විපල්ලාස සංඥාව එය දිට්ඨි මට්ටමෙන් අපිට තියෙන්නේ. මෙන්න මේ දෙකම, දිට්ඨි මට්ටමෙන් බැස ගත්ත මට්ටමට අපිට පාර වදින්න ඕනේ මේ කාරණා ටික අපි විමසල බලන කොට. ඇස හා රූපය පිළිබඳව අපි විමසීමක් කරණ කොට මේ කාරණා ටික අපිට බොහොම හොඳින් විග්‍රහ වෙලා පේන්නට ඕනෙ.

දැන් ඇස හා රූපය කියලා කියන කොට මේ ඇසයි රූපයයි කියන කාරණාවෙදි හැම වේලාවෙදිම ඇස කියන එක ප්‍රසාදවත් ලක්ෂණයන්, රූපය කියනදේ මේ ප්‍රසාදයට බවට පතිත වනදේ. අපි මේ න්‍යාය කීපයක් දැන් කතාකළා. මූලික වශයෙන් අපි තුනක් කියලා ගත්තොත්. අපි පලවෙනි එක කතාකළා මේ ඇසෙන් රූපය දකින බවක් තියෙනවා නම්. මේ දකින බවට දර්ශන කෘත්‍යයට තමයි ඇස කියලා කිව්වේ. ඇසෙන් රූපය දකින බවට. ඒ වගේම මේ ඇස කෙරෙහි රූපය පතිත වන බවක්. ඊට පස්සේ තුන්වැනි එක, මේ රූපය කෙරෙහි ඇස පතිත වන බවක් තියෙනවා නම්. දැන් සම්පූර්ණයෙන් මේ සිද්ධිය ආවරණිතයි. මේ ආවරණය වීම තුළ සම්පූර්ණව දැන් රූපය පෙනෙනවා කියන මේ අවස්ථාව තමයි කතා කලේ. හැබැයි මෙතෙන තියෙනවා ප්‍රශ්නයක්. දැන් ඇස කියන දේ හැම වෙලාවකදීම විපාක අවස්ථාවක් එහෙම නැත්නම් චක්ඛුප්‍රසාදය. ප්‍රසාදය කියනදේ දන්නේ හැම වෙලාවකදීම "*අත්තභාව පරියාපන්න*" වූ ලක්ෂණයෙන් ඒ ප්‍රසාදයේ ස්වභාවය විතරයි. ඊට පස්සේ රූපය හැම වෙලාවකදීම,

එයා වෙනම දෙයක් දන්නේ නැහැ, ඒයාගේ කෘත්‍ය තමයි ඇසට පතිත වනබව. ඇසේ කෘත්‍ය තමයි රූපය පතිත කර ගන්න බව. ඔය දෙක එකිනෙකට වැයවුණ සිද්ධියක්. දැන් අපිට ගහක් පේන තැනකදි ඇස දන්නේ නැහැ මම ගසක් මේ පැත්තෙන් දාගත්තා කියලා. ඒ වගේම මේ පැත්තෙන් රූපය (වර්ණ සටහන) දන්නේ නැහැ මම ගසක් අරගෙන ගිහිල්ලා ඇසට දානවා කියලා. ඔය දෙක තුළ තියෙන්නේ සම්පූර්ණව අනාත්ම ලක්ෂණයක්.

ඒ වගේම තමයි හැම වෙලාවකදීම චක්ඛු විඤ්ඤාණය කියන තැන එය අපි ඉදිරියටත් කතා කරමු. චක්ඛු විඤ්ඤාණය කියන තැනින් ඇස බිඳුනුබව ගැන දැන ගත්ත ලක්ෂණය පමණයි. ඇස බිඳුනුබව ගැන දැන ගත්ත චක්ඛු විඤ්ඤාණය විජානන ලක්ෂණය තුළ හැම වෙලාවකදීම ඇස ගැන දැනුමත් නැහැ. රූපය ගැන පුද්ගල වශයෙන් දැනුමත් නැහැ. මේ තුන් දෙනාගේම එකතුව, ස්පර්ශය කියන ඵලය හදලා දීලා තියෙනවා. දැන් මේ තුන් දෙනාගෙම එකතුව මිසක මේ තුන නෙමයි ස්පර්ශය කියලා කියන්නේ. තුන් දෙනාගේ එකතු වීම මත හැදුන ස්පර්ශය. නැවත මනෝ විඤ්ඤාණය කියන මට්ටමින් ගත්තොත්, දැන් මනෝ විඤ්ඤාණයෙන් දැන ගත්තේ ඇස බිඳුනු බවෙන් හෙවත් රූපය පතිත වූ බවින් ගෙනාපු ලක්ෂණ ටික මිසක වෙනත්වූ දෙයක් නෙමෙයි. මනෝ විඤ්ඤාණයෙන් රූපය පතිත වූ බවට ආපු සංඥාවට හිතලා ඒ දේ දැන ගත්ත මිසක, ඇස ගැනවත් වර්ණ රූපය ගැන දැනගන්න පුළුවන් කමක් ඇතිවුනේ නැහැ. මේ ධර්මතා, හට ගන්න මොහොතේම මේක ඉතුරු නැතිව නිරුද්ධ වෙලා නිසා වැය වෙලා ඉවරයි. එතකොට මේ ඉතුරු නැතිව වැය වුණ සිද්ධිය අරඹයා හිතෙන් දැන ගත්තේ එතන තියෙන ලක්ෂණ ටික.



දැන් මෙතන (රූප සටහනේ මැදින් ඇති මනෝ විඤ්ඤාණය) දැන ගත්ත බව කියලා කියන කියනකොට ඒ දැන ගත්ත ලක්ෂණයම නැවත හිතට නැගීම් වශයෙන් ඇතිවෙලයි උපාදාන වශයෙන් දැනගන්නේ. මේ දැන ගත්ත දේට හිතනකම හැමවෙලාවකදීම අපි සංඛාරය කියලා කියනවා. චේතනාව. එහෙමත් නැත්නම් කර්මය. එතකොට මේ කර්මය හැම වෙලාවකදීම සකස් කර ගන්නේ අපි දන්න පරාසය තුළ. ඇස රූප දෙක ඉතුරු නැතුව නිරුද්ධ වුණ තැනක අපි දන්න ගස ගැන, අපි දන්න නිමිති ටික ගැන අපි සිහිපත් කර ගන්නවා. ඔය ගස හොඳද? ඔය ගස නරකද? ඔය ගසේ නම? ඒ සියලුම දේවල් අපි සිහිපත් කර ගන්නවා මෙතන 'දැනගත්ත දේට හිතන කම' හරහා. ඊට පස්සේ 'සිතන දේට දැන ගත්ත ලක්ෂණය' කියන්නේ කර්ම සහගත මනෝ විඤ්ඤාණය. එතකොට අපි මෙතනින් (රූප සටහන) 'දැනගත්ත දේට හිතලා' 'සිතන දේ දැන ගත්තා'. දැන් අපි දැන ගත්තේ වෙන මොකක්වත් නොවෙයි 'සිතන දේ' දැන ගත්තේ. හැබැයි ඒ 'සිතපු දේ' සම්පූර්ණම නියෝජනය කලේ පුද්ගල සංඥාවක්. එලිය පැත්තේ ඉන්න පුද්ගල සටහනක් එහෙම

නැත්නම් ගසක් හෝ මනුස්සයෙක් හෝ කෙනක් ඉන්නවා කියන මට්ටමක තමයි ඒ නියෝජනය සිද්ධ කලේ.

සම්පූර්ණව දැන් ඔය කෙනෙක් ඉන්නවා කියලා අපි දැනගත්ත බවකුයි තිබුනේ. කෙනෙක් ඉන්නවා කියලා දැකපු බව නොවෙයි. මේ පැත්තෙන් මනෝ විඤ්ඤාණයෙන් දැන ගත්ත ලක්ෂණයකුයි තිබුනේ. කෙනෙක් ඉන්නවා කියන පැත්ත. හැබැයි ඒ හදපු මොහොත වෙනකොටත් (රූප සටහනේ අග ඇති) මනෝ විඤ්ඤාණය තුළ අර කෙනාව නිර්මාණය කරපු මොහොත වෙන කොටත්, ඇස රූප දෙක ඉතුරු නැතුවම නිරුද්ධ වෙලා. මෙහෙන් ඇස රූප දෙක ඉතුරු නැතුවම වැය වෙලා, මේ ධර්මතා (රූප සටහනේ වේදනා, චේතනා, සංඥා, මැද මනෝ විඤ්ඤාණය) ටිකත් ඉතුරු නැතුව නිරුද්ධ වුණ තැනක තමයි අපි හැම වෙලාවකදීම කෙනෙක්ව දැන ගන්නේ. කෙනෙක්ව දැන ගත්ත තැනක අපි හිතනවා අපි දැන ගත්තේ රූපය කියලා.

හැබැයි අපි දන්නේ නැහැ අපි දැන ගත්තේ කෙන කෙනා එකිනෙකාගේ මනස පැත්තම සිහි කර ගත්තේ කියලා. එතකොට ඔන්න ඔය ඇස රූප දෙක ඉතුරු නැතුව නැතිවුණ තැන තිබුනු අනිත්‍ය ලක්ෂණය නොදන්නකම නිසා, ඉතුරු නැතුව නිරුද්ධවුණ බව නොදන්නකම නිසා ඒ රූපෙම නැවත ඇති හැටියට සිහිපත් කර ගන්නකමට අපි නව කර්ම කියලා කියනවා.

ඒක තමයි අපට තියන දිට්ඨි සහගත කෙලේසය. එළියේ ලෝකය තියෙනවාමයි කියලා අපි දෘෂ්ටි සහගතබවක ජීවත් වෙනවා. එතකොට අනිත්‍යයේ නිත්‍යයයි කියන විපල්ලාස සංඥාව අපිව අද ජීවිතයේ සම්පූර්ණයෙන් පුද්ගලභාවයක්, ආත්මවාදයක් ලඟට අපිව අරගෙන් ගිහිල්ලා දිට්ඨි මට්ටමක් ඇති කරලා තියෙනවා. දැන් මේ කාරණාව තුළ හැමවිටම විග්‍රහ කරලා දෙන්නේ ඇසයි රූපයයි කියන තැනදි, ‘‘ඇස දකින්න එපා රූපයෙන් තොරව, රූපය දකින්න එපා ඇහෙන් තොරව. ඇහැයි රූපයයි දෙකම එක මොහොතෙ හට ගත්ත, එක මොහොතෙ ඉතුරු නැතිව නිරුද්ධවුණ ධර්මතාවයක්. ඇස වැයවුනා රූපයට. රූපය වැයවුණ බවට ඇස' කියනා කාරණාව ගෙනැල්ලා දෙනකොට, අපිට නාම ධර්මතා ටික ඇස වුනෙත් නැහැ රූපය වුනෙත්

නැහැ. නාම ධර්මතා ටික ඇහැත් නෙමෙයි රූපයත් නොවෙයි. මේ නාම ධර්මතා ටික ඇස සහ රූපය නොවුණ තැනක මේ දෙක වැය වෙලා ඉවරයි නාම ධර්මතා ටික (රූප සටහනේ වේදනා, චේතනා, සංඥා) හට ගන්න කොට." කියන අවබෝධය අපිට ගෙනැල්ලා දෙනවා. ඒ අවබෝධය ඇති වුනාට පස්සේ අපිට අර අනිත්‍යදේ නිත්‍යයැයි ගන්න විපල්ලාස සංඥාව තමයි අපිට මේ දර්ශනය දකින්න දකින්න ක්‍රමයෙන් ඉවත්වෙලා යන්නේ, දුරු වෙලා යන්නේ.

ඒක නිසා අපිට සිද්ධ වෙනවා මේ කියන කාරණා ටික පිළිබඳව හොඳ අවබෝධයක් ඇති කරගන්න. මේ චක්ඛායතනය නම්, එය ගැන මොකද්ද කිව්වේ මේ කාරණය තුළ? චක්ඛායතනය තුළ මේ විග්‍රහය කලේ හැම විටම ඇසෙන් තොරව රූපය නැහැ, රූපයෙන් තොරව ඇස හට ගෙන නැහැ. ඇහැත් සමඟම රූපය, රූපයත් සමඟම ඇහැ. අපිට වටේටම බලන්න පුළුවන් ලෝකයක් තියෙනවා කියලා සංඥාවක් තියෙනවා නම් හුදෙක්ම ඒක සිතුවිලි මාත්‍රයක්ම විතරමයි. එක් දකින්න පුළුවන් වර්ණ රූපයක් කියන අපේ ආශ්‍රව ටික සිඳෙනවා.

අපි දන්නෙවා හැම වෙලාවකදීම ඇස ඉතුරු නැතුව නිරුද්ධ වුණ තැනක තමයි අපිට මේ ලෝකයක් හදලා දෙන්නේ කියලා. උදාහරණයක් වශයෙන් කියනවනම්, අහලා ඇති වැස්ස වගේ කියලා. අපිට තියෙන ඇස හරියට වැස්සක් වගේ. මහා හයියෙන් වහින කොට අපිට ලස්සන වැස්සක් බලන්න පුළුවන්. දැන් මේ වැස්ස හැදුවේ, නිර්මාණය කලේ මොන වැහි බිංදුවෙන්ද? අපි හයියෙන් වහිනවා කියන හැම තැනකදීම වැස්ස කියලා කතා කරපු වැහි බිංදුව නැහැ. ඒ වැහි බිංදුව නැති වුණ තැනක එක බිංදුවකින් වැස්සක් කියන්නත් බැහැ. ඒ වගේම ඒ වැස්සක් කියලා කතා කරපු වැහි බිංදුව ඉතුරු නැතිව නැතිවුණ තැනක අපි වැස්ස ගැන කතා කරනවා. අපි වැස්ස කියලා කියන හැම මොහොතම වැස්ස නැති තැනක්. දැන් අපි වැස්ස යැයි කියලා කියන තැනක ඇත්තටම ලෝකෙ වැස්ස නැහැ. රූපය කියන එකත් ඇස කියන එකත් හරියට වැස්සක් වගෙයි. ඇස කියන එක මහ මේඝයක්, ලොකු වැස්සක්. මේ අපි ඇස කියලා කතා කරන, රූපය කියලා අපි කතා කරන මේ සිද්ධිය අපි කොයි මොහොතේ තිබුන ඇස රූප දෙක ගැනද අපි කතා කරන්නේ?

අපි හිතමු මේ ගහක් ඊයෙ ඉඳන් තිබුනා කියලා අපි කියනවා. මේ ඊයේ ඉඳන් තිබුන කියලා හිතන ගහේ, ගහ ඊයේ ඉඳලා තිබුනා කියන එකෙන් අපි කියන්නේ ඊයේ ඉඳන් ඒ වර්ණ සටහන ඇහැට පතිත වුනා කියන එකද? නැත්නම් ඊයෙ ඉඳන් ඒ ආපු ආලෝකය ආවා කියන එකද? නැහැ. එහෙනම් ඊයේ ඉඳන් එකදිගට ඒ ආලෝකය අපේ ඇහැට පතිත වෙමින් තිබුන කියන එකද? නැහැ. එතකොට හැම වේලාවකදීම ඇස හා රූපය කියන එක ඉතුරු නැතිව නිරුද්ධවුනා කියන තැනක අපි රැස් කර ගත්ත දේම අපි විසින් සිහිපත් කර ගන්න මට්ටමේදී තමයි අපිට ඊයේ ඉඳලා තිබුන ගස හදලා දීලා තියෙන්නේ.

දැන් එක දිගට තියන ඇහැක් එක දිගට තියන රූපයක් හැම වෙලාවකදීම ගොඩ නගලා තියෙන්නේ කෙන කෙනාගෙ අවිද්‍යාව මත. නොදන්නකම මත. රූපය ඉතුරු නැතුව නිරුද්ධවුනා කියන මේ ලක්ෂණය දකින්නේ නැති කම නිසා අපිට හැම වෙලාවකදීම එක දිගට පවතින ධර්මතා සමූහයක පැවැත්මක් ගැන අහගන්න වෙලා. ඒ පැවැත්මක් ගැන අපිට දැන ගන්න වෙලා. මෙන්න මේක තමයි අපිට දුරු විය යුතු කෙලේසය, අපිට අර ඇති බවට ගෙනැල්ලා දුන්න ඒ ගතිය ඇතිකලේ හැම වෙලාවකදීම ඇහේ නිරෝධය නොදන්නාකම නිසා. ඇස අනිත්‍යවුණ බව නොදන්නාකම නිසා. ඇහේ ආනාත්මය නොදන්නකම නිසා. ඇහේ අනිත්‍ය හා අනාත්මය ඔබ තේරුම් ගන්න වැස්සේ තියන අනිත්‍ය හා අනාත්ම තුළින්. වැස්සේ අනිත්‍යය කියලා කිව්වේ වැහි බිංදුවක් ඉතුරු නැතිව නැතිවුණ තැනක අපි වැස්ස කියලා කතා කරනවා. අපි වැස්ස කියලා කියන තැනක ඒ වැහි බිංදුව ඉතුරු නැතිව පොළොවට වැටිලා, පොළොවට වැයවෙලා ඉවරයි. ඒක තමයි අපි අනිත්‍ය කියලා කිව්වේ. ඒ වගේම අනාත්මය ගැන කතා කරනවා නම්, අනාත්මය කියලා කිව්වේ හැම වෙලාවකදීම කොයි වැහි බිංදුවද අපිට වැස්ස වුනේ? තෝරලා පෙන්නන්න කොයි වැහි බිංදුවද වැස්ස වුනේ? වැස්ස වුණ වැහි බිංදුවක් අපිට පෙන්නන්න තැනක් නැතිවෙයි. මෙන්න මේ මේ වැහි බිංදු ගොඩාක් එකතු වුණ තැනක වැස්ස කියලා කතා කරලා තියෙනවා. මේ වැහි බිංදු ටික ඉතුරු නැතිව නැතිවුණ තැනක අපිට වැස්ස පනවන්න තැනක් නැති වෙලා තියෙනවා. වැස්ස වූ වැහි බිංදුවක් ලෝකේ නෑ වගේ ආත්මවූ රූපයක් ලෝකය පනවන්න පුළුවන්කමක්, පනවන්න තැනක් අපට හම්බවෙළා නැහැ. ඒ වගේම අපිට එකදිගට තියන වැස්සක් හම්බවුනේ නෑ වගේ,

එකදිගට තියෙන රූපයක් අපිට ලෝකය තුළ හම්බවෙන්නේ නැහැ. මෙන්න මේ විදියට අපිට අනාත්ම ධර්මතාවයක් හා අනිත්‍යය වන ධර්මතාවයක් ගෝචර වෙන කොට අර දිට්ඨි සහගත විපල්ලාස මට්ටම අපෙන් දුරු වෙනවා, මේ ආයතනය පිළිබඳ අවබෝධ කරගන්න මේ තියන ක්‍රමවේදය තුළ.

මේ න්‍යාය, මේ දේ බොහොම වැදගත් මේ ඇස ගැන අපිට අවබෝධ කර ගන්න කොට. මේ කතා කරන්නේ ඇහෙන් තොරව රූපය ගැනත් නොවෙයි, රූපයෙන් තොරව ඇස ගැනත් නොවෙයි. මේ දෙකම එකට හට ගන්න, මේ දෙක ගැනමයි මේ සිද්ධිය කතා කරන්නේ යන්න පිළිබඳව හොඳ අවබෝධයක් ඇති කර ගන්න පුළුවන් කාරණා ටිකක් තමයි මේ රූප කාණ්ඩය තුළදී මේ කතා කරන මේ කාරණා ටික තුළ විග්‍රහ වෙන්නේ. එහෙමනම් හැම කෙනෙක්ම මේක ජීවිතයේ ප්‍රායෝගිකව, අපිට රූපය පෙනෙන තැනක තියන යථාර්ථ ස්වභාවය අවබෝධ කර ගන්න පහසු දෙයක් හැටියට කවුරුත් ජීවිතයට මේක යොදා ගන්නවානම් ඒක බොහොම වැදගත් වෙනවා.

පුණ්‍යානුමෝදනා !!!

සාධු ! සාධු !! සාධු !!!

2 පරිච්ඡේදය

එක දිගට ජීවත්වන පුද්ගලයෙක් ඉන්නවා ද?

නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස////

ශ්‍රද්ධා සම්පන්න කාරුණික පින්වතුනි, අපි දිගටම සාකච්ඡා කලේ අභිධර්ම පිටකයේ ධම්මසංගණිප්‍රකරණයේ එන රූප කාණ්ඩයට අදාලව, අපි ඒකවිධේන රූප සංගහො කොටස අවසාන කරලා, ඉන් පස්සේ දුවිදේන රූප සංගහෝ කියන කොටසේ "අත්ථි රූපං උපාදා, අත්ථි රූපං නො උපාදා" කියන දුකය, එහෙම නැතිනම් මාතිකා දෙක අරගෙන මේ මාතිකා දෙක යටතේ *අත්ථි රූපං උපාදා* කියන එකේ *උපදා රූප* කියන්නේ මොනවද කියන ටික විග්‍රහ කරගෙන යන්නේ. ඒ *අත්ථි රූපං උපාදා* කියන එකෙන් චක්ඛායතන රූපය කොහොමද කියන එක ගැන අපි විස්තර කරගන්නේ. චක්ඛායතන රූපය විස්තර කරනකොට අපි ඒක කතා කළා බොහොම විස්තරාත්මකව ඇස කියන එක කතා කරන්නේ මේ සාසනයේ මොන අර්ථයෙන්ද කියන එක ගැන.

ඇස කියන එක නිකම්ම ඇතිවුණ ධර්මයක් නොවන විදියටත් ඒ වගේම ඇස කියන එක අපි මේ තියනවා කියලා හිතාගෙන ඉන්න සංකල්පය තුළ පනවන්න බැරි දෙයක් විදියටත්, *පසාදෝ අත්තභාව පරියාපන්නෝ*. එවගේම *අනිදස්සනං සප්පටිඝං* මෙන්න මේවගේ *ප්‍රසාදවත්* ආත්මභාවය අනුව ගියපු ඒ වගේම අනිදර්ශන දකින්න බැරි, සප්පටිඝ ගැටීම් ස්වභාවයෙන් යුක්ත මේවගේ මාතිකා ටිකක් ඔස්සේ අපි කතා කළා. ඊට පස්සේ විග්‍රහ කළා ඇසෙන් රූපය දකිනවා නම් කියන කාරණය. ඊට පස්සේ ඇසෙහි රූපය පතිත වෙනවානම් කියන කාරණය. ඊට පස්සේ රූපයෙහි ඇස පතිත වෙනවානම් කියන කාරණය. මේ විදියට මේ න්‍යායන් කීපයක් ඔස්සේ අපි කතා කළා. මේකෙදී මේ න්‍යායන් කීපයකින් පෙන්නන්න හේතුත් අපි කිව්ව. ඒ න්‍යායන් කීපයකින් පෙන්වන්න අවශ්‍ය වුණ හේතුව තමයි, වෙනමම ඒක සංග්‍රහ කරලා වෙනමම ඒක දක්වන්න ගියොත් මේ සියලු භාත්පස කියන මේ ලක්ෂණය පැමිණෙන්නේ නැති නිසා. ඒක නිසා මේ කොයි පැත්තෙන් කිව්වත් කොයි ප්‍රදේශයෙන් කතා කළත් මේ කතා කරන්නේ ඇසෙන් තොර රූපයත් රූපයෙන් තොරව ඇසත් කියන තැන පැනවීමක් නැති මට්ටමකට කියන් නුවණ ගන්න අවශ්‍ය

නිසයි මේ හාත්පස පැන වීම, මේ හාත්පස පෙන්වීම කලේ. මේ කාරණා ටික විග්‍රහ කරනකොට අපිට එන්න ඕන නුවණ, ඥාන දර්ශනය තමයි හැම වෙලාවකදීම ඇහැයි කියලා යම් තැනක පැන වීමක් තියෙනවානම් එතැනම රූපය පනවනවා . රූපය පිළිබඳව යම් පැන වීමක් කරනවානම් එතැනම ඇස ගැන පනවනවා.

හැබැයි මෙතනදී ඇස හා රූපය පිළිබඳව තේරුම් ගන්න එක වටිනවා. ඇස කියා කියන එකයි රූපය කියලා කියන එකයි මේ අපි දකින ඇස නෙමෙයි කියන එක කියලා අපි මුලින්ම මතක් කළා, රූපය කියන කොටත් අපි කතා කරන කර්ම සහගත විඥානන ස්වභාවයේ තියන රූපය නොවෙයි. අපි රූපය ගැන අද දැනගන්නවානේ රූපය අරඹයා මේ දැන ගන්න තැනකදී අපි රූපය කියලා මේ දැන ගන්න එක මේ සාධාරණ සහේතුක මට්ටමක් නෙමෙයි. අපි නාම ධර්ම ටිකක් දැන ගන්නවා. නාම ධර්මතා ටික දැන ගන්න එකට අපි කියනවා වැරදි විදියට රූපය ගැන දැන ගන්නවා කියලා. මෙන්න මේ කාරණාව තමයි අපේ වෙනස් වෙන්න ඕන දේ. රූපය කියලා කියන කොට අපි මේ රූපස්කන්ධය කියන තැනින් මේ සංග්‍රහ කරන්නේ.

රූපස්කන්ධය කියනකොට ඒ තුළ දකින්න එපා ගස්, ගල්, ගෙවල්, දොරවල්, යාන, වාහන වූ රූප. ඒ රූප නෙමෙයි මේ කතා කෙරෙන්නේ. රූපස්කන්ධයේ ස්වභාවය. මෙතනම ඇහැනම් ඇහැට ගෝචර වන වර්ණ සටහන් මාත්‍රය පමණයි. ඇස හරහා දැන ගන්නකොට අපි දැන ගනනේ විපාක සිත් ටික තුළ නැතිනම් විපාකය කියන අවස්ථාව තුළ තව විදියකට කියනවා නම් "*පභස්සරමිදං භික්ඛවේ චිත්තං*" කියන තැනේ සිත ප්‍රභාස්වරයි කියන තැනක, ඒ හිතෙන් ඒ කෘතය පමණක් කරන්නේ.

ඇහැට රූපය පතිත වන තැනකදි, ඇහැට රූපය ගැන දැනගන්න හිතෙන්, රූපය ගැන දැන ගන්නබව විතරයි සිද්ධ කරන්නේ. එයා එතනින් තොර දෙයක් ගෙනැල්ලා දෙන්නේ නැහැ. ඒ ලක්ෂණ ටිකම අරගෙන ඊට පස්සේ වේදනා, සංඥා, විඤ්ඤාණ කියලා මනෝවිඤ්ඤාණ මට්ටමෙ විපාක හිතක් තියන කොට හිතින් දැන ගන්නේ ඒ ලක්ෂණ ටික අරඹයා හිතට ඇතිවුණ වේදනා, සංඥා කියන ගති ස්වභාවය මිසක වෙනත් දෙයක් ගැන නෙමෙයි. ඇස ගැනවත් රූපය ගැනවත් නෙමෙයි.

මේ මූලික කාරණා ටික, ඒ ටික විපාක ධර්ම ටික. ඒකෙ කෙලෙස් නැහැ. කිලිටි නැහැ. මේක තමයි විපාකය. මේකට කියනවා ස්කන්ධය කියලා. තව වචනයකින් කියනවා භූතය කියලා. භූතය කියන්නේ වූ පරිදී ස්වභාවය. දැන් මේ ධර්මතා ටික ගැන තමයි අපට හොඳ අවබෝධයක් ඇතිවෙන්නෙ ඕන. මේ අවබෝධය තමයි බොහොම වැදගත්ම දේ. මේ කාරණා ටික පිළිබඳව අපි දැනගන්න එක. ඒකයි අපි ජීවිතය තුළින් මේදේ දකින ක්‍රමය පිළිබඳව අපි විමසීමක් කරන්නේ. බොහෝ දෙනෙක් සමහර වෙලාවට මතක් කරනවා මේ කියන කාරණා ටික ටිකක් ගැඹුරුයි කියලා, සරල කරන්න පුළුවන්ද කියන එක.

ඒක නිසාම තමයි නැවත නැවතත් මේ කාරණා ටික විග්‍රහ කරමින් කියන්නේ මේ කාරණා බොහොම සුවිශේෂී අපිට අත්‍යාවශ්‍ය වෙන කාරණා ටිකක් නිසා. මේකෙදී අදහසක් ඇති කර ගන්න එපා හුඟක් වෙලාවට මතක් කරනවා වගේ මේ කාරණා ඔක්කොම පාඩම් කරගෙන ලියා ගෙන, කෙටි සටහන් ගහ ගෙන නිවන් දකින්න ඕන කියලා. එහෙම ශාසනයක් නොවෙයි. එහෙම නිවන් දකින්න පුළුවන් කියනවාත් නොවෙයි. මේ කියන්නේ මේක ජීවිතයේ තමා තුළ අවබෝධ කරගන්න නුවණ, තමා තුළ දකින නුවණ. ඒ නුවණට තමයි ආශ්‍රවක්ෂයවෙන නුවණ ඇතිවෙන්නේ කියන කාරණය ගැනයි මේ විග්‍රහ කරගෙන යන්නේ.

මෙතනදී අපි කතා කළා කාරණා තුනක්. එකක් අපි මඟ හැරියා. ඒ තමයි අපි ඇසෙන් රූපය දකී කියන එක කතා කළා, ඇසෙහි රූපය ගැටෙයි කියන එක කතා කළා. රූපයෙහි ඇස ගැටෙයි කියන එක කතා කළා. එතනින් එහාට තව කාරණයක් තියෙනවා ඒ කාරණය අපි කතා කලේ නැහැ. ඒ තමයි යම් ඇසක් තියෙනවා නම් සතරමහාධාතු ඇසුරු කරගත්ත *පසාදෝ අත්තභාව පරියාපන්නෝ* ප්‍රසාදවත්වූ ආත්මභාවය අනුව ගියපු යම් ඇහැක් තියෙනවානම් *අනිදස්සනෝ සප්පටිඝෝ,* අනිදස්සන වූ , සප්පටිඝ ගැටීම් සහිත දකින්න බැරි ඇහැක් තියෙනවා නම් මේ ඇස *යං චක්ඛුං නිස්සාය, යම් ඇහැක් නිසා, රූපං ආරබ්ඛ* රූපය අරඹයා. ඇහැක් නිසා රූපය අරඹයා. හොඳ වැදගත් කතාවක්. *චක්ඛුසම්ඵස්සෝ උප්පජ්ජි වා, චක්ඛුසම්පස්සය ඉපදුනානම් උප්පජ්ජති වා* චක්ඛුසම්පස්සය උපදිනවා නම් , *චක්ඛුසම්ඵස්සෝ උප්පජ්ජිස්සති* චක්ඛුසම්පස්සය උපදින්නේනම් *චක්ඛුසම්ඵස්සෝ උප්පජ්ජේවා*

චක්ඛුසම්ඵස්සය උපදිනබවක් තියෙනවානම් මෙන්න මේ කියන මොන ආකාරයක, මොන ස්වභාවයක් වුණත් චක්ඛුං පේතං මේ ස්වභාවයට තමයි ඇස කියන්නේ. ඒවාගේම *චක්ඛායතනං පේතං....චක්ඛුධාතු පේසො...* මේවිදියට දැන් චක්ඛුසම්පස්සය උපදිනබවක් තියෙනවානම් ඇස අනුව ගියපු චක්ඛුසම්පස්සයක් උපදිනබවක් තියෙනවානම් කියලා මේ කාරණාව දැන් විග්‍රහයක් කරනවා. දැන් මේ කාරණාව බොහොම වැදගත් තැනක් හේතුව තමයි මේ සාකච්ඡාව කෙරෙන කොට ඇතැම් කෙනෙකුට ඇති වන ප්‍රශ්නයක් තියෙනවා. එක සිතක් එක මොහොතක හට ගන්න කොට, ඒ හිතක් හට ගන්නවා කියන්නේ ඒ ස්කන්ධ පංචකයක හට ගැනීමක්. එතනදී චක්ඛුවිඤ්ඤාණය පච්ඡාජාතයි. රූපය පුරෙජාතයි.

පුරේජාතයි කියලා කිව්වේ මේ ටික කලින් හට ගතත අනික් ටික පස්සේ. දැන් ඒ විදියට ඇස රූප දෙක කලින් වේදනා සංඥා සංඛාර විඤ්ඤාන පස්සේ. පුරේජාතයි කියලා කියන්නේ කලින් හට ගත්තා කියන එක . පුරේ කියන්නේ 'කලින්' ජාත කියන්නේ 'හට ගත්තා' කියන එක. පච්ඡාජාතයි කියන්නේ 'පස්සේ. රූප සටහන අනුසාරයෙන්ම අපි මේ ගැන ටිකක් කතා කලොත්, ඇස හා රූපය කියන තැනක ඇසයි රූපයයි චක්ඛුවිඤ්ඤාණයයි කාරණා තුනක් තියෙනවා. ඇස කියනකොට චක්ඛායතන රූපය , රූපය යනු රූපායතනය, මේ දෙකම රූපස්කන්ධයට අයිති ධර්මතා දෙකක්. මේ දෙක රූපස්කන්ධය. චක්ඛුවිඤ්ඤාණය කියනකොට ඒක විපාක හිතක්. චක්ඛුවිඤ්ඤාණය කියන කාරණාව හට ගන්න මොහොත වෙනකොට, මේ චක්ඛුවිඤ්ඤාණය කියනදේ හට ගන්නවාද වේදනාව නැතුව?.... සංඥා නැතුව? ... සංඛාර නැතුව? මේ චක්ඛුවිඤ්ඤාණය පමණක් වෙනමම තනියම හට ගන්නේ නැහැ. ඇස රූප දෙක ඇති තැනක චක්ඛුවිඤ්ඤාණය හට ගන්නවා කියන කොට මෙතන චක්ඛුවිඤ්ඤාණය කියන කාරණය තුළ ස්කන්ධ පංචකයක් නියෝජනය වෙනවා. නමුත් එතන චක්ඛුවිඤ්ඤාණ හිතේ මූලිකත්වය ගන්නේ විජානන කෘත්‍යය. ඒක නිසා තමයි චක්ඛුවිඤ්ඤාණය කියන දේ (රූප සටහනේ එතන) නම් කරන්නේ. එහෙම නැත්නම් මෙතන චක්ඛුවිඤ්ඤාණය අනිත් ධර්මතා ටික නැතුව තනියෙන් හිටගෙන ඉන්නවා නෙමයි. මෙතන (රූප සටහනේ චක්ඛුවිඤ්ඤාණය) ස්කන්ධපංචකයක පැවැත්මක් තියෙනවා. "*තිණ්ණං සංගති ඵස්සෝ*" එනම් තුන් දෙනාගේ එකතුවයි ස්පර්ශය.

දැන් මේ විඤ්ඤාණය ඇති වෙනකොට ස්පර්ශය ඇති වෙනවා කියන කාරණාව (ගත්තාම) ස්පර්ශය තනියම තියෙන්නේ නැහැ. ස්පර්ශය කියන දේ තනියම තියෙන්නෙ පුළුවන්කමක් නැහැ. එතනද මනෝධාතු සිතක්. හැබැයි මේ මනෝධාතු සිතේ ස්පර්ශය තමයි මූලිකත්වය ගන්න නායකයා. මෙතන කතා කළ යුතු තැන, ඒ නිසා තමයි මෙතනදි එහෙම මේ (රූප සටහනේ එසේ) නම් කරලා තියෙන්නේ. එතකොට මේ රූප සටහනේ ඒ ඒ ස්කන්ධ පංචකයේ ගොඩක් ගැන කතා කරන්නේ. අපි *භවාංග, භවාංග චලන, භවාංග උපච්ඡේද, පංචද්වාරාවජ්ජන, සම්පටිච්චන, සන්තීරණ, වොත්තපන* කියන මේ කාරණා ටික කතා කලොත් ඒ ඔක්කොම විපාක හා ක්‍රියා මට්ටමෙ සිත්.

ඒ විපාක හා ක්‍රියා සිත් වල ඇතිවන ලක්ෂණ ටික තමයි මේ කාරණා ටික. අපි ගත්තොත් මධුපිණ්ඩික සූත්‍රයහි තියෙන පරියාය තමයි දළ වශයෙන් ඒ රූප සටහනකට නගලා තියෙන්නේ. මේ පරියාය තුළ අපිට කතා කරන්න පුළුවන්කම තියෙනවා මේ ඔක්කොම ඵස්ස වෙදනා සඤ්ඤා ටික එකම හිතක යෙදන ධර්මතා ටිකක් නෙමෙයි. මේ විපාක (රූප සටහනේ වේදනා, සංඥා, චෙතනා, මනෝවිඤ්ඤාණ) හා නව කර්ම (රූප සටහනේ දැන ගත්දේට හිතන බව හා සිතනදේට දැන ගත් බව) ටික අපට කවදාවත් එකම හිතක පනවන්න පුළුවන්කමක් නැහැ. මෙතන විපාක සිත් එකක් නෙමෙයි, විපාක සිත් රාශියක් තියෙනවා. මනෝධාතු සිත් මනෝවිඤ්ඤාණ ධාතු සිත් මේ වගේ සිත් රාශියක් එතන තියෙනවා.

මේ සිත් රාශියම හැම වෙලාවකදීම එකක් කියලා සංගහ වෙන්නේ කියලා අදහසක් ගන්න එපා. එහෙම ගත්තොත් නම් අපට වරදිනවා. ස්කන්ධ පංචකයක් එකට එකට කඩලා දක්වන්න පුළුවන්කමක් නැහැ. නමුත් මේ ස්කන්ධ පංචකය ගැන අපට දැනගන්න අවශ්‍ය වෙන්නේ න්‍යායාත්මකව බෙදාගන්න. අපිට අවශ්‍ය වෙන්නේ රූපයක් එළියේ තියෙනවා, කෙනෙක් එළියේ ඉන්නවා කියලා අපිට ඇතිවන දේ දැනගන්න. එතනදී මේ රූප සටහනේ කොහොමද ඒ සිද්ධිය වෙන්නේ කියන එකේ මූලික ලක්ෂණ ටිකයි අපි කතා කරන්නේ. ඒ සමස්ථ සිද්ධිය ගැන කතාකලේ නුවණ ගන්න මිසක, කරුණු ගොඩක් පෙලගස්සගෙන කරුණු ගොඩක් ගැන දැන ගන්න නම්

නෙමෙයි. ඒක නිසා තමයි අපි මේ (රූප සටහනේ සිද්ධිය) වෙනම බෙදලා කතා නොකරන්නේ.

(එක සිතක පහලවන) මේ නාම ටික පෙර-පසු කියල පනවන්න බැහැ. නමුත් මේ පරියායේදී වේදනා සඤ්ඤා විතක්ක පපඤ්ච ආදිය එකම සිතෙ යෙදෙන දෙ විදියටත් දකින්න එපා. එකම සිද්දිය ඇතුළට මේ සිද්දිය විග්‍රහ කරගන්න ගියොත්, එක ස්කන්ධපංචකයක් ඇතුලෙ අපි පඤ්චස්කන්ධයත්, කර්ම සහගත පඤ්චඋපාදානස්කන්ධයත් එකම තැනකට දාලා, එකම තැනකින් සංග්‍රහ කරගත්තා වෙනවා. පංචස්කන්ධයත්, කර්ම සහගත පඤ්චඋපාදානස්කන්ධයත් එකම තැනකට දාලා, එකම තැනකින් සංග්‍රහ කරගන්න ගියාට පස්සෙ අපිට කවදාවත් මිදීමක්නම් ඇතිවෙන්නෙ නැහැ. ඒක නිසා මේ රූපය පෙනෙන තැනක සමස්ථ සිද්ධාන්තයක්. මේ රූපය පෙනෙන, රූපය දැනගන්න සමස්ත සිද්ධාන්තය තුළ එක හිතකින් මේ ගැන කතාකරන්න කිසිසේත්ම පුලුවන් කමක් නැහැ. ඒක නිසා අපි ඒ ගැන අවබෝධ කරගන්න එක, දැනගන්න එක වටිනවා ඒ කාරණාව විග්‍රහකරගනන්න කොට.

විපාක ඇස, රූප, චක්ඛුවිඤ්ඤාණ කියන මේ කාරණා තුන ඇතුලේ තියන ධර්මතා ටිකක් තමයි දැන් අපි මේ කතා කරන්නේ. දැන් මේ සිද්ධියේ අපි කතා කරන්නේ චක්ඛායතන රූපය ගැන. චක්ඛායතන රූපය විස්තර කරගන්න කොට අපි දැන් ඇසෙන් රූපය දකී කියලා කතා කළා... අසෙහි රූපය පතිත වේ... රූපයෙහි ඇස පතිත වේ.. කියා. ඊට පස්සේ කියනවා යං චක්ඛුං නිස්සාය රූපං ආරබ්භ ඇසක් නිසා රූපය අරඹයා "*චක්ඛුසම්ඵස්සො උප්පජ්ජි*" චක්ඛුසම්පස්සයක් උපදිනවා නම්. මේ චක්ඛුසම්පස්සය කියන එක හා චක්ඛුවිඤ්ඤාණය බැලුවාම මෙතන ගති දෙකක් තියෙනවා. එකක් පටිඝ සම්පස්සය අනෙක අධිවචන සම්පස්සය. පටිඝ සම්පස්සය කියන්නේ ඇසට රූපය ගැටෙන ගතිය. ඒ වගේම ඒ නාම ධර්මතා ටික අරගත්ත යම් නාම ධර්මතාවල යම් ස්පර්ශයක් තියෙනවානම් ඒකට කියනවා අධිවචන සම්පස්සය කියලා. පටිඝ කියන්නේ ගැටීම , මේ ඇසෙහි රූපය ගැටීම ඇති නිසා එයට කියනවා පටිඝ සම්පස්සය කියලා. "*චක්ඛුසම්ඵස්සො උප්පජ්ජි වා උප්පජ්ජති වා උප්පජ්ජිස්සති*" ඒ කියන්නේ එතන චක්ඛුසම්පස්සයක් හටගන්නවානම්, හටගෙන තියෙනවා නම් , අනාගතයට හට ගන්න තියෙනවා නම්, කොටින්ම චක්ඛුසම්පස්සයක් කියන

ලක්ෂණයක් කියලා දෙයක් මෙතන හට ගන්න බවක් තියෙනවානම් අන්න ඒකට තමයි ඇස කියලා කියන්නේ. ඊලඟට එන්නේ *චක්ඛුසම්පස්සජා වේදනා, චක්ඛුසම්පස්සජා සඤ්ඤා, චක්ඛුසම්පස්සජා චේතනා.*

චක්ඛුවිඤ්ඤාණ කියන කාරණාව දක්වා විග්‍රහ කර දෙනවා. වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ කියන මෙන්න මේ ගති තියෙනවා නම් මේ එකම රූපය කියන එක ගැටෙන මොහොත ඒ වෙලාවෙ කතා කලේ. චක්ඛුං පේතං ඇස කිව්වේ ඒකයි. පටන් ගැනීමේදී අපි කතා කලේ මේ ස්කන්ධපංචකය එකක් එකක් වෙන් කරන්න බැහැ.

එහෙම වුනොත් අපි කලින් හැදිලා තිබුන ඇහැට දැන් තියනා මේ රූපෙ ගැටුනා කියන වෙනවා. ඒ නිසා මේ ඇස හැදීමයි රූපෙ ගැටීමයි කාරණා දෙකක් නෙමෙයි. මේ එකම සිද්ධිය තුළ එකම අවස්ථාවේ සිද්ධවෙන කාරණා. ඔක්කොම එකට හට ගත්ත ධර්මතා ටිකක්. ඒකයි අපිට ඔය කාරණාව සාධාරණව සහේතුකව කතා කරන්න පුළුවන් වෙන්නේ. *චක්ඛුසම්පස්සජා වේදනා, චක්ඛුසම්පස්සජා සංඥා, චක්ඛුසම්පස්සජා චේතනා හා චක්ඛුවිඤ්ඤාණය.* මෙහිදී චක්ඛුවිඤ්ඤාණය හා මනෝවිඤ්ඤාණය පටලවා ගන්න එපා. චක්ඛුවිඤ්ඤාණය කිව්වේ ඇස ගැන දැන ගත්ත බවට, ඒ කිව්වෙ ආපාතාගම වූ රූපය දැනගන්නා කමට. ඒකත් විඥානන බවක් තමයි. එක විදියකින් ගත්තොත් එකත් මනෝවිඤ්ඤාණයක් වගේ තමයි.

ඒ අනුව ඇස කියන්නේ දර්ශන කෘත්‍යකට මිස තියන දෙයකට නෙමයි. පෙනන බවට, පෙනෙන ගතියට. මේ පෙනෙන දර්ශන කෘත්‍ය කර්ම සහගත දැන ගන්න මොහොත වන විට ඇත්තේ නැහැ. කෙටියෙන්ම ඒ කාරණාව තමයි මේ කියන්නේ. කොටින්ම "*දිට්ඨේ දිට්ඨ මත්තං*"."*විඤ්ඤාතේ විඤ්ඤාත මත්තං*". ඒ කියන්නේ දැකීම දැකීමක් විතරයි, දැන ගැනීම දැන ගැනීමක් විතරයි. කර්ම සහගතව දැන ගත්තේ නාම ධර්මතා මිසක දැන ගන්න බැහැ රූපය. දැන ගන්න බැහැ ඇස. දැන ගන්නේ කර්ම සහගත නාම ධර්මතා ටික. "*දිට්ඨය*" කියන තැන තියෙන්නේ මේ ස්කන්ධපංචකයක පැවැත්මක්. "දිට්ඨය" හා "*විඤ්ඤාතය*" කළවම් වෙන එක තමයි අපිට තියන ප්‍රශ්නය. ඒක නිසාම තමයි මේ දෙක එකතු වෙලා, අද අපි දකින්නේම පුද්ගලයෙක්. දකින්නේම මනුස්සයෙක්.

හැබැයි ඇත්තටම බැලුවොත් අපි කවදාවත් මනුස්සයෙක් දැකළා නැහැ. අපි මනුස්සයෙක් දැන ගෙන තියනවා. දැන ගන්න එකයි දකින එකයි සිද්ධි දෙකක්. දකින සිද්ධියට මනුස්සයා කවදාවත් අයිති නැහැ. මනුස්සයා දකිනවා කියන තැනක අපිට හැම වෙලාවකදීම තියෙනවා එක්කෝ ප්‍රිය නැත්නම් අප්‍රිය බව. නැත්නම් උපේක්ෂා සහගත බව. මනුස්සයෙක් ඉන්නවා කියන තැන ඔය සංකල්ප තුන අනිවාර්යයෙන්ම අපි බැස ගන්න දෙයක්. මේ තුන් ආකාරයකින් බැස ගත් සංකල්පය මනුස්සයා ඉන්නවා කියන දේ තුළ ඇතිවන දෙයක්. සම්පූර්ණයෙන්ම අපිට ඔය මනුස්සයෙක් ඉන්නවා කියන සංකල්පයක් ඇතිවුනේ දැකපු දේ දැකීමෙන් පසු ඉතුරු නැතුව නිරුද්ධයි කියන එක නොදන්නකම නිසා. දැකපු දේ අස්සට දැන ගත්ත මනුස්සයා අයිතියි කියලා හිතපු නිසා. හැබැයි දකින සිද්ධියට දන්න මනුස්සයා ගාවගන්න එක තමයි අපිට තියන 'ජටාව' නැත්නම් අවුල කියලා කියන්නේ. "*අන්තෝ ජටා බහී ජටා ජටාය ජටිතා පජා*" කිව්වේ ඒකයි. ඇතුළතත් අවුල් පිටතත් අවුල් මේ සත්වයා අවුලෙන් අවුලට පත්වෙලා ඉන්නේ. ඒ අවුල නිසා අපිට දකින දේ දැන ගන්න පුළුවන්. දැන ගන්න දේ දකිනන පුළුවන්. දකින දේ අල්ලන්න පුළුවන්. අල්ලන දේ දකින්න පුළුවන්. දැන් මේ පේන පොත, කවදාවත් අල්ලන්න බෑ කිව්වොත් අපිට තර්ක විතර්ක කරන්න පුළුවන්, අල්ලලා කියන්න පුළුවන් මේ අහුවෙන්නේ පොත නෙමෙයිද? කියලා. එතකොට තියන ප්‍රශ්නය ඔය පොත නම් අහුවුනේ අතට අල්ලන කොටම ඔය පොතේම සම්පූර්ණ මුළු හැඩයම ප්‍රකට වුනාද? ස්පර්ශය වෙන් කලොත් ස්පර්ශයට පොතේ හැඩය ප්‍රකට වුනේ නැහැ. එහෙනම් 'ඔබට' වර්ණය ප්‍රකට වුනාද? නැහැ. 'ඇසට' පෙනුනේ වණීය විතරනෙ, එම වර්ණයේ අල්ලන සංඥාවක් (කියලා දෙයක්) තිබුනේ නැහැනේ. ඝනකම ගතියක්, පොට්ඨබ්බයක් තිබුනේ නැහැනේ ඇහැට? මෙන්න මේ විදිහට මේ ආයතන ටික වෙන්කරන එකකුයි මේ දර්ශනය තුළ සිද්ධ කරන්නේ. දිට්ඨේ දිට්ඨ මත්තං කියලා මේ ඇස රූප දෙක වෙන්කරලා පෙන්වනවා, මේ ස්කන්ධපංචකයෙන් වුනේ දකින ලක්ෂණය හදලා දෙන එක විතරයි. ඒකෙන් පුළුවන්කම තිබුනේ දකිනබව සිද්ධ කරන කාරණයට විතරමයි. එතනින් එහාට දෙයක් මෙතනින් කරන්න පුළුවන්කමක් තිබුනේ නැහැ. එම දකින දේ දැකීමෙන් පසුව ඉතුරු නැතිව නිරුද්ධවුනා.

එතකොට තමයි දැකපු දේ අරඹයා දැන ගන්න සිද්ධිය පටන් ගන්නේ. ස්පර්ශ, වේදනා, සංඥා, චෙතනා, මනෝවිඤ්ඤාණ කියන මේ නව කර්ම මට්ටම. දැන් මේ ඔක්කොම දැකපු දේ ඉතුරු නැතිව නැතිවූ තැනක අපි හදා ගත්ත ටිකක්. එතකොට අපිට දැන් ඒ ඒ ආයතන ගැන එන්න අවශ්‍යය නුවණ තියෙනවා. ඇස ගැන ඔන්න ඔය විදියේ නුවණ ඇති වෙනකොට අපිට එන්න ඕනේ අවබෝධයක් අපි දැන් කිසිම කලක රූපය 'දැන ගෙන' තියෙන්නේ නැහැ , 'දැන ගෙන' තියෙන්නේ නාම ධර්මතා ටික විතරක්ම බවට . රූපය ඇසුරුවන මොහොතේ අපිට කවදාවත් 'දැන ගන්න' පුළුවන්කමක් ඇත්තේ නැහැ. රූපය ඇසුරුවන මොහොතට අපිට කවදාවත් හීනෙකින්වත් යන්න පුළුවන්කමක් නැහැ.

රහතන් වහන්සේටවත් බැහැ රූපය ඇසුරු වෙන තැනකට යන්න. ඒක තමයි විපාකය. ඒක තමයි ස්කන්ධ ටික. හැම වේලාවකදීම අපිට පුළුවන්කම තියෙන්නේ ස්කන්ධ ටික අරඹයා ප්‍රතිචාර දක්වන ක්‍රමය වෙනස් කරන එකට. ඒ ක්‍රමය වෙනස් කරන එක තමයි අද දවසේ මේ කියන කාරණා ටික තුළ මේ ක්‍රමයෙන් ඒ නුවණ අරගෙන යෑමෙන් වෙන්නේ. ඇස කියන්නේ රූපයෙන් තොරව පනවන්න බැරි දෙයක් කිව්වා. ඇස කියන්නේ මේ මොහොතෙ හට ගෙන ඉතුරු නැතුව නිරුද්ධ වෙන දෙයක් කියලා කිව්වා. ඊට පස්සේ කිව්වා ඇස කියන්නේ හේතු ටික ඇති කල්හිම හටගෙන හේතු ටික නිරුද්ධවන කොටම නිරුද්ධවන දෙයක් , මේ තනියෙන් ඇහැයි රූපයි කියලා දෙකක් තිබිලා ඒ අනුව නාම ධර්මතා ඇතිවෙනවා නොවෙයි. හැම විට දර්ශන කෘත්‍යටයි ඇස කියලා කිව්වේ.

ඒවාගේම රූපය කියලා කිව්වේ මේ දර්ශන කෘත්‍යටමයි. මේ මොහොතේ දර්ශන කෘත්‍ය කර්ම සහගත ගැන දැන ගන්න මොහොත වෙනකොට එම `දර්ශන කෘත්‍ය` ඉතුරු නැතිව වැයවෙලා ඉවරයි. කර්ම සහගත විඥානනය වෙන කොට, අර දකින ගති (ලක්ෂණ) ටික ඉතුරු නැතිව නැතිවෙලා ඉවරයි. අපිට ජීවිතයේ ප්‍රකට කර ගන්න වෙනවා හැම වෙලාවකදීම දෙපැත්තටම මේක වෙන් කරලා. ආයතන ටික වෙන් කර ගන්නවා කිව්වේ නැතිනම් අපි නාමරූප පරිච්ඡේදයක් කරනවා කියලා මුලින් මතක් කලේ ඒකයි. නාමරූප පරිච්ඡේදයක් වෙනකොට අපිට වටිනා කාරණයක් තියෙනවා සිද්ධ කර ගන්න මෙතනදි. ඒ කිව්වේ ඇහේ දර්ශන කෘත්‍ය ගැන අවබෝධ කරගන්න

තැනක්. ඒ දර්ශන කෘත්‍ය ගැන අවබෝධ කරගන්න කියනවා කොට දර්ශන කෘතය ඇතුලෙ දකින්න එපා මනුස්සයො, ගස්, ගල්, ගෙවල්, දොරවල් කියන මේ මේ ධර්මතා ටික, ඒ ටිකෙන් පරිභාහිරට ගියපු ලක්ෂණ ටිකක් මෙ කතා කලේ. ඒවා අපේ ජීවිතයට අයිති ටිකක් නෙමෙයි. ඒවාට කිව්වේ ස්කන්ධ ටික නැත්නම් විපාකය කියලා. මේ විපාකය අරඹලා ප්‍රතිචාරය දක්වන අකාරය විතරයි අද අපිට වෙනස් කරන්න පුළුවන්කමක් තියෙන පැත්ත.

ඒ ප්‍රතිචාර දක්වන්න ක්‍රමය වෙනස් කරන්න ඕන කාරණා ටික තමයි මේ විදියට ටිකෙන් ටික අපි විග්‍රහ කර ගෙන එන්නේ. දැන් අපිට තියෙනවා මේකෙන් ජීවිතයට ගන්න ලොකු පාඩමක්. ඒ තමයි වර්ණ ලෝකය පිළිබඳ සම්පූර්ණයෙන්ම අවබෝධ කරගන්න.

අපිට ඔය කාරණා ටිකම එලෙසම සොතායතනයේදීත් කතා කරන්න පුළුවන්. සොතායතන ගැන කතා කරද්දී "*යං සොතං චතුන්නං මහාභූතානං උපාදාය පසාදො අත්තභාවපරියාපන්නො අනිදස්සනො සප්පටිඝො*" යම් සතරමහා ධාතු උපාදාය නිසා හට ගත් "*පසාදෝ*" ප්‍රසාදවත් "*අත්තභාව පරියාපන්නෝ*" ආත්මභාවය අනුව ගියපු , "*අනිදස්සන*" දකිනන බැරි අහන්න පුළුවන්, "*සප්පටිඝො*" ගැටෙන ස්වභාවයකින් යුක්ත මේ ශබ්දයක් (සද්දං) "*සුණි වා සුණාති වා සුණිස්සති වා සුණෙ වා*" . "*සුණි වා*" ඇසුවා නම්, "*සුණාති වා*" ඇසෙනවා නම්, *සුණිස්සති* වා අනාගතයට අහනවා නම්, *සුණෙ වා* අසන බවක් තියෙනවා නම් මෙන්න මේ කාරණයට කියනවා *සොතය කියලා, සෝතධාතු, සොත ඉන්ද්‍රිය, ලෝකය , ද්වාරය, සමුද්ද, ඛෙත්ත, ඕරිම තීර*... මේ කියන වචන ටික දැන් කතා කරනවා සෝතය කියන තැනට.

ශබ්දය (සද්දං) කියන තැන මේ විග්‍රහ කලේ අර කලින් කතා කළ න්‍යායන් ටික යටතේමයි. ඒ කියන්නේ 'කනෙන් ශබ්දය අහනවා නම්', 'කනෙහි ශබ්දය පතිත වෙනවානම්', 'ශබ්දයෙහි කන පතිත වෙනවානම්'. මේ කාරණා තුන *අඤ්ඤමඤ්ඤව* පනවන්නේ විහිලුවකට වගේ කාරණාවකට නෙමෙයි. එසේ පෙන්නන්නේ මේ ටිකම එකටම හට ගන්නවා කියන්න. මේ ලෝකෙ ශබ්ද තියෙනවා, ඒ තියෙන ශබ්ද අහනවා කියන දෘෂ්ටියෙන් මිදීමට. ඒ ශබ්දය ලෝකයේ තියෙනවා කියන එක මට හම්බවෙන

මඤ්ඤනාවක්. එනම් චේතනාවක් විතරයි. ඒ චේතනාවද මේ මොහොතේ හටගෙන මේ මොහොතේම නිරුද්ධවෙන එකක්.

අපිට ලෝකය ගැන අවබෝධ කරගන්න පුළුවන්කම තියෙන්නේ ලෝකය කියන්නේ අපි මේ ආයතන කියන ධර්මතා ටික ලෙස බලමින්. ඒකනේ "ලෝකෝ පේසෝ" කියලා කිව්වේ. ලෝකයත් මේකමයි කියලා හැම ආයතනයටම විග්‍රහ කරලා දෙන්නේ ඒක නිසයි. කලින් අපි ඇහෙන් ගත්ත අරමුණු ටික සම්පූර්ණයෙන්ම ඔබේ ජීවිතයෙන් අයින් කළානේ. ඇහෙන් ගත්ත අරමුණු ටික පැත්තකින් තියෙන කොට,ඇහෙන් ගත්ත කිසිම අරමුණක් ලඟට මනස ගන්න නැතිවෙනකොට, දැන් 'ඇති බවට ගත්ත' කිසිම වර්ණ සටහනක් නැති බවට තේරෙනවා. ඇහැත් එක්කම හටගෙන ඉතුරු නැතිවම නැතිවෙන දෙයක්. ඒවාගේම ශබ්ද ලෝකය දිහා බලන්න. ලෝකයේ ශබ්ද තියෙනවා කියලා හිතා ගත්ත බව. මේ ශබ්ද තියෙනවා කියලා හිතා ගත්ත ලක්ෂණයත් මේ මොහොතේ හට ගෙන ඉතුරු නැතිව නිරුද්ධවන බවකට. කනෙන් තොර ශබ්දයත් ශබ්දෙන් තොරව කනත් පනවන්නේ නැති කොට, කන "*අත්තභාව පරියාපන්න*" කියන කොට ආත්මභාවය අනුව ගිය දෙයකුයි මේ කන කියලා කියන කොට, මේ කන මේ පුද්ගලබවත් එක්කම හැදුනා පුද්ගලබව නිරුද්ධවෙන කොටම නිරුද්ධවෙලා යනවා බව කියන කොට, හැම වෙලාවෙම මේ කන අරඹයා ගොඩ නැගුනු පුද්ගල සංඥාවක් තියෙනවා නම් 'මේ පුද්ගල සංඥාව' ; මේ මේ හේතු ටිකෙන්මයි හට ගත්තේ, මේ මේ හේතු නිරුද්ධවෙන කොට මේ මන අනුව ජීවත්වෙන පුද්ගලයා නිරුද්ධවුනා.

අපිට ඔය පුද්ගලබව ගොඩ නැගෙන්නේ තැන් හයක. ඇස, කන, නාසය, දිව, කය , මනස කියන මේ ආයතන වල. මේ ආයතන තුළ තමයි පුද්ගලයෙකු ජීවත්වන බවට කරුණු ඉතිරි කරන්නේ. මේ ආයතන ලෝකය තුළ 'තියෙනවා කියලා' හිතා ගෙන ඉන්න කමම තමයි අපිට එක දිඟට ජීවත්වන පුද්ගලයෙක් ඉන්නවා කියන දේ 'රඳලා තියා ගන්න' එකම හේතුව වන්නේ.

අපි හෙට ඇවිල්ලා මේ ස්ථානය බැලුවොත්, මෙතන තියන මේ පරිසරය හෙටත් මේ විදියට තිබුනොත් 'තියෙනවා' කියලා අපි කියනවා. ඊයෙ තිබුන එක අදත් තියෙනවා

කියලා. ඊයෙ තිබුන එක අදත් තියෙනවා කියලා කිව්වොත් කියන්නේ ඊයෙ ඉඳලා මම ජීවත්වුනා කියන එක. 'ඊයෙ ඉඳලා මම ජීවත්වුනා කියන එක' නිකම්ම ආකස්මිකව ගොඩ නැඟුන දෙයක් නෙමෙයි. ඊයෙ ඉඳලා ඇස තිබුනා....ඊයෙ ඉඳලා ඒ රූපය තිබුනා.. එතකොට තාමත් ඒක තියනවා...මේ ඇහේ නිත්‍ය සංඥාව රූපේ නිත්‍ය සංඥාව කියන විපල්ලාසය. එදා අහපු ශබ්දයම තමයි ආය ඇහෙන්නේ.. ඒ කුරුල්ලාම තමයි අදත් කෑගහන්නේ කියලා වැරදි දෘෂ්ටි ඇති කර ගන්නවා. දැන් අපිට වැරදි ලෙස දෘෂ්ටිගතව ශබ්දයට කුරුල්ලෙකුත් ඉන්නවා ආපු ශබ්දයට කුරුල්ලෙකුගෙ රූපයක් ගලපලා, කුරුල්ලෙකුට ශබ්දයකුත් තියෙනවා කුරුල්ලා කියන රූපයකින් ශබ්දය ආවා කියලා.

මේක ලොකු ප්‍රශ්නයක්. ලොකු අවුලක්. හැම වෙලාවකම ශබ්දය තුළ අපි දැක්කේ නැහැ ශබ්දය කියන එක සම්පූර්ණයෙන්ම පුද්ගලබවකින් තොරව හේතු ටික ඇති කල්හි හට ගත්ත එකක් කියලා. ශබ්දය ශබ්ද මාත්‍රයක් විතරයි. ශබ්දයට වෙනමම සටහන් කුරුල්ලෙකුගේ වගේ තිබුනේ නැහැ. ශබ්දය ශබ්ද මාත්‍රයක් විතරක් වන තැනක අපි කෙන කෙනා තුළ ඇති සටහන් එකතු කරගෙන උපද්ද ගත්තා කියන එක අපි දැක්කේ නැහැ. 'ශබ්දය ශබ්ද මාත්‍රයක් විතරයි' කියන තැනකදි "*සුනේ සුන මත්තං*" කියන කාරණාව මේ විග්‍රහ වෙන්නේ. කනෙන් තොර ශබ්දයත් ශබ්දයෙන් තොර කනත් නැහැ. කන "*අත්තභාව පරියාපන්න*" යි. කන ආත්මභාවය අනුව ගියපු දෙයක්. කනේ හැකියාව අනුවයි අපිට ශබ්දය ගැටෙන්නේ. කනේ හැකියාව අනුව ශබ්දයක් ගැටුනාට පස්සේ අපි කනේ හැකියාව අනුවයි දැන් ගන්නේ , ඒත් වැරදි විදියට අපි හිතනවා පවතින ශබ්දය දැන ගත්තා කියලා. අන්තිමේදි දැන ගත්තේ හැම වෙලාවකදීම වේදනා, සංඥා ටිකක්. හැබැයි අපේ නුවණ යන්නේ වැරදි විදියට ශබ්දය දැන ගත්තා කියන එකට. කන කියන දේ විග්‍රහ වෙන තැනක අපිට හොඳට දකින්න වෙනවා මේ 'තියෙන කනක්' ගැන නෙමෙයි කතා කරන්නේ. ශබ්දය ගෝචර වෙන කොටම ශබ්දය කනත් එක්කම උපදින එකක්. මොකද කන කොච්චර තිබුනත් වැදගත් වෙන්නේ නැහැ ශබ්දය නැත්නම්. අපි ඒවගේ තැන් වල කියන්නේ කන ඇහෙන්නේ නැහැ කියලා නැත්නම් ශබ්දක් ඇහෙන්න නැති නිසා. ඒ වගේම ශබ්ද කොච්චර තිබුනත් වැඩක් නැහැ කන නැත්නම්. අපිට ශබ්දය ගැන දැන ගන්න බැහැ. ඒ නිසා මේ කන හා ශබ්දය කියන එකේ පෙර හා පසු නැතිව හට ගැනීම තුළ තමයි අපි කනත්

ශබ්දයත් කියලා කතා කරන තැන තියෙන්නේ. කන ඇතිවෙලා නම් එතන නම් ශබ්දය තියෙනවා. ශබ්දයක් තියෙනවානම් එතන කන තියෙනවා. හැබැයි මේ කන හා ශබ්දය කියන තැන හිතන්න එපා අපි දැන ගන්න ශබ්ද (උදා-කුරුල්ලා කියලා කියන රූපයකින් ආපු ශබ්ද).

ශබ්දය ශබ්ද මාත්‍රයක් විතරයි. ඒ ශබ්දය තුළ දැන් අම්මා කියන වචනය ඇහෙන කොට අම්මා කියලා හදාගන්න චිත්තජ රූපය ශබ්දය නෙමෙයි. ඒක චිත්තජ රූපය. ඒක හිතෙන් දැනගත්ත අම්මා කියන විඥානන ස්වභාවය. හැබැයි මේ අම්මා කියන තැන ඇතිවුණ මේ ලක්ෂණ ටිකක් තිබුනා. මේ ලක්ෂණ ටිකට තමයි කියන්නේ හැම වෙලාවකදීම ශබ්දය කියන ශබ්දවත් ගතියට. ඒකට තමයි කියන්නේ ශබ්ද මාත්‍රය කියලා. එම ශබ්ද මාත්‍රය දැන ගන්න එක අම්මා නෙමෙයි. රූපය නෙමෙයි. ඒවගේම මේ ශබ්ද මාත්‍රය දැන ගන්න මට්ටමත් කොයි වෙලාවකදීවත් ශබ්දය නෙමෙයි.ඒක විඥානන බව.

දැන් අපි හිතමු, අපිට නොදන්නා ශබ්දයක් දැන් අපිට ඇහෙනවා කියලා. අපි ඒ ශබ්දය කවදාවත් අහලා නැහැ. හැබැයි අපි ශබ්දය ගැන ඇහුනුබව දන්නේ 'දැන ගන්න' මොහොතෙදි මිසක ශබ්දය ඇහුනු තැන දි කනට ගැටුනු තැන දි නෙමෙයි. ශබ්ද ඇසෙන තැන අපගේ මුළු ජීවිතයම "අත්තභාවපරියාපන්න" කියනව වගේ මුළු ආත්මභාවයම වැය වෙලා ඉවරයි ප්‍රසාදවත් බවට. මුළු 'කෙනාම' ශබ්දය වෙලා. 'ශබ්දය' කෙනා (පුද්ගලයා) වෙලා. ශබ්දය ගෝචර කර ගන්න කොටම මුළු කනම ශබ්දය වෙලා, ශබ්දය කන වෙලා, නැත්නම් කෙනා කන බවට පත්වෙලා, කන 'කෙනා' (පුද්ගලයා) බවට පත්වෙලා. හැම වෙලාවකම මේ අඤ්ඤමඤ්ඤ සිද්ධියක්. ශබ්දය ඇහෙනබව ඒ වෙලාවෙදි ඒ ස්කන්ධපංචකයේම ඒ පුද්ගලභාවය නිර්මාණය කරගෙන තියෙන්නේ. ඒක වරදවා ගන්න එපා, පුද්ගලභාවය නිර්මාණය කරනවා කිව්වේ ඒ තුළ නව කෙලෙස් තුළකින් හදා ගත්ත පුද්ගලභවක් නෙමෙයි. ඒ ස්කන්ධපංචකයම තමයි මේ 'කෙනා' කියන මට්ටමට ම හදලා දුන්නේ. ඒ වගේම ඒ ස්කන්ධපංචකය ම ඉතුරු නැතුව නිරුද්ධවන මට්ටමේදිමයි ඔය කෙනා කියන මට්ටම නිරුද්ධ වුනෙත්.

ඒක ශේෂමාත්‍රයක්වත් ඉතුරු වුනේ නැහැ. හැබැයි ඒ ටික තුළ කිසිම විටෙක ශබ්දය දෙයක් ලෙස ගන්නා බවක් තිබුනේ නැහැ. කන බිඳුනු බව දැන ගන්න පුළුවන්. හැබැයි ශබ්දය අරඹයා දෙවල් දැන ගන්න ලක්ෂණයක් තිබුනේ නැහැ. ශබ්දය අරඹයා දැනගන්නේ ශබ්දය නොවුනු තැනක. නැවත නැවත කියන උදාහරණයක් තමයි හිටගෙන ඉන්න තැන දකින්න පුළුවන් එතනින් අයින් වෙලා. මෙන්න මෙතනයි කියලා. හැබැයි අපි දන්නේ නැහැ අපි ඒක 'හිටගෙන හිටපු' තැන මිස දැන් හිටගෙන ඉන්න තැන නෙමෙයි කියලා. ඒවගේම අපිට ශබ්දය ගැන කතා කරන්න පුළුවන් හැබැයි ශබ්දය නොවන තැනක ඉඳලා. අපිට ශබ්දය අහන්න පුළුවන්, ශබ්දය දැන ගන්න පුළුවන් හැබැයි ශබ්දය 'දැන ගන්නේ' ශබ්දය කියලා දෙයක් නොවන තැනක ඉඳලා. ඒක දැන ගන්න මට්ටමක්. දැන ගන්නේ මොකද්ද? වේදනා, සංඥා කියන ගති දෙකක්. අපිට දැන ගන්න බෑ කවදාවත් ශබ්දයක්. වේදනා , සංඥා දෙකක් දැන ගන්න තැනකදී අපි ශබ්දයක් ගැන කතා කරනවා. ඒක හරියට අපි කලින් දේශනාව තුළ ඇසට උපමා කරමින් කතා කළා වගේ වැස්ස නොවන තැනක වැස්ස ගැන කතා කරනවා වගේ දෙයක්.

අපි පැයක් තිස්සේ වහින වැස්සක් ගැන කතා කරනවා. ඒත් පැයක් තිස්සේ වහින වැස්ස තිබුනේ කොහෙද? ඒ පැයක් තිස්සේ වැහි බිඳුවක් එක තැන තිබුනාද? පැයක් තිස්සේ තිබුනු කොයි වැහි බිඳුවද ඔය වැස්ස වුනේ? එහෙම බැලුවාම අපිට වැස්ස වශයෙන් පනවන්නෙ දෙයක් නැති වෙනවා. ඒ වගේම ශබ්දය ගැන කතා කරන්න අපිට තැනක් නැති වෙන්න ඕනේ. හැම විටකම ශබ්දය කියන තැන විඥානන බවින්ම දකින්න එපා. ශබ්දය කියන මොහොත අපි කවදාවත් නොදන්න මට්ටමක තිබුනේ. ඒක බොහොම ගැඹුරු කාරණාවක්. අපි ඇස ගැන කතා කරලාම ගොඩක් දෙනෙකුට ඇස ප්‍රධානයි. නමුත් ශබ්දය වගේ දෙයක් ප්‍රකට නැහැ. "*සුතේ සුත මත්තං*" කියන්නේ අපිට ඇහුනා ඇහුන දේ ඉවරයි කියලා කියාගන්න කාරණය නෙමෙයි. "*සුතේ සුත මත්තං*" කියන්නේ මේ (කලින් සඳහන් කළ) බවට. ඒක අපිට කවදාවත් අත්දකින්න බැරි කාරණාවක් කිව්වේ "*සුතේ සුත මත්තං*" කියන කොට ඒක සම්පූර්ණයෙන්ම අපේ ජීවිතයට වැය වෙලා ඉවරවෙන අවසාන වෙන තැනක් වන නිසා. "*සුතේ සුත මත්තං*" කියන මොහොත අපේ ජීවිතයට වැය වෙලා ඉවරයි. අසන ලක්ෂණයට අපේ

හිත සම්පූර්ණවම ජීවත් වෙලා කියන බව ගෙවිලා, වැය වෙලා, අවසාන වෙලා ගිය නිසා අපිට ඒක දැනගන්න පුළුවන් කමක් ඇත්තෙ නැහැ.

අපි කර්ම සහගතව දැන ගන්නේ ඒ ශබ්දය නොවන තැනකට ගිහිල්ලා. ඒ ස්කන්ධ පංචකයෙන්ම ශබ්දය දැනගන්න බැහැ. කර්ම සහගතව ශබ්දය පිළිබඳව දැන ගන්නේ විඥානනය කියන මට්ටමින්. හැබැයි ඒ ශබ්දය ගැන කර්ම සහගතව දැන ගන්න මොහොත ශබ්දය නෙමෙයි. මම ශබ්දය ගැන කරණ ඒ කර්ම සහගත තීරණය අනිත්‍ය වූ තැන නිත්‍යයි කියලා ගත්ත විපල්ලාස සංඥා පතිත කර ගත්ත තැනක් වෙනවා. ඒක නිසා අපිට ඒ විපල්ලාස සංඥාව වැරදි දෙයක් ලෙසට අවබෝධ කරගන්න අවශ්‍ය නිසයි අපිට මේ කනේ යථා ස්වාභාවය අවබෝධ කර ගන්න වෙන්නේ. "*සුතේ සුත මත්තං*" කියන කොට කොයි වෙලාවකදී වත් ඇහෙන දේ දැන ගන්න මොහොත වෙනුවට ඉන් එහා ගිය දෙයක් ගැන හිතන්න එපා.ඇහෙන දේ දැන ගන්න මොහොතදී ඒ දැන ගන්න ලක්ෂණය දැන ගන්න බවින්ම ඉවර වෙලා යනවා. දැන ගන්න බවින් ඉවර වෙනකොට එතන ශබ්දය නැහැ. ශබ්දය වැය වෙලා ඉවරයි. කන වැය වෙලා ඉවරයි. කන වැය වුණ තැනකදී තමයි අපි ශබ්දය ගැන දැන ගන්නේ. ඔය දැන ගන්න ශබ්දය තුළ තමයි අපි ජීවිතය තුළ මේ හැම සංකල්පමය දුකක්ම හදා ගන්නේ.

දැන් අපිට එළියේ තියෙන ශබ්දය අරඹයා උපේක්ෂා සහගත වෙන්න පුළුවන්. දුක් වෙන්න පුළුවන්. ගැටෙන්න පුළුවන්. හැබැයි ඒක කෙන කෙනා සතු දේ. මිසක ඒක ශබ්දයෙන් ආපු දෙයක් කිව්වේ ඒකයි. ශබ්දය අරඹයා දුක හදා ගන්නවාද සැප හදා ගන්නවාද කියන කාරණය අපි ශබ්දය අරඹයා ජීවිතය ජීවත් කරවන්න හදන ලක්ෂණ ටික. ඒක නව කර්ම මට්ටම. ශබ්දය ශබ්දය මාත්‍රයක් කියලා කියන කොට ශබ්දයෙහි හැම මොහොතකදීම නව කර්ම ලක්ෂණ ටික දකින්න බැරි මට්ටමක්. එළියේ තියෙන ශබ්දයක් දැන ගත්තා කියන එක ඉදිරිපත් වෙන්න බැරි මට්ටමක්.

ඒකදී අපිට නුවණ විතරයි පවත් වන්න පුළුවන්. ශබ්දය ඉතුරු නැතුව නිරුද්ධවුණ තැනකදී, තමන් තමන්ගේ හිතට දැනුනු ලක්ෂණ ටික 'දැන ගත්තා' කියල නුවණ පමණක් පවත්වන්න විතරයි පුළුවන්. ශබ්දයහි නිරෝධයත්, තමන් දැන ගන්න ලක්ෂණ ටිකෙහි ඉතුරු නැතිව නිරුද්ධවන බවත් ගැන ඔහුට නුවණ තියෙනවා.

ශබ්දයහි නිරෝධය හා තමන් දැන ගන්න බවෙහි නිරෝධය අවබෝධ කරගන්න එක තමයි අපිට දැන් අවශ්‍ය වෙන තැන. ඒකට තමයි අපි මේ 'කන' ගැන අවබෝධ කරගන්නේ. අද අපිට පුද්ගලබවකින් තියෙනවා කන කියලා ලෝකෙ තියෙනවා කියලා හිතා ගත්ත ධර්මයක්. කන කියලා ඇති බවට ගත්ත මේ ධර්මය වෙනස් වෙන්න ඕනේ. එක දිගට තියෙන කනක්, එක දිගට තියෙන ශබ්දයක් කියන මේ සංකල්පය වෙනස් වෙන්න ඕනේ. මේ කන කියන තැනදී අපි කන නිසාම හටගත් ශබ්දයක් තියෙනවා කියලා හිතා ගෙන හිටියොත් එසේ අපි හිතාගෙනම ඉන්නේ වැරදි දෘෂ්ටි ගතව 'කන' කියලා දෙයක් තියෙනවා කියන තැන. එසේ කනක් ගැන සිතා ගෙන හිටිහොත් ඒ ඉන්නේ 'ශබ්දය' තියෙන තැනක ඒ කන තියෙනවා කියන සංකල්පයක. මේ දෙකම අඤ්ඤමඤ්ඤව අපිට අවබෝධ කරගන්න සිද්ධ වෙනවා එකිනෙකට මේ දේ දැන ගන්න මට්ටමකට අපේ ජීවිතයේ අවබෝධයක් ගන්නට නම්.

මෙතනදි අපිට ඇත්තටම යතාභූත ස්වභාවය ගැන තේරුම් ගන්න කොට මෙම කාරණය අපිට දැන් කන පිළිබඳව ගියපු යථාර්ථවාදී නුවණ අපේ ජීවිතයට ගෙනල්ලා දීලා තියෙනවා. ඒ නුවණ කිව්වේ පෙර නොතිබීම හට ගෙන ඉතුරු නැතුව නිරුද්ධ වෙන "*අත්තභාව පරියාපන්න*" ආත්මභාවය අනුව ගියපු සිද්ධියකුයි කන කියන්නේ. කන නොවන සිද්ධිය අතනින් අයින් කර ගන්න. ශබ්දය පිළිබඳව දන්න කන් තියෙනවානම් ඒ ඔක්කොම අයින් කර ගන්න. ඒ කියන්නේ ලෝකෙ කුරුලු හඬ, මනුස්සයොන්ගේ හඬ, බැනුම් වල හඬ, හොඳ කීමේ හඬ.. මේ අහවල් ගායකයගේ ශබ්දය කියලා ශබ්දය ට රූපත් ඒ රූප වලට ශබ්දත් ඔක්කොම එකතු කරගන්න කම, එළියේ තියෙනවා කියලා වැරදි විදියට ශබ්දය දැන ගන්නකම.

මේ ගති සියල්ලම අපි තේරෙන්න ඕනේ විඥානන කෘත්‍ය තුළ පංච උපාදානස්කන්ධය තුළ හදා ගත්ත එකක් කියලා. එහෙම තේරෙනකොට තමයි අපිට ඇත්තටම සළායතන නිරෝධය පැත්තට මනස යොමු වෙන්නේ. ඇත්තටම කනේ ස්වභාවය අනාත්මයි නේද? කනේ ස්වභාවය ශූන්‍යයයි නේද? මෙතන සත්ත්ව පුද්ගල භාවයකින් ගන්න කිසිම දෙයක් නෑ නේද? කියලා හිස් බවක් අපිට තේරෙන්නේ. "*සුඤ්ඤෝ ගාමො පෙසො*" හිස් ගමක් කිවේ නිකම් නෙවෙයි. මේ ඇත්ත වශයෙන් හිස් දෙයක් ඇති

තැනක අපි පුරවගෙන ඉන්නේ කියලා අපිට මේ කාරනා ටික විග්‍රහ කරලා බලන කොට හොඳට පේනවා.

එක් එක් ආයතනයෙන් ආයතනයට අපිට කතා කරලා සංග්‍රහ කරලා බලන කොට හොඳටම පෙනී යනවා, ක්‍රමානුකූලව දැන් කලින් ඇහේ නිමිති ටික අයින් කර ගත්තා. දැන් අපි මේ සාකච්ඡාවෙන් කනෙන් තියන නිමිති ටික අයින් කර ගත්තා. දැන් අපිට ලෝකේ තියන වර්ණ සටහන් නැහැ. ඒ වෙනුවට තියන්නේ ආයතන ටිකෙන් හදා ගත්ත බවක් බවකින් හැදුනු ශබ්දයක් . ලෝකයේ තියෙන ශබ්ද නැහැ, තියෙන්නේ ඒ වෙනුවට හේතු ටිකත් එක්ක හදා ගත්ත බවක්. මේ මොහොත වර්තමානය තුළ විතරයි ඇසුරු වෙන්නේ. ඇසුරු වෙලා වර්තමාන මොහොතේම නැති වෙන දේ ගැන අපි පස්සේ නැවත 'ඇති හැටියට උපද්ද ගන්න බව' තමයි අපි විඳින්නේ. මෙන්න මේ ලක්ෂණය අපිට මේ තුළ ප්‍රකට වෙන කොට අපිට තේරෙනවා මේක දෙකක් කියලා. එතකොට හිතේ තියන ඒ ගතිය වැරදි විදියට එළියට දාලා විඳින්න හදන මේ මෝඩ ගතිය අපෙන් ටිකෙන් ටික දුරු වෙනවා මෙතන තියෙන යථාර්ථය අපි අවබෝධ කර ගන්න කොට.

නාම ධර්මතා ටික හා රූපය කියන කාරණාව දෙපැත්තට බෙදිලා එයින් නාමරූප පරිච්ඡේදයට නුවණ එනවා. අන්න ඒකට එතනට අදාළ කාරණා ටික තමයි අපි මේහිදී විග්‍රහ කර ගන්නේ. ඒ සම්මර්ශණය තුළ උපදින නුවණ තමයි අපිට ජීවිතයට වැදගත් වෙන්නේ. ඒක නිසා කවුරුත් බොහෝම ශ්‍රද්ධාවෙන් මේ කියන කාරණා ටික ජීවිතයට යොදා ගන්න. ධර්මය දන්න බවකට නොවෙයි, ප්‍රායෝගික අවබෝධවන බවකට මේ කාරණය යොදා ගන්න කියලා කාටත් කළ්‍යාණ මිත්‍රභාවයෙන් මතක් කරනවා.

පුණ්‍යානුමෝදනා !!!

සාධු ! සාධු !! සාධු !!!

3 පරිච්ඡේදය

කෙසේ නම් ආධ්‍යාත්ම ධර්මයන් මෙනෙහි කිරීමෙහි ප්‍රඥාව වස්තුනානත්ව ඥාන නම් වන්නේද?

නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස////

ශ්‍රද්ධා සම්පන්න කාරුණික පින්වතුනි, ලොව්තුරා බුදුපියාණන් වහන්සේ අපි හැම දෙනාටම යහපත පිණිස පවතින කුසල මාර්ගයක් දේශනා කරන්නට යෙදුනේ. ඒ කුසල ප්‍රතිපදාව ලෞකික හා ලෝකෝත්තර වශයෙන් ආකාර දෙකකට විග්‍රහ කරන්න පුළුවන්කම තියෙනවා. "*සබ්බ පාපස්ස අකරණං කුසලස්ස උපසම්පදා සචිත්ත පරියෝදපනං ඒතං බුද්ධානසාසනං.*" ඒ සියලු බුදුරජාණන් වහන්සේලාගේ අනුශාසනයක් වන ඒ උතුම් ගාථා රත්නයෙන් දැක් වෙන්නේ සියලු අකුසලයන්ගේ/පාපයන්ගේ නොකිරීමත් සියලු කුසල ධර්මයන්ගේ අප්‍රමාදී සම්පාදනයත් ඒවාගේම හිත දමනය කිරීමත් කියන මේ කාරණා තුන. "කුසලස්ස උපසම්පදා" කිව්වේ ලෞකික කුසල ධර්මයන්. "සචිත්ත පරියෝදපනං" කිව්වේ හිත දමනය කර ගැනීම ලෝකෝත්තර අර්ථය ප්‍රකට කර දැක්වීම සඳහා. මේ ශාසනයේ හිත දියුණු කර ගන්නවා නම් ඒ හිත දමනය කර ගැනීම ඒකාන්තයෙන්ම අශ්‍රවයන්ගේ ක්ෂය වන ප්‍රතිපදාවෙහිලා වැඩිය යුක්තක්. එය මනාව හිත දමනය කර ගන්න ප්‍රතිපදාවක්. ලෞකික හා ලෝකෝත්තර වශයෙන් පෙන්වූ මේ ධර්මයෙහි ලෝකෝත්තර පැත්තට වැටෙන ඥාන දර්ශනයක් පිළිබඳව. අපේ ජීවිතයේ තියෙන යථාර්තවාදී සත්‍ය පැතිකඩ පිළිබඳවයි අපි මේ ක්‍රමයෙන් විග්‍රහ කරමින් විමසගෙන යන්නේ.

<u>සෝතධාතු පේසෝ</u>

මේ වන විට අපිට වැදගත්වන බොහෝ කොටස් අපි සාකච්ඡා කළා. අභිධර්ම පිටකයේ ධම්මසංගණිප්‍රකරණයේ රූප කාණ්ඩයට අදාලව "*එක විධෙන රූපසංගහො*" කොටස නිමා කරලා (එම කොටස මේ පොතෙහි අඩංගු නැත), "*දුවිධෙන රූපසංගහො*" කියන කොටස යටතේ චක්ඛායතන රූපයත්, සෝතායතන රූපයත් කියන මේ රූප දෙක අපි

කතා කලේ. ඇත්තටම සියලු රූපයේ ආයතන ටික ගත්තාම ආධ්‍යාත්මික ආයතන ටික කතා කළයුතු වෙන්නෙම නැහැ, මොකද එක ආයතනයක ස්වභාවයක් පිළිබඳව කතා කළාම සමස්ථයක් විදිහට ඒ සියලු ආයතනයන්ගේ ස්වභාවය තමයි අපිට කතා කරන්න සිද්ධ වෙන්නේ. අපි පහුගිය දේශනාව තුළ කතා කරා සෝතායතන රූපය පිළිබඳව. සෝතායතන රූපය පිළිබඳව විග්‍රහ කරගන්න කොට, අපි සෝතයෙන් තොරව නැතිනන් කනෙන් තොරව සද්දයත්, සද්දයෙන් තොරව කනත් නොහටගන්නා බවට කතා කලේ. හැම වෙලාවකදීම සද්දය සහ කන කියන කාරණා දෙකම පෙර පසු නැතිව එකට උපදින ලක්ෂණයක් බව කතා කළා.ඒ වගේම එතනදි අපට දැනගතයුතු කාරණයක් බවට පත්වෙන්නේ අපි ඇස පිළිබඳ සාකච්ඡා කළ න්‍යායෙදි වගේම සෝතය පිළිබඳව මේ කතාකරන න්‍යායෙදිත්, අපිට ධර්මසංගණී ප්‍රකරණයේ දැක්වෙන ලක්ෂණ ටිකක් තියෙනවා.

ඒ තමයි "*සොතං නිස්සාය සද්දං ආරබ්භ සොතසම්ඵස්සො උප්පජ්ජි වා උප්පජ්ජති වා උප්පජ්ජිස්සති වා උප්පජ්ජෙ වා*". එතකොට සෝතය නිසා, සද්දය අරභයා, යම් සෝත සම්ඵස්සයක් උපදිනවානම්, ඒ උපදින, ඉපදුනු, හෝ අනාගතයට උපදින්නාවු, ඒ කියන්නේ උපදින බවක් තියෙනවා නම්, මෙන්න මේකටයි *"සොතං පෙතං සොතායතනං පෙතං සොතධාතු පෙසා"* කියන්නේ. එතකොට සෝතය කිව්වෙත් මේකටයි, සෝතායතනය කිව්වෙත් මේකටයි, සෝතධාතුව කිව්වෙත් මේකටයි. දැන් මෙන්න මේ කාරණා ටික අනුව අපිට විග්‍රහ කරගන්න වෙනවා සෝතය, සෝතායතනය, සෝතධාතුව. මේ කියන කාරණා ඔක්කොම විග්‍රහ කරන්නේ මේ සෝතසම්පස්සයෙන් ඉපදුණු මෙන්න මේ කාරණාවත් එක්කමයි.

ඒ වගේම සෝතසම්පස්සජා වේදනා, සෝතසම්පස්සජා සංඥා, සෝතසම්පස්සජා චේතනා, සෝතසම්පස්සජා විඤ්ඤාණ කියන ස්කන්ධ පංචකයට අදාල සියලුම කාරණා ටික සංග්‍රහවෙන්නේ හැමවෙලාවකදීම සෝතායතනය කියන මේ සංගෘහිතය යටතේ. නැතිනම් සෝතායතනය කියලා කියන මේ සංග්‍රහය යටතේ තමයි අපිට හැමදේම කතාකරන්න වෙන්නේ. ඔක්කොටම පොදුවේ ව්‍යාවහාර කරන දේ තමයි සෝතායතනය කියන මේ නාමය.

<u>කවදාවත් කන දන්නේ නැහැ ශබ්දයක් පතිතවුනු බව, ශබ්දය දන්නේ නැහැ එය කනකට පතිතවුනු බව</u>

එතන නාමරූප ධර්මයන්ගෙන් තොරව මේ සෝතායතනයේ හටගැනීමක් වෙන්නේ නැහැ. මේ නාමරූප දෙකම සමවායක් ඇති කල්හී තමයි සෝතායතනය කියන දේ තීරණය වෙන්නේ. හැමවෙලාවකදීම සෝතය ඇති බවට සංග්‍රහකරන්න පුළුවන්කමක් ඇත්තේ නැහැ, එතන වේදනා, සංඥා, චේතනා, විඤ්ඤාණ කියන ලක්ෂණ ටික නැත්නම්. එතන කන ඇතිබවට අපිට සංග්‍රහ කරගන්න වෙන්නේ නැහැ. හේතුව? විජානන කෘත්‍යක් නැතුව! හිතින් දැනගැනීමක් නැතුව අපිට සෝතය කියන දේ පිළිබඳව නිමිති නැති නිසා. සෝතය හා ශබ්දය අනාත්ම මට්ටමකයි තියෙන්නෙ කියන්නේ කවදාවත් කන දන්නේ නැහැ ශබ්දයක් පතිතවුනු බව, ශබ්දය දන්නේ නැහැ එය කනකට පතිතවුනු බව. එකිනෙකට නොදන්න ධර්මතා ටිකක් ඇති කල්හී, ඒ පිළිඹඳව විජානන කරගත්තේ සෝතය නොවුණු තැනකින්. සෝතය නොවුණු තැනකින් සෝතය යැයි කියලා හිතාගෙන විජානන කරපු බව තුළ තමයි. ශබ්දය යැයි කියලා විජානන කරපු බව තුළ තමයි අපිට ප්‍රශ්න ඇති වුණ තැන.

ඒක නිසා මෙතනදී අපිට මේක දෙකක් කොට අවබෝධ කරගන්න කියපු එක පසුගිය දේශනයේදි අපි මතක් කළා. හැම වෙලාවකදීම සෝතය හැම වෙලාවකදීම අපි ශබ්දය ගැන හිතනවා කියන කාරණය. හිතන මොහොත වෙනකොට ශබ්දය ඉතිරි නැතිවම නිරුද්ධ බව දකින්න තරම් අපි දක්ෂ උනොත්, අපි එයාට කියනවා නිවුණු මනසක් පරිහරණය කරනවා, මිදුණු මනසක් පරිහරණය කරනවා, නොතැවරුණ මනසක් පරිහරණය කරනවා කියලා.

<u>ගඳ සුවඳ එලියේ තියනවාද?, තියන ගඳ සුවඳ මට එතනට ගිහිල්ලා විඳින්න පුළුවන්කම තියනවාද?</u>

දැන් අපිට මෙතනදී අනිත් ආයතන ගැන කතා කරද්දීත් ඔය කාරණා ටිකම තමයි අපිට කතාකරන්න තියෙන්නේ. ඝානායතන හා ගන්ධායතනය ගත්තත්, ඝානයෙන් තොරව, නැත්නම් නාසයෙන් තොරව ගඳ සුවඳත්, ගඳ සුවඳින් තොරව නාසයත් ගැන කතා කරන්නේ නැහැ. අපේ තියන ප්‍රපංච මට්ටම තමයි ගඳ සුවඳින් තොරව නාසයත් නාසයෙන් තොරව ගඳ සුවඳත් තියනවා කියන ලක්ෂණය. අපිට මේ ගඳ සුවඳ කියන

දේ විඳින්න පුළුවන්කම තියනවා. ගඳ සුවඳ එලියේ තියනවා, තියන ගඳ සුවඳ මට එතනට ගිහිල්ලා විඳින්න පුළුවන්කම තියනවා කියන (වැරදි) සංකල්පනාව හැම වෙලාවකදීම තියනවා. නමුත් ඇත්තටම අපි නොදන්න දේ තමයි ගඳ සුවඳ විඳිනවා කියන ඔය ලක්ෂණය.

ගඳ සුවඳ විඳිනවා කියන ඔය මොහොත කවදාවත් අපේ ජීවිතයට අත් නොවිඳින තැනක්. ගඳ සුවඳ නාසයට ගැටෙන තැන අපි ඇත්තටම නොවිඳින තැනක්. ගඳ සුවඳ නාසයට ගැටෙන තැන තියෙන්නේ උපෙක්ෂා සහගත තැනක්. ඒ උපෙක්ෂා සහගත බව අරඹයා කෙන කෙනා, කෙන කෙනාගේ පැත්තෙන් හොඳ හෝ නරක හෝ ලෙස ඒ ගන්ධය නිර්වචනය කරනවා. අපේ මට්ටමට අපි හිතෙ ගන්නේ හැමදාම ලෝකයේ ප්‍රිය විදිහට සුවඳ රූප තියෙනවා. අප්‍රිය අමනාප විදිහටත් ගඳ රූප තියෙනවා කියලා. නමුත් අපි දන්නේ නැහැ ඒ ප්‍රිය මනාප අප්‍රිය අමනාප බවක් ගන්ධය තුළ ඇත්තේ නැහැ. ඒක කෙන කෙනා, කෙන කෙනාගෙ හිත තුළ හදාගත්ත දෙයක් කියලා.

රළු වශයෙන් උදාහරණයක් ගත්තොත්, අපි දුරියන් කියන පළතුර ගැන කතා කරොත් මේක කෙනෙකුට බොහොම සුවඳයි, කෙනෙකුට බොහොම දුර්ගන්ධවත්. දැන් අපි හිතන්නේ මේ දුරියන් ගෙඩියෙන් එන දුඟඳට තමයි කෙනෙක් අප්‍රසන්න කරන්නේ දුඟඳයි කියලා කියන්නේ කියලා? ඒ දුඟඳ වෙන බව ඒකේ තියනවා, ඒ තියන නිසා තමයි දුඟඳ වෙන්නේ කියලා? නමුත් ඒ තුළ නම් දුඟඳ වන බව තියෙන්නේ ලොකයේ කාටත් පොදුවේ ඒක දුඟඳ බවම ගෙනල්ලා දීලා තියෙන්න ඕන. ඒ වගේම තමයි සුගන්ධවත් බව. ලොකේ කාටත් ඒක සුගන්ධවත් බවක් වෙන්න ඕන ඒකෙන් සුවඳ එනවනන්. නමුත් හැම වෙලවකදීම ඒක සුවඳද දුඟඳද කියන ලක්ෂණය තිබුනේ කෙන කෙනාගේ මට්ටම අනුව.

<u>සාධාරණව ඉදිරිපත් වෙන කොට දෙන්නා දක්වුවපු ප්‍රතිචාර දෙකක්</u>

අසුචි ටිකක් ගත්තොත්, මේ ගත්ත අසුචි ටිකට අපි කියනවා මේක බොහෝම දුර්ගන්ධවත් දෙයක් කියලා. අපි හිතන දෙයක් තමයි හැම වෙලාවකදීම මේ අසුචි ටික බොහොම දුර්ගන්ධවත් දෙයක්! අසුචිය දුඟඳ නිසා තමයි අපිට දුර්ගන්ධවත් කියලා. ඇත්තටම ඒක දුර්ගන්ධවත්ද ? අපි ඒක දුඟඳක් ලෙස දකින නිසා මිසක අප්‍රසන්න බව

තියෙන්නේ වෙනත් දෙයක් නිසා නෙවෙයි. ඒ මට්ටමට කර්ම විඤ්ඤානය මේ පැත්තේ සකස් වුනොත්, තවත් විදිහකින් කියනවානම් ප්‍රතිචාර දක්වන ක්‍රමය වෙනස් උනොත්, අපි අසුචි ටික බොහොම ලස්සනට පිළිගන්නවා. ඒක සුවඳක් ලෙස හඟින තත්වයට අපිට පත්කර ගන්න පුළුවන්.

බල්ලෙක් වගේ තිරිසන්ගත සතෙක් මළ කුණක් හොයාගෙන ඒ ගඳ එන දිශාවට යනවා. අපි පුළුවන්තරමක් ඒ ගඳ එන දිශාවෙන් ඈත්වෙන්න උත්සහවත් වෙනවා. එතකොට ඇත්තටම ඒ ආපු එක ගඳද? ඇත්තටම ඒ ආපු එක සුවඳද? නැතිනම් උනේ ඒ ආපු එක දෙන්නා කෙරෙහිම සාධාරණව ඉදිරිපත් වෙන කොට දෙන්නා දැක්වුවේ ප්‍රතිචාර දෙකක්ද? ඒ ආපු ගඳ සුවඳ දෙන්නා කෙරෙහිම සාධාරණව ඉදිරිපත් වෙන කොට දෙන්නා දක්වපු ප්‍රතිචාර දෙකක්. එතකොට ඇත්තටම අපිට දැන් ලෝකය තුළින් මිහිරි සුවඳ හෝ අමිහිරි ගඳ සුවඳ ලැබුනේ ලොකේ තියනවා කියලා හිතාගත්ත දේ මනසින් විඳින මට්ටමේදී මිසක නාසයත් ගන්ධයත් ඇති තැනක නෙවෙයි! නාසයත් ගන්ධයත් කියන දේ මේ මොහොතේ හටහෙන ඉතුරු නැතිවම නැතිවන දෙයක්. එතකොට මේ නාසය හා ගන්ධය කියන කාරණාවෙදි අපිට විග්‍රහ කරගන්න බැහැ මේ ලෝකේ එලියේ තිබුන ගන්ධයක් ඇවිල්ල මට ගැටුනා කියන එක. එතකොට එලියේ තිබුණ ගන්ධයක් ගැන මට නිමිති තියෙන්නේ හැමවෙලාවකදීම නිරුද්ධ වුනු අවස්ථාවක් ගැන මම ගන්න නිමිත්තක් නිසා.

<u>ගඟක තියෙන වතුර ගැන කතා කරනවා වගේ</u>

උදාහරණයක් කිව්වොත්, ඔබට ගිහිල්ලා ගලාගෙන යන ගඟකට අත දාන්න පුළුවන්. අත තෙමාගන්න පුළුවන්. ආපහු අත එතනින්ම දෙවැනි වතාවටත් තෙමා ගන්න පුළුවන්. හැබැයි කලින් තිබුණ වතුර ටිකෙන්ද ඔබ අත තෙමා ගත්තේ? කවදාවත් කලින් තිබුණ වතුර ටිකෙන් දැන් අත තෙමාගන්න පුළුවන් කමක් වෙන්නේ නැහැ. ඒ වගේම තමයි සුවඳ කියන දේත්. අපි එක දිගට තියන සුවඳක් ගැන කතාකළාට, එක දිගට තියන සුවඳක් ගැන අපිට කතාකරන්න පුළුවන්කමක් ඇත්තේ නැහැ. ගඟක තියෙන වතුර ගැන කතා කරනවා වගේ සුවඳ ගැන අපි කතා කළාට එතන කොයිම වෙලාවකවත් එක වතුර ටිකක් එක තැනක රැඳිලා තිබ්බේ නෑ වගේ අපිට මේ එක දිගට එන සුවඳක් ගැන කොයි වෙලාවකවත් කතාකරන්න පුළුවන් කමක් තිබ්බේ

නැහැ. හැම වෙලාවකදීම එක මොහොතක නාසය ඇති කරන්න හේතුවුණ ගන්ධය අපිට ඒ මොහොතේ ඒ නාසය ඇති කරන්න හේතුවුණ ගන්ධය විතරයි ගෝචර වුනේ.

එතනින් එහාට නැවතත් ඝානායතනය හදාගත්තට පස්සේ, නාසය පැත්තේ ප්‍රසාදය හදාගත්තට පස්සේ තමයි ආයෙත් ගැටෙන්නේ. හැබැයි අපේ සංඥාවෙන් ගෙනැල්ල දෙන ඉස්සෙල්ල තිබුන ගන්ධය තමයි තාම තියෙන්නෙ. පැයක් තිස්සේ එන ගඳක්, පැයක් තිස්සේ එන සුවඳක් විඳින්න පුලුවන් කම තියනවා. අපි කතා කරන්නේ බොහෝ වෙලාවක් තිස්සේ එන ගන්ධයක් පිළිබඳව. ඇත්තටම මේ මොහොතෙ ඇතිවන දේ විඳින්නෙ. මෙන්න මේ අවිද්‍යාව දුරුකරගන්න අවශ්‍යය නිසා තමයි අපි කියන්නේ හැම වෙලාවකදීම ඝ්‍රාණය හා ගන්ධය පෙර නොතිබීම හටගෙන ඉතුරු නැතිවම නැතිවන ධර්මතාවයක් බව. ඝ්‍රාණයෙන් තොරව ගන්ධයත්, ගන්ධයෙන් තොරව ඝ්‍රාණයත් හටගත්තේ නැහැ. එතකොට මේ දෙකම එකම මොහොතේ පෙර පසු නොවී පුරේජාත, පච්ඡාජාත බවක් නැතුව එකටම හැදුනු ධර්මතා සමූහයක්.

<u>විඳලා තියෙන්නේ රසයද? දිවද?</u>

ඊලඟට ජිව්හායතනය හා රසායතනය අරගෙන බැලුවත් අපි හිතාගෙන ඉන්නේ අපි රස විඳින්නේ තියන ආහාරයෙන් ලැබෙන රස කියලා. අපි විඳින්නේ තියන දෙයින් ලැබෙන රසයක්? ඇත්තටම අපි විඳින්නේ හැම වෙලාවකම අපේ සංකල්පනාවකින් විඳින රසයක් පිළිබඳව. සංකල්පනාවකින් විඳින රසයක් කියනකොට ඔබට කල්පනා කරන්න පුළුවන් එතකොට බාහිර භෞතික රූපයේ රස ඇත්තෙම නැද්ද? කියලා.

රසායතනය බාහිර ආයතනය. ජිව්හායතනය ආධ්‍යාත්මික ආයතනය. අපි කලින් දේශනාවකින් මතක් කළා වගේ අපිට විඳින්න පුළුවන් කම තියෙන්නේ දිව ගෙනල්ලා දෙන මට්ටමේ රසයක් පමණයි. දැන් අපි විඳල තියෙන්නේ රසයද? දිවද? අපි විඳල තියෙන්නේ හැම වෙලාවකදීම දිව. දිව කියන මට්ටම තුළ දිව විඳින අපි එයින් රසය පිළිබඳව තීරණය කරනවා. "*ජිව්හඤ්ච පටිච්ච රසේ ච උප්පජ්ජති ජිව්හාවිඤ්ඤාණං*" ජිව්හාවත් රසයත් නිසා, මේ තුන්දෙනාගේ එකතුව නිසා ජිව්හා විඤ්ඤාණය උපදිනවා. මේ සමස්ථ සිද්ධිය තුළ හැම වෙලාවකදීම රස නැතුව දිව දකින්න එපා. අද අපි රූපවත්වූ දිවක් දකිනවා. රූපවත්වූ දිව තිබුනා කියල ඒක ඇත්තටම දිව

නෙවෙයි, ඒක වර්ණ සටහන. දිවට අල්ලල බලන්න. රස සංඥාවකින්ද තේරෙන්නේ එහෙමත් නැතිනම් අතට අහුවෙනවා කියන මට්ටමකින්ද? ඒක කායායතනයත් ඵොට්ඨබ්බයත් මිසක ඒක රසයක් නෙවෙයි. එතකොට දැන් දිව සහ රසය කියන කාරණාව අතර මිසක, දිවෙන් අනිත් කාරණාවක් විඳින්න පුළුවන්කමක් නැහැ. ඒක නිසා හැමවෙලාවකදීම දැන් දිවෙන් තොරව රසය ගැන කතා කරන්නේ නැහැ, රසයෙන් තොරව දිව ගැන කතා කරන්නේ නැහැ.

මේ ජිව්හා විඤ්ඤාණය ලඟට එනකන්, "*ජිව්හං නිස්සාය, රසේ ආරබ්භ උප්පජ්ජති ජිව්හා සම්පස්සයං*" - *මේ දිව නිසා, රසය අරඹයා යම් ජිව්හා සම්පස්සයක් උපදිනවානම්*, මෙන්න මේ ජිව්හා සම්පස්සය වැදගත් වෙනවා අපිට මේ කාරණාව තේරුම් ගන්න. ජිව්හා සම්පස්සය කියන තැනින් හැම වෙලාවකදීම දිව ගැන දැනුම හඳලා දෙනවා. ජිව්හා සම්පස්සජා වේදනාවෙන්, ජිව්හා සම්පස්සජා සඥාවෙන්, ජිව්හා සම්පස්සජා චේතනාවෙන්, ජිව්හා විඤ්ඤාණයෙන් තමයි අපිට දිව සහ රසය. මේ කාරණාව හැම වෙලාවකදීම මේ සායන කෘත්‍ය හඳල දෙන්නේ. එතකොට හැම වෙලාවකදීම මේ විඳින බව, සායන කෘත්‍ය කරලා තියෙන්නේ මේ කාරණා ටික එකතු වුණාට පස්සේ. මේ ටිකෙන් තොරව අපිට කොයිම වෙලාවකවත් රසය ගැන කතා කරන්න පුලුවන් කමක් ඇත්තේ නැහැ.

දැන් අපිට ලොකයේ රස ආහාර ගොඩාක් සිහිපත් කරගන්න පුළුවන් කම තියෙනවා. ඒත් මොන තරම් රස ආහාර පිළිබඳව අපි සිහිපත් කර ගත්තත් අපි කෙන කෙනා සිහිපත් කරගෙන මිසක ආහාරය සිහිපත් කරගෙන නෙවෙයි. ඒක නිසා මේ පැත්තෙන් ගෙනැල්ල දෙන එක සහ ජිව්හා විඤ්ඤාණය පැත්තෙන් අපි විඳින කාරණය ගැන අපිට කොටස් දෙකකට දකින්න සිද්ධ වෙනවා. දිවත් ඒ වගේම රසයත් පෙර නොතිබීම හටගෙන ඉතුරු නැතිවම නිරුද්ධ වෙන මෙන්න මේ ලක්ෂණය පිළිබඳව.

<u>කය කියන දේට හැඩයක් සටහනක් ඇත්තේ නැහැ.</u>

කයත් ඵොට්ඨබ්බයත් ඒ වගේමයි. කය සහ ඵොට්ඨබ්බය කියන කොට අපි හිතාගෙන ඉන්නවා අපිට අඩි පහක හයක විතර මේ ලොකු කයක් තියෙනවා. මේක තමයි කය

කියන්නේ කියලා. ඇත්තටම කය කියලා මේ සාසනයේ කතා කරන්නේ මේ අඩි පහක හයක ඇඟකට නෙවෙයි. කය කියන දේට හැඩයක් සටහනක් ඇත්තේ නැහැ. මේ ඇඟිලි තුඩවල් දෙකක්නම් අපිට ස්පර්ශ වෙන්නේ, මුළු කයම මේ ඇඟිලි තුඩ විතරයි. මේ ඇඟිලි තුඩක් ස්පර්ශ වෙනකොට ඕගොල්ලොන්ට තේරෙනෙවද මේ ඇඟිලි තුඩේ තියෙන වර්ණයක්? ඒ වගේම මේ ඇඟිල්ලේ තිබුන හැඩතලයක්? ඒ වගේම මේ ඇඟිල්ලේ තිබුන අත කියන ස්වභවයක්? ඒ වගේම කය කියන ස්වභාවයක් අපිට ප්‍රකට වෙන්නේ නැහැ. ඒකට කියනව ස්පර්ශය, ස්පර්ශ මාත්‍රයක් පමණයි.

ස්පර්ශය, ස්පර්ශ මාත්‍රයක් විතරක් වෙන තැනක අපි කෙන කෙනා, කෙන කෙනාගේ මනසින් ගෙනැල්ල දෙන ටික තමයි මෙච්චර අඩි පහක හයක ඇඟක මේ අතේ මේ ඇඟිල්ලයි ස්පර්ශ වුනේ කියන කාරණාව. මේක අවිද්‍යාව නිසා නොදන්න කම නිසා කයත් ඵොට්ඨබ්බයත් ඉතුරු නැතුවම නැතිවුනා කියල නොදන්න කම නිසා තමයි ස්පර්ශයට කයක් අපි සම්බන්ධ කරලා තියෙන්නේ. මේක කෙලෙසයක්! ඒ කෙලෙසය දුරුවෙන මට්ටමකට අපි හැම වෙලාවකදීම මනසිකාරය පවත්වන්න උත්සහවත් වෙන්න ඕන. අන්න ඒකට තමයි මේ දැනුම අපිට උපකාරවත් වෙන්නේ.

මෙතනින් උපදින ප්‍රඥාව ඒ සඳහා යෙදෙන දෙයක් වෙන්නේ. දැන් අපිට වැදගත්ම සිද්ධිය තමයි හැම වෙලාවකදීම මේ තුළ විග්‍රහ කරගත යුතු දෙයක්. ඒ තමයි සැප වේදනාවක් එන්න පුළුවන් එකම ආයතනය තමයි කය සහ ඵොට්ඨබ්බය කියන මෙන්න මේ දෙකේ එකතුව. කයට කෙලින්ම සැප වේදනාව ගැටෙනවා. කයෙන් කෙලින්ම සැපය උපදිනවා. ඒ වගේම දුක උපදිනවා. කායික වේදනාව කියන එකෙන් සැප හා දුක උපදිනවා. කටුක වේදනාවක් ගැටුනොත් ඒක කෙලින්ම කටුක සහගත වේදනාවක් බවටම පත්වෙලා. ඒ වගේම සැප සහගත දේ සැප සහගත බවටම පත්වෙලා. ඒක කයට විතරයි සාධාරණ. නාම ධර්මතා ටික පැත්තෙන් බැලුවොත් එහෙම, නාම ධර්මතා ටිකේදී අපිට කොයි වෙලාවකදීවත් සැප හා දුක කියන කාරණාව කතා කරන්නේ නැහැ. එතනදී කතා කරන්නේ සෝමනස්සය හා දෝමනස්සය කියන මාතෘකා දෙක යටතේ.

දැන් චක්ඛායතනය හරහා හටගන්න චක්ඛු සම්පස්සජා වේදනා කියන මට්ටමේදී විපාක වේදනාව. ඒකට කියනවා උපෙක්ෂා සහගතයි කියලා. චක්ඛු, සෝත, ඝාන, ජිව්හා කියන මේ ආයතන හතරම උපෙක්ෂා සහගතයි. මේ වේදනාව උපෙක්ෂා සහගත විපාක වේදනාවක් නිසා. කාම වස්තුව හඳුනගෙන තම මනසින් ඡන්දරාගය ඇතිකරගෙන විඳින මට්ටමකට යන දෙයක් නොවන නිසා මෙතනදී කතාකරන්න බැහැ සෝමනස්ස හෝ දෝමනස්ස විපාක වේදනාව. නමුත් කායික වේදනාව සැප හෝ දුක සහගත කොට කෙලින්ම කතා කරනවා. ඒක නිසා රහතන් වහන්සේටත් කායික වේදනාව, කායික වේදනාවක් විදිහට දැනෙනවා. හැබැයි කායික වේදනාව අරඹයා හදාගන්න මානසික වේදනාව කියන කොටස රහතන් වහන්සේට හටගන්නේ නැහැ. අපිට ප්‍රශ්නය තියෙන්නේ කායික වේදනාව නිසා හටගන්න මානසික වේදනාව. අන්න ඒ කොටස අර දර්ශනය උපදිනකොට නැතිවෙලා යනවා.

<u>එකම වේදනාව තැන් දෙකකින් විඳින්නෙක්</u>

අපේ ඔලුව රිදෙන කොට හැම වෙලාවකදීම කායසම්ඵස්සයෙන් හටගත්ත වේදනාව පිළිබඳව අපි විඳින්නේ නාම ධර්මතා ටිකකින්. කය නොවුනු තැනක ඉඳලා තමයි අපි ඔලුවෙ කැක්කුම හැම වෙලාවකදීම විඳින්නේ. හැබැයි කාය සම්පස්සයෙන් හටගත්ත වේදනාව එතන ඉතුරු නැතුවම නිරුද්ධයි කියලා නිරෝධය පැත්තට අවබෝධ කළ නොගත්තොත් අපිට පැයක් එක දිගටම හැදුන ඔලුවේ කැක්කුමක් විඳින්න පුළුවන් කම ලැබෙනවා. අවුරුදු ගානක් ලෙඩවෙලා දුක් විඳින කෙනෙක් අපිට දැකගන්න පුළුවන් කම ලැබෙනවා. ඒක නිසා දැන් කායික වේදනාව කියන එකට අපිට කයට බහාලා කය පැත්තෙන් ඕක දකින්න ගත්තොත් අපි එකම වේදනාව තැන් දෙකකින් විඳින්නෙක් වෙනවා. ඒක තමයි ස්පර්ශයෙන් හටගත්ත වේදනාව ස්පර්ශ නිරෝධයෙන්, නිරුද්ද වෙන බව නිසා එතන ස්පර්ශයෙන් හටගත්ත වේදනාවත් විඳින්න වෙනවා. ඒ වගේම ස්පර්ශය ඉතුරු නැතුවම නිරුද්ද වුනාම නිරුද්ද වුණු බව නොදන්නාකම නිසා එක දිගටම තියෙන කායික වේදනාවත් ඊට පස්සේ අපිට විඳින්න සිද්ධ වෙනවා. එතකොට එක දුකට දුක් දෙකයි! කාය සම්පස්සයෙන් හටගත්ත වේදනාව සහ මගේ ඔලුව රිදෙනවා කියලා තමන් හදාගත්ත ඔලුව නිසා හැදෙන ඔලුවේ කැක්කුම අපිට විඳින්න වෙනවා. එතකොට මෙතන එකම දුක දෙපැත්තකින් විඳිනවා.

එකම දුක දෙපැත්තකින් විඳින මේ ගතිය අපිට දුරු කර ගන්න නම් මේ කාරණා ටික දිහා අපිට හොඳට බලන්න සිද්ධ වෙනවා. මේ කය සහ ඵොට්ඨබ්බය කියලා කතා කරන තැනදී කයෙන් තොර ඵොට්ඨබ්බයත්, ඵොට්ඨබ්බය තොර කයත් කතා කරන්නේ නැහැ. අර අනික් රූපායතන ගැන කතා කරපු න්‍යායමයි මෙතනත් කතා කරන්නේ. කයෙන් තොර ඵොට්ඨබ්බයත්, ඵොට්ඨබ්බයන් තොර කයත් නැහැ. දැන් ඔබේ කයට නිමිති තියෙන්න බැහැ, වර්ණ සටහන් තියෙන්න බැහැ. ඒ වගේම ඒකට හැඩතල තියෙන්න පුළුවන් කමක් නැහැ. මොකද ඔය හම්බවෙන ස්පර්ශයට හැඩතල ඇත්තේ නැහැනේ.

කෝට්ටකින් ගහන කොට දික්වු හැඩතල විඳින්නේ නැහැ. කය පරිහරණයෙන් වේදනාවකුයි විඳින්නේ. කෝට්ට විඳින්නේ නැහැ. එතකොට කායික වේදනාව විඳින තැනක හැමවෙලාවකදීම අවබෝධයක් ගන්න වෙනවා කය වෙනම වූ දෙයක්. ඒ වගේම කය අරඹයා ඇතිකරගන්න ස්පර්ශය වෙනම දෙයක් හැටියට. මේ දෙක දෙපැත්තකට කරලා දකින කොට ස්පර්ශයට කය අයිති නැහැ, කයට ස්පර්ශය අයිති නැහැ. මේ දෙක දෙපැත්තකට කරලා දකින කොට හැම වෙලාවකදීම අපිට හම්බවෙනවා නුවණ. ඒ තමයි මේ ස්පර්ශය හා කය කියන කාරණාව වෙන වෙනම පනවන්න පුළුවන් කමක් නොමැති බව. ස්පර්ශය ඇති කල්හී කයත්, කය ඇති කල්හී සිදුවන ස්පර්ශයත් කියන මේ දෙකම අපිට මේ අන්‍යෝන්‍ය අවබෝධය තුළ ගන්න වෙන දෙයක්. මේ කාරණා දෙක ගැන විමසන කොට තමයි හැමවෙලාවකදීම මේ නුවණ අපිට ඇතිකරගන්න පුලුවන් කම තියෙන්නේ.

<u>පටිසම්භිදාමග්ග ප්‍රකරණයෙන්</u>

ඒක නිසා තමයි "*අජ්ඣත්තවවත්ථාපනෙ පඤ්ඤා*" සහ "*බහිද්ධා වවත්ථාපනෙ පඤ්ඤා*" කියලා රූපය පිළිබඳව ආධ්‍යාත්මික ධර්මතා ටික ව්‍යවස්ථාපනය කරගන්න විදිහත් බාහිර ධර්මතා ටික ව්‍යවස්ථාපනය කරගන්න ප්‍රඥාව කොටස් දෙකකට බෙදල පෙන්නන්නේ. එතකොට මේ ටිකට පෙන්නන හේතු ටික සමානත්වයෙන් පෙන්වනකොට අපිට ඇතිවෙන නුවණ තියෙනවා. ඒක නිසා අපි ඒ කාරණා ටික විමසලා බලනවානම් ඒක වැදගත් වෙනවා. අපි කලින් ටික කතා කලේ අභිධර්ම

පිටකයේ ධම්මසංගණිප්‍රකරණයේ එන රූප කාණ්ඩයට අදාලව. ඒ වගේම අපි මෙතනදී අදාල කරගත්තොත් පටිසම්භිදාමග්ග ප්‍රකරණයෙන් එන *වත්ථුනානත්තඤාණනිද්දෙසො* පිළිබඳව. මේ වස්තූන් ව්‍යවස්ථාපනය කරගන්න ආකාරය සහ ගෝචරනානත්තයේ ඥානය (*ගොචරනානත්තඤාණනිද්දෙසො*) ගැන කතා කලොත් ඒක මේ රූපායතන පිළිබඳ විග්‍රහ කරගන්න කොට බොහොම වැදගත් දෙයක් වෙනවා.

"*කථං අජ්ඣත්තවවත්ථාපනෙ පඤ්ඤා වත්ථුනානත්තෙ ඤාණං?*". ආධ්‍යාත්මික ධර්මතා ව්‍යවස්ථාපනය කරගන්න ප්‍රඥාවට කියනවා වත්ථුනානත්ත ඥානය කියලා. "වත්ථු" කියලා කියන්නේ වස්තුවක් කියන එක. චක්ඛු වත්ථු, සෝත වත්ථු, ඝාන වත්ථු, ජිවුහා වත්ථු, කාය වත්ථු මේ ධර්මතා වලට කියනවා වත්ථු කියලා. එතකොට වත්ථුනානත්ත ඥනයේදී අපිට තියෙනවා ආධ්‍යත්මික වස්තූන් ගැන ව්‍යවස්ථාපනය කරන්න. ව්‍යවස්ථාපනය කියන්නේ මේ පිළිබඳව විමසීමක්/ පිහිටුවා දැක්මක් කරන්න තියෙනවා. *"කථං අජ්ඣත්තධම්මෙ වවත්ථේති?"* කොහොමද මේ ආධ්‍යාත්මික ධර්ම ටික අපි ව්‍යවස්ථාපනය කරගනේ? *"චක්ඛුං අජ්ඣත්තං වවත්ථේති"* ඇස කියන එක ආධ්‍යාත්මික ධර්මයක් කියලා ව්‍යවස්ථාපනය කරගන්නවා. ඇස කියන එක ආධ්‍යාත්මික ධර්මයක් කියලා ව්‍යවස්ථාපනය කරගන්න කොට ඒක හරි වැදගත්. ඇයි ඇස ආධ්‍යාත්මික ධර්මයක් කියලා කියන්නේ? ඇස බාහිර ධර්මයක් නෙවෙයි. බාහිර ධර්මයක් කියන්නේ හැම වෙලාවකදීම රූපායතනය. ඇහැයි රූපයයි කියන දේ එකක් කියන කාරණාවකින් විග්‍රහ කරන්න බැහැ. ඇහෙන් තොරව රූපයත්, රූපයෙන් තොරව ඇහැත් යන කාරණාව පනවන්න පුළුවන් කමක් නැහැ.

ඒකයි කිව්වේ කායායතනය විස්තර කරන කොට මේ දෙක දෙකක් කියන නුවණ අපිට තියෙන්න ඕන. *"චක්ඛුං අජ්ඣත්තං වවත්ථේති... රූපෙ බහිද්ධා වවත්ථේති"* ඇස ආධ්‍යාත්මිකයි කියලා ව්‍යාවස්තාපනය කරගන්නවා. රූපය බාහිරයි කියලා ව්‍යවස්ථාපනය කරගන්නවා. එතකොට දැන් ආධ්‍යාත්මික ඇස කියන කාරණාව ව්‍යවස්ථාපනය කරණ කොට අපිට ඇස පිළිබඳව අර කතා කරපු සියලු ආකාරයන්ගෙන් ආධ්‍යාත්මිකව යෙදෙන්නේ කොහොමද කියන කාරණය පෙනෙන්නට ඕන. අපි ඉගෙන ගත්ත ලක්ෂණ ටික නුවණ තුළින් අවබෝධ කර ගත

යුතුයි. ඇස කියන එක ආධ්‍යාත්මික ධර්මයක්. කලින් අපි කතා කළා *"අත්තභාව පරියාපන්නො"* කියලා. ඒ ලක්ෂණය නිසාම තමයි ඇස කියන එක ආධ්‍යාත්මික ධර්මයක් කියලා සංග්‍රහ කරන්නේ. රූපය කියන එකේ *"අත්තභාව පරියාපන්නො"* ලක්ෂණයක් ඇත්තේ නැහැ. ගන්ධයේ *"අත්තභාව පරියාපන්නො"* ලක්ෂණයක් ඇත්තේ නැහැ, ගන්ධයේ, රසයේ, ඵොට්ඨබ්බය පැත්තේ *"අත්තභාව පරියාපන්නො"* ලක්ෂණයක් ඇත්තේ නැහැ. එතකොට හැම වෙලාවකදීම ආධ්‍යාත්මික ප්‍රසාදය පැත්තේ තමයි *"අත්තභාව පරියාපන්නො"* ලක්ෂණය යෙදිලා තියෙන්නේ. අන්න ඒක නිසා *"චක්ඛුං අජ්ඣත්තං වවත්ථේති"* කියනකොට ඇස ආධ්‍යාත්මික ධර්මයක් කියලා ව්‍යවස්ථාපනය කරගන්නේ. ඇස කියන කාරණාව හැම වෙලාවකදීම *"අත්තභාව පරියාපන්නො"* කියන කාරණාව නිසා.

<u>මේකයි ඇස කියලා කියන්නේ</u>

ආත්මභාවය අනුව ගියා කියන සිද්ධිය නිසාම තමයි මේ ඇස ආධ්‍යාත්මික ධර්මයක් විදිහට ව්‍යවස්ථාපනය කරගන්න කියලා කියන්නේ. ඒක බාහිර ලක්ෂණයකින් දකින්න එපා! ඇස කියන දේ රූපායතනයක අපි දැකළා පුරුදු නිමිත්තකින්, අපි TV එකක හෝ වේවා, කඩදාසි කොලයක හෝ වේවා එහෙමත් නැතිනන් කණ්නාඩියකින් ඉදිරිපිටට ගිහිල්ලා හෝ වේවා අපි ඇස කියලා යමක් දන්නවානන් ඒක බාහිර රූපායතනය මිසක ඒක ඇස නෙවෙයි. ඇස කියන එක ආධ්‍යාත්මික ධර්මයක්. ඒ ආධ්‍යාත්මික ධර්මය, *"අත්තභාව පරියාපන්නො"* කියන වචනය එක්ක යොදලා අර්ථය ගන්න. ආත්මභාවය අනුව ගියපු දෙයක්. ඒක බාහිරින් දකින්න එපා. අපි ඇස කියල දෙයක් ගැන එක දිගට තියෙන ඇහැක් ලෙස මෙනෙහි කර ගන්නවනන් එසේ හිතලා අපි කතා කරනවානම් අපි කරන්නේ ඇස පිළිබඳව පිරිසිඳ නොදන්නා කම නිසා! ඇහේ ඇත්ත නොදකින කම නිසා! *"චක්ඛුං අජ්ඣත්තං වවත්ථේති"* කියලා කියන කොට ඇස ආධ්‍යාත්මිකයි කියලා ව්‍යවස්ථාපනය කරගන්න කියන කොට ඇස බාහිර රූපයක් ආශ්‍රයෙන් මෙනෙහි කරගන්න එපා. ඇස කියලා යම් දර්ශනයක් අපි අද මතක්කර ගන්නවානන්, මෙන්න මේකයි ඇහැ, *මේ විදිහට සුදු පාට එකක් මැද කළු පාට ඉංගිරියාවක මෙන්න මේ විදිහට පුලුන් පෙඳි හතකට තළ තෙල් බිංදුවක් දැම්මහම මේ තළ තෙල් බිංදුව හත්වෙනි පෙන්දට උරාගන්න ඉතාමත් සුළු, වූටි තැනක්, උකුණු හිසක් වගේ තැනක්* මෙන්න මේකයි ඇස කියලා කියන්නේ කියලා අපි යම් නිමිති

ටිකකින් ඇස ගැන කතා කරනවානම් මේ ඔක්කොම ටික අපි කතා කරලා තියෙන්නේ රූපය ඇසුරු කරගන්න පැත්තකින් මිසක, ඇස පිළිබඳව වූවකින් නෙවෙයි.

ඇස පිළිබඳව කතා කරනවානම් ඒක ආධ්‍යාත්මික හැටියට ව්‍යවස්ථාපනය කරගන්න ඕන. ඒ ආධ්‍යාත්මික හැටියට ඒ ඇස ව්‍යවස්ථාපනය කරගන්න කොට මේ ඇස *"අත්තභාව පරියාපන්නො "* ප්‍රසාදවත් වූ, ආත්මභාවය අනුව ගියපු රූපයක් කියන මෙන්න මේ දැනුම අප ජීවිතයට බැසගෙන සිටින්නට අවශ්‍ය වෙනවා. ඒකයි *"චක්ඛුං අජ්ඣත්තං වවත්ථේති"* කියන කාරණයෙන් කියන්නේ.

<u>කන අනිදස්සනයි</u>

ඊට පස්සේ *"සොතං අජ්ඣත්තං වවත්ථේති "*. කන කයන එක ආධ්‍යාත්මික ධර්මතාවයක්. සෝතයත් නිකන් බාහිර ධර්මතාවයක් නෙවෙයි. සෝතයත් ආධ්‍යාත්මික ධර්මයක්. අපි කන කියන එක අද හඳුනගෙන තියෙනවනන් මෙන්න මේ විදිහට රූපයක් හැඩ සටහනක් විදිහට. අපි හඳුනන එකක් තියනවානන් මෙන්න මේ රූපයටයි අපි කන කියලා කියන්නේ කියලා , අපිට කන දකින්න පුළුවන්නන් කන් බෙරය කියන්නේ දෙයක් කියලා අපිට යම් නිමිති තියෙනවානන්, ඒ නිමිති, සටහන් රූපායතනයක සටහන් මිසක කන්කි සටහන් නෙවෙයි. කන කියන දේ ආධ්‍යාත්මික දෙයක් නිසා ඒකට අපිට බාහිර සටහන් තියන්න පුළුවන් කමක් ඇත්තේ නැහැ. ඒක නිසා තමයි අනිදස්සනයි කියලා කිව්වේ. ඒවට නිදර්ශන දෙන්න පුළුවන් කමක් නැහැ. ඒක නිසා ඒක ආධ්‍යාත්මික ධර්මයක්. *"සොතං අජ්ඣත්තං වවත්ථේති".*

<u>මේ දකින දෙය ආධ්‍යාත්මික දෙයක් නෙවෙයි</u>

ඒ වගේම *"ඝානං අජ්ඣත්තං වවත්ථේති"* ඝානය කියන එක ආධ්‍යාත්මික ධර්මයක්. ඒ ඝානයට අපිට දෙන්න බැහැ මේ නාසය කියන එක මේ හැඩයේ, මෙන්න මේ ස්වභාවයෙන් යුක්තයි, එළු කුරයක් වගේ මේ තියෙන තැනකට තමයි මේකේ විඥානන ස්වභාවය යෙදෙන්නේ මෙතනටයි ගඳ සුවඳ දැනෙන්නේ කියලා අපිට මේ නාසයට නිමිති තියන්න පුළුවන්කමක් ඇත්තේ නැහැ. හැම වෙලාවකදීම මේ ඝාන කෘත්‍යයට කතාකරනවා මිසක නාසය කියන තැනකින්, ඒක ආධ්‍යාත්මික ධර්මයක් විදිහට සංග්‍රහ

කරගත යුතුයි මිසක, ඒක බාහිරින් පෙනෙන රූපායතනයකින් කතා කරන්න පුළුවන්කමක් නැහැ. අපි නාසය කියල පෙන්නන්න, දකින්න හදන හැමදෙයක්ම රූපය මිසක ඒක නාසය බවට පත්වෙලා නැහැ. නාසය කියන දේ ගන්ධයත් එක්කම හටගන්න ගන්ධය නිරුද්ධ වෙනකොටම නිරුද්ධවෙන, ඒ වගේම නාසය හටගෙන ඉතුරු නැතුවම නිරුද්ධවෙන කාරණයක්. එතකොට ඒක ආධ්‍යාත්මික ධර්මයක් කියන තැනට නුවණ එන්න ඕන එතනදීත් අර *"අත්තභාව පරියාපන්නො"* කියන වචනයත් සමගම.

"ජීවිතං අජ්ඣත්තං වවත්ථේති " දිව කියලා කියන එක ආධ්‍යාත්මික ධර්මයක්. දිව කියලා කියන්නේ බාහිර ධර්මයක් නෙවෙයි, ආධ්‍යාත්මික ධර්මයක්. අපි මේකයි දිව කියලා කියන්නේ කියලා දිව කියලා රූපයක් හඳුනගෙන හිටියට, ඒක රූපායතනය මිසක ජීවිතාව නැමැති ආධ්‍යාත්මික ධර්මයක් නෙවෙයි. ඒක නිසා ""*අත්තභාව පරියාපන්නො"* කියන වචනයත් එක්කම දිව කියන එක ආධ්‍යාත්මික ධර්මයක් විදිහට ව්‍යවස්ථාපනය කරගත යුතුයි. එතකොට තමයි අපිට දිව පිළිබඳව තියෙන කෙලේසය අඩුවෙන්නේ.

"කායං අජ්ඣත්තං වවත්ථේති " කය කියලා කියන එක ආධ්‍යාත්මික ධර්මයක් විදිහට ව්‍යවස්ථාපනය කරගන්න. එතකොට කය කියන එක ආධ්‍යාත්මික ධර්මයක් කියලා කියන්නේ කය බාහිර දෙයක් නෙවෙයි. අද අපි මෙහෙම බලන කොට අපේම ඇඟ දිහා, කය කියන එක අපිට පේනවා ආධ්‍යාත්මික කියලා පනවගත්ත මම කියලා හිතා ගත්ත මම කියලා හදාගත්ත කයක් අපිට දකින්න පුළුවන්කම තියෙනවා. නමුත් මේ දකින දෙය ආධ්‍යාත්මික දෙයක් නෙවෙයි, මේ දකින එක බාහිර රූපායතනය. ඒක නිසා මේකෙදි ආධ්‍යාත්මික ආයතනය බවට පත් උනේ ඇහැ. ඇසට ගෝචර උනේ රූපායතනය. එතකොට කයට පුළුවන්කමක් තිබ්බේ නැහැ ඇහැට පෙනීසිටින්න. මොකද කය පනවන්නේ ඵොට්ඨබ්බයත් එක්ක නිසා. එතකොට කය අපිට ඇහෙන් දකින්න පුළුවන් කමක් තිබ්බේ නැහැ. එතකොට මෙන්න මේ ආයතනයන්ගේ ආයතන කෘත්‍යය ගැන අපිට හොඳ අවබෝධයක් ලබා ගන්න පුළුවන්කමක් තියෙනවා මේක විස්තර කරගන්න කොට. *"මනං අජ්ඣත්තං වවත්ථේති "* මනස ආධ්‍යාත්මික ධර්මයක්

විදිහට ව්‍යවස්ථාපනය කරගන්නවා. නමුත් මෙතන අපි රූප කාණ්ඩයට අදාලව නිසා "මනං අජ්ඣත්තං *වවත්ථේති*" කියන එක අතහැරලා අපි කතාකරමු.

<u>ඇයි ඇස ආධ්‍යාත්මිකයි කියලා කිව්වේ?</u>

"කථං චක්ඛුං අජ්ඣත්තං වවත්ථේති " එතකොට කොහොමද මේ ඇස ආධ්‍යාත්මික ධර්මයක් විදිහට ව්‍යවස්ථාපනය කරගන්නේ? දැන් අපි ඇයි ඇස ආධ්‍යාත්මිකයි කියලා කිව්වේ? *"චක්ඛුං අවිජ්ජාසම්භූතන්ති වවත් වවත්ථේති, චක්ඛුං තණ්හාසම්භූතන්ති වවත්ථේති, චක්ඛුං කම්මසම්භූතන්ති වවත්ථේති, චක්ඛුං ආහාරසම්භූතන්ති වවත්ථේති, චක්ඛුං චතුන්නං මහාභූතානං උපාදායාති වවත්ථේති, චක්ඛුං උප්පන්නන්ති වවත්ථේති, චක්ඛුං සමුදාගතන්ති වවත්ථේති. චක්ඛුං අහුත්වා සම්භූතං, හුත්වා න භවිස්සතීති වවත්ථේති. චක්ඛුං අන්තවන්තතොති වවත්ථේති, චක්ඛුං අද්ධුවං අසස්සතං විපරිණාමධම්මන්ති වවත්ථේති, චක්ඛුං අනිච්චං සඞ්ඛතං පටිච්චසමුප්පන්නං ඛයධම්මං වයධම්මං විරාගධම්මං නිරොධධම්මන්ති වවත්ථේති "* දැන් ඔන්න සෑහෙන වචන ගණනාවකින් අපිට ඇස පිළිබඳව ව්‍යවස්ථාපනය කරගන්න ආකාරය කියලා දුන්නා. එතකොට ආධ්‍යාත්මික වුණ ඇස කොහොමද ව්‍යවස්ථාපනය කරගන්නේ?

<u>ආකස්මිකව නිකන් පහලවුනා නෙවෙයි</u>

ඇස අවිද්‍යාවෙන් උපන් දෙයක් කියලා ව්‍යවස්ථාපනය කරගන්න. දැන් ඇස කියන දේ කොහොමද හැදුනේ කියලා කෙනෙක් විමසුවොත්, මේක අධිච්ච සමුප්පන්න නෙවෙයි. අධිච්ච සමුප්පන්නයි කියලා කියන්නේ අහේතුකව අප්‍රත්‍යව හටගත්ත දෙයක් නෙවෙයි. ඇස අධිච්ච සමුප්පන්නව, අහේතුකව, අප්‍රත්‍යව හටගත්ත දෙයක් නොවන නිසා ඇස හැදුනේ කුමන හේතු ටිකෙන්ද? කියන කාරණය අපිට විග්‍රහකරලා කියන්න අවශ්‍ය වෙනවා. ඇස හැදුනේ හැම වෙලාවකදීම, *"අවිජ්ජාසම්භූතන්ති වවත්ථේති "* අවිද්‍යාව නිසා. එතකොට කොහොමද ඇස අවිද්‍යාවෙන් සකස්වුනේ? අපි වූ පරිදි දෙය නොදන්නා බවට කියනවා අවිද්‍යාව කියලා. එතකොට මොකක් නොදන්නා කමද? අපි හටගත්ත ආකාරය දන්නේ නැහැ. හටගත්ත පැත්තේ සමුදය, සමුදයේ අන්තය දන්නේ නැහැ. ඒ වගේම වැය, වැය වන පැත්ත ගැන අපි දන්නේ නැහැ. මේ සමුදය හා වැය කියන කාරණය නොදන්නා කම නිසා, ඒ නොදන්න අවිද්‍යාව හේතුයි නැවත ඇහැක් හදලා දෙන්න. එතකොට කොහොමද නොදන්නා කම

නිසා ඇහැක් හදලා දෙන්නේ? අපි ටිකක් විමසලා බැලුවොත්, ඇස අපිට ජීවිතයේ හම්බවෙන තැන අපි කතා කළා මුල ඉඳලාම දර්ශන කෘත්‍යයට අදාලව කාරණා ගොඩක් අපි සාකච්ඡා කළා. ඇස කියන එක අධිච්චසමුප්පන්නව හටගත්ත දෙයක් නෙවෙයි, මේ ඇස කොහොමද හැදුනේ කියන එක පිළිබඳව අපිට ඒ පැත්ත ගැන අපිට කතාකරන්න සිද්ධවෙනවා. මොන හේතුවකින්ද මේ ඇස හැදිලා තියෙන්නේ? එතකොට මේ ඇස හැදෙන්න හේතු ටික තමයි අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාර, නිබ්බත්ති ලක්ඛණ නොදැනීම. මේ වගේ දෙයක ඵලයකුයි මේ අද ලැබුනු ඇස කියන විග්‍රහයකින් කියන්නේ. එතකොට මේ හේතු ඵල දහමක පැවැත්ම පිළිබඳව අපිට හොඳ යථාර්ථවාදී අවබෝදයක් ලබාගන්න පුළුවන්කම තියෙනවා. පළවෙනි දේ *"චක්ඛුං අජ්ඣත්තං වවත්ථේති "* ආධ්‍යාත්මික දෙයක් කියලා ව්‍යවස්ථාපනය කර ගන්න කියලා.

කොහොමද ආධ්‍යාත්මිකයි කියලා ව්‍යවස්ථාපනය කරගන්නේ? *"චක්ඛු අවිජ්ජාසම්භූතන්ති වවත්ථේති "* මේක අවිද්‍යාවෙන් හදපු දෙයක්. එකපාර හටගත්තා නෙවෙයි. ආකස්මිකව නිකන් පහලවුනා නෙවෙයි, මේ හේතු ඵල දහමක සිද්ධියක් කියන එක දක්වන්න අවශ්‍ය වෙන නිසා, ඇස අවිද්‍යාවෙන් හදල දීපු දෙයක්. මොකද්ද අවිද්‍යාව? නොදන්නා කම. නොදන්නා කම කියලා කිව්වේ කුමන ධර්මයක් නොදන්නා කමද? සමුදය පැත්ත ගැන නොදන්නා කම. වැය නොදන්නා කම. එතකොට උදයව්‍ය නොදන්නා ලක්ෂණය නිසා උදය වැය නොදන්නා කම නිසා ඇස පිළිබඳව ඇති බවට කරන මනසිකාරය නිසාම, ඒ අවිද්‍යාවම හේතුයි නැවත ඔහුට ඇහැක් සකස් කරලා දෙන්න. දැන් අපි *"චක්ඛුංච පටිච්ච රූපේච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං"* කියන කොට ඇහැත් රූපයත් නිසා චක්ඛු විඤ්ඤාණයාගේ හටගැනීම සිද්ධවෙනවා. ඊට පස්සේ තුන්දෙනාගේ එකතුව ස්පර්ශයයි. ස්පර්ශය නිසා වේදනා, සංඥා ඇතිවෙනවා. එතකොට මේ කාරණා ටික විපාක ධර්මතාටික. විපාකය, විපාකය හැටියට නොදන්නා කම නිසා රූපය ඇති දේ හැටියට මෙනෙහි කරන කොට, රූපයේ අනිත්‍ය කම නොදන්නා නිසා, රූපයේ නිත්‍ය සංඥාවක් පිහිටන කොට ඒකට කියනවා සංඛත ලක්ෂණය නොදන්නා අවිද්‍යාව කියලා. මෙතනදී අපිට කලින් ඉඳල කතාකරපු ටිකේ විග්‍රහයෙන් එන නුවණ අපිට ඇතිකරගන්න වෙනවා. නුවණ යෙදෙන්න වෙනවා.

ජාතිය දෙයාකාරයි

ඇස හා රූපය අනිත්‍යයයි කියල කියන්නේ මේ තියන දේ නැතිවෙලා යනවා කියන දේට පමණක්ම නෙවෙයි. මේ ඇස ඉතුරු නැතුව නිරුද්ධවුනු තැනක, ඇස නොවන තැනක ඇස පවතින බවට දැනගන්න කමයි එතන පැවතුණ නිත්‍ය සඤ්ඤාව. ඒ නිත්‍ය සඤ්ඤාව නිසා රූපයේ නිරෝධය/නැතිවුණ බව නොදන්නා කම නිසා හැම වෙලාවකදීම භව සංඥාව එළඹ සිටිනවා. කාම සහගත දේ බාහිර පවතින බවට ගන්න එකට කාම භවය කියනවා. මේ භව සංඥාවෙන් ගේන දේ තමයි මේ ඇති බවට ගෙනැල්ල දෙන මේ සංඥාව. (එහෙමත් නැත්නම්) රූපය බාහිරයේ ඇතිබවට ගෙනැල්ල දෙන මේ සංඥාව. එතකොට රූපය බාහිරයේ ඇතිබවට ගෙනැල්ල දෙන කම හැම වෙලාවකදීම රූපය ඉතිරි නැතිවම නැතිවූ පසුව ඇති වූ දෙයක්. මේ ඉතිරි නැතිවම නැති වෙනකොට ඇතිවෙන ඇතිබවට ගෙනැල්ල දෙන භවය නිසාම, "භව පච්චයා ජාති" නිසාම මේ මොහොතේ එක් ක්ෂණික ජාතිය ඇති වෙනවා.

ජාතිය දෙයාකාරයි. "සන්තති" ජාතිය හා එක් "ක්ෂණික" ජාතියක් තියෙනවා. අපි ජාතිය කියන දේ කතාකරනවා උපදින පැත්ත ගැන. උපදින පැත්ත ගැන කතාකරන කොට, මවු කුසින් බිහිවීම.*"යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජාති සඤ්ජාති ඔක්කන්ති අභිනිබ්බත්ති"* කියලා පෙන්නන තැනක් තියෙනවානම්, ඒ තැනත් ඒ වගේම *"ඛන්ධානං පාතුභාවො ආයතනානං පටිලාභො"* ස්කන්ධයන්ගේ නැවත පහල වීමක්, ආයතනයන්ගේ ප්‍රතිලාභයක් කියලා පෙන්නන තැනක් තියෙනවා. දෙයාකාරය නැවත ලැබීමක් තියෙනවානන් මෙන්න මේකට කියනවා ජාතිය කියලා.

ඉතුරු නැතුව නිරුද්ධ වුනු තැනක, ඉතුරු නැතුව නිරුද්ධ වුනු බව නොදන්නා අවිද්‍යාව නිසා මේ මොහොතේ එලියේ රූපය තියෙනවා කියලා හිතන භව සංඥාව පදනම් කරගෙන හැම වෙලාවකදීම ඒ තියෙන දේ විඳින්න පුළුවන් වෙන විදිහට ආයෙත් ඇස හදන කම ජාතියයි.

ඇස පිළිබඳව උදාහරණයක් කිව්වොත්; ඇස කියන එක ගන්න පරණ රීල් එක දාන කැමරාවක තියෙන නෙගටිව් පටියක් වගේ කියලා . නෙගටිව් පටිය ආලෝකයට

සංවේදියි, ආලෝකයට බිඳෙනවා. දැන් ආලෝකයට බිඳුනු ඇහෙන් බැහැ නැවත රූපයක් දකින්න. නැවත රූපයක් ගෝචර කරගන්න. එහෙනම් සිද්ධවෙනවා අලුතෙන් නැවත ඇස හදාගන්න. ඒ ඇස නිකම්ම හැදෙන්නේ නැහැ. "*භව පච්චයා ජාති*" එලියේ තියෙනවා කියලා ඇති දේ නොදන්න කම නිසා, ඇති දේ පිළිබඳව විඳින්න පුළුවන් විදිහට, එලියේ තියන රූපය විඳින්න පුළුවන් විදිහට ඇස සකස් කරලා දෙනවා. එතකොට ඇස සකස් වුනාට පස්සේ, "*භව පච්චයා ජාති*" මේ මොහොතේම අපිට ක්ෂණික ජාතිය හදලා දෙනවා. දැන් ඔන්න ඇස කියන එක "අවිජ්ජා සම්භූතං වවත්ථේති " , අවිද්‍යාවෙන් හදලා දීපු දෙයක් කියලා දකින්න.

<u>අවිද්‍යාව විතරක් නෙවෙයි</u>

මේ ඇස කියන එක *"තණ්හාසම්භූතන්ති වවත්ථේති "* .අවිද්‍යාව විතරක් නෙවෙයි. ඇස තණ්හාවෙනුත් හදලා දීපු කාරණයක්. අවිද්‍යාව, තණ්හාව, කර්මය මේ ලක්ෂණ ටික ඔක්කොම හේතුවෙනවා මේ ඇස හදලා දෙන්න. අවිද්‍යාව කියන කාරණය නිසා වුනේ ඇස පිළිබඳව නොදන්න කම විතරයි. නොදන්නා කම නිසා හදාගත්ත දේට, ඇති බවට ගත්ත දේට තණ්හා කළා. ඒ තණ්හාව නිසාම ඒ දේ උපාදාන වශයෙන් ගත්තා. උපාදාන නිසාම හැම වෙලාවකදීම භවය හදාගත්තා. මේ එක පෙලක්! පරියායක්. පටිච්චසමුප්පාද න්‍යායට අනුව වේදනාවට, අවිද්‍යා, සංකාර, තණ්හා, උපාදාන, භව. එතකොට අතීත හේතු පහක් කියලා අතීත අවිජ්ජා, සංකාර, තණ්හා, උපාදාන, භව. වර්තමාන ඵලය විඤ්ඤාණ, නාමරූප, සලායතන, පස්ස, වේදනා කියන ටික.

නැවත වර්තමාන හේතුව මේ මොහොතේ ඉතුරු නැතුව ඇස රූප නිරුද්ධ වුනු බව නොදන්න ඇත්ත නොදන්නා කම නිසා තියෙන අවිද්‍යාවත්, ඒ නොදන්න කම නිසා රැස්කරගත්ත සංකාරයත්, ඒ වගේම ඒ සංකාරයෙන් උපද්දපු දේට කරන තණ්හාවත්, ඒ වගේම ඒ තණ්හා කරපු දේම තණ්හා-උපාදාන වශයෙන් දැඩිව ග්‍රහණය කරගැනීමත්, ඒ නිසාම එලියේ තියෙනවා කියලා ඇති දේ මත ඇති කරගත්ත "භවය" කියන මේ කාම භවය පිළිබඳව ඇතිවුනු දේ නිසා වර්තමාන හේතු පහ. ඒ හේතුවෙන් නැවත විඤ්ඤාණ, නාමරූප, සලායතන, පස්ස, වේදනා කියන අනාගත ඵල පංචකයක් හදන්න. මේ මොහොතේ එක් ක්ෂණික වශයෙන්ම නැවතත් ජාතිය හදලා දෙන්න.

ඇස කියන එක නිකම්ම ඇතිවුණ දෙයක් නෙවෙයි. මේ ජාතිය මේ රූපයේ ඇත්ත නොදන්නා කම නිසා, ස්කන්ධයන්ගේ උදය-වැය නොදන්නාකම නිසා හදාගත්ත දෙයක්. මේ ජාතිය, ඇස උපද්ද ගත්තා කියන එක නොදන්නා කම. දන්නා කමක් ඇති කර ගත්තොත් ඇස උපදින්න තියෙන හේතුව අපි නැති කරගන්නවා. මේ කියන කාරණය අනුව ඇස හදාගත්තේ ඇස කියන කාරණය නොදන්නා කම නිසා. ඒ නොදන්නාකම නිසා හදාගත්ත දේට ඇති බවට රැස්කර ගත්තදේට කිව්වා "සංඛාරය" කියලා. එතකොට ඒ දේටම තමයි අපි තණ්හා වශයෙන් අල්ලගත්තේ. ඒක නිසා *"චක්ඛු තණ්හාසම්භූතන්ති වවත්ථේති"*. අවිද්‍යාවට තනියම පුළුවන්කමක් තිබුනේ නැහැ, ඒක නිසා තණ්හාව උපකාර කරගත්තා.

<u>සතර ආහාරයම එතන යෙදිලා තියෙනවා</u>

තණ්හාව නැමැති මේ වඩුවා තමයි මේ ගේ සකස්කරලා දෙන්නේ. ඒවගේම *"චක්ඛු කම්මසම්භූතන්ති වවත්ථේති"*. ඇස කියන එක කර්මය නිසා හදපු දෙයක්. *"චක්ඛු ආහාරසම්භූතන්ති වවත්ථේති "* ඇස කියන එක ආහාර සමවායෙන් හදපු දෙයක්. ආහාරය කියනකොට සතරමහා ධාතුව පැත්තෙන් එන කබලිංකාර ආහාර ප්‍රත්‍යයත්, ඇස හදන්න පැත්තෙන් පස්සේ හෙතුවුණ අවිද්‍යා සංඛාර දෙක හදන පැත්තට අනෙක් ආහාර තුනත්. ඒ ආහාර තුන කියනවා *ඵස්ස ආහාර, මනෝ සංචේතනා ආහාර විඤ්ඤාණ ආහාර* . ආහාර තුනත් එකතුව, මේ සතර ආහාරයම හේතුයි මේ ඇස හදන්න. යම් තැනක ඇස තියෙනවානන් එතන සතර ආහාරයම යෙදිලා තියෙනවා. ඒක විශේෂයෙන්ම අපි කතා කළයුතු මාතෘකාවක්. මේන්න මේ විදිහට ඇස කියන එක ආහාර ප්‍රත්‍යයෙන් ඉපදුණු දෙයක්.

<u>ඇස සතර මහාධාතු නෙවෙයි</u>

ඒ වගේම *"චක්ඛු චතුන්නං මහාභූතානං උපාදායාති වවත්ථේති "* ඇස කියන එක සතර මහාධාතු නෙවෙයි, සතර මහාධාතු නිසා පවත්නා රූපයක්. මෙන්න මේ විදිහට අපිට දැන් ඇස කියන එක පිළිබඳව හොඳ ව්‍යවස්ථාපනයක් කරගන්න අවශ්‍ය කාරණා ටිකක් පෙන්නනවා. මේ කාරණා ටික මත ඇස ව්‍යවස්ථාපනය කරනකොට තමයි ඒක අප ජීවිතයට අවබෝධයක් විදිහට ලැබෙන්නේ. මේ මේ හේතු ටික නිසා හැදුනු ඵලයකුයි අපේ ජීවිතය කියලා පේන්නේ. අපි ජීවත්වෙනවා කියන බව අද කතා

කරන්නේ, ජීවත්වෙනවා කියලා කියන්නේ ඇහෙන් රූප පෙනෙන බව, කනෙන් ශබ්ද ඇසෙන බව, නාසයෙන් ගඳ-සුවඳ විඳින බව, කයට ස්පර්ශය විඳින බව, දිවට රස විඳින බව කියන මේ දෙවල් ටිකට.

මේ ධර්මතා ටික පිළිබඳව අවබෝධ කර ගත්තට පස්සේ අපිට හැම වෙලාවකදීම ජීවත් වෙනවා කියන තැනක තියෙන ඇත්ත කතාව මේ පෙනෙන්නේ. අපේ ජීවිතය කියන තැන (හැම තිස්සේම) හේතු-ඵල දහමක්. මේ පුද්ගල භාවය ඉකමවා ගියපු නුවණ ඇති කර ගත්තාම තමයි ලොකයේ ඇලෙන්න, ගැටෙන්න දෙයක් හම්බවෙන්නේ නැති තැනකට අපිට මනස පත්කරගන්න පුළුවන්කම තියෙන්නේ. ඒ දර්ශනයෙන් අපිට ලැබෙන ඒ ශක්තිමත් බව මත. ඒක නිසා මේක බොහොම වැදගත් දර්ශනයක්. ඒ කාරණා අපේ ජීවිතයට දර්ශනයක් විදිහට, ප්‍රඥාවක් විදිහට අපිට යෙදෙනවානන් ඒ ප්‍රඥාව තමයි අපිට වැදගත්ම දේ වෙන්නේ. ඒ ප්‍රඥාව තමයි වැඩියයුතු ප්‍රඥාවක් බවට පත්වෙන්නේ. මේ ප්‍රඥාව තමයි ලෝකෝත්තර භූමියට අපිව නගාසිටුවන ප්‍රඥාව බවට පත්වෙන්නේ. ඒ කාරණා ටික පිළිබඳව හොඳට සම්මර්ශනය කරන්න, වචන ටිකකින් ඔබ්බට ගියපු, ජීවිතයේ යෙදෙන නිවනකින් ඒක සම්මර්ශණය කරන්න. ඒක බොහොම ප්‍රඥාගෝචර දෙයක් බවට පත්වෙනවා. ඒක බොහොම වැදගත් සන්ධිස්ථානයක් බවට පත්කරගන්න පුළුවන්කම තියෙනවා.

පුණ්‍යානුමෝදනාව.

සාධු ! සාධු !! සාධු !!!

4 පරිච්ඡේදය

කෙසේ නම් බාහිර ධර්මයන් මෙනෙහි කරන්නාවූ ප්‍රඥාව ගොචරනානත්ත ඤාණය නම් වේද?

නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස////

ශ්‍රද්ධා සම්පන්න කාරුණික පින්වතුනි, අපි දැන් විශේෂයෙන්ම සාකච්ඡා කරන්නේ ධම්මසංගණිප්‍රකරණයේ රූප කාණ්ඩයට අදාලව රූපය පිළිබඳව විස්තර විග්‍රහ වෙන කොටස. එතනදී අපි බොහෝ කරුණු කාරණා සාකච්ඡා කරන්නට යෙදුනා. ඒ විග්‍රහ කර ගැනීම් තුළ අපි හැම වෙලාවකදීම උත්සහා විය යුතු වෙන්නේ අපේ ජීවිතයේ යථාර්ථයක් විදිහට දකින අවබෝධයක් ලබා ගන්න මිසක තවත් එක පාඩමක් ජීවිතයට සිද්ධ කරගන්න නෙමෙයි. අපි තවත් එක පාඩමක් ජීවිතයට සිද්ධ කර ගත්තොත්, එසේ සිද්ධකර ගන්න පාඩම තුළ තව දුරටත් පුද්ගලභාවය රැඳී තියෙයි. එහෙමත් නැත්නම් අභිධර්ම පිටකයේ රූප කාණ්ඩය දැනගත් තවත් පුද්ගලයෙක් ලෝකයට බිහි වෙලා තියෙයි මිසක කිසිම කලෙක මේ ධර්මය දේශනා කරපු අර්ථය අපි සිද්ධකරගෙන නැහැ. යම් අර්ථයක් සඳහාද බුදුරජාණන් වහන්සේ අපිට ධර්ම දේශනා කරන්නේ අන්න එම අර්ථය සඳහාම මේ ධර්මය භාවිත කරන්න වෙනවා. සසර දුකින් මිදීමට දේශනා කර ධර්මය ඒ සඳහාම යෙදිය යුතුය. නැතිනම් මේ ධර්මය ශ්‍රවනය කරන කොට අපේ මේ ජීවිතයෙ තියෙන ඇත්ත යථාර්ථය නැත්නම් ජීවත් වෙනවා කියන තැන ඇත්ත පැතිකඩ පේන්නට ඕන මිසක ජීවිතයෙන් පරිබාහිර වූ තවත් ධර්ම කාරණා ටිකක් අපිට හමු වෙන්නට බැහැ.

අපි කලින් දේශනා වල රූපය ගැන කතා කරන කොට රූපය ගැන පමණක් සීමා නොවී, අපිට රූපය හමු වෙන මානසික මට්ටමත් එක්ක අපි සාකච්ඡා කරන්නේ ඒ හැම තැනකම මේ නාම රූප පරිච්ඡේදයක් වෙන්නට අවශ්‍යවන නිසා හා අපේ ජීවිතය තුළ ඇත්ත පැතිකඩක් අපිට විවරණය වෙන්න අවශ්‍ය වන නිසා. අපි චක්ඛායතන රූපය ගැන නම් කතා කරන්නේ අපිට පෙන්න ඕනේ මේ ජීවත් වන 'පුද්ගලයෙකුට' ඇස ඇති වුනා නෙමෙයි. ඇස 'ඇති කරගන්න බව' තමයි 'තමන්' වුණේ නැතිනම්

පුද්ගලභාවය නියෝජනය කලේ. ඇස රූප දෙක 'හට ගන්න' මොහොතම තමයි පුද්ගලභාවය නියෝජනය කලේ. ඒකත් ඉතුරු නැතිව නිරුද්ධ වනවා කියන මේ දර්ශනයට අපේ මනස යොමු වෙන්නට ඕනෙ. එහෙම නැතුව අපි කාරණා ටිකක් විතරක් ඉගෙනගෙන තියෙයි නම් එයින් පුද්ගල බව වැඩිවෙයි මිසක පුද්ගලබව දුරුවන ලක්ෂණයක් අපි තුළ වැඩිලා නැහැ. හොඳ අවධානයක් යොමු කරන්න වෙනවා ඒ නිසා අපිට එතනදි.

<u>ප්‍රශ්නය තියෙන්නේ ප්‍රතිපදාව පනවන තැන.</u>

ගොඩක් වෙලාවට අපේ සමාජය තුළ වර්තමාන කාලය වෙන කොට නොයෙක් දර්ශන මතවාද වලට ශාසනික ප්‍රතිපදාව හා ධර්මය මුහුණ දුන්න බව අපිට දැක ගන්න පුළුවන්. කෙන කෙනා හිතු මතේට ධර්මය විග්‍රහ කිරීම තුළ, හිතු මතේට අර්ථ විවරණ කරන්න යෑම තුළ ඇතැම් අවස්ථාවන්හි මේ ශාසනයේ යථාර්ථය, නිර්වාණගාමී ප්‍රතිපදාව ටිකක් පැත්තකට වෙනවා අපිට දකින්න පුළුවන්කම තියෙනවා. අපි විශේෂයෙන්ම බොහෝ ධර්ම කාරණා සාකච්ඡා කිරීම නෙමෙයි මෙතන බලාපොරොත්තු වෙන්නේ. මේ කතා කරන දර්ශනය තුළ අපිට අපේ නිර්වාණගාමිණී ප්‍රතිපදාව දකින්නට පුළුවන්කම තියෙන්නට ඕනේ. එහෙම නැත්නම් අපි මේ කතා කරන දෙයින් තේරුමක් නැති වෙනවා. අපි කතා කරනවා නම් අද ඇස අවිද්‍යාවෙන් හදා ගත්තා කියලා මේ විදියට මනස ව්‍යාවස්ථාපනය කරන කොට , මනස පිහිට වන කොට අපිට එය තුළින් නිවන් ප්‍රතිපදාව පැහැදිලි වෙලා තියෙන්න ඕනෙ. එහෙම නිවන් ප්‍රතිපදාව පැහැදිලි නොවුනොත් මේ ක්‍රමවේදයෙන් අපි විමසන කාරණාව සාර්ථක වෙන්නේ නැහැ. ඒ නිසාමයි බොහොම කළ්‍යාණමිත්‍රභාවයෙන් නැවත නැවතත් සිහිපත් කරන්නේ හුදෙක්ම මේ කතා කරන දේ නිවන් ප්‍රතිපදාව දක්වාම භාවිත කරන්න උත්සාහවත් වෙන්න කියලා.

එහෙම නැතිනම් අපි ධර්මය නිකම් වචන ටිකක් විදිහට යොදාගෙන භාවිත කළාට ඒකෙන් ප්‍රයෝජනයක් වෙන්නේ නැහැ. මේ වචන ටික පමණක් කතා කළාට මේ දර්ශනය අපේ ජීවිතය තුළට එන්නේ නැහැ, වැදගත් වෙන්නේ මෙ ටික කතා කරන එක නෙමෙයි. ඕනම කෙනෙකුට පොතක් ගත්තට පස්සේ මේ වචන ටික කතා කරන්න හා ප්‍රකාශ කරන්න පුළුවන්කමක් තියෙනවා. හැබැයි එතකොට ප්‍රශ්නය

තියෙන්නේ ප්‍රතිපදාව පනවන තැන. එනම් මේ ධර්මතාව අවබෝධ කරගැනීම පිණිස අද දවසේ අපි කුමක් කළ යුතුද? අන්න ඒ අද දවසේ කළ යුතු දේ පනවන තැන තමයි අපිට තියෙන අවශ්‍යතාවය. මොකද ඒක තමයි ප්‍රතිපදාව, අද අපි යා යුතු දේ. ඒ යා යුතු ප්‍රතිපදාව වැටෙන්නේ අර අපි කතා කරපු ඵලය උපදවා ගත යුතු තැනටද? කියන එක අපි තේරුම් ගන්න එක වටිනවා. එහෙම නැත්නම් අද සමාජය දිහා බලන කොට කවුරුත් වගේ එකම වාගේ වචන ටිකක් කතා කරන්න පුළුවන්කම තියෙනවා. හැබැයි ඒ වචන ටිකෙන් පනවන්න හදන ප්‍රතිපදාව කොහොමද? එකම ද? නානත්වයක් තියෙනවා ද? කියන කාරණාව තමයි වැදගත් වෙන්නෙ.

අපි කිව්වොත් කවුරුත් අනිච්ච කතා කරන්න පුළුවන්. හැබැයි එම වචන තුළ අපි කතා කරන තැනදි ප්‍රතිපදාව පනවන කොට, අද දවසේ අනිත්‍ය ස්වභාවය සාක්ෂාත් කර ගන්න යන කොට අර්ථ විවරණ දෙකක් තියෙනවා. උදාහරණයක් හැටියට ගත්තෝත් කෙනෙක් කියනවා ආශ්වාද හැටියට ලෝකය ගන්න එපා මේක කැමති විදියට ගන්න බැහැ. මෙ ස්කන්ධ තුළ හරි, පංච උපාදානස්කන්ධ තුළ හරි, කැමති ලෙස පවත්වන්න බැහැ කියලා. ඒ වාගේම තවත් කෙනෙක් කතා කරනවා වෙන අනිත්‍ය ස්වභාවයක් පිළිබඳව.

<u>පදය විකෘති කරලා</u>

(මොකද්ද දැන් හරි?) දැන් අපිට විමසලා බලන්න වෙනවා මේක ප්‍රායොගික ප්‍රතිපදාවක් විදියට තෝර අරගෙන වඩන කොට මේක අනිච්ච ද ? අනිච්ඡ (අනිච්ච නොවේ) ද ? කියලා. අපිට අනිච්ඡ කියලා 'ඡ' අකුර යොදලා ගන්න අය කියන්නේ අපිට සම්පූර්ණයෙන් ආශ්වාද හැටියට ගන්න එපා කියලා. එවිට ආශ්වාදය වශයෙන් නොදැකිය යුතු ආශ්වාදය ඉෂ්ට නොකරන වස්තුවක් බාහිරින් හෝ එහෙමත් නැතිනම් ආශ්වාද වශයෙන් ඉෂ්ට නොකරන පටිච්චසමුප්පන්න වූ ස්කන්ධ ටිකක පැවැත්මක් (සමහරු වැරදි දෘෂ්ටිගතව) කතා කරනවා. නමුත් පටිච්චසමුපන්න වූ ධර්මයක සත් භාවයක් නැතිනම් පැවැත්මක් බුදුරජාණන් වහන්සේ පනවන්නේ නැහැ. ඒ ඒ මොහොතේ හට ගෙන නිරුද්ධවන ස්වභාවයක් දේශනා කළා මිසක. ඒ ඒ මොහොතට හට ගෙන නිරුද්ධවන ස්වාභාවයක් පැනෙව්වා මිසක. අවබෝධ කළ උතු යැයි පෙන්වුවා මිසක 'පටිච්චසමුප්පන්න වූ ධර්මතා ටිකක් වත්' බාහිරයේ තිබ්බා කියලා

(බුදුරජාණන් වහන්සේ) කතා කළෙ නැහැ. අපිට දැන් හරියට අර්ථය ගන්න වෙනවා අනිච්ච කියලා සමාන්‍යයෙන් ගන්න වචනයත් , (සමහරු) අමුතුවෙන් මේ පදය විකෘති කරලා වෙනස් කරලා අනිච්ඡ කියලා ගන්න සංකල්පය තුළත් කොහොමද අපේ ප්‍රතිපදාව සකස් කර ගන්නේ? මේ ප්‍රතිපදාව කොතනකට යනකන් අපිට උපකාර වෙනවාද? කොතනකට යනකම් යෙදිලා තියෙනවාද? මේ කියන කාරණා අපිට පැහැදිලි කර ගන්න සිද්ධ වෙනවා. අපිට ඒකෙදි බොහොම වැදගත් වෙන කාරණා ටිකක් සංග්‍රහ වෙන තැනක් තමයි අපි සාකච්ඡා කර ගෙන ආපු දහම් පරියාය.

<u>වස්තු ධර්මතා වලට ගෝචර වෙන ධර්මතා</u>

අපි පහුගිය වාරයෙ සාකච්ඡා කලේ රූප කාණ්ඩය සාකච්ඡා කර ගෙන ඇවිල්ලා; චක්ඛායතන රූපය පිළිබඳව අපි විග්‍රහ කර ගන්න කොට, ඇස කියන තැන හට ගන්න ස්වභාවය පිළිබඳව. ඊට පස්සේ පටිසම්භිදාමග්ගයෙහි එන වත්ථුනානත්තඤ්ඤාණදි වස්තු ධර්ම (ඇස, කන,නාසය...) ගැන ව්‍යාවස්ථාපනය කර ගන්න තැන විග්‍රහ කළා. අපි පහුගිය වතාව තුළ දළ වශයෙන් සාකච්ඡා කළා *"චක්ඛුං අජ්ඣත්තං වවත්ථේති චක්ඛු අවිජ්ජාසම්භූතන්ති වවත්ථේති, චක්ඛු තණ්හාසම්භූතන්ති වවත්ථේති, චක්ඛු කම්මසම්භූතන්ති වවත්ථේති, චක්ඛු ආහාරසම්භූතන්ති වවත්ථේති, චක්ඛු චතුන්නං මහාභූතානං උපාදායාති වවත්ථේති"* කියන කාරණා ටික. අපි මතක් කළා මේක විශාල වශයෙන් කතා කළ හැකි මාතෘකාවක්. එනම් ඇස හට ගන්න පැත්ත ගැන කතා කරන කොට ඒක බොහොම විශාල පැත්තක්. එතනදි ප්‍රායෝගිකව අපිට මේ පෙළ කතා කරන්න පහසු වෙයි අපි අදාල කර ගත්තෝත් (ත්‍රිපිටකයෙහි ඒ ඥානයටම) එහා පැත්තේ 16 වන ඥානයට තියෙනවා ගොචරනානත්තඤ්ඤාණය. අපි කලින් කතා කලේ වත්ථුනානත්තඤ්ඤාණය දැන් ගොචරනානත්තඤ්ඤාණයත් අලලාම මේ කාරණා ටික කතා කලොත් යම් අර්ථයක් මතු කර ගන්න අපිට පුළුවන්කම තියෙනවා. අපි *"චක්ඛුං අජ්ඣත්තං වවත්ථේති "* කියන කාරණය පහුගිය වතාවේදී විග්‍රහ කර ගන්න යෙදුනා. දැන් ගොචරනානත්තඤ්ඤාණයදී කියන්නේ අර වස්තු ධර්මතා වලට ගෝචර වෙන ධර්මතාවය.

ඇස ආධ්‍යාත්මික නම් ඇසට ගෝචර වෙන රූපය *"රූපෙ බහිද්ධා වවත්ථේති "* බාහිරයි කියලා ව්‍යාවස්ථාපනය කරගන්න. එහෙම කරන කොට *"රූපා අවිජ්ජාසම්භූතාති*

වවත්ථේති රූපා තණ්හාසම්භූතාති වවත්ථේති, රූපා කම්මසම්භූතාති වවත්ථේති, රූපා ආහාරසම්භූතාති වවත්ථේති, රූපා චතුන්නං මහාභූතානං උපාදායාති වවත්ථේති". *"රූපා අවිජ්ජාසම්භූතාති වවත්ථේති "* රූපය අවිද්‍යාවෙන් හට ගත්තේ කියලා ව්‍යාවස්ථාපනය කරගන්න. *"රූපා තණ්හාසම්භූතාති වවත්ථේති "* රූපය තණ්හාවෙන් කළ දෙයක් කියලා ව්‍යාවස්ථාපනය කරගන්න ."*රූපා කම්මමසම්භූතාති වවත්ථේති "* රූපය කර්මයෙන් හට ගත්තේ කියලා ව්‍යාවස්ථාපනය කරගන්න. *"රූපා ආහාරසම්භූතාති වවත්ථේති "* රූපය ආහාරයෙන් හට ගත්තේ කියලා ව්‍යාවස්ථාපනය කරගන්න. *" රූපා චතුන්නං මහාභූතානං උපාදායාති වවත්ථේති "* රූපය සතර මාහාධාතු උපාදාය රූප නිසා කියලා ව්‍යාවස්ථාපනය කරගන්න.

<u>රූපය කොහොමද අපි අවිද්‍යාවෙන් හැදුනා කියන්නේ?</u>

දැන් මේ ආකාරයට අපි කලින් කතාකළ ධර්ම ටික රූපය පැත්තෙන් පෙන්වනවා. එනම් රූපය අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාර කියන මේ ධර්මතා ටිකෙන් හටගත්තේ. මේවා කලින් ඇහැට පෙන්වූවා. දැන් ඒ ටිකම රූපයටත් පෙන්වනවා. දැන් මම ඔබෙන් ප්‍රශ්නයක් ඇහුවොත්? ඇස අපි අවිද්‍යාවෙන් හදා ගත්තා ඒක කිසි ගැටළුවක් නැහැ, හැබැයි රූපය කොහොමද අපි අවිද්‍යාවෙන් හැදුනා කියන්නේ? ඇහැට පතිත වෙන වර්ණ සටහන කොහොමද අපි අවිද්‍යාවෙන් හැදුන දෙයක් කියන්නේ? කනට පතිත වෙන ශබ්දය කොහොමද අපි අවිද්‍යාවෙන් හැදුන දෙයක් කියන්නේ? ඒවගේම නාසයට පතිත වන ගන්ධය දිවට පතිත වන රසය, කයට පතිත වන ඵොට්ඨබ්බය? පොදුවේ රූපය කියන කාරණාව අපි කොහොමද අවිද්‍යා, කර්ම, තණ්හා , ආහාර හට ගත්තේ කියලා ව්‍යාවස්ථාපනය කරගන්නේ?

ඕක බොහොම වැදගත් අවස්ථාවක්. ඇස අවිද්‍යාවෙන් හැදුනා කියලා කියන කොට මෙතනදී මතු කර ගන්න ඕන අර්ථය තමයි ඇස නැතිව කිසිම කළක රූපය පිළිබඳව දැනීමක් තිබුනේ නැහැ. යම් තැනක වර්ණ රූපය පිළිබඳව යම් දැනීමක් තියෙනවානම් ඒ සැම තැනකම ඇස යෙදෙන්න අවශ්‍ය වෙනවා. මේ ඇස හා වණ්ණ රූපය තමයි එකටම හට ගන්න එකම ධර්මතාවය. අන්න ඒ නිසා තමයි *"චක්ඛු අවිජ්ජාසම්භූතාති වවත්ථේති "* ඇස අවිද්‍යාවෙන් හදපු දෙයක් කියන කොට ඒ වර්ණ සටහනත් අවිද්‍යාවෙන් හදපු දෙයක් කියලාම කියන්නේ.

ඒකට තව හේතුවක් තියෙනවා, හැම වෙලාවකම අපි ලෝකයේ වණ්ණ රූපයේ දකින්නේ බාහිර වස්තු රූපයේ වණ්ණයට වැඩිය එම වණ්ණ රූපෙය ගෝචර කරගන්න අපේ ප්‍රසාදයේ මට්ටමට. ඒකට අනුව තමයි අපි වණ්ණ රූපය ගෝචර කර ගන්නේ. අපිට මේ පෙනෙන ගහක් දිහා බලලා අපිට පොදු ප්‍රඥප්තියක් පනව ගත්තට මේ ගහ කොල පාටයි කියලා, මට කියන්න පුළුවන්කමක් නැහැ මට පෙනෙන කොල පාටමයි තව කෙනෙකුට පේන්නේ කියලා. හේතුව? දකින්නේ ප්‍රසාදයේ හැකියාව මිසක කිසිම කළක රූපයේ හැකියාව නොවන නිසා. එකම රූපයේ එකම වස්තුව දිහා වයස් පරාස කීපයක පුද්ගලයෝ බලා ගෙන හිටියොත්, ඒ වගේම තිරිසන්ගත සතෙක්, මනුස්සයෙක්, දෙවියෙක් කියන මේ තුන්දෙනා අපි ගත්තොත් ඔවුන් රූපය දිහා බලන ආකාරය එකිනෙකට වෙනස්. අපිට පේනවා මනුස්සයෙක් රූපය දකින තැනක ඒ විදියට නොව බල්ලෙකු වෙනම ආකාරකින් ඒ රූපය ගෝචර කර ගන්නවා. දෙවියන්ට සියුම් ශරීරය නිසා සියුම් ධර්මතාවය නිසා මේ මට්ටම විනිවිද යන්න පුළුවන් මට්ටමේ ඇහැක් තියෙනවා.

<u>ප්‍රසාදයේ හැකියාව විතරයි</u>

දැන් කාගේ ඇස ද හරියටම රූපය දැකපු ඇහැ? අපි කියනවා අපේ මනුෂ්‍යය ලෝකයට සාපේක්ෂව අපි දකින දේ හරියටම හරි කියලා. ඒ වුනාට බල්ලාගෙන් අහන්න පුළුවන් වුනොත් බල්ලා කියාවි බල්ලාට පේන දේ හරි කියලා. දෙවියගෙන් ඇහුවොත් දෙවියා කියාවි දෙවියට පේන දේ හරි කියලා. දැන් අපිට නිවැරදි කරගන්න අවශ්‍ය වෙන කොට අපිට පුද්ගලබව හදා ගත්ත පැත්ත තුළ තමයි අපි තර්කයක් ගොඩනඟා ගන්නේ. හැම විටම අපි දකින දේ නිවැරදියි කියලා. නමුත් කෙන කෙනා අවබෝධ කර ගත්තේ, දැක්කේ, කෙන කෙනාගේ ප්‍රසාදයේ හැකියාව මිසක වෙනත් හැකියාවක් නෙමෙයි. එකම රූපයක් ගත්තොත් වයස් පරාස කීපයක පුද්ගලයන් දකින්නේ විවිධ ආකාරයට. ඒ වගේම ලෝකේ වර්ණ අන්ධතාවය කියලා දෙයක් තියෙන්නේ. ඒ ඒ කෙනා රූපය දකින නිසා නෙමෙයි. ප්‍රසාදයේ මට්ටම තේරුම් ගන්න නිසා.

කෘතීමව හරි අපිට පුළුවන් වුනොත් කණ්නාඩියක් දාලා හරි ඒ ප්‍රාසාදයේ මට්ටම ටිකක් වෙනස් කරන්න අපිට පේන පැත්ත වෙනස් වෙලා තියෙනවා. උදාහරණයක් වශයෙන් ඇස් පරික්ෂා කරන්න යනකොට ඇහැට දානවා බෙහෙතක් ඇසේ කාචය ලොකු වෙන්න. දැන් මේ ඇසේ කාචය ලොකු වෙන්නෙ දාන බෙහෙත නිසා, අපිට රූප වැඩිපුර දර්ශනය වෙනවා. ලොකුවට ආලෝකය ග්‍රහණය කර ගන්නවා මොකද ප්‍රසාදයේ පැත්තෙන් ඇසේ කාචය ලොකුවෙන නිසා. එවිට වෙනදා දකින ආලෝකයට වැඩිය දීප්තිමත් ආලෝකයක් දකිනවා. වෙනදා සාමන්‍ය සුදු පාට දැන් තද දීප්තිමත් සුදු පාටක්. දැන් ඔය බෙහෙත දැම්මට පස්සේ පෙනෙන දර්ශනයද හරි? එහෙම නැත්නම් බෙහෙත දාන්න කලින් පෙනුන දර්ශනය ද හරි? හිතයි කලින් තිබුන එක හරි. දැන් වැරදි දර්ශනය කියලා.

<u>අපි ඇහෙන් එළියට ගිහිල්ලා නැහැ</u>

මෙහෙමෙ දෙයක් කිව්වොත්; අපිට ඔය අලුතින් බෙහෙත දැම්මට පස්සේ හට ගෙන තිබුන දර්ශනය අපේ මුළු ජීවිතයම වෙලා තිබුනොත් ? ඉපදුන වෙලාවේ ඉඳලා තිබුනේ ඒක නම් අපිට බෙහෙත දැම්ම වෙලාවේ ඉඳන් තිබ්බේ ඔය දෙක මාරු වෙලා නම්? අපි දැන් කියයි අලුත් වෙනස් වු දර්ශනය බොරුවක් කියලා. මොකද අපේ ජීවිතය වෙලා තියෙන්නේ අර කලින් මට්ටම නිසා. පිංවතුනි ලෝකයේ ඇත්ත යථාර්ථය ඒකයි. අපි රූපය විඳිනවා කියලා ඒ ගැන කතා කළාට, ඇත්තටම අපි ඇහෙන් එළියට ගිහිල්ලා නැහැ. අපි විඳලා දැන ගෙන තියෙන්නේ අපේ ඇසේ මට්ටම. ඇසේ ප්‍රසාදය ගෙනෙ දෙන මට්ටමයි අපි විඳලා තියෙන්නේ. ප්‍රසාදය ගෙනෙ දෙන මට්ටමයි අපි දැන ගෙන තියෙන්නෙ. ඒ ප්‍රසාදය මට්ටමට රූපය පිළිබඳව දැන ගත්ත නිසා ඒ දැන ගත්ත රූපයටත් අපි කියනවා *"අවිජ්ජාසම්භූතාති වවත්ථේති "*, ඒ රූපය නිකම් නෙවෙයි, අවිද්‍යාවෙන් හට ගත්ත ඇසේ රූපයට තමයි විඳලා තියෙන්නේ. ඇස අවිද්‍යාවෙන් සකස්කර ගත්ත දෙයක්.

<u>ජීවමාන පෙරේතයෙක්</u>

ඒකයි කියන්නේ දැඩි කර්මයක් තිබුනොත් මේ ජීවිතයේදීම අපේ ප්‍රසාදය වෙනස් කරන්න පුළුවන්. මිලක්කතිස්ස කතාව ගත්තොත්, ගැබ්ගත් මුව දෙනක් මරා ගෙන කාපු මිලක්කතිස්ස වැද්දට ඒ මොහොතෙම ප්‍රකෘති ප්‍රසාදය වෙනස් වුනා. ජලය අනිත්

කෙනෙකුට පේන තැනක ඔහුගේ ප්‍රසාදය වෙනස් වෙලා ජලය පෙනෙන්නේ නැති මට්ටමකට පත්වුනා. ජීවමාන පෙරේතයෙක් වෙන්න පුළුවන්කම තියෙනවා ප්‍රසාදය වෙනස් වුනොත්. කර්ම ශක්තිය වැඩිබව මත ප්‍රසාදය දිට්ඨධම්මවේදනීයව වෙන්ස්වූවොත් අපි කියනවා ඒ මනුස්සයා දිට්ඨධම්මවේදනීයව පෙරෙතයෙක් වෙනවා කියලා. ඇතැම් වෙලාවල් වලට ඒ දේවල් ලෝකය තුළ සිද්ධ වෙනවා.

මරණාසන්න මොහොතට යන කොට මේ තියන මට්ටමේ ප්‍රසාදයට වඩා මේ ප්‍රසාදය කර්ම ශක්තිය මත වෙනස් වෙන්වා. ඒයාට ගති නිමිති පහල වෙනවා. ඇතැම් අය ගින්දර එනවයි කියලා කෑගහනවා. ඒ දකින නිසාමයි කෑගහන්නේ. ඒ කෙනාට ඒ රූපය පෙනෙන නිසා, ඒක දකින නිසාමයි එසේ කියන්නේ. අපිට හැම වෙලාවකදීම අපි රූපයක් දකින තැන *"අවිජ්ජාසම්භූතානි වවත්ථේති "* කියන තැන ඇස සකස් කරගත්තේ යම් හේතු ටිකක් නිසා නම් ඒ ඇසේ හේතුවම පෙන්වනවා රූපයට. ඇස හදා ගත්තෙ අවිද්‍යාව නිසා, අවිද්‍යාය කිව්වේ නොදන්නකම නිසා. මොකක් නොදන්නකමද? ඇස ඉතුරු නැතුව හට ගෙන ඇස රූප දෙක නිරුද්ධ වුනා කියන කාරණාව නොදන්නාකම නිසා. දුක්ඛසත්‍යය පිළිසිඳ නොදන්නාකම නිසා ස්කන්ධ ටිකක් හට ගෙන ස්කන්ධ ටිකක ඉතුරු නැතිව නිරුද්ධවුණ තැනක අපි හදා ගත්ත ආශ්‍රව/කෙලෙස් කියල මේ දර්ශනෙයේ ඇත්ත නොදත්තකම නිසා . අවිද්‍යාව නිසා නැවත ඇස හදාගන්නවා. සතර මහා ධාතුව පැත්තේ රූපය විඳින්න පුළුවන් මනසක් හදා ගත්තේ රූපය නොපවතින තැනක. රූපය පවතිනව කියන සංඥව හදා ගන්න අවිද්‍යාව හේතු වුනා.

<u>ක්ෂණික ප්‍රතිසන්ධිය</u>

"ඛන්ධානං පාතුභාවෝ ආයතනානං පටිලාභෝ අයං වුච්චතා ආවුසෝ ජාති". සතර මහා ධාතුව පැත්තෙ අනාත්ම වර්ණ සටහනක් පෙනෙන තැනක ඇහැට 'අම්මා' කියලා ධාතුව පැත්තේ අම්මාව පෙන්වන මානසික මට්ටම නිසා / සතර මහා ධතුව පැත්තෙ සත්වයෝ පුද්ගලයෝ ඉන්නවාය කියන කාම භව සංඥාව නිසා අපිට කාම භවයේ ප්‍රතිසන්ධිය. ඒ කිව්වේ එක්ක්ෂණික ප්‍රතිසන්ධිය, ස්කන්ධයන්ගේ පහළ වීමක් ආයතනයන්ගේ නැවත ලැබීමක්. එතකොට ඇසේ නැවත හට ගැනීමක්. ඒ නැවත ඇසේ සකස් වීම කුමක් ප්‍රත්‍යයෙන්ද සිද්ධවුනේ රූපය සතර මහා ධාතුව පැත්තේ

තියෙනවා කියලා ධාතුව පැත්තෙන් රූපය විඳි අතීත අවිද්‍යාව නිසා තමයි අපිට ඇස නැවත හදා ගන්න හේතු වුනේ.

ඒ වාගෙම *"කම්මසම්භූතානි වවත්ථේති "* . හැම වෙලාවකම කර්මය නිසයි ඇස හැදුනේ. කර්මය නිසයි රූපය හැදුනේ. අපි සතර මහා ධතුව පැත්තෙ යම් මට්ටමකින් විඳින්න පුළුවන් කර්මයක්ද රැස් කලේ ඒ කර්මයේ මට්ටමට අපි විඳින්න බලාපොරොත්තු වුණ, කැමති වුණ කර්මයේ මට්ටමට තමයි ප්‍රසාදය සකස් කරලා දෙන්නේ. ඒ ප්‍රසාදය ඒ අනුව සකස් වෙනකොට ඒකට කියනවා *"කම්මසම්භූතානි වවත්ථේති "* . ඒ ප්‍රසාදය *"කම්මසම්භූතානි"* වෙනකොට ඒ ප්‍රසාදයට ගෝචර වෙන රූපයත් නම් කරනවා *"කම්මසම්භූතානි වවත්ථේති "*.

<u>සමාන අවිද්‍යාවක්</u>

එ වාගේමයි *"තණ්හාසම්භූතානි වවත්ථේති "* තණ්හාවෙන් හදපු දෙයක්. යම් මට්ටමකට බාහිරයට ඇති දේකට නම් තණ්හා කලේ අපි කැමති /අකමැති වස්තුවක් එළියේ තිබුනත් මේ කැමතිත්/අකමැතිත් කියන කාරණාව තුළ අපි ඇති කර ගත්ත සමාන අවිද්‍යාවක් තියෙනවා. ඒ තමයි එළියේ තියෙන දේට මම කැමති වුණත් එළියේ තියන දේට මම අකමැති වුණත් බාහිර ඇතිබවට ගෙනෙන ස්කන්ධ ටිකට මම කැමති කියලා. කැමති වුණ ස්කන්ධ ටික මතට ගෙනැල්ලා දීපු ටිකට අකමැති වෙන්න පුළුවන්. බාහිර වස්තුවක් මත අකමැතිබව හදා ගන්න පුළුවන්. හැබැයි ස්කන්ධ ටික මත නියෝජයන කරගත්ත, මත හදා ගත්ත උපාදානස්කන්ධ පංචකයක්. තමන් අකමැති දේටත් තණ්හා කරලා උපදින්නේ ඒ නිසා තමයි.

<u>රූප වෙනවා රූප ස්කන්ධ වෙන්නේ නැහැ</u>

අපි අකමැති මනුස්සයෙක් කියන තැනට ඇහැට එන ආනත්ම වර්ණ වටසටහනත් ඇස බිඳුනු තැනක වේදනා ,සංඥා ,සංඛාර විඤ්ඤාණය යන මේ පංචස්කන්ධය කියලා අපි කියනවා. මේ පංචස්කන්ධය හට ගත්ත තැනක අපි හිතෙන් අකමැති කෙනෙක් කියලා හිතෙන් හිතා ගන්න තැනක දැන් අකමැතිබව ඇහැට ආවේ නැහැ. අකමැති බවින් ඇස බිඳුනේ නැහැ. හැඳිනුවෙත් නැහැ. ඇස පිළිබඳව දැන ගත්තෙත් නැහැ. සම්පූර්ණවම පුරාණ ආශ්‍රව ටිකක් මත අපි අකමැති බවක් හදා ගත්තා. අකමැතිබව නිර්මාණය කර

ගත්තා ආශ්‍රව ටිකක මත. ඒ ආශ්‍රව ටිකක් මත හදා ගත්ත අකමැති පුද්ගලයා කියන රූපය රූපස්කන්ධය නෙමෙයි. ඒක රූපය. ඔතනදී අපි සම්බන්ධ කර ගත්තොත් යමකප්‍රකරණයේ එන බන්ධ යමකය. එතනදී පෙන්වනවා ප්‍රිය රූපය , සාත රූපය රූප වෙනවා රූප ස්කන්ධ වෙන්නේ නැහැ'. ඒත් රූප ස්කන්ධය 'රූපත් වෙනවා රූප ස්කන්ධයත් වෙනවා' කියලා.

<u>රූප ස්කන්ධය , රූප උපාදානස්කන්ධය</u>

එතනදී විග්‍රහ කලේ ප්‍රිය රූපය සාත රූපය කියන කොට අපි කැමති සැප ගෙන දෙනවා කියල. හිතන්නේ 'රූපය' මිසක 'රූප ස්කන්ධය' නොවෙයි. රූප ස්කන්ධය කියන කොට සතර මහා ධාතුත්, උපාදාය රූපයත් කියන මට්ටම මිසක රූප ස්කන්ධය තුළ ප්‍රිය මනාප බවක් හෝ අප්‍රිය අමනාප බවක් නැහැ. ඒ වාගේම තමයි රූප උපාදානස්කන්ධය මට්ටමට යන කොට හැම වෙලාවකම රූපය එක්කෝ ප්‍රියයි එක්කෝ අප්‍රියයි එක්කෝ උපේක්ෂා සහගත මට්ටමින් අපිට පෙනී ඉඳලා තියෙනවා. ඒ එළියේ තියෙනවා කියලා හිතපු රූපය ගැන. හැබැයි ඒ මොහොත වෙන විට රූපය ඉතුරු නැතිව නිරුද්ධ වෙලා.

රළුවශයෙන් තේරුම් ගන්න පුළුවන් හැටියට කිව්වොත් රූපය ඉතුරු නැතිව නිරුද්ධවුණ තැනක අපි ස්කන්ධ හතරකින් ස්කන්ධ පහක් නියෝජනය කරන තැන තමයි පංච උපාදාන ස්කන්ධය කියලා කියන්නේ. රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ කියන් ස්කන්ධ පහ හට ගෙන නිරුද්ධවුනාට පස්සේ අපි වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ කියන මේ නාම ධර්මතා ටික ඇති තැනක, නාම ධර්මතා හතරේ නියෝජනයෙන් සම්පූර්ණයෙන් බාහිරව ඉන්නවා කියලා 'අම්මාව' නියෝජයනය කර ගන්නවා. ඇත්ත වශයෙන්ම අම්මාව හදා ගන්න මට්ටම කෙන කෙනාගේ මනස තුළ රැස් කර සකස් කර ගත්ත ආශ්‍රව මත උපද්දපු 'අම්මා'. ඒ නිසා තමා අර නිරුද්ද උනත් ඒ රූපස්ඛන්ධය සාසවා කියන නමින් හඳුන්වන්නේ. පසුව ඇතිකර ගත් ආශ්‍රවයනට අරමුණක් වූ නිසා. ඒ විදියට ගත්තාම අපිට පෙනෙනවා පෘථජ්ජනයා ඇසුරු කරන්නේම සාසව උපාදානීය හා ආසව හා උපාදාන යෙදුනාවූද ස්ඛන්ධ සමූහයක් බව.

අපි තණ්හා කලේ ඇත්තටම අපේම මනසට

දැන් මේ අම්මා කියන රූපය සම්පූර්ණව ස්කන්ධ හතරක් ඇති තැනක ස්කන්ධ පහක් පිළිබඳව කරන නියෝජනයක්. ඒක නිසයි ඒක වැරදි. ස්කන්ධ හතරක් ඇති තැනක ස්කන්ධ පහක් පවතින බව නොදන්න කම නිසා අපි රූපය පිළිබඳව නිශ්චයකට පැමිණිලා තියෙනවා. ඒ රූපය පිළිබඳව නිශ්චයකට පැමිණුන ඒ අවිද්‍යාව තමයි අපිට හෙතු වුනේ අම්මාව විඳින්න පුළුවන් විදියට අම්මා සකස් කරන්න. අම්මා සතර මහා ධාතුවේ ඉන්නවා කියලා දැන ගත්ත අවිද්‍යාව හේතු වුනා සතර මහා ධාතුවේ විඳින්න පුළුවන් විදියට ඇස නැවත සකස් කරන්න. ඒ ඇස තනියම නිකම්ම හැදිලා නැහැ. ඇස හැදෙනවා නම් අනිවාර්යෙන්ම රූපය හැදෙනවා. ඇස පෙන්වූවා නම් කර්මයෙන් හැදෙනවා කියලා, තණ්හාවෙන් හැදෙනවා කියලා අපි තණ්හා කලේ හැමවිටම අපිට බාහිරෙන් පෙනුනාට අම්මාට තණ්හා කළා කියලා ඒක වැරදියි. අපි තණ්හා කලේ ඇත්තටම අම්මා කියන බව හදලා දුන්න අපේම මනසට.

අම්මාව ඉදිරිපත් කලේ යම් ආශ්‍රව ටිකක් නම්, ආශ්‍රව ටිකක් පදනම් කර ගෙන අපි හැම වෙලාවකදීම අම්මාට ආදරෙයි කියලා, අම්මාට කැමතියි කියලා අපි ආශා කරන්නේ අන්න ඔය ස්කන්ධ ධර්මතා ටිකට. ඒ ස්කන්ධ ටිකට තියෙන තණ්හාව අපිට පෙන්නේ නැහැ. ඒ නොපෙනෙන නිසා ඒ ස්කන්ධ ටිකේ පවතින තණ්හාව හේතු වුනා සසර පැවැත්මක් අරගෙන දෙන්න. ඒ තණ්හාව හේතු වුනා නැවත ඇහැක් හදන්න. තණ්හාව හේතුවෙන් නැවත සතර මහා ධාතුව පැත්තෙන් ඇස හදන්න හේතු වෙනවා කියන කොටම ඒ හා අනුරූපව රූපය හදන්නත් හේතු වෙනවාමයි. ඒ නිසා ඇහැත් රූපයත් දෙකම *"තණ්හාසම්භූතන්ති වවත්ථේති"* වෙනවා.

ඇසේ නිරෝධයම ආහාරයන්ගේ නිරෝධයක්

ඊට පස්සේ "*ආහාරසම්භූතන්ති වවත්ථේති*" අහාරය නිසයි හට ගන්නේ. අපි කලින් දේශනාව තුළ සාකච්ඡා කළා ඇස කොහොමද ආහාරයෙන් හට ගන්නේ කියලා. ඇස හදන්න හේතුවුණ රූපය පැත්ත ගත්තාම එතන තියෙනවා කබලිංකාර ආහාරය කියන කොටස. සතර මහා ධාතු පැත්ත සකස් කරන්න නියෝජනය වෙන්නේ කබලිංකාර ආහාරය හැම විටකම. ස්පර්ශ ආහාරය, මනෝසංචේතනා ආහාරය , විඤ්ඤාණ ආහාරය කියන නාම ධර්මතා ටිකත් හේතු වුනා ඇස හදලා දෙන්න. මොකද ස්පර්ශයේ

ඇත්ත නොදන්නකම නිසා මනෝසංචේතනාවෙන් රැස් කර ගත්තේ යම් මට්ටමකටද ඒ මනෝසංචේතනාවෙන් රැස් කර ගත්ත මට්ටමට අපිට ගෙනැල්ලා දුන්නා විඤ්ඤාණ ආහාරයට රූපය පිළිබඳ දැනුමක්. කෙටියෙන්ම කිවොත් සතර ආහාරය පිළිසිඳ නොදැක්ම හේතු වුනා අපිට නැවත ඇස හදලා දෙන්න. ඇසේ පැවැත්මම කියන්නේ සතර ආහාරයක පැවැත්මක්. ඇසේ නිරෝධයම ආහාරයන්ගේ නිරෝධයක්. අපිට මේක තමයි සාක්ෂාත් කරන්න ඕනේ තැන. *"ආහාරසම්භූතන්ති වවත්ථේති "* කියන කොට අපිට දකිනන වෙනවා ඇස කොහොමද ආහාරයන්ගෙන් හට ගන්නේ කියලා. ඇස ආහාරයෙන් හට ගත්තා කියන ලක්ෂණය අපි දකින්න පුරුදු වුනොත්, එසේ බැලුවොත් අපිට ලොකු කෙලෙස් මට්මක් එයින් දුරු කර ගන්න හැකි වෙනවා. මොකද අපි ආහාරය ආහාරය හැටියට නොදන්නාකම නිසයි කබලිංකාර ආහාරය ඉතුරු නැතිව නැති වුණ තැනක අපි කබලිංකාර ආහාරය පිළිබඳව අපි රූප සංඥාවන්ගෙන් ඇසුරු කරන්නේ. කබලිංකාර ආහාරය පෙන්වන්නේ *"ඕජට්ඨමකං රූප කළාපං ආහාරඨිති ආහාරෝ"* ඕජාව අටවෙනි කොට ඇති රූප කාලාප ගෙන එන නිසා ආහාරය කියලා කියනවා.

<u>ආහාරය හැටියට දකින්න ඔය රූප කළාප ඇති කරන මට්ටම</u>

මොනවාද ඕජට්ඨමක රූප කළාප ගෙනැල්ලා දෙන්නේ ? පඨවි, ආපෝ, තේජෝ, වායෝ, වණ්ණ, ගන්ධ, රස, ඕජා කියන මට්ටම. කබලිංකාර ආහාරය කියන කොට දකින්න එපා බත්, පාන්, කවුපි, මුං ඇට කියන ස්වාභාවය කියලා. කබලිංකාර ආහාරය කියලා කියන්නේ එය අපිට ආහාරය කියන මට්ටමෙන් ලැබෙන නිසා නෙමෙයි. මේ රූප කළාප සකස් කරගන්න යම් හේතුවක් වෙනවාද යම් ප්‍රත්‍යයක් වෙනවාද අන්න ඒ අර්ථයෙන් විතරයි අපි කබලිංකාර ආහාරය කියලා කියන්නේ. මොකද බත්, පාන්, කවුපි, මුං ඇට කෑවා කියලා අපේ ඇඟේ බත්, පාන්, කවුපි, මුං ඇට සකස් වෙන්නේ නැහැ. ඒ වාගේම තමයි ඒ බත්, පාන්, කවුපි, මුං ඇට කෑවාම අපි ඒ අරඹයා එතන තිබුන ඕජා ස්වභාවය අරගෙන මෙතන ප්‍රසාද මට්ටම තමයි සකස් කරගන්නේ. සතර මහා ධාතු පැත්ත රූප කළාප තමයි සකස් කර ගන්නේ. ඒ සතර මහා ධාතු පැත්තෙන් අපි ඕජට්ඨමක රූප කළාප ගෙනැල්ලා දෙන නිසා ආහාරය කියන කොට ආහාරය හැටියට දකින්න ඔය රූප කළාප ඇති කරන මට්ටම. ඒක දකින්න එපා බත්, පාන්, කවුපි, මුං ඇට මට්ටමෙන්ම. අපි කතා කරන කොට කරුණු අවබෝධ කර ගැනීමට ඒ

මට්ටම කතා කරන්න වෙනවා මොකද ඒ දේ ගන්න නිසා තමයි මේ දේවල්වල වැඩීමක් පෙන්නේ. නමුත් හැම වෙලාවකදීම කබලිංකාර ආහාරය කියන තැන ප්‍රත්‍ය වෙන්නේම, ආහාරයක් වෙන්නේම මෙන්න මේ රූප කළාප ගෙනැල්ලා දෙන මට්ටමින්.

ඒ කබලිංකාර ආහාරය ස්පර්ශ ආහාරයට ආහාර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය වෙන්නේ කොහොමද? කබලිංකාර ආහාරය කෙලිනම ස්පර්ශ ආහාරයට ආහාර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය වෙන්නේ නැහැ. මේ පැත්තේ ඇසේ ප්‍රසාදය සකස් කරන මට්ටමෙන් සතර මහා ධාතු සකස් කරන මට්ටමට ඇවිල්ලා ඇස සකස් කරන මට්ටමින් එතනදී උපකාර කරලා තියෙනවා ආහාර පත්‍යයෙන් ප්‍රත්‍ය වීමට. එහා පැත්තෙන් රූපය සකස් කරන මට්ටමිනුත් සකස් කරලා තියෙනවා. කබලිංකාර ආහාරය ආහාර වුනා ස්පර්ශ ආහාරයට ආයතන ටික හදන පැත්තෙන්.

ඊට පස්සේ ස්පර්ශ ආහාරය ප්‍රත්‍ය වෙනවා මනෝසංචේතනා ආහාරයට. නිකම්ම නෙමෙයි, ස්පර්ශය නිසා හට ගන්නව වේදනා, සංඥා දෙකක්. වේදනා, සංඥා දෙකේ ගති ටික තමයි මනෝසංචේතනාවෙන් ගෝචර කර ගන්නේ. මනෝසංචේතනාවෙන් ආහාරයට ගන්නේ වේදනා, සංඥා කියන ගති දෙක. කෙලින්ම ස්පර්ශය නෙමෙයි. ඊට පස්සේ මනෝසංචේතනාවෙන් ත්‍රිවිධ භවය සකස් කරනවා. ත්‍රිවිධ භවය සකස් කරාට පස්සේ විඤ්ඤාණ ආහාරයෙන් ගෝචර කර ගන්නේ මේ ත්‍රිවිධ භවය කියන මට්ටම.

<u>ආහාර චක්‍රයක් ක්‍රියාත්මක වෙන්නේ.</u>

භාවෙක් වගේ සතෙක් තණකොළ ආහාරයට ගන්නවා. භාවා ගිහිල්ලා තණකොළ කෑවාට භාවාගේ ඇඟේ තණකොළ හැදුනේ නැහැ. භාවාගේ ඇඟේ තියෙන ඒ ඒ අංග විතරයි හැදුනේ. දැන් භාවාව ගොදුරු කර ගත්තොත් නරියෙක්, ඒ නරියට ඊට පස්සේ භාවාගේ වගේ ඇඟක් හට ගන්නේ නැහැ. මේක ඒයාට ආහාර ප්‍රත්‍යයෙන් සකස් වෙන්නේ එයාගේ ලඟ තියෙන අංග ටික. දැන් ඒ නරියාව ගෝචර කර ගන්නවා කොටියෙක්. ඒක නිසා දැන් කොටියගේ කවදාවත් නරියාගේ අංග හැදේන්නේ නැහැ. කොටියාගේ හැදෙන්නේ එයාගේ තියන දේවල් විතරයි. කොටියාව ගෝචර කර

ගත්තොත් සිංහයෙක්, එවිට සිංහයා සිංහයාගේ ලක්ෂණ ටික හදා ගන්නවා කොටියාගේ ලක්ෂණ නැතුව. දැන් මේ උදාහරණ චක්‍රය මඟින් බලන්න හැම වෙලාවකදීම තණකොළ ටික කාලා හාවා අංගප්‍රත්‍ය ටික හදා ගත්තා වාගේ කබලිංකාර ආහාරය ප්‍රත්‍ය කර ගත්ත හැම වෙලාවකදීම ස්පර්ශ ආහාරය කබලිංකාර ආහාරයට ප්‍රත්‍ය වුනා.

ප්‍රත්‍යවීම තුළ ස්පර්ශ ආහාරයට අදාල ලක්ෂණ ටික හැදුනා මිසක කබලිංකාර ආහාරයේ පැවැත්ම නෙමෙයි ස්පර්ශය කියලා කියන්නෙ. කබලිංකාර ආහාර ප්‍රත්‍යයෙන් ආහාර ටික සකස් කළා සකස් වුනා ආයතනයන්ට පටිඝ සම්පස්සයෙන් සම්ඵස්සයක් සිද්ධ වුනා. ස්පර්ශයක් සිද්ධ වුනා. මේක ආහාරමය සිද්ධියක්. ස්පර්ශ ආහාරයෙන් ආහාර කර ගත්තේ හැම වේලාවකමදිම අතන තිබුන ආයතන පැත්තෙන් විතරයි. *"චක්ඛුං ච පටිච්ච රූපේච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං තිණ්ණං සංගති ඵස්සො"* , මේ තුන් දෙනාගේ එකතුවයි කියපු තැන.

ඊට පස්සේ ස්පර්ශ අහාරයෙන් හාවා හදා ගත්තේ ඒයාගේ ඇඟේ තියන ටික වගේ එයා හදා ගත්තා වේදනා, සංඥා කියන එයාගේ ගති ටික. එයා නැවත රූපය පැත්තක හදන්න ගියේ නැහැ. එයා හැදුවේ වේදනා, සංඥා කියන ගති ස්වාභාවයක් විතරයි. වේදනා, සංඥා කියන ගති ටිකට අනුව එයාගේ මනෝ සංචේතනාව එයාගේ ගති ටිකකුත් හදා ගත්තා. සතර මාහා ධාතුව රූපය පැත්ත එයාට අදාල වුනේම නැහැ. එයා හදා ගත්තේ මනෝ සංචේතනාව අනුව ගිය ධර්මතා ටික. මනෝ සංචේතනා ආහාරය වේදනා, සංඥා දෙක ආහාර කර ගත්තා. ආහාර කර ගෙන එයා හදා ගත්තා එයාගේ කාරණා ටික. එයා හදා ගත්තේ ත්‍රිවිධ භවය.

නැවත සතර මහා ධාතුව පැත්තේ රූපය තියෙනවා කියලා හිතන මානසික මට්ටම නම් එයා කාම භවය සකස් කර ගත්තා ඊට පස්සේ පුද්ගල බව රූපය පිළිබඳව නාම ධර්මතා ටික ආශ්‍රයෙන් දකින බව සතර මහා ධාතුව පැත්තේ නොදකින බව එයා රූප භවය ගොඩ නඟා ගත්තා. ඒවාගේම නාම ධර්මතා ටිකේ පිහිටා සිටින මට්ටමෙන් එයා ගොඩනඟා ගත්තා අරූප භවය. දැන් ඔන්න ඔය ලෙස ත්‍රිවිධ භවය ගොඩනඟා ගත්තා.

ත්‍රිවිධ භවය ගොඩනඟා ගත්ත තැනක විඤ්ඤාණය සකස් වුනා. ඒ කාම භවය අනුව සකස් වුනා නම් ඒ කාම භවය අනුව සකස් වුණ විඤ්ඤාණයක් එයාට පහළ කර ගත්තා. ඒ ලෙසටම රූප හා අරූප භවය අනුව ගියපු විඤ්ඤාණක් සකස් කර ගන්න පුළුවන් කමක් තිබුනා මොකද කබලිංකාර ආහාරය ප්‍රත්‍යයෙන් නියෝජයන කරපු ධර්මතාවය අනුව ප්‍රතිචාර දක්වපු ක්‍රම තුනක්. මේ ක්‍රම තුන අනුව ඒයාට ඉලඟට ආපහු ආහාරය හදා ගන්න පැත්තෙන්/එහා පැත්තෙන්, ආයතන සකස් කරන පැත්තට, නැවත හෙතුවක් වෙනවා. මේ විඤ්ඤාණ ආහාරය නැවත් හේතුවක් වෙනවා එහා පැත්තෙන් ආපහු සතර මහා ධාතුවෙන් විඳින පැත්තට ගිහිල්ලා කබලිංකාර ආහාරය සකස් කර ගන්න පැත්තට නැවත හේතුවක් වෙනවා. මෙන්න මේ කියන ආහාර චක්‍රයක් ක්‍රියාත්මක වෙන්නේ.

අපිට රූපය හම්බ වෙන්නේ හැම වෙලාවකදීම ඔය කබලිංකාර ආහාර ප්‍රත්‍ය ඉතුරු නැතුව නිරුද්ධ වෙලා ස්පර්ශ ආහාරයත් ඉතුරු නැතුව නිරුද්ධ වෙලා මනෝ සංචේතනා ආහාරය හට ගෙන, මනෝ සංචේතනා ආහාරය ඉතුරු නැතිව නැති වන මොහොතේ දී තමයි අපිට විඤ්ඤාණ ආහාරය හදා ගන්න තැනදී. මේ ආහාර ටිකේම කෘත්‍ය තමයි. රූපයක් පේනවා කියන මටම හදලා දීම. ත්‍රිවිධ භවය ගෙනැල්ලා දීලා භවය අනුව සකස් කර ගත්ත විඤ්ඤාණය කියලා කියන කොට දැන් මේ පූර්ණ වශයෙන්ම අපි විඳින්නේ මොකද්ද? සතර ආහාරයේ පැවැත්ම කියන තැන.

ඒකයි මුලින්ම මතක් කලේ අපි ආහාරයන්ගේ පැවැත තියෙන්නේ! අපේ ජීවිතය සම්පූර්ණ සතර ආහාරයක පැවැත්ම කියන තැන. ඇහැට රූපයක් ගැටෙනවා කියන තැන, අපි රූපය දැන ගන්නවා කියන තැන තිබිලා තියෙන්නේ වෙන මොකක්වත් නෙමෙයි සතර ආහාරයේ පැවැත්මක්. අපිට දකින රූප එළියේ පැත්තේම තියෙනවා කියලා හිතලා තියෙන්නේ ආහාර තුනක් අපේ ජීවිතය වුණ මට්ටමක අපිට කබලිංකාර ආහාරය කෙනෙක් පුද්ගලයෙක් හැටියට දැකපු මානසික මට්ටම. ඒක බොහොම වැදගත් කාරණාවක්.

අපි ඇත්තටම අපේ ජීවිතය පවතින්නේ අපි ජීවත් වෙනවා කියන තැන පුද්ගල බව පනවන්න උත්සහාවත් වෙන්නේ ආහාර තුනක පැවැත්මක් නිසා. ස්පර්ශයත්, මනෝ

සංචෙතනාවත් , විඤ්ඤනය කියන මෙ ආහාර තුනක පැවැත්ම. මෙ ආහාර තුනක පැවැත්ම ආහාර තුනක් හැටියට නොදන්නකම නිසා මේ හිතේ තියන ගති ටික බාහිර සතර මහා ධාතුව පැත්තට දාල විඳිනකම තමයි හැම වෙලාවකම අපේ අද තියෙන මනස.

<u>උපාදානස්කන්ධ පංචකයත්, ස්කන්ධ පංචකයත්</u>

මේ ස්පර්ශ ආහාර, මනෝ සංචේතනා ආහාර, විඤ්ඤාණ ආහාර කියන මේ ආහාර තුනේ පැවැත්ම අද අපිට හම්බ වෙන්නේ රූපය පැත්තෙන්. අපිට පෙන්නේ ගොඩක් කල් දැකළා තියපු රූපය දකිනවා කියලා. සතර මහා ධතුව පැත්තට. අපේ ජීවිතය කියන්නේ මේ සතර ආහාරයකම පැවැත්මක්. සිතක් සිතක් පාසා අද තියෙන සතර ආහාරයේම පැවැත්මක්. ස්කන්ධ ටිකේ පැවැත්ම ගත්තාට පස්සේ යථාභූත ස්වභාවය තමයි සතර මාහා ධාතුව ඇති තැනක නාම ධර්මතා ටිකක් පැවැත්වූවා කියන තැනක. උපාදාන පංචකයේ ස්වාභාවය තමයි හැම විටම මේ ස්පර්ශය අරඹයා මනෝ සංචේතනා හා විඤ්ඤාණ ආහාරයක පැවැත්ම. අපිට උපාදාන ස්කන්ධ පංචකයත්, ස්කන්ධ පංචකයත් කියන කාරණා සංග්‍රහ කර ගන්න පුළුවන්කම තියෙනවා ආහාර පරියායෙන්.

පොදුවේ මෙ ආහාර හතරම යෙදෙන තැනකට කියනවා ස්කන්ධ පංචකයක් කියලා. මේ ස්කන්ධ පංචකයක් ඇති තැනක අපි උපාදාන ස්කන්ධ පංචකය හදා ගන්න තැනට අපි කතා කරනවා අර ස්පර්ශ ප්‍රත්‍යයෙන් හදා ගත්ත මනෝ සංචේතනාවත් විඤ්ඤාණයත් කියන මේ ආහාර තුන තුළ, අපි ත්‍රිවිධ භවය අනුව සතර මාහා ධාතුව තුළ රූපය දකිනවා, රූපය තියෙනවා කියන මානසික මට්ටමට තමයි පංච උපාදාන ස්කන්ධ මට්ටම කියන්නේ. අන්න ඔය ආහාර පිළිසිඳ නොදන්නාකම හේතුයි අපිට නැවත ඇස හදලා දෙන්න. ඒනිසා රූපය හම්බ වෙන මනස අපි දකින කොට *"රූපා ආහාර සම්භූතාති වවත්ථේති"* ආහාරය නිසා හදපු දෙයක් කියලා හොඳට ව්‍යාසවස්ථාපනය කරගන්න කියලා කියනවා.

එවාගේම ඊලඟට *"රූපා චතුන්නං මහාභූතානං උපාදායාති වවත්ථේති "* -රූපය සතර මහාධාතු නිසා හදා ගත්ත උපදාය රූපය හැටියට ව්‍යාසවස්ථාපනය කරගන්න. ඒ සතර

මහා ධාතුව නිසා පවත්නා උපාදාය රූපය හැටිය ව්‍යාසවස්ථාපනය කරගන්න කියන තැනදි කොයි වෙලාවකදීවත් දකින්න එපා බාහිර පැත්තේ ගස් ගල් වූ රූප, මනුෂ්‍ය වූ රූප, දේව බ්‍රහ්ම රූප. සතර මහා ධාතුවත් උපාදාය රූපයත් නිසා පවත්නා මට්ටමක් කියලා කියන කොට කොයි වෙලාවකදීවත් ඒ සතර මහා ධාතුව තුළ තිබුනේ නැහැ මනුෂ්‍යවූ සතර මාහා ධාතු , මනුෂ්‍යවූ උපාදාය රූප, අමනුෂ්‍යවූ උපාදාය රූප තිබුනේ නැහැ. සප්‍රාණ අප්‍රාණ සතර මහා ධාතු තිබුනේ නැහැ.

ධාතුව ධාතුව විදියට පැවතුන තැනක උපාදාය රූප උපාදාය රූප විදියට පැවතුන තැනක අපි පුද්ගලබව හදා ගත්ත තැන කියන කාරණාව හොඳට මෙ තුළ අවබෝධ කර ගන්න. අන්න ඒ නිසා තමයි *"චක්ඛු චතුන්නං මහාභූතානං උපාදායාති වවත්ථේති .....රූපා චතුන්නං මහාභූතානං උපාදායාති වවත්ථේති "* ඇස සතර මාහා ධාතුවේ උපාදාය යැයි ව්‍යවස්ථාපනය කර ගන්න. රූපය සතර මාහා ධාතුවේ උපාදාය යැයි ව්‍යවස්ථාපනය කර ගන්න.

<u>ඇස මම අවිද්‍යාවෙන් හදාගත්තා නෙවෙයි.</u>

දැන් බොහොම වැදගත් වෙනවා උපාදාය රූපය හැටියට ඇහැත් රූපයත් ව්‍යවස්ථාපනය කරගන්න . අපිට මේ කාරණාව හොඳට පිරිසිඳ දකින්න වැදගත් වෙනවා. මොකද්ද? අපිට අපේ ජීවිතයේ ජීවත්වෙන තැනක ඇත්තටම තියන යථාර්ථය අවබොද කරගන්න. එයටයි මේ කාරණාව ඍජුවම අපිට උපකාර කරන්නේ. මුලින්ම මතක් කරපු අපිට ජීවිතය තුළ මේ කියන කාරණාව පේන්න ඕන අපේ ප්‍රතිපදාව කියලා.

ඇස අවිද්‍යාවෙන් හැදුනේ කොහොමද? කියන කාරණාව ඔය පිංවතුන් ව්‍යවස්ථාපනය කරගන්න යන කොට ඇස අවිද්‍යාවෙන් සකස් උන ආකාරය ව්‍යවස්ථාපනය කරගන්න එක තුළ "මේ මම" ඇස අවිද්‍යාවෙන් හදාගත්තා කියන මට්ටමකට එන්න එපා. ඇස මම අවිද්‍යාවෙන් හදාගත්තා නෙවෙයි. ඇස කියන එක හදාගත්ත ලක්ෂණයමයි ඇත්ත නොදන්නකම මයි හේතු උනේ ඇස හදාගන්න. මේ ඇස හදාගෙන මේ රූපය විඳින සිද්ධාන්තයෙන් තොරව තමන්ව දකින්න එපා. තමන්ගෙන් තොරව ඇස හදාගන්න මට්ටම දකින්න එපා. මේ තුළ අවබොධ කරගන්න සලායතන

නිරෝධය කියන පැත්තට. තමන්ගේ මනස බැසගන්න විදිහට නුවන පවත්වන්න. ඇහෙන් තොරව තමන්වත් තමන්ගෙන් තොරව ඇහැත් නොපවතින මට්ටමකට හිත ගන්න. ඒක තමයි වැදගත් වෙන්නේ.

අපිට දැන් මනිසිකාරය පවත්වන්න උත්සහාවත් වෙන්නේ මම බාහිර තියෙන රූප දකින තැනක මේ බාහිර රූපය අවිද්‍යාවෙන් හැදුවා, මේ එළියේ තියෙන ගහ අවිද්‍යාවෙන් උපද්දපු දෙයක්, තණ්හාවෙන් උපද්දපු දෙයක් , කර්මයෙන් උපද්දපු දෙයක් කියලා බාහිර එළියේ තියෙන රූපායතනය ගැන අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාර කියන ලක්ෂණයන්ගෙන් ඉපැද්දුවා කියලා දකින්න එපා. මේ ඇස උපදින සිද්ධියම තමයි තමන්ගේ උපදීම වුනේ. තමන්ගේ උපදීමම තමයි ඇස උපදින සිද්ධිය වුනේ. ඇහෙන් තොරව තමනුත් තමන්ගෙන් තොරව ඇහැතුත් දකින්න එපා. එතකොට ලෝකේ පුද්ගලබව පිහිටා හිටින්න තැනක් දෙන්නේ නැතුව මෙතන තියෙන යථාභූත ස්වභාවය දකින්න.

<u>හෙතු ඵල දහමක පැවැත්මක්</u>

මේ කතා කලේ පටිච්චසමුප්පාද න්‍යාය තව පැත්තකින් ගත්තාම. අවිද්‍යා, සංඛාර , තණ්හා, උපාදාන, භව කියන කාරණා ටික නිසා විඤ්ඤාණ , නාමරූප, සලායතන, ඵස්ස, වේදනා කියන මේ ධර්මතා ටික හැදුනා. මේකේ විපාකය විපාකය හැටියට නොදන්නාකම නිසා නැවත මේ විපාකය නොදන්නා අවිද්‍යා, සංඛාර , තණ්හා, උපාදාන, භව කියන ටික හෙතු වුනා අනාගතයේ විඤ්ඤාණ , නාමරූප, සලායතන, ඵස්ස, වේදනා කියන අනාගත ඵල පංචකයක් හදලා දෙන්න. දැන් හෙතු ඵල දහමක පැවැත්මක් මීසක කවදාවත් සත්ව පුද්ගල සංඥාවක්/ස්වාභාවයක් නොවෙයි කියලා හොඳට මේ කියන කාරණාව අවබෝධ කර ගන්න.

මේ කතා කරන්නේ ජීවිතයෙන් පරිභාහිර වූ ධර්මතාවයක් නෙමෙයි. අපි ජීවත්වන තැන තුළ තියෙන ඇත්ත. මේ පුද්ගලයා ජීවත් වෙනවා කියලා කියන්නේ මෙ ධර්මතා ටිකේ හට ගැනීම. මේ මොහොතේ ඇස හට ගත්තා කියන්නේම *"අත්තභාව පරියාපන්න"* ලෙස මේ පුද්ගලභාවය හදා ගත්තා. මෙ මොහොතෙම ඇස නිරුද්ධ වුනා කියෙන්නේම පුද්ගලබව නිරුද්ධ වුනා.

දැන් ඇහැත් නිරුද්ධ වෙලා පුද්ගලබවත් නිරුද්ධ වෙලා කියන මට්ටම හොඳට ප්‍රත්‍යක්ෂ කර ගන්න. ඒ ඒ ආයතන ඒ ඒ මොහොතේ හට ගෙන ඉතුරු නැතුව නිරුද්ධයි කියන බව සාක්ෂාත් කළා නම් ඔබට ගස්, ගල්, ගෙවල් කියලා බාහිර

රූපයක පැවැත්මක් හම්බ වෙන්නේ නැති වෙයි. ඒවාගේම ඒ බාහිර රූපය විඳින පුද්ගලයෙක් හමු වෙන්නේ නැති වෙයි. ඒවාගේම පවතින ස්කන්ධ ටිකක හම්බ වෙන්නේ නැති වෙයි. පවතින පටිච්චසමුප්පන්න ස්වභාවයක් හමු වෙන්නේ නැති වෙයි. හෙතු ඵල දහමක පැවැත්මක් මිසක කොයි වෙලාවකවත් වෙනත් කාරණා ටිකක් නැහැ.

මේ ධර්මතාව *"ඉමස්මිං සති ඉදං හෝති"* ඇති කල්හි මෙය හට ගත්තා. ඒවාගේම *"ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති",* මේ හේතුවේ හටගැනීමෙන් මේ ඵලය හටගත්තා" *"ඉමස්මිං අසති ඉදං න හෝති"* මෙය නැති කල්හි මෙය නොවේ. *ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ජති' මේ හේතු නිරුද්ධ වීමෙන් ඵලය නිරුද්ද වේ.* කියන ඉදපච්චයතා පටිච්චසමුප්පාදය අනුව අපට තේරුම් ගත හැකියි.

<u>අනුප්පාදය නිවන</u>

එනම් හේතු ටික ඇති කල්හි ඇස තිබුනා. ඒ හේතුන්ගේ ඉපදීමෙන් ඇසේ ඉපදීම උනා. ඒ වගේම හේතු නොවීනම් ඇසේ වීමක් නැහැ. හේතු නිරෝධයෙන් ඇසේ නිරෝධය වුනේ මෙන්න මේ විදියටමයි. ඇහෙන් තොරව තවත් රූප විඳින පුද්ගලයෙක් හිටියා නෙමෙයි. ඇහැත් එක්කම හට ගත්තා නම් ඇස ඉතුරු නැතිව නිරුද්ධ වෙන කොටම නිරුද්ධ වුනා නම්, කන පෙර නොතිබී හට ගෙන ඉතුරු නැතිව නිරුද්ධ වුනා නම්, ඒ ඒ ආයතන ඒ ඒ මොහොතේ නිරුද්ධ වුනා නම් අපි දැන් මම කියලා කතා කරන්නේ මොන මොහොතේ තිබුන ස්ඛන්ධ ටිකකට ද? රූපය කියලා කතා කරන්නේ , ගස්,ගල් කියලා කතා කරන්නේ මොන වෙලාවේ හට ගත් ස්කන්ධ ටිකකටද? මොන වෙලාවේ ඇහැට ආපු වර්ණ සටහනකටද?

අපට පනවන්න තැනක් නැති වෙයි. අනුප්පාද බව නිවන මිසක ඉපදුන ධර්මතාවයන් පිළිබඳ පැවැත්ම කියන කාරණය නිවන නෙමෙයි. ඉපදුන දේ නැති බවත් ඉපදුන දේ කැමැත්ත ඉශ්ඨ නොකරන බවත් යන මේ හැම දෙයක්ම ඇති සංකල්පය මත පනවන දේ. හැබැයි හොඳට මතක තියා ගන්න අවශ්‍ය දේ තමයි අනුප්පාදය නිවන කියන කාරණාව. ඒක තමයි අපි තේරුම් ගන්න අවශ්යම තැන. අද දවසේදී අපි සාකච්ඡා කරන්නට යෙදුනේ ඇස කතා කළ පරියායටම අනුව අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාර කියන ටිකමයි රූපයට පෙන්වන්නේ මොකද ඇහෙන් තොරව රූපයක් පෙන්වන්න බැරි නිසා.

පුණ්‍යානුමෝදනාව.

සාධු ! සාධු !! සාධු !!!

5 පරිච්ඡේදය

අනුත්පාදය තමයි නිවන

නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස////

ශ්‍රද්ධා සම්පන්න කාරුණික පින්වතුනි, පසුගිය වාරය තුළ අපි සාකච්ඡා කළා ඇස හා රූපය ව්‍යවස්ථාපනය කර ගන්න ආකාරයෙන් කොටසක් පිළිබඳව. අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාර කියන කාරණාවන් නිසා ඇස හට ගත්තා කියන එක. *"අවිජ්ජාසම්භූතාති වවත්ථේති, කම්මසම්භූතාති වවත්ථේති ,තණ්හාසම්භූතාති වවත්ථේති ,ආහාරසම්භූතාති වවත්ථේති "* කියන කරණා. ඒවාගේම *"චතුන්නං මහාභූතානං උපාදායාති වවත්ථේති "* සතර මහා ධාතුවත් සතව මහා ධාතුවත් නිසා පවත්නා උපාදාය රූපයත් නිසා ඇස හදා ගත්තා කියන එක ව්‍යවස්ථාපනය කර ගන්න විදිය ගැන සාකච්ඡා කළා.

<u>ඉපදුන කල්හිම ඇස දකින්න කියනවා</u>

අද කතා කරනවා *"චක්ඛුං උප්පන්නනන්ති වවත්ථේති "* ඇස කියන්නේ උපන්න දෙයක්. ඒ කියන්නේ සතර මහා ධාතුව නිසා ඉපදුන සතර මහා ධාතුව නිසා පවත්නා දෙයක් හැටියට හැමවිටක ඇස ව්‍යාවස්ථාපනය කර ගන්න කියන එක. මෙතන්දී ඇස *"උප්පන්නනන්ති වවත්ථේති "* කියන කොට උප්පන්න කියන කාරණය බොහොම වැදගත් වෙනවා. ඇස කියන එක ඉපදුන දෙයක් කියන්නේ නූපන්න දෙයක් නෙමෙයි. නූපන්න දෙයක් නෙමෙයි කිව්වාම අපට සරල අර්ථයක් විදියට තේරෙන්න පුළුවන්කම තියෙනවා. නමුත් ඒ තුළ බොහොම ගැඹුරු අර්ථයක් තමයි ප්‍රකාශ කරන්නේ. රූපය ගැන විග්‍රහ කරන කොටත් අපි දෙකම එක තැන තියා ගෙන කතා කරමු කියන තැන ඉඳන් මේ සාකච්ඡා කර ගෙන යන්නේ. *"චක්ඛුං උප්පන්නනන්ති වවත්ථේති "* , එසේම *"රූපා උප්පන්නනන්ති වවත්ථේති ".* ඇස උපන්න දෙයක්, ඒවාගේම රූපයත් උපන්න්න දෙයක්.

ඇස නොහට ගත්ත දෙයක් නෙමෙයි. ඒකෙන් කියන දෙය තමයි අපිට (වැරදි දෘෂ්ටිගත වීම නිසා) තියනවා හැම වෙලාවකදීම එක දිගට තියෙන ඇහැක් පිළිබඳව හා එක

දිගට තියෙන තියෙන රූපයක් පිළිබඳව කෙලේසයක්. ආශ්‍රව ටිකක් තියෙනවා. මේක දුරු කර ගන්න තමයි මේ දහම් පරියාය කියලා දෙන්නේ. ඇස උපන්න දෙයක් හැටියට, රූපය උපන්න දෙයක් හැටියට. අද්ධාන, ක්ෂණ වශයෙන් වශයෙන් උපන්න දෙයක් හැටියට දකින්න කියලා කියන්නේ. මේ මොහොතේම හට ගත් ඉතුරු නැතුව නිරුද්ධවන ධර්මතාවක් හැටියට. ඉපදුන කල්හිම ඇස දකින්න කියනවා මිසක නූපන්න ඇහැක් දකින්න එපා.

අතීතයට ගිහිල්ලා අතීතයෙ ඉඳලා තිබුන ඇහැක් හෝ අනාගතයටත් තියෙන ඇහැක් නෙමෙයි. *"චක්ඛුං උප්පන්නං වවත්ථේති "* ඇස කියන එක දකිනන උපන්න අර්ථයෙන්. ඒ වෙලාවට ඇස ඉපදුනොත්! ඒ වාගේම *"රූපා උප්පන්නන් වවත්ථේති "* රූපය කියන එක ඉපදුනොත්! අන්න ඒ උපදින මොහොත පිළිබඳව. ඇස උපන්න දෙයක්, රූපය උපන්න දෙයක් හැටියට ව්‍යාවස්ථාපනය කරගන්න. *"උප්පන්නන් වවත්ථේති "* කියන එක වාගේම ඊලඟට අපිට තියෙනවා *"සමුදාගතන්ති වවත්ථේති "* කියන කොට හේතුන්ගෙන් හට ගත්ත දෙයක් කියන එක.

සමුද කියන්නේ හට ගත්ත පැත්ත. මේ විදියට හේතු ධර්මතා ටිකක් නිසා තමයි ඇස ආවේ කියන කාරණාවත් එක්කම මේ කතා කරන ඔක්කොම එක තැනකට අපේ මනස අරගෙන යන්න අවශ්‍ය වෙනවා.*"චක්ඛු අහුත්වා සම්භූතං, හුත්වා න භවිස්සතීති වවත්ථේති "* මේ ඇස පෙර නොතිබීම හට ගෙන ඉතුරු නැතිව නිරුද්ධ වෙනවා. *"අහුත්වා"* කියන්නේ පෙර නොතිබී *"හුත්වා න භවිස්සතීති"* කියන්නේ තිබිලා අයේ අනාගතයට තියෙනවාත් නොවෙයි. කලින් කිව්වා *"උප්පන්නන් වවත්ථේති "* උපන්න දෙයක් හැටියට දකින, *"සමුදාගතන්ති වවත්ථේති "* මේ මේ ප්‍රත්‍ය තියෙන කල්හි (පමණක්) ඇස තියෙනවා කියලා දකින්න කියලා.

ඊට පස්සේ විග්‍රහ වන්නේ පෙර නොතිබීම ඉතුරු නැතුව නිරුද්ධ වෙනවා කියලා දකින්න. දැන් රූපය කියන දෙයත් ඔය කාරණා ටිකෙන්ම පෙන්වනවා *"රූපා උප්පන්නාති වවත්ථේති, රූපා සමුදාගතාති වවත්ථේති. රූපා අහුත්වා සම්භූතා, හුත්වා න භවිස්සන්තීති වවත්ථේති"* රූපය කියන්නේ උපන්න දෙයක්, ඒ වාගේම සමුදාගත දෙයක්. ඇස වාගේම පෙර නොතිබීම ඉතුරු නැතුව නිරුද්ධ වෙන කාරණයක්. මේක

බොහොම වැදගත්, අපි මේ කතා කරන හැම දර්ශනයක් තුළම මේ පින්වතුන්ට හිතෙන්න පුළුවන් අපි මේ එකම කාරණා ටිකක විග්‍රහ වෙන්නේ කියලා. ඇත්තෙන්ම එකම කාරණා ටිකක් විග්‍රහ වෙන්නේ. එසේ කිරීමට හේතුව ඒකයි කලින් මතක් කලේ මේ එක වචනයක්/පදයක් අරගෙන කෙනෙකුට ලෝකෝත්තර මට්ටමට යනකම් ප්‍රතිපදාව සකස් කර ගන්න පුළුවන් කම තියෙන බව.

ඇස ගත්තාම ඇස පිළිබඳව විග්‍රහ වන එක පදයක් අරගෙන *"සබ්බං රූපං න හේතු"* කියලා ගත්තත් හේතු නෙමෙයි සියලු රූපය කියලා කතා කරන කොට, මොන මොන අර්ථයෙන්ද රූපය හෙතු නෙමෙයි කිව්වේ? කියලා විමසන කොට ඒ ගැන අවබෝධ කර ගන්න කොට ඒ තුළ තමයි ලෝකෝත්තර ප්‍රතිපදාව අපිට මතු කර ගන්න පුළුවන්කම තියෙන්නේ.

<u>පොඩි කාලේ ඉඳන් තිබුන ඇහෙන්</u>

ඒ වාගේම ඇස කියන එක උප්පන්න ධර්මය කියන එක, ඇස නූපන්න දෙයක් නෙමෙයි. ඉපදීල දිගටම තියෙන උපන්නා වූ දෙයක් නෙමෙයි. කලින් මොහොතේ ඇස කියලා දෙයක් තිබිලා ඒ එක දිගටම පොඩි කාලේ ඉඳන් තිබුන ඇහෙන් රූප බලනවා එහෙම නෙමෙයි. *"රූපා උපන්න වවන්ථේති"* කිව්වාම, රූප කියන දෙයත් උපන්න ධර්ම කියලා ව්‍යවස්ථාපනය කරන්න කියන කොට මේ සියලුම රූපත් කලින් ඉඳලා තිබුනා නෙමෙයි.

දැන් අපිට මිත්‍යා දර්ශනයක් තියෙනවා මේ ලෝකේ රූප බොහෝම කලින් ඉඳලා ලෝකයේ තිබෙනවා කියලා. ඒක වැරදි දැක්මක්, වැරදි දෘෂ්ටියක්. අපේ මුළු කෙලෙස් පද්ධතියම දුවන්නේ ඔය වැරදි සංකල්පය අනුව. මේ ලෝකය තියෙනවා කියලා හිතා ගන්න ඔය වැරැද්ද අනුව පූර්ණ වශයෙන් අපේ සියලු කාරණා ගොඩ නැගිලා තියෙනවා. අපි (වැරදි දෘෂ්ටියට අනුව) දන්නේ අපි ඉපදින්න කලින් ලෝකය තිබුනා, තිබුන ලෝකේ අපි ඉපදුනා, තියෙන ලෝකේ අපි ජීවත් වෙලා, ලෝකය තියෙන කොට අපි මැරෙනවා, මේක තමයි අපේ වැරදි දර්ශනය. අපේ සියලු ප්‍රතිපදාව ඔය දර්ශනය අනුවයි ගොඩනඟලා තියෙන්නෙ.

අපි උපදිනන කලින් ලෝකය තිබුනා නම් ඒ තියෙන ලෝකය අරඹයා අපි සතුටු වෙනෙන් පුළුවන්කම, දුක් වෙන්න පුළුවන්කම තියෙනවා. ඒ නිසා (පෘතජ්ජනයාට) දුක අයින් කරලා තියෙන ලෝකේ සැප විතරක් තියෙන විදියට හදා ගන්න ක්‍රමයක් අවශ්‍ය වෙනවා. ඉපදුන දවසේ ඉඳලා කෙනෙක් මැරෙනකන් උත්සහාවත් වෙන දෙයක් තමයි අන්න ඔය 'තියෙන ලෝකයෙන්' දුක අයින් කරලා සැප වෙන්කරවා ගෙන සැප ලැබෙන දේ වෙන්කර ගන්න.

නමුත් අපිට පේනවා ජීවිතයේ අපිට හැම දාම නොලැබෙන දේත් ඒකමයි. මුළු ජීවිතයම ගොඩනඟලා තියෙන්නේ මොන දර්ශනය මතද? 'බාහිර ලෝකය' තියෙනවා කියන සංකල්පය මත. ඔබට දැන් මේ වේලාවේ නිවසින් පිට මුළු ලෝකයක් තියෙන බවට හිතන්න පුළුවන්කමක් තියෙනවා නේද? නමුත් ඒය හුදක් සිතුවිලි මාත්‍රයක් මිසක ප්‍රත්‍යක්ෂයක් නෙමෙයි. එහෙම කිව්වේ ඇහැට පෙනෙන දෙයක් නෙමෙයි ඇත්තටම , ඒක හිතින් හිතන දෙයක්. ඇස කියන දේ ගැන කතා කරන්න පුළුවන්කම තියෙන්නේ මේ මොහොතේ ඇහැට ගැටෙන මොහොත ගැන විතරයි. ඒක බොහොම ගැඹුරු කතාවක්. ඒකෙන් කියන්නේ අපිට කවමදාකවත් ඇස ගැන දැන ගන්න හමු වෙන්නේවත් නැහැ. කවමදාකවත් ඇස ගැන විඳින්න පුළුවන් වෙන්නේත් නැහැ.

කවදාවත් ඇහෙන් රූප දකින්න පුළුවන් වෙන්නේත් නෑ කියලා කීවොත් අපිට සමහර විට හිතෙයි මොකද්ද මේ කියන කාරණාව? කියලා. ඇත්තම කාරණාව තමයි *"චක්ඛුං උප්පන්න වවත්ථේති "* කියන කොට එනම් ඇස උපන්න බවට ව්‍යවස්ථාපනය කරන්න කියලා කියන කොට හුදෙක්ම ඒක ප්‍රඥාවක් විතරයි. නමුත් ඇස උපදින මොහොත ගැන අපි කවුරුත් දන්නේත් නැහැ අපි කාටත් නුවණ තියන්න පුළුවන් කමකුත් නැහැ.

<u>ටිකක් ගැඹුරු කරුණක්.</u>

ඇයි ඇස උපදින මොහොත ගැන නුවණ පවත්වන්න අපිට බැහැ කියන්නේ? ඇස උපදින මොහොතේ හැම වෙලාවක්දීම ඇස හා රූපය පිළිබඳ දැන ගන්න පුළුවන් මට්ටමක් නැතිනම් නව කර්ම මට්ටමක් අපේ හිතේ යෙදෙන්නේ නැහැ. අපිට කවදාවත් ඇස ඇතිවන මොහොතක ඇස ගැන සිහිය හෝ නුවණ පවත්වන්න බැහැ.

ඇස ගැන රැවටෙන්න පුළුවන් කමකුත් නැහැ. ඇස හැදෙන මොහොතේදී ඇස ගැන සිහිය පවත්වලා ඇහෙන් මිදෙන්න වත් ඇස ගැන ලෝභ සහිතව අරමුණු කරලා ඇහේ ඇලෙන්න වත් පුළුවන් කමක් නැහැ. හේතුව හැම මොහොතකම ඇස කියන එක උපදින මොහොත වෙන කොට ඒ හිත ඇස ඇති කරන්න ඇහැ/රූප උපද්ද පැත්තේ වැය වෙලා මිසක කොයි වෙලාවේදීවත් ඒ ඇහැ/රූප දැන ගන්න පැත්තට වැය වෙලා නැති නිසා.

ඒක උපද්දන පැත්තට ඇස හදන කෘත්‍ය පැත්තට වැය වෙලා ඉවරයි. ඒකට කියනවා අපි විපාක ටික කියලා. විපාක ඇතුලේ නව කර්ම කිසිම කළක යෙදෙන්නේ නැහැ. ඇස ඉතුරු නැතුව නිරුද්ධ වුණ තැනක තමයි අපි හැම දාම රූපය දැන ගන්නෙත් රූපය විඳින්නේත්. ඒ රූපය ගැන දැන ගන්න , රූපය ගැන විඳින හැම මොහොතකදීම ඇස ඉතුරු නැතුව නිරුද්ධ වුණ ඇස නැති මොහොතක ඇස නොවුනු තැනක තමයි අපි ඇස විඳින්නේ. ඒක ටිකක් ගැඹුරු කරුණක්.

ඉතින් අපිට ඇස උපන්න දෙයක් හැටියට දකින්න වෙන්නේ හැම වෙලාවකදීම ප්‍රඥාවෙන් අවබෝධ කළ යුක්තක් ඇස ගැන. කොහොමද? ඇස එක දිහට පවතින රූපයකින් දකින්න එපා. ඇස කියන එක මේ දර්ශන කෘත්‍යයෙන් නැත්නම් පෙනෙන බවත් එක්කම දකන්න. පෙනෙන බවටමයි ඇස කියලා කියන්නේ. කොයි වෙලාවේ වත් චක්ඛු ප්‍රසාදය පමණක්මයි ඇස කියලා පනවන්න බැහැ. ඒක *"පසාදෝ අත්තභාවපරියාපන්න"* කියලා කියනවා. හැබයි ඔය දෙකේ විතරක් පැවතුනා කියලා කිසිම කළක දැන ගැනීමක් ඇති කරගනන් පුළුවන් කමක් නැහැ.

ඇස තියෙනවා කියලා දැන ගන්නේ හැම වෙලාවකදීම ඇහැට රූපයක් පතිත වීම තුළ මයි. හැබැයි රූපයක් පතිත වුන තැනක තමයි ඇස බිඳුන් බවටත් ඇස හට ගත්ත බවටත් දැන ගන්නේ. ඇස උපන්න දෙයක් කියලා කියන කොට අපිට බලන්න වෙනවා ඇස මොන අර්ථයෙන්ද උපන්න දෙයක් කියලා කිව්වේ. ඇස උපන්නේ හැම වෙලාවකදීම පෙර නොතිබිම හට ගෙන ඉතුරු නැතිව නැති වන ධර්මයක් විදියට.*"අහුත්වා සම්භූතං"* පෙර නොතිබීම හට ගත්තා කියලා කියන්නේ ඒ ඇස බොහෝ කාලයක් තිස්සේ තිබුන ඇස නෙමෙයි.

<u>කවදාවත් ඇස දකින්න පුළුවන් කමක් නැහැ</u>

අපි බොහෝ විට මතක් කරලා දෙනවා මේ ඇස කියන්නේ මේ තියෙන මස් ඇස කියන මට්ටමේ දකින ඇස නෙමෙයි. ඒ මස් ඇස කියන්නේ රූපයටයි. අපි දකින්නේ වර්ණ සටහනක් විතරයි. (ඇස යනු දර්ශන කෘත්‍යක් නිසා) ඇහැට කවදාවත් ඇස දකින්න පුළුවන් කමක් නැහැ. අපිට මේ තියන මස් ඇස අතින් අල්ලන්න පුළුවන් කීවොත් කයක් අසුවෙයි. මේ ඇහැට ඇන ගත්තොත් ඒ ඇන ගැනීමට කාය විඤ්ඤාණයක් හට ගනී මිසක කිසිම විටක චක්ඛුවිඤ්ඤාණය හට ගන්නේ නැහැ. ඇත්තම ඇස කියන එක දකින්න එපා මේ තියන (මස් ඇස නම් වූ) රූපායතන පැත්තෙන්. ඵොට්ඨබ්බය පැත්තෙන් අල්ලන්න පුළුවන් ඇහැක් හෝ වෙනමම දකින්න පුළුවන් ඇහැක් කියලා හිතන්න එපා. ඒ දකින්න පුළුවන් කම වර්ණ රූපය මිසක ඇස නෙමෙයි. ඒ වර්ණ සටහන ගෝචර කර ගන්න මේ පැත්තේ වැය වන ප්‍රසාදවත්බව තමයි ඇස කියලා කියන්නේ.

<u>කොයි වැහි බිංදුව ද වැස්ස වුනේ?</u>

ඇස පනවන්න නම් අපට හැම වෙලාවකදීම දර්ශන කෘත්‍ය කියන දේ පනවන්න වෙනවා. දර්ශන කෘත්‍ය තොරව කිසිම කළක ඇහැක් නැහැ. එහෙම ඇහැක් තියෙනවා කියලා හිතාගෙන ඉන්න පුළුවන් හැබැයි ඒක එහෙම නොවන තැනක ඇස ගැන කරන (වැරදි) තීරණයක්. හයියෙන් වහින උදාහරණය ගත්තොත්, දැන් මට කියන්න කොයි වැහි බිංදුව ද වැස්ස වුනේ? අපට වැස්ස වුණ එකම වැහි බින්දුවක්වත් පනවන්න ලැබෙන්නේ නැහැ. මොකද එකම වැහි බින්දුවක් වත් වැස්ස නොවන නිසා. හැබැයි ඔය එක වැහි බින්දුවක් වත් නැතිව වැස්සක් හැදුනාද? එසේ වුනෙත් නැහැ. වැස්ස නොවන වැහි බින්දු ටිකක ඇති තැනක අපි වැස්ස කියලා කියනවා, ඒත් අපි වැස්ස නැති තැනක වැස්ස ගැන කතා කරනවා, පැහදිලිද? හයියෙන් වහින තැනක ඒ මොහොතෙම හට ගෙන ඒ මොහොතෙම නිරුද්ධ වෙලා යන වැහි බින්දුවක් අරඹයා වැස්ස කියලා කතා කලේ, ඒ වැහි බින්දුව ඉතුරු නැතිව නිරුද්ධ වුණ නැනක තමයි අපි හයියෙන් වහින බව නිර්මාණය කර ගෙන තියෙන්නේ. අපි හයියෙන් වහිනවා කිව්වේ මොන වැහි බින්දුවටද අපිට පෙන්වන්න පුළුවන් කමක් නැහැ.

පින්වතුනි ඇස කියන එකත් හයියෙන් වහින වැස්සක් වගේ. කන කියන එකත් හයියෙන් වහින වැස්සක් වගේ. ඇස කියන එකට හයියෙන් වහිනවා මොනවාද? රූප . මේ ඇහැට හයියෙන් රූප වහින කොට අපිට කොයි වෙලාවේ පෙනුන රූපයද කොයි වෙලාවේ පෙනුන ඇහැද කියලා කතා කරන්න පුළුවන් කමක් ඇත්තේ නැහැ. ඔබ රූපය කියලා කියන්නේ ගහක් තිබුනා කියන්නේ කොයි තත්පරයේ ඇහැට පතිත වුණ වර්ණ සටහනදැයි ඇහුවොත් ? කොයි තත්පරයේ තිබුන ප්‍රසාදය කියලාද ඇහුවොත්? කිසිම තප්පරයක වුණ ප්‍රසාදය ඔබේ ඇස වුනේත් නැහැ ගහ වුනේත් නැහැ. ඔබට එක දිගට තිබුන ගහක් හමු වුනාට ඇස පැත්ත විමසාලා බලන කොට එහෙම හමු වෙන්න විදියක් නැහැ. මොකද ඒ ඒ මොහොතට හේතු ඇති කල්හි හට ගෙන හේතු නිරුද්ධ වීමෙන් නිරුද්ධ වී යන ධර්මතා ටිකක් මිසක එක දිගටම පවතින ඇහැක් හෝ රූපයක් අපිට හමු වෙන්න විදියක් නැහැ.

හරියට වැස්ස නැති තැනක වැස්ස ගැන කතා කළා වගේ කතා කරන්න පුළුවන් කමක් තිබුනාට එක දිගට තියෙන ඇහැක් ගැන හෝ රූපයක් ගැන කතා කළාට ඒක ප්‍රායෝගික වෙන්නේ නැහැ. ඇයි ප්‍රායෝගික වෙන්නේ නැහැ කියලා කියන්නේ? ඒ ඇස ඒ මොහොතේම ඉතුරු නැතිව නිරුද්ධ වුණ ධර්මතාවයක් නිසා. ඇස අපි කතා කරන්නේ ප්‍රසාදවත් මට්ටමකින්.

රළුම උදාහරණයක් ගත්තොත් ලෝකයට සංවේදීවන (පරණ කැමරා වල) නෙගටිව් පටියක් වගේ කියලා. ඇහැට පුළුවන්කම තියෙන්නේ බාහිරින් පතිතවන වර්ණ සටහන ගෝචර කර ගන්න බව කරන එක විතරමයි. එතනින් එහාට දෙයක් ඇහැකින් කරන්න පුළුවන් කමක් ඇත්තේ නැහැ. ඇස වැය වෙලා රූපයට , රූපය වැය වෙලා ඇහැට. එතකොට දැන් ඇස තියෙනවා කියන්නෙ පුළුවන් වෙන්නේ මොන මට්ටමටද? ඇස තියෙනවා කියන්න පුළුවන් එකම අවස්ථාව තමයි හදා ගත්ත ඇහැට වර්ණ සටහන පතිත වෙනවා කියන මොහොත, ඒ ක්ෂණයම. එච්චරයි ඇහැ. *"උප්පන්න වවත්ථේති "* කිව්වේ එතනට. යම් මොහොතක අලෝකයට බිඳෙන ප්‍රසාදය හැදුනේ, ඒ ක්ෂණයම අලෝකයට බිඳුනා නම් ඇස උපන්න කිවේ ඔතෙන්ට මිසක ඇස වූ රූපයක් එක දිගට තිබුනා නෙමෙයි.

"රූපං උප්පන්න වවත්ථේති " කියලා කිවේ ඒ ක්ෂණයන්හි ඒ මොහොතේ ඇහැට පතිත වුණ වර්ණ සටහනක්. යම් වර්ණ සටහනක් නිසා ප්‍රසාදය බිඳුනේ, ඒ ප්‍රසාදය තමයි *"උප්පන්නා රූපං"* නැතිනම් උපන්න රූපය. ඔය එක මොහොතට එය කිව්වේ. නැතිනම් එක දිගට තිබුනා නෙවෙයි. ක්ෂණිකව ඇස හැදුනා නම් වර්ණ සටහන ගැටුනා කියන මේ මොහොතේ. දැන් ඔය ඇස පවතින , (අපිට පේන විදියට) හැඩයක් තියෙන දෙයක් නෙමෙයි. ඒ වාගේම ඔය වර්ණ සටහන කලින් ඉඳලා අවුරුදු ගාණක් තිබ්බ වර්ණ සටහනකුත් නොවෙයි. මේ මොහොතේ හැදුන ඇහැට මේ මොහොතේ පතිත වුණ වර්ණ සටහනක්. *"උප්පන්න වවත්ථේති "* උපන්න දෙයක්.

ඒ ඇස ඉපදුනා මේ මොහොතේ ඒ වර්ණ සටහන ඉපදුනා මේ මොහොතේ. ඒ වර්ණ සටහන ඉපදුනා නම් ඇස ඉපදිලා, ඇස ඉපදුනා නම් වර්ණ සටහන ඉපදිලා. දැන් ඔවුනොවුන්ට ප්‍රත්‍යයෙන් ඇස ත් රූපයත් කියන මේ කාරණා දෙක පවතිනවා. *"උප්පන්න වවත්ථේති "* කියන කොට ඔය දැනුම අපිට එන්න ඕනේ මොන තරම් සියුම් මට්ටමකටද මේ මොහොතේ ඇස ඉපදුනේ? ඒ සියුම් මට්ටමක ඉපදුන ඇස පෙරත් එක්කම එක දිග්ගට තිබුන ඇහැක් නෙමෙයි. මේ මොහොතේ ප්‍රසාදය සකස් කර ගන්න බව.

<u>කෙටිම අවස්ථාවේ කෙටිම විදියට පැවතුනා</u>

මේ මොහොතේ රූපය ගැටෙන බව. *"චක්ඛු උප්පන්න වවත්ථේති ....රූපා උප්පන්න වවත්ථේති "* - ඔය මට්ටමින් විතරයි ඇහැයි රූපයයි ඇස දුරු වෙන මට්ටම තියෙන්නේ. මොන තරම් පොඩ්ඩක්ද? මොන තරම් ස්වල්පයක්ද? ඒකයි *"සබ්බං රූපං පරිත්තං"* කියලා "ඒකවිධේන රූපසංගහෝ" කොටසේ කලින් සාකච්ඡා කලේ. පරිත්තයි , කෙටියි කියලා. මේ ඇස අපිට පවතින්නේ ඔය *"පරිත්ත"* කියන ඉතාමත් කෙටි අර්ථයෙන් විතරයි. රූපය කියන දේත් ඔයම කෙටිම අවස්ථාවේ කෙටිම විදියට පැවතුනා. එච්චරයි!

දැන් ඔබට තේරෙනවා ද අපේ තියන අවිද්‍යාව කොපමණද කියලා? ඇයි අවිද්‍යාව කොච්චරද කියලා මතක් කර ගන්න පුළුවන් කියලා කිව්වේ? ඇහැයි රූපයයි ඉතුරු නැතිව නිරුද්ධ වූ තැනක දැන් අපිට හදා ගන්න පුළුවන් ගස් වූ රූප හදා

ගන්න. ගෙවල් වූ රූප හදා ගන්න. මනුස්ස වූ රූප හදා ගන්න. මොන තරම් අවිද්‍යාවක් ද? අපේ තියෙන්නේ මොන තරම් වැරදි දෘෂ්ටියක් ද? (හරි දර්ශනය තමයි) මේ මොහොතේ ඇස හට ගෙන මේ මොහොතේ නිරුද්ධයි. ඉපදුනාට පස්සේ තමයි ලෝකය කියලා කියන්නේ. වර්ණ සටහන ඇහැට ගෝචර වුනා , ඇස ලෝකය. එච්චරයි වුනේ. මේ දෙකේ තිබුනේ නැහැ කිසිම ප්‍රිය මනාප අප්‍රිය අමනාප බවක්, ඔය ගැටෙන වණී සටහනෙන් ඇහැට ආවේ නැහැ එහෙම ප්‍රිය මනාප බවක්. රූපය වන වර්ණ සටහන දන්නේ නැහැ ඒක ප්‍රිය මනාප බවක් ඇහැකට අරගෙන එනවා කියලා. ඒකයි ඔය විපාකය පැත්ත කතා කරන කොට රූපය ප්‍රිය මනාප , අප්‍රිය අමනාප බවක් කතා කරන්නේ නැත්තේ.

<u>තමන් කියන්නේ කවුද ?</u>

අපි මේ කතා කරන්නේ ලෝකය හැම වෙලාවකම ඇතැයි කියන දර්ශනයක් නෙමෙයි. හට ගත්ත විදිය පෙන්වීමක්. මේ මේ හේතු ටික ඇති කල්හි ඇස හැදුනා නම් ඒ හෙතුවෙන්ම වර්ණ සටහන ගැටෙනවා. දැන් මට කියන්නෙ තමන් කියන්නේ කවුද කියලා? මේ ගැටෙන මොහොතේ තමන් කවුද? ඔය ඇහැට කිව්වා නම් *"අත්තභාවපරියාපන්න"* කියලා. එනම් ආත්ම භාවය අනුව ගියපු දෙයක් කියලා එම ඇස පුද්ගලභාවය අනුව ගියපු දෙයක් බවට පත්වෙලා. ඇස හැදුන මොහොතේ දී ඇස කියන දේ තමන් කියන ස්වාභාවයට වැය වෙලා. තමන් ඇස කියන ස්වභාවයට වැය වෙලා.

තමන්ගෙන් තොර ඇහැත් ඇහෙන් තොර තමනුත් දකින්නේ නැති මට්ටමකට ගන්න. එතකොට අපිට නුවණ ඇතිකර ගන්න පුළුවන් *"චක්ඛු අහුත්වා සම්භූතං හුත්වා න භවිස්සති"* පෙර නොතිබීම හට ගෙන ඉතුරු නැතුව නිරුද්ධ වෙනවා කියලා දැන ගන්න කොට තමන්ගේ ලක්ෂණයත් පෙර නොතිබීමයි හට ගත්තේ. තමන්ගේ ලක්ෂණ ටිකත් ඉතිරු නැතිව නිරුද්ධ වුනා.

ඊට පස්සේ ඒ අරඹයා නව කර්ම සිත්, විපාක මනෝවිඤ්ඤාණ ධාතු සිත් පවත්වන්න පුළුවන්කම තියෙනවා. අපිට ඒ හැම මොහොතකදීම දකින්න ඇස රූප දෙක ඉතුරු නැතිව වැය වෙලා/නිරුද්ධ වෙලා ඉවර වන ලක්ෂණය. චක්ඛුවිඤ්ඤාණ සිතක් හට

ගන්න මොහොත වෙන කොට, චක්ඛුවිඤ්ඤාණය වෙනකන් චක්ඛායතනය හා රූපායතනය ගැන කතා කරනවා. හේතුව මේ ස්කන්ධ පංචකයක පෙර පසු නැතුව එකට හට ගන්න ධර්මයක් නිසා.

ඊයේ දැකපු පුද්ගලයෙකු පිළිබඳව අද දකින්න පුළුවන් කම

මේ ස්කන්ධ පංචකය එකටමයි හට ගත්තේ. ඒක තමයි මේ දර්ශන කෘත්‍ය හැම වෙලා වෙදීම ඔය ස්කන්ධ පංචකය ඇතුළදීම පනවන්නේ. දකින්න හැම වෙලාවකදීම ආයතනයට වර්ණ සටහන ගැටෙන මොහොත. ඇස ට පාට ටික ගැටෙන මොහොත. මේකට කියනවා පටිඝ සම්පස්සය කියලා. මේ ධර්මතා ටික පවතින්නේ මේ ස්පර්ශය මූලික කර ගෙන. මෙතනදී හැම මොහොතමක දර්ශන කෘත්‍ය මූලික කර ගත්ත බව නිසා ඇස ගැනම කතා කරනවා. එතකොට පෙර නොතිබීම හට ගෙන ඉතුරු නැතිව නිරුද්ධ වුනා කියන්නේ , මේ ඇස , දැන ගන්න බවට හට ගෙන ඉතුරු නැතිව ඒ මොහොතේ දී ඇස වැය වෙන කොට ඒ අරඹයා ඊලඟ සිත් පහළ වෙන තැන යන කොට , හැම වෙලාවක ඇස කියන තැන ඉතුරු නැතිව නැති වුණ තැනක තමයි අපි ඇස ගැන මතක් කරන්නේ. ඇස ගැන මෙනෙහි කර ගන්නේ. ඇස නොවුණ තැන ඇස ගැන දැන ගන්න මට්ටම තමයි අපේ තියන අවිද්‍යාව. ඇස නිරුද්ධ වුණ තැනක රූපය නිරුද්ධ වුණ තැනක, ඇස ගැන හා රූපය ගැන අපි කතා කරන ගතිය මෙන්ම මෙනෙහි කරන ගතිය තමයි අපේ තියන අවිද්‍යාව කියලා කියන්නේ.

ඒ හැම මොහොතමකම ඇස ඉතුරු නැතිව නැතිවෙලා අවසානයි. ඒ නිරුද්ධ වුණ තැනක ඇස ගැන කතා කරන නිසා තමයි අපිට ඇස නිත්‍ය වෙන්නේ. රූප නිත්‍ය වෙන්නේ. මේ සියලු ලෝකයම නිත්‍ය වෙන්නේ, ඒ නිසායි. ඇයි ? අපිට හිතේ අත්දැකීම රැස් කර ගෙන තියෙනවා. අපිට ඊයේ දැකපු පුද්ගලයෙකු පිළිබඳව අද දකින්න පුළුවන් කම හා කතා කරන්න පුළුවන් කම තියෙනවා. දැන් ඊයේ දැකපු පුද්ගලයා කියලා කතා කලේ කොයි වෙලාවේ හට ගත්ත ඇහැට ද? කොයි වෙලාවේ පතිත වුණ වර්ණ සටහනට ද? එක වර්ණ සටහනක් වත් අපිට ඊයේ දැකපු පුද්ගලයා වුනේ නැහැ. ඒ වාගේම එක ඇහැක් වත් අපිට ඊයේ දැකපු පුද්ගලයා වුනේ නැහැ. ඔබ තමන්ගේ ජීවිත්ය තුළට බහාලා බලන්න.

මම ප්‍රශ්නයක් ඇහුවොත්, තමන්ගේ දරුවා කියලා කතා කරන කොට කොයි තත්පරයේ ඇහැට පතිත වන වර්ණ සටහන ද ඔබ දරුවා කියලා කතා කරන්නේ කියලා? ඔබට එක තත්පරයකදී ආපු පාට ටිකකින් දරුවා වූ පාට ටිකක් හෝ දරුවා වූ වර්ණ සටහන් ඉන් පෙන්වන්න පුළුවන් ද? එක තත්පරයකදී වත් පතිත වුණ දරුවා වූ වර්ණ සටහනක් ඔබට පෙන්වන්න පුළුවන් වෙනෙන් නැහැ. හෙතුව වර්ණ සටහන කිසිම කළක දරුවා නොවුනු නිසා. කොයි වෙලාවේ ඒ වර්ණ සටහන ගෝචර කර ගත්ත ඇස ද දරුවාද වුනේ? කියලා ඇහුවොත් ඔබට පෙන්වන්නත් නැහැ. දැන් ඇහැයි වර්ණ සටහනයි තොරව අපිට දකින්න පුළුවන් රූපයක් තියෙයි ද? ඇහැකුත් නැත්නම් වර්ණ සටහනකුත් නැතිනම් ? එවිට අපිට දකින්න පුළුවන් රූපයක් නැහැ. ඒකෙන් මට කියන්න කොයි තත්පරයේ තිබි ඇස රූප දෙකද දරුවා වුනේ කියලා ඇහුවාම එක තත්පරයකවත් තියෙන ඇස රූප දෙක දරුවා නෙමෙයි නම් එහෙනම් ඉස්සර ඉඳලා පොඩි කාලේ ඉඳලා දරුවා බලන්න පුළුවන් කියන්නේ මොන දේ යටතේ ද? පොඩි කාලේ සිට ඇස පුරුදු කළ දරුවා ගැන කතා කලේ කොතනකදී ද අපි? අර රූපය ඉතුරු නැතිව නැති වුණ තැනක අපි හිතෙන්ම උපද්ද ගත්ත ආශ්‍රව ටිකකට හිතේ පැවැත්මකටම නෙමෙයිද අපි දරුවා කියලා කතා කලේ? අපි දරුවා කියලා ඇස කලේ තමන් කර ගත්ත හිතම නෙමෙයි ද?

<u>ලෝකෙනුත් මිදිලා , තමන්ගෙනුත් මිදුනා කියන තැනකට</u>

අපි දරුවා කියලා ඇස පුරුදු කරන්නේ තමන්ගේම මනස පැත්තේ තියන ලක්ෂණ ටික. කොටින්ම කියනවා නම් තමන් කර ගත්තෙ මේ ලක්ෂණ ටික. දැන් අපිට දරුවා වෙලා තියෙන්නේ තමන්වූ මේ ලක්ෂණ ටිකක් තමයි අපි දරුවා කියලා මේ ඇස පුරුදු කරලා තියෙන්නේ. දරුවා ගැන දැන ගන්න වැය වුනේ තමන් වූ මේ හිත නේද? ඒ හිතන මොහොතේ තමන් වුනේ කවුද? ඒ හිත. කොටින්ම කියනවා නම් තමන් දරුවා වෙලා දරුවා තමන් වෙලා කියන කාරණාවක් ඒක.

මෙතන්දී අපි කතා කර ගෙන ආපු කාරණාව තමයි , ඇස පෙර නොතිබීම හට ගත්තා. මේක කලින් දිහටම තිබුන ඇහැක් නෙමෙයි. ඒකයි "*උප්පන්නං.. අහුත්වා ස්ම්භූතං හුත්වා න භවිස්සති.. සමුදාගතන්ති වවත්ථේති* ". ඇස හේතු ප්‍රත්‍යන්ගෙන් හට ගත්ත දෙයක්. මේ මොහොතේ ඇසක් හැදුනා නම් ඒ හෙතු ටික නිසාමයි රූපයත් හදා

ගත්තේ. මේ ඇස රූප පෙර නොතිබීම හට ගෙන ඉතුරු නැතිව නිරුද්ධ වුනා. ඇස පැත්තෙන් බලන කොට දැන් ඔබට ලොකයේ සියලුම වර්ණ රූප ඇතැයි කියලා යම් සංඥාවක් හෝ දෘෂ්ටියක් තියෙනවා නම්, ඒක අයින් කරලා දාන්න.

වර්ණ ලෝකයක් දැන් ඔබට නැහැ. වර්ණ ලෝකය ඉතුරු නැතුව නිරුද්ධයි. ඔය විදියටම අනිත් ආයතන ටිකටත් ඔය සිහිය පවත්වන්න.

දැන් මට කියන්න කොයි ආයතනය තුළද තමන්ව පනවන්න පුළුවන් කමක් තියෙන්නේ? ඔය එක ආයතනයකවත් තමන්ව පනවන්නේ පුළුවන් කමක් නැති බව ජීවිතය තුළ ප්‍රත්‍යක්ෂ ඥානයකින් ප්‍රත්‍යක්ෂ වෙන කොට ඔබට මේ පැත්තේ තමන්වත් තමන්ව විඳින්න පුළුවන් ලෝකයවත් කියන දෙපැත්තම හමු වෙන්නේ නැහැ. ලෝකෙනුත් මිදිලා , තමන්ගෙනුත් මිදුනා කියන තැනකට බැස ගන්න නුවණ හට ගන්නවා.

ඊලඟට තියෙනවා *"චක්ඛුං අන්තවන්තතො වවත්ථේති "* - ඇස කියන්නේ එක කෙලවරක්, කියන එක නිශ්චය කර ගන්න ඕනේ. *"රූපා අන්තවන්තතො වවත්ථේති "* රූපය කියන එකත් (ඇස වාගේම) එක කෙලවරක්. ඒවාගේම *"චක්ඛුං අද්ධුවං අසස්සතං විපරිණාමධම්මන්ති වවත්ථේති* - ඇස අශාස්වත දෙයක් දිගට නොපවතින දෙයක්. *විපරිණාමධම්මන්ති*-එක් ක්ෂණික ස්වාභාවයෙන්ම වෙනස්වෙන ස්වාභාවයෙක් යුක්තයි කියන කරණා දැන් අපි ව්‍යාවස්ථාපනය කර ගන්න ඕනේ.

මේ විදියට ව්‍යාවස්ථාපනය කරන කොට ,*"චක්ඛු අනිච්චං සඞ්ඛතං පටිච්චසමුප්පන්නං ඛයධම්මං වයධම්මං විරාගධම්මං නිරොධධම්මන්ති වවත්ථේති"*. ඇස කියන එක අනිත්‍ය දෙයක්, හේතුන් ගෙන් සකස් කර ගත්ත දෙයක් සංඛත දෙයක්. ක්ෂය වන වැය වෙන විරාගය පිණිස නිරෝධය පවතින ධර්මයක් හැටියට ව්‍යාවස්ථාපනය කර ගන්න.

දැන් එම කාරණා එක එකක් ව්‍යාවස්ථාපනය කරන කොට අපිට මාහා ලොකු අර්ථ ගොඩාක් මතු කර ගන්න පුළුවන්කම තියෙනවා. එවිට අපේ ජීවිතයේ සියලුම ධර්මතා ටික මේ පැත්තේන් හසු වෙලා තියෙන්න ඕනේ. වැදගත්ම දේ තමයි අපේ කියන

කෙලෙස් සහගත ආශ්‍රව ටික පවත්වන්න පුළුවන් නැති මට්ටමකට හම්බවෙන එක ඒකෙන් මම මතක් කරන්න උත්සහාවත් වුනේ. ගොඩක් දෙනෙක් උත්සහාවත් වන දෙයක් තමයි ඡන්ද රාග ප්‍රහාණය පිණිස. වරදක් නෙමෙයි. ඡන්ද රාගය ප්‍රහාණය කිරීමක් තමයි අපි කළ යුත්තේ. මොකද සමුදය සත්‍ය ප්‍රහාතවය්‍ය නිසා. සමුදය සත්‍ය දුරු කර ගන්න එක තමයි අපි අද දවසේ කළ යුත්තේ. තණ්හාව තමයි ප්‍රශ්නේ. තණ්හාව තමයි දුරු කර යුත්තේ. හැබැයි තණ්හාව දුරු කර ගන්න ප්‍රතිපදාව තුළ තමයි අපිට එකම ගැටළුව තියෙන්නේ.

තණ්හාව දුරු කර ගන්න එකට වඩා මේකයි වැදගත්ම ප්‍රශ්නය බවට පත් වෙන්නේ. අපිට තණ්හාව පවතින්නේ හැම වෙලාවකදීම ලෝකේ *"ප්‍රිය රූප සාත රූප "* පැත්තට තමයි අපේ තණ්හාව පවතින්නේ. *"චක්ඛු ලෝකේ පිය රූපං සාත රූපං එත්තේසා තණ්හා උප්පජ්ජති එත්ත නිවීසමානා නිවීසති"*. දැන් *චක්ඛුං ලෝකේ පිය රූපං සාත රූපං* කියන කොට ඇස ලෝකයේ ප්‍රය ස්වාභාවයෙන් යුක්තයි, මධුර ස්වාභාවයෙන් යුක්තයි. *"එත්තේසා තණ්හා උප්පජ්ජති"* මෙන්න මෙතන තමයි උපදින්නේ තණ්හාව. *"එත්ත නිවීසමාන නිවීසති"* ඇස එතන තමයි නිවෙන්නේ.

මොකද්ද මේ කියපු කතාව? මෙතනදී මේ විග්‍රහ කරන්න අවශ්‍ය වුනේ අපේ ජීවිතය පැත්තෙන් පෙන්වන වටිනා දර්ශනයක්. ඇස ලෝකයේ ප්‍රිය මධුර ස්වාභාවයෙන් යුක්තයි කියලා කිව්වේ *එත්තේසා තණ්හා උපජ්ජමාන* කියන කාරණාව විග්‍රහ කලේ මේ ඇස නොපවතින තැනක.

ඇස ප්‍රිය රූප සාත රූප කියන තැන අපි කලින් කතා කළා රූපස්කන්ධ කියන තැන අපි ප්‍රිය රූප සාත රූප හසු වෙන්නේ නැහැ කියන කාරණාව. වෙන විදියකට කියනවා නම් ප්‍රිය රූප සාත රූප , රූප වුනාට රූප ස්කන්ධ නෙමෙයි කියලා අපි කලින් කතා කළා. " *චක්ඛුං ලෝකේ පිය රූපං සාත රූපං"* කියලා මොකද්ද මේ කියලා තියෙන්නේ? අපිට මේ පිළිබඳ හොඳ දැනුමක් ඇති කර ගන්න වෙනවා. නැතිනම් අපිට මේ කාරණාව හොඳට ජීවිතය තුළ විග්‍රහ කරන්න ඇත්ත දකින්න පුළුවන් කමක් නැහැ. අපි ඇස ගැන දැන ගන්නේ හැම දාම ඇස නොවුනු තැනක. එතන්දී අපිට හැම වෙලාවකදීම ඇස ප්‍රිය මධුර ස්වභාවයකින් යුක්තයි. අපි ඇස ගැන දැන ගන්නේ (වැරදි විදියට) දකින රූපය

පැත්තෙන්. ඇහැට වර්ණ සටහනක් පෙනෙන තැනක අපි වර්ණ සටහන දන්නේත් නැහැ ඇස දන්නේත් නැහැ හැබැයි දැන ගන්නේ 'අම්මා ! ' කියන මට්ටම.

දැන් ඔය අම්මා පෙනුනෙ කොහෙටද? කියලා ඇහුවොත් අපි කියයි ඇහැට කියලා. අපි ඔය ඇස කියලා කතා කරන තැන, අම්මා දකින ඇහැක් ගැන තමයි ඔය කතා කරන්නේ. අම්මා දකින ඇස කිසිම වෙලාවක ප්‍රිය මධුර ස්වාභාවයෙන් යුත් මට්ටමක් මිස රූපස්කන්ධ මට්ටමෙන් පනවන්න පුළුවන් තැනක් නෙමෙයි. අම්මා දකින ඇස කියන මට්ටම තමයි ප්‍රිය රූපය , සාත රූපය. ඒ ප්‍රිය රූපය , සාත රූපය කියන එක තුළ ඇහැත් අපට ප්‍රියයි සාතයි. ඒ රූපය දකින මට්ටම ප්‍රියයි , සාතයි.

<u>දන්නේ නැති නිසා හිතන්නේ අපි රූපයට තණ්හා කළා කියලා.</u>

හිතමු අපි බොහොම අකමැති දෙයක් දකිනවා කියලා. අසුචි ගොඩක් දැක්කත් -ඒ වුණත් තමන්ට තමන්ගේ ඇස ප්‍රියයි, සාතයි. ඒ කොහොමද? එම අසුචි ගොඩ අප්‍රියයි අසාතයි (මධුර නොවන) වුවත් ඇස *"චක්ඛුං ලෝකේ පිය රූපං සාත රූපං"* දී කිව්වා වගේ ඇස ලෝකේදී තමාට ප්‍රියයි සාතයි. ප්‍රශ්නය වුනේ ඒ ප්‍රිය ස්වාභාවයෙන්වූ ඇහැට අප්‍රිය දේ ගැටීම. දැන් හොඳට තම තමන් විමසන්න මේ කාරණාව. මේක බොහොම ප්‍රඥා ගෝචර කාරණාවක් වන නිසා.

මේ කතා කරන්නේ ඇස නොවුනු තැනක මට්ටමක්. ඒකයි කලින්ම කතා කලේ අම්මා කියන මට්ටම් දකින ඇස ගැන. ඒ මොහොත වෙද්දී ඇත්තටම පවතින දර්ශන කෘත්‍ය සිද්ධ කරන ඇස ඉතුරු නැතිව නැති වෙලා ඉවරයි. ඒ ඇස ඉතුරු නැතිව නිරුද්ධ වෙලා ගියපු තැනක තමයි අපිට මේ කාරණය ගැන සාකච්ඡා කරන්න වෙලා තියෙන්නේ. හැම විටම ප්‍රිය මධුර ඇස ගැන අපි කතා කලේ අර ප්‍රිය මධුර අම්මා කියන රූපය හම්බ වෙන තැනට සාපේක්ෂව. අප්‍රිය අමනාප රූපය හමු වන තැනක ඇස ප්‍රියයි මධුරයි.

"එත්තේසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති" මෙන්න මෙතන තමයි උපදින්නේ තණ්හාව. කොතන ද ? ඇත්තටම තණ්හාව ඇති වුනේ අම්මා හදන මොහොතේ තිබුනු ඇහැට. අම්මා, ගස් කොළ බලන්න පුළුවන් ඇහැට තණහාව ඇති වුනේ. අපි තණ්හා

කලේ ඇහැට. අපි දන්නේ නැති නිසා හිතන්නේ අපි රූපයට තණ්හා කළා කියලා. නැහැ! අපි තණ්හා කරන්නේ ඇස පැත්තට , ස්කන්ධ ටික පැත්තට. මේ ඇස ගැන ඇස නොවුණ තැනක සිට කතා කිරීමක්. යථාර්ත වශයෙන් දර්ශන කෘත්‍ය නැමැති ඇස ඉතුරු නැතිව නිරුද්ධවුණ තැනක දැන් අපි තණ්හා කරන්නේ අම්මා/දරුවා පෙනෙන ඇහැට. ඇයි? අපිට දරුවා බලන්න ඕනේමයි මේ ඇහෙන්. ඇපි හැම විටම තණ්හා කරන්නේ ඔය මට්ටමේදී.

දැන් අපිට ඇස කියන මට්ටමේදීම තමයි තණ්හාව නිරුද්ධ කර ගන්නත් තියෙන්නේ. දැන් ඔබ හිතනවාද ඔය දරුවා බලන ඇස තියෙනකම් අපිට පුළුවන් වේවි කියලා ඔය තණ්හාව දුරු කරන්න? එසේ තියෙනවානම් ලෝකයේ අපිට කිසිම කළක තණ්හාවනම් දුරු කර ගන්න වෙන්නේ නැහැ. ඒ කිව්වේ සමුදය පිළිබඳව නෙමෙයි , සමුදය සතය්‍ය පිළිබඳව. සමුදය නම් දුරු කරගන්න පුළුවන් වේවි. අම්මාට කරන තණ්හාව ඔබට දුරු කර ගන්න පුළුවන් වේවි (සමුදය) ,හැබැයි ඔයාලාට අම්ම බලා ගත්ත ඇහැට කරපු තණ්හාව දුරු කර ගන්න හම්බ වෙන්නේ නැහැ. ස්කන්ධ වලට කළ තණ්හාව දුරු කර ගන්න වෙන්නේ නැහැ. අන්න ඒ හේතුව නිසා තමයි බුදුන් වහන්සේ අපිට තණ්හාව දුරු කරන්න කියලා පනවලා එනම් සමුදය සත්‍ය ප්‍රහාණය කළ යුතු දෙය යැයි පනවා අපිට පෙන්වූවා දුක්ඛ සත්‍ය පිළිසිඳ දැකිය යුතුයි කියලා.

ප්‍රතිපදාව පැනෙව්වා සම්මා දිට්ඨියෙන්. ඇත්ත ඇති හැටියට දකිනන. දුක්ඛේ ඤාණං , දුක ගැන හොඳට දැන ගන්න. දුක අවබෝධ කර ගන්න. දුක්ඛ සත්‍ය පිළිසිඳ දකින්න. දැන් ආපහු ඔබට යන්න වෙනවා මුලට පිරිසිදු ස්කන්ධ ටිකට නුවණ තියන්න. එවිට ඔබට තේරෙයි ප්‍රිය රූප සාත රූප හදා ගත්තේ කොහොමද කියලා. බලන්න පුළුවන් ඇස කොහොමද හදා ගත්තේ කියලා. දැන් හෙතු ඵල දහමක් විදියට මේ කතා කර දර්ශනයට අනුව ස්කන්ධයන්ගේ උදය වැය බලන තැනට, එනම් දුක්ඛ සත්‍ය පිළිසිඳ දකින්න යන කොට, ඔයාලට නුවණ ගන්න වෙනවා ප්‍රිය මනාප නොවුණු ඇහේ යථාර්තය ගැන කථා කරපු මොහොතට සිහිය ගැනීම තුළින් නුවණ පැවත්වීමෙන්. එතන පවතින ඇත්ත කතාව මොකද්ද? අපිට එතකොට ස්කන්ධ ටික හොඳට ප්‍රකට වෙන්න වෙනවා.

<u>දුක්ඛ සත්‍ය පිළිසිඳ දකින්න</u>

ඇස කියන එක *'අහුත්වා සම්භූතං හුත්වා න භවිස්සති'* පෙර නොතිබීම හට ගෙන ඉතුරු නැතිව දුරුවන ධර්මයක්. ඇස පෙර එක දිගට තිබිලා හට ගත්තා නෙමෙයි. ඔබට ප්‍රිය/ අප්‍රිය ඇහැක් හදා ගන්න හෝ ප්‍රිය/ අප්‍රිය රූපයක් හදා ගන්න හේතු ටික නැහැ. ඇයි ? *"රූප උප්පන්න වවත්ථේති...චක්ඛු උප්පන්න වවත්ථේති "* රූපය හා ඇස දෙකම ඉපදුන දෙයක්. දැන් ඉපදුනාට පස්සේ විතරයි තියෙන්නේ.

ඒකත් *"අහුත්වා සම්භූතං හුත්වා න භවිස්සති"* ඒකත් පෙර නොතිබීම හට ගෙන නිරුද්ධ වෙනවා. ඒ දර්ශනයෙන් කියන්නේ ඔබට කොයි වෙලාවේවත් අම්ම කියලා ඉපදූ රූපයක් කතා කරන්න වුනේ නැහැ. දැන් නුවණ පවත්වන්න පුළුවන්කම ලැබුනේ කොතනද? නුවණ පවත්වන්න පුළුවන්කම ලැබුනේ ඇස කියන දේ හට ගත්ත පැත්ත බලන කොට හා නිරුද්ධ වෙත්ත පැත්ත ගැන බලන කොට. ඒ මොහොතෙම හට ගත්තා ඒ මොහොතේම ඉතුරු නැතිව නිරුද්ධවුනා කියන ඔය දර්ශනයෙන් දැන් ඔබ උත්සහාවත් වුනේ තණ්හාව දුරු කරන්න නොවේ. ඔබ උත්සාහවත් වුනේ ඇස පිළිසිඳ දකින්න. ඇස හදා ගත්ත ස්කන්ධ ටික පිළිසිඳ දකින්න. තව විදියකට කියනවා නම් දුක්ඛ සත්‍ය පිළිසිඳ දකින්න. දුක්ඛ සත්‍ය පිළිසිඳ දකින්න කොට දැන් ඔබට අම්ම වුණ රූපය අම්මාව හදා ගත්ත ප්‍රිය සාත ඇස කියන මට්ටම හමු වෙන්නෙ නැති වෙයි.

<u>පතිත වෙන්නෙ පොළොවක් නැති වුනොත්?</u>

දැන් මේකට කියන්නේ උපාදාන වශයෙන් ගන්න දෙයක් හමු නොවීම තුළ ඇතිවන පරිනිර්වාණයක් ගැන තමයි මේ කතා කරන්නේ. උපාදාන වශයෙන් නොගෙන පිරිනිවන පිරිනිවීමක් ගැන. ඒකයි සෝපදිශේෂ නිබ්බාන කියන්නේ. උපදියක් නැහැ. උපදි ශේෂයක් විතරයි තියෙන්නේ. මෙතන ස්කන්ධ ටිකක පැවැත්ම විතරයි තියෙන්නේ. උපාදාන ස්කන්ධ හදා ගෙන විඳින අනික් ධර්මතා ටිකේ පැවැත්මක් ඇත්තේ නැහැ. ඔබට හොඳට ප්‍රත්‍යක්ෂ කරන්න වෙන ධර්මතාවයක්. ඇස පිළිබඳව ඇස හැදිලා යන තැන ගැන හොඳට නුවණ පවත්වන කොට දැන් ලෝකයේ ප්‍රිය මධුර ස්වභාවයෙන් යුක්තවූ රූපය හා ඇස හදා ගත්ත තැනක තණ්හාව දුරු කරන්න නෙමෙයි කිව්වේ මෙතන. තණ්හාව උපදින්නේත් මෙතන තණ්හාව නිරුද්ධ වන්නේත් මෙතනමයි. හැබැයි ඔබට තණ්හාව නිරුද්ධ කරන්න අවශ්‍ය නම් සිද්ධ වෙනවා

ඇත්තටම ඇස කියපු තැන තියෙන ඇත්ත පෙන්වන්න. ඔබට තණ්හාව පවත්වන්න තැනක් හම්බ වෙන්නේ නැහැ. ඇයි ඒ? මොන මොහොතේ හදා ගත්ත ඇහැට ද මොහොතේ හදා ගත්ත වර්ණ සටහනටද මොහොතේ හදා ගත්ත ස්කන්ධ ටිකකටද ඔබ තණ්හා කරන්නෙ? ඒ ටිකම පෙර නොතිබීම හට ගෙන ඉතුරු නැතිව නිරුද්ධ වෙලා. ඒ නැතිවුණ බව දකින විට කිසිම වෙලාවක තණ්හා කරන්න විෂයක්හමු වෙන්නේ නැහැ.

උදාහරණයක් වශයෙන් පෙර දිග බිත්තියෙ තියන කවුළුවකින් පෙරදිගින් නගින සූර්යාගේ ආලෝකයෙන් අනෙක් බිත්තියට බස්නාහිර පැත්තෙන් පතිත වෙනවා. බස්නාහිර බිත්තියක් නැති වුනොත්? බස්නාහිර පැත්තේ පොළොවට පතිත වෙයි. බස්නාහිර පැත්තේ පොළොවටත් නැති වුනොත්? පතිත වෙන්නෙ පොළොවක් නැති නිසා නොපෙනීයයි. ඒ වාගේම තමයි තණ්හා නිරොධයත් කරන්න තියෙන තැන. තණ්හාවයි කියලා, තණහාව නැති කරන එකක් නෙමෙයි බුදුරජාණන් වහන්සේ දේශනා කලේ. තණ්හාව ඇතිවුනේ යම් ක්ශේස්ත්‍රයක නම් අන්න එය නැති කරන තණ්හාවට පිහිටා හිටින තැන නැති කරන එක දේශනා කලේ.

අපිට තණ්හාව හැම විට හැදුනේ දුක්ඛ සත්‍ය පිළිසිඳ නොදකින කම නිසා. අපි ස්කන්ධ ටික ඇති තැනක උපාදාන ස්කන්ධ ටිකක් හදා ගත්ත කම. උපාදාන ස්කන්ධ දුක් වුනා. දැන් ස්කන්ධ ටිකක ඇති තැනක උපාදාන ස්කන්ධ ටිකක් හදාගත්තේ අපි. අපි යම් මොහොතක දැක්කා නම් ස්කන්ධ ටිකේ යථාර්තය! මේ හෙතු ටික ඇති කලිහි ස්කන්ධ ටික හට ගෙන ඉතුරු නැතිව නිරුද්ධ වෙනවා කියලා දැක්කා නම්? උපාදානස්කන්ධ කියන එක නොහට ගන්න බවට යනවා. උපාදානස්කන්ධ අනුත්පාදයට යනවා. අනුත්පාදය තමයි නිවන වෙන්නේ.

ස්කන්ධ ටික හට ගෙන ඉතුරු නැතිව නිරුද්ධ වෙලා. උපාදානස්කන්ධ අනුත්පාදය හෙවත් නිවන බවට වැටිලා. එතකොට අමුතුවෙන් තණ්හාව කියලා නැති කරන්නේ මොකකට තියෙන තණ්හාවක් ද? තණ්හාවට පැවැත්මක් නැති වෙලා. අපට අශ්වාදය ඉෂ්ට කරන/නොකරන බවක් දකින්න අපිට ස්කන්ධයන්ගේ පැවැත්මක් හමු වෙලා

නැහැ. ඒ ඒ මොහොතේ *"අහුත්වා සම්භූතං හුත්වා න භවිස්සති"* පෙර නොතිබීම හට ගෙන ඉතුරු නැතිව නිරුද්ධවන දර්ශනයකට හිත තියලා තියනවා.

මේ විදියේ දර්ශනයක් තමයි අපේ ජීවිතයට ගලපන්න බුදුරජාණන් වහන්සේ අපේ මනස අරගෙන ආවේ. මේ තුළ කවුරුත් ජීවිතයේ භාවනාව කියන දේ, හේතු ඵල දහම ගැන අවබෝධ කරන තැන, දුක්ඛ සත්‍ය පිළිසිඳ දකින තැන ගැන හොඳ අවබෝධයක් ඇති කර ගන්නට අවශ්‍ය වෙනවා.

පුණ්‍යානුමෝදනා !!!

සාධු ! සාධු !! සාධු !!!

6 පරිච්ඡේදය

ඉච්ඡාව ද අස්මි මානය ද ප්‍රශ්නේ වුනේ? සැබෑ නිස්සරණය කුමක්ද?

නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස////

පින්වතුනි, ලොව්තුරා බුදුන් වහන්සේ අපට දේශනා කළ ධර්මය තුළ අපගේ ජීවිතයේ යථාර්ථය අවබෝධය තමයි පැනවූයේ. ජීවත් වෙන තැන තියන ඇත්ත ධර්මතා පිළිබඳ ඇති කර ගන්න අවබෝධය තමයි පැනවූයේ. ඒ උතුම් ධර්මය තුළින් අපි ජීවත්වන තැන ගැන යථාර්ථයක් අවබෝධය කර ගන්නට අවශ්‍ය වෙනවා. අපි මේ වන තෙක් කතා කර ගෙන ආවේ රූප කාණ්ඩයට අදාලව හා පටිසම්භිදාමග්ගයට අදාලව. එතන්දී රූපය විස්තර වෙන වත්ථුනානත්ත ඥනය ගැන අපි සාකච්ඡා කර ගෙන යනවා. අපි අදහස් කරන්නේ කොහොම හරි රූපය පිළිබඳ කතා කරලා අවසන් කරන්න නෙමෙයි. අපේ ජීවිතය තුළම යථාර්ථයක් දැක අවබෝධ කර ගැනීමට. ඒ නිසා අදාළ මාතෘකාවට ඔබ්බෙන් ගොස් එම කරුණු ටිකට එහයින් ගිය අර්ථයකට හිත තියලා ප්‍රයෝගික භාවනාවක් වෙන්නේ කොහොමද? නිවන් දකින ප්‍රතිපදාවක් මෙයි සකස් වෙන්නේ කොහොමද? කියන මේ කාරණා ටිකම සාකච්ඡාට භාජනය වන විදියට තමයි මේ දේශනා මාලාව සිද්ධ කර ගෙන එන්නේ.

රූපය පිළිබඳ ඇති අනවබෝධය නිසා රූපය පිළිසිඳ නොදන්න කම නිසා එහි යථාර්ථය ඇත්ත ඇති හැටියට නොදන්න කම නිසා අපි හැම වෙලාවකම රූපය පිළිබඳව අවිද්‍යාවෙන් ගොඩ නඟා ගත්ත මානසික මට්ටමක් තුළ කටයුතු කරනවා. කාම භූමියේ සත්වයෝ රූපය අනුව ගිහිල්ලා රූපය පරියාපන්නව ජීවත් වෙනවා. ඒ තැනදි ගැටළුව තියෙන්නේ අපි රූපය අනුව ගියාට අපි රූපය නොවුණ තැනක රූපය විඳින කම. ඒ නිසා තමයි අපි රූපය පිළිසිඳ දැකිය යුතු වෙන්නේ. රූපයෙ යථා ස්වභාවය මොනවාද යැයි අවබෝධ කර ගත් යුතු වෙන්නේ! ධම්මසංගණී ප්‍රකරණයේ රූප කාණ්ඩයේ සම්පූර්ණයෙහ්ම විග්‍රහ කෙරෙන්නේ මේ රූප ස්කන්ධය තුළ අපි හදා ගෙන තියෙන ක්‍රමවේදය පිළිබඳව දෙපැත්තට වෙන් කරල බැලීමක් සිද්ධ කරන්නට. රූපය පිළිබඳ වැරදි දෘෂ්ටිය දුරු කරලා රූප ස්කන්ධය පිළිබඳ අවබෝධයක් ඇති කර ලීම. දුක්ඛ සත්‍ය පිළිසිඳ දැකීමට අදාල කාරණා ටික ඉදිරිපත් කිරීම. ඒ නිසා මේ

දේශනා ටික බොහොම වැදගත් වෙනවා නිර්වාණ ගාමිනී ප්‍රතිපදාවේ යෙදෙන කෙනෙකුට. මොකටද? මහා කරුණු ගොඩක් ඉගෙන ගෙන පොතක් අරගෙන ලියලා පාඩම් කර ගන්න නෙමෙයි. ජීවිතයේ ඇත්ත කතාවක් අවබෝධ කර ගන්නට අවශ්‍ය වන කරුණු ටිකක් නිසා. ඒක තුළ අපිට පේනවා අපගේ නිර්වාණ ගාමිණී ප්‍රතිපදාවේ තුළ , තමන්ට මේ යන ප්‍රතිපදාව තුළ රූපය ගැන මේ දැන ගන්න අවබෝධය හරිද? වැරදි ද? කියන තීරණය නිශ්ටාව කර ගන්න පුළුවන් කම තියෙනවා.

<u>ඵලය කියන තැනට අවශ්‍ය ඉලක්කය හදාලා දෙන්න</u>

මේ දුක්ඛ සත්‍ය පිළිසිඳ දකින්න ඕන කාරණා ටික කොටින්ම අපි මේ කතා කරන්නේ. එසේ ස්කන්ධ ටික පිළිසිඳ දකින කොට අපිට සමුදය සත්‍ය නොහටගන්න බවට යන්නට ඕනේ. නැත්නම් තව විදියකට කියනවා නම් උපාදාන ස්කන්ධය නොහට ගන්න මට්ටමට යන්නට ඕනේ. රූපස්කන්ධය හරියට ප්‍රකට වෙනකොට අපිට රූප උපාදාන ස්කන්ධය හට නොගන මට්ටමට යන්නට ඕනේ. එතනට තමයි අපිට යන්න අවශ්‍ය විග්‍රහය මේ සිද්ධ කර ගෙන යන්නේ.

<u>විදර්ශනාව විතරක් නෙමෙයි</u>

අපි මෙතන කරන්නේ ඵලය කියන තැනට අවශ්‍ය ඉලක්කය හදාලා දෙන්නට. මේ කාරණා ටික ගොඩාක් උපකාර වෙනවා ජීවිතයට. *"ඒකායනෝ අයං භික්ඛවේ මග්ගෝ, සත්තානං විසුද්ධියා"* කියලා මහණෙනි මේ නිවනට තියෙන එකම මඟයි කියලා බුදු රජාණන් වහන්සේ දේශනා කලේ සතර සතිපට්ඨානය. සතිපට්ඨාන කියන්නේ සිහිය පිහිටවීම කියන එක. සිහිය පිහිට වන්නට තැනක් දේශනා කළා වගේම ඒ පිහිට වන ලද සිහියෙන් කරන්නට වැඩකුත් අපිට දේශනා කළා. ඒ ටික තමයි අපිට *"සමුදය ධම්මානු පස්සී වා, වය ධම්මානු පස්සී වා, සමුදය වය ධම්මානු පස්සී වා"* කියන කාරණා ටිකෙන් විග්‍රහ කලේ.

මේ කතා කරන ටිකෙන් අපිට එන්නට ඕනේ අන්න ඒ උදය වැය දක්නට ඇති තැනක ඇති නුවණ ඇති කර ගැනීමක්. එහෙම නැතුව මේ ටික විතරකට හිත තියලා සතර සතිපට්ඨානයක් තුළින් සිහිය පිහිටවීමක් නැතුව කෙනෙක් නිවන කියන දෙය බලාපොරොත්තු වෙනවා නම් ඒක ඇත්තටම සිද්ධ වෙන දෙයක් නොවෙයි. මේ

කාරණා ටික පිළිබඳ හොඳ අවබෝධයක් සිද්ධ කරන්න පිළිවන් කම තියෙන්නේ සතර සතිපට්ඨානයක් තුළ මනස පිහිටුවපු කෙනෙකුටමයි. මොකද මේ ටික මතක් කලේ? ගොඩක් වෙලාවට මේ ගැඹුරු කාරණා සාකච්ඡා කර ගෙන යන කොට අනික් දේවල් බොහොම සරල දේවල් හැටියට සලකළා ඒ දේවල් අයින් කර ප්‍රතික්ෂේප කරන්නට ඇතැම් අය පෙලඹෙනවා.

සමහරු දන්නේ නැහැ බුදුරජාණන් වහන්සේ දේශනා කරන්න ගියේ විදර්ශනාව විතරක් නෙමෙයි කියන කාරණාව. මාර්ගයත් මාර්ග සත්‍යත් කියන දෙකම බුදු රජාණන් වහන්සේ පැනවූවා කියන එක ඇතැම් අයට විග්‍රහ කර ගන්න හැකියාවක් නැහැ. ඒ නිසා මාර්ගයය අදාල කාරණා වලදී වැරදි අර්ථකතන දීලා ප්‍රතිපදාව ආරම්භ කරලා වඩන එක කෙලින්ම පනවනවා පටිච්චසමුප්පාදය අවබෝධ කර ගන්න තැනයි නිවන ලැබෙන්නේ කියලා. අනික් කාරණා තුළ හිතලා නිවන ලැබෙන්නේ නෑ කියන තැනක අර මාර්ගය කියන තැන ප්‍රතික්ෂේප කිරීම් කරනවා සමහරු. ඇතැම් විට මාර්ග සත්‍යයේ කාරණා මාර්ගය තුළට බහා ලන්නටත්, මාර්ගයේ කාරණා මාර්ග සත්‍යයට බලා ලන්නටත්, නැතිනම් මේ දෙකේ සීමා නිර්ණයක් නැතිවීම තුළ බොහෝ අද සමාජයේ ප්‍රශ්න ගැටළු ඇතිවන බව දකින්න තියෙනවා.

<u>මාර්ගයත් මාර්ග සත්‍යයත්</u>

එනිසා අපිට හොඳ අවබෝධයක් ඇති කර ගන්න තියෙනවා මාර්ගයත් මාර්ග සත්‍යයත් පිළිබඳව. නිතරම මතක් කරන උදහරණයක් තමයි අපිට පඩිපෙලක් නඟින්න යන කොට කකුල උස්සලා උඩම පඩියේ කකුල තියන්න පුළුවන් වුණත් එහෙම කළාට පස්සේ යට කකුල උස්සන එක කරන්න බැහැ වැටෙන්නේ නැතුව. ඒ නිසා අපිට සිද්ධ වෙනවා උඩම පඩියට අඩිය තිබ්බාට ආපහු පළවෙනි පඩියේ ඉඳන් නැඟ ගෙන එන්න. මේ කාරණා ටික අපිට කතා කරන එක සත්‍ය ඥානය වශයෙන් අපට වැදගත් වෙන දෙයක්. මොකද? මෙතනින් නිවන වැරදුනොත් මේ මූලික තැනින්ම අපේ ඉලක්කය වැරදුනොත් එහෙනම් ඒකෙන් අපිට ප්‍රතිපදාවත් වරදිනවා.

ඒ නිසා සත්‍ය ඥානය තුළ අපිට නිවන වැරදින්න බැහැ. සත්‍ය ඥානය තුළ අපිට නිවන ගැන අවබෝධයක් තියෙන්නට ඕනේ. ඊට පස්සේ කෘත්‍ය ඥානය තුළ අපිට මේක

වඩන්න පුළුවන්කම තියෙනවා. මේ කතා කරන දර්ශනය, මේ ධර්මතා ටික, පළමුව සත්‍ය ඥානය වශයෙන් අවබෝධ කර ගන්න. ඊට පස්සේ කෘත්‍ය ඥානය වශයෙන් ජීවිතයට සතර සතිපට්ඨානය කියන තැන ඉඳලාම ඉදිරියට වඩන්න ගන්න ඒක තමයි අපි සඳහා අවශ්‍ය වන දෙය.

කලින් අපි කතා කළා ඇස තුළ, *"චක්ඛු උප්පන්නන්ති වවත්ථේති, චක්ඛු සමුදාගතන්ති වවත්ථේති. චක්ඛු අහුත්වා සම්භූතං, හුත්වා න භවිස්සතීති වවත්ථේති"* කියන කාරණය. පසුව *"චක්ඛුං අන්තවන්තතො වවත්ථේති, චක්ඛු අද්ධුවං අසස්සතං", අසස්සතං* කියන්නේ ශාස්වත හෝ අශාස්වත නෙමෙයි කියලා.අශාස්වත කියන එකෙන් කියන්නේ උච්ඡේදය නෙමෙයි, එක දිගට පවතින අර්ථයකිනුත් නෙමෙයි. හේතු ඇති කල්හි හට ගෙනෙ හේතු නිරුද්ධ වෙන කොට නිරෝධ වන ධර්මතාවයක් නිසයි. ශාස්වත කියන්නේ තියෙනෙවා කියන එක අශාස්වත කියන්නේ නැහැ කියලා සමහරු ඒ වචන වලට වැරදි අර්ථකතන දෙන්න හදනවා. නැහැ ඒක වැරදියි! අශාස්වතයි කියන්නේ නැහැ කියලා කියන්න නෙමෙයි. හේතු ටික ඇති කල්හි හට ගත් හා හේතු නිරෝධයෙන් නැති වී යන කියන මේ විග්‍රහය දෙන්න අවශ්‍ය නිසයි.

<u>අනාත්ම වචනය අනාත්ම අර්ථයෙන්මයි</u>

තව උදාහරණයක්, අනාත්මයි කියන වචනයට කෙනෙක් උත්සාහවත් වෙනවා ආත්මයක් නැහැයි කියලා, ආත්ම යනු ආත්මයක් තියෙනවයි කියලා වැරදි විග්‍රහයක් කරන්න. තවත් මෙසේම සමාජය තුළ වෙනත් අඥාන මතයක් ඇති වෙලා තියෙනවා අනාත්ම කියන්නේ ආත්ම නැති කතාවක් නෙමෙයි , අසාර කතාවක් විතරයි සාර වශයෙන් ගන්න බැරි නිසා අනාත්මයි කියලා කියනවා කියලා. බුදුන් වහන්සේ එම අනාත්ම වචනය අනාත්ම අර්ථයෙන්මයි දේශනා කලේ. *"අසස්සතං"* විග්‍රහ වූ සේම අනාත්මයි කියලා යෙදුනේ හේතු ටික ඇති කල්හි හට ගත් හා හේතු නිරෝධයෙන් නිරෝධ වුණ නිසා එක දිගට පවතින ආත්ම භාවයක් වශයෙන් පනවන්න දෙයක් නැහැ. ඒ අර්ථයෙන් අනාත්මයි කියන්නේ.

ඒ නිසා ඔය වචන වල සැබෑ අර්ථය අපි දැන ගෙන ඉන්න එක වටිනවා. *"විපරිණාමධම්මන්ති වවත්ථේති"* - වෙනස් වන ස්වාභාවයට අහුවෙන දෙයක්. ඒත්

එතන වෙනස්වීම කියන්නේ තියන ඇහැක වෙනස්වීම නෙමෙයි. ඒ මොහොතට හටගෙන නිරුද්ධ වන බව නම් ඒකටමයි එතන තියෙන විපරිණාමය යැයි අදහස් කලේ. පසුව *"චක්ඛු අනිච්චං සඞ්ඛතං පටිච්චසමුප්පන්නං ඛයධම්මං වයධම්මං විරාගධම්මං නිරොධධම්මන්ති වවත්ථේති "* කියලා නිශ්චය කර ගන්න බුදු රජාණන් වහන්සේ මෙතන විග්‍රහ කරනවා. ඊට පස්සේ තියෙන්වා *"චක්ඛුං අනිච්චතො වවත්ථේති, නො නිච්චතො; දුක්ඛතො වවත්ථේති, නො සුඛතො; අනත්තතො වවත්ථේති, නො අත්තතො; නිබ්බින්දති, නො නන්දති; විරජ්ජති, නො රජ්ජති; නිරොධෙති, නො සමුදෙති; පටිනිස්සජ්ජති, නො ආදියති. අනිච්චතො වවත්ථෙන්තො නිච්චසඤ්ඤං පජහති, දුක්ඛතො වවත්ථෙන්තො සුඛසඤ්ඤං පජහති, අනත්තතො වවත්ථෙන්තො අත්තසඤ්ඤං පජහති, නිබ්බින්දන්තො නන්දිං පජහති, විරජ්ජන්තො රාගං පජහති, නිරොධෙන්තො සමුදයං පජහති, පටිනිස්සජ්ජන්තො ආදානං පජහති. එවං චක්ඛුං අජ්ඣත්තං වවත්ථේති"*. ඔන්න ඇස ආධ්‍යාත්මිකයි කියලා විග්‍රහ කර ගන්න එක සම්පූරණව එක තැනකට කැටි කරලා අපිට මෙතනදී විග්‍රහ කරලා තියෙනවා.

<u>*නිවනද සසරද යන්න තීරණය කරන*</u>

"චක්ඛුං අනිච්චතො වවත්ථේති, නො නිච්චතො". ඇස අනිත්‍ය යැයි ව්‍යවස්ථාපනය කර ගන්න, නිත්‍ය වශයෙන් නෙමෙයි. අද තියෙන ප්‍රශ්නයක් තමයි අනිච්ච වෙනුවට අනිච්ඡ කියලා කරන වැරදි විග්‍රහ. පුද්ගල විවේචනයක් කරනවා නෙමෙයි, මම මෙතන ලොකු ප්‍රශ්නයක් දකිනවා. සමහරුන්ට හිතෙන්න පුළුවන් ඇයි මේ එක වචනයක් අල්ල ගෙන මේ තරම් කරුණු විග්‍රහ කරන්නේ කියලා? පුද්ගල ප්‍රාහාරයක් එල්ල කරනවා නෙමෙයි ඒත් මේ තුළ මහා අර්ථ හානියක් දකින්නට ලැබෙනවා. අනිච්ච වෙනුවට අනිච්ඡ කියලා ආරොපණය කිරීම තුළන් තනි අකුරක් වුනාට සම්පූර්ණයෙන්ම නිවනද සසරද යන්න තීරණය කරනා මහා බරපතල මාර්ගය සම්බන්ධ වචනයක් මේක.

කෙනෙක් වචනයක් විතරයි වචන අල්ල ගෙන මොකටද අර්ථය විතරක් ගනිත්වා කියලා කතා කළාට බුද්ධ ශාසනයේ බුදුන් වහන්සේගේ ධර්ම විනය අර්ථය විතරක්ම මූලික කර ගත්ත දෙයක් නෙමෙයි. *"අත්ථ පටිසම්භිදා"* අර්ථයත් එතෙනට අවශ්‍යයයි.

ඒ වාගේම තමයි අපිට මෙතන නිරුක්තිය වගේම පදය පිළිබඳවත් "*සාත්ථං සව්‍යඤ්ජනං කේවල පරිපුණ්ණං*" - ඒක අර්ථ සහිතයි, ව්‍යංජන සහිතයි, ඒ වාගේම හාත්පසින්ම පිරිලා තියෙන්නේ. කෙනෙක් කීවොත් ව්‍යංජනය වැදගත් නෑ කියලා ඒක වැරදියි. ඒනිසා මෙතන එක වචයනයක් ප්‍රකාශ කළාට මේ තුළ මුළු සසරමද නිවනද යන කාරණාව අඩංගු වන කොටසක්.

<u>එක අකුරක වෙනසින් අර්ථ දෙකක් වෙන්න පුළුවන්</u>

සමහරු කියනවා වැරදි මතයක් පල කරමින් පාලි භාෂාව අකුරු නැති භාෂාවක්, අකුරු නැති භාෂාවක කොහොමද අල්පප්‍රාණ මහාප්‍රාණ කතා කරන්නේ කොහොමද කියලා දෙයක්. ඇත්තටම කවුද මේ කියන්නේ පාලි භාෂාව අකුරු නැති භාෂාවක් කියලා? පාලි අපි කතා කළාට අපේ වචන වලින් ලිව්වාට ඒකාලේ පාලි භාෂාවට අකුරු තිබ්බා. අපි ඒ අකුරු වලින් අද භාවිත කරන්නේ නැහැ කිව්වාට නම් කමක් නැහැ පාලි භාෂාවට අකුරු නැහැ කියලා වැරදි මත නොකියා. ලෝකයේ අකුරු තියෙන භාෂා බොහොම සීමා සහිතයි තියෙන්නේ. ඒ භාෂා වල තියෙන අක්ෂර අනික් භාෂා වල උප භාෂා වලට ගන්නවා. ඒ කාලේ භාෂා ලේඛනගත කරන්න අක්ෂර තිබුනා. ඒකාලේ ඇත්තෝ එවා ලියුවා ඒවා ගන්ථාරූඩ කළ අවස්ථා තිබුනා.

පාලි භාෂාවේ අපේ සම්ප්‍රදායික ක්‍රමවේදය අනුව අක්ෂර භාවිතය අනුව මහා විශාල අවබෝධයකින හා අවධානයකින් කළ බවක් තමයි ඒ කාලේ තිබුනේ. හිතු මනාපේට කෙනෙකුට කතා කරන්න ලැබුනේ නැහැ. සමහර විට ආධුනිකව ශාසනයට ආපු කෙනෙක් මේ කාරණාව නොදන්න පුළුවන්. ඒවුනාට මේ ශාසනයට ශාසනික ව්‍යවහාරයක් තියෙනවා. විනය පැත්තට ගියාම හරියට කර්ම වාක්‍යයක් උච්චාරණය කරන්නේ නැත්නම් ඒ විනය කර්මයවත් හරියට සිද්ධ වෙන්නේ නැහැ. එක අකුරක වෙනසින් අර්ථ දෙකක් වෙන්න පුළුවන්. දැන් ඒකාලේ ඇත්තෝ ඔය අකුරු ගැන අවධානය යොමු නොකර කතා කළා කියලා අපිට එහෙම කියන්න පුළුවන්කමක් නැහැ. මේවා හොඳට සංග්‍රහා කරලා අරගෙන ආවා. මෙසේ ආපු දේ අද අපේ පුද්ගලික අර්ථයක් මතු කර ගන්න ඕනේ කියලා අපි වෙනස් කරන්න හරි යන්නේ නැහැ. අනිච්ච හා අනිච්ඡ (අතර වෙනස්) අර්ථය මතු කරන්න කලින් කිව යුතු කාරණාව තමයි ඒ ටික.

මෙතෙක් අපි කතා කලේ සම්මුති පැත්තෙනුත් අර වැරදි ක්‍රම වේදය තුළ මහා විශාල ධර්ම හානියක් සිදු වෙනවා අපි දාර්ශනික පසුබිම දැන් කතා කරමු. විභජ්ජාවාද යනු බෙදා දක්වන නිසා. මොන මොන කාරණා වල බෙදා දක්වන අවශ්‍යයද කියලා අපිට බලා ගන්න වෙනවා. අනිච්ච කියන පදයට වෙනුවට සමහරු අනිච්ඡ කියලා පදයක් යොදලා ඉච්ඡාව ඉෂ්ට කරන්නේ නැහැ එනම් කැමති පරිදී පවතින්නේ නැහැ (කියන අර්ථයක් ගෙනැල්ලා) කැමති වුණත් අකමැති වුණත් ස්කන්ධ ටික ඒ මට්ටමට පත්වනවානේ ඒකට මගේ ඉච්ඡාවේ බාධාවක් නැහැනේ කියන වැරදි මතයක් කියනවා. ඒ වැරදි මතයට අනුව *"චක්ඛුං අනිච්චතො වවත්ථේති, නො නිච්චතො"* කියන කොට නිච්ච කියන පදය බෙදන්නේ කොහොමද? අන්+ඉච්ඡ= අනිච්ඡ කළා නම්? (මේ ත්‍රිපිටක පෙළේ සඳහන් ව ඇති) නිච්ච කියන පදය බෙදන්න පුළුවන් ද? බැහැ. මොකද නිච්ච කියන පදය යොදන්නේ නිත්‍ය කියන අර්ථයට. ඒක න+ඉච්ඡ? කියන අර්ථයට යොදලා ඒකත් අනිත්‍ය කියන අර්ථයට ගන්න බැහැ. අනිච්ච කියන විට එහෙනම් අපිට කියන්න වෙනවා මේය කියලා තියෙන්නේ අනිත්‍ය අර්ථයෙන්ම තමයි කියලා. (එනම් අනිච්ඡ කියලා අනිච්ච වෙනුවට යෙදීම පැහැදිලිවම වැරදියි). ඒක පළවෙනි කාරණාව.

ඒවාගේම තමයි *"චක්ඛුං අනිච්චතො වවත්ථේති, නො නිච්චතො"* කියනකොට ඇස අනිත්‍ය වශයෙන් දකින්න නිත්‍ය වශයෙන් නෙමෙයි කියන කොට මෙතන කියන්නේ අපි කලින් දේශනා වල කතා කරපු හට ගෙන ඉතුරු නැතිව නිරුද්ධ වන ධර්මතාව පිළිබඳව. දැන් ඇස පෙර නොතිබීම හට ගෙන ඉතුරු නැතිව නිරුද්ධ වුනා නම් අපිට එම ඇස *"ඛය ධම්මං වය ධම්මං විරාග ධම්මං නිරෝධ ධම්මං"* කියලා කියන විදියට ඇස කියන එකේ ක්ෂය වුණ වැය වුණ ස්වාභාවයත් නිරොධයත් අවබෝධ කර ගන්න වෙනවා. ඒක තමයි අනිත්‍ය දැක්කා කියන්නේ.

ඇස පෙර නොතිබීම හට ගෙන ඉතුරු නැතිව නිරුද්ධ වුණ දේ. ඇස කියන දේ අපේ කැමැත්ත ඉෂ්ට කළාද නැද්ද කියන එක මත අදාල වෙන්නේ නැහැ. ඇස පැත්ත කැමැත්ත ඉෂ්ට කළත් නොකළත් අපිට ප්‍රශ්නයක් වෙන්නේ නැහැ නේද? අපිට කැමැත්ත ඉෂ්ට කරන්න නම් හැම වෙලාවකදීම කැමැත්ත ඉෂ්ට කරන බව හෝ

කැමති පරිදී නොපවතින බව තීරණය වන්නේ/දැන ගන්නේ පංච උපදාන මට්ටමකදී මිසක ස්කන්ධ ටිකකදී නෙමෙයි. මේ කතා කරන්නේ ස්කන්ධ ටිකකදී අනිත්‍යය වීම මිසක පංච උපාදාන මට්ටමේදී අපේ ආශ්වාදය ඉෂ්ට නොවී යන මට්ටමකට නොවේ. මේක සඳහන් කලේ මහා විශාල තර්කයක් ගොඩනඟන්න නෙමෙයි. තව කෙනෙකු දක්වන අදහසකට පහර ගහන්නත් නෙමෙයි. මේසේ සඳහන් කලේ අපි සහේතුකව යන ගමන කොතනකටද වැටෙන්නේ කියලා යන එක දැන ගෙන යනවා නම් ඒක ගොඩක් වටිනවා. බොහොම ප්‍රයෝජනවත් වෙනවා.

බුරුලේ කිරි පිරුන දෙනක් ලඟට ගිහිල්ලා අපි මේ දෙනගේ අඟ අරගෙන මට කිරි ඕනේ මට කිරි ඕනේ කියලා කිරි දෙව්වාට දෙනගේ අඟින් කවදාවත් කිරි ලැබෙන්නේ නැහැ. දෙනගෙන් කිරි ලබන්න ඕනේ නම් අපි කරන්න ඕනේ කිරි ලැබෙන බුරුලෙන් කිරි දේවීමයි. ඒ වාගේමයි මට නිවන ඕනේ මට නිවන ඕනේ කියලා කෙනෙක් නිවන නොලැබෙන තැනකට ගිහිල්ලා නිවන බලාපොරොත්තු වුනා කියලා එයාට නිවන හමු වෙලා නැහැ. එයාට වෙහෙස නම් හමු වෙලා තියෙයි.

උත්සාහයක් පෙනුනාට හැබැයි නිවන හමුවෙන්නේ නැහැ..ඒ නිසා 'බුරුලෙන්' කිරි දෙවිය යුතුයි. මෙතන උත්සහාවත් වෙන්නේ එම 'බුරුල' කොතනද කියලා පෙන්වන්න මිසක අං දෙක දොවන එක හරිද වැරදිද කියන එක නෙමෙයි. ඒ නිසා බොහොම කල්පනාවෙන් මේ කියන කතා මොන හේතුවක් නිසාද කියන්නේ කියන එක අඟ ගත්තොත් ගොඩක් ප්‍රයෝජනවත් වෙයි. විවේචනයක් කීමට වඩා මෙතන කියන්නේ අර වැරදි මාර්ගයෙන්/ප්‍රතිපදාවෙන් නිවන් දකින්න බැහැ කියලා විග්‍රහ කර දීමක්. බුදුරජාණන් වහන්සේත් එතන තියෙන දෘෂ්ටිවාද දර්ශන වලදී ඒ ගැන කතා කරලා මේ මේ හේතු නිසා එහෙම කියන්න බැහැ කියලා පැනවෙවුවා. ඇතැම් වෙලාවකට කෙනෙක් අහන්න පුළුවන් ඇයි මේ ධර්මය අරගෙන රණ්ඩු වෙන්නේ කියලා. නැහැ! ධර්මය අල්ලගෙන රණ්ඩු වෙන්න , අපිට එසේ ගැටීමක් ඇති කර ගන්න විදියක් නැහැ. එහෙත් කෙනෙක් ගැටුණු මානසික මට්ටමකින් බලනවා නම් ඒ මානසික මට්ටමට කරන්න දෙයකුත් නැහැ? හැබැයි මෙ අපි කතා කරන්නේ නිර්වාණ ගාමිණී ප්‍රතිපදාව පැහැදිලි කිරීමක් පමනයි.

<u>කැමැත්ත නිසා එයා පෙලෙනවා.</u>

අපි කතා කර ගෙන ආපු අනිත්‍ය කියන දේ ගැන කතා කරන කොට සංකල්ප දෙකක් තියෙනවා. එකක් තමයි මේකෙ *"ඛය ධම්මං, වය ධම්මං, විරාග ධම්මං, නිරෝධ ධම්මං"* කියපු පැත්ත. *"අහුත්වා සම්භූතං හුත්වා න භවිස්සති"* කියපු තැන පෙර නොතිබී හට ගෙන ඉතුරු නැතිව නිරුද්ධ වන යැයි කියපු දේ. ඒ වාගේම තව වැරදි දෘෂ්ටි ගත වුණ පැත්තක් තියෙනවා ඒ තමයි ආශ්වාදය ඉෂ්ට කරන්නේ නැහැ කියපු තැන. අදාලව යොදා ගන්න උදාහරණයක් එක්ක කිව්වොත්, ලෝකයේ ආශ්වාදය මම කැමති පරිද්දේන් තියෙන්නේ නැහැ කියන එක.

කෙනෙක් ගිහිල්ලා පත්තරයක් බලන්න ඕනේ වෙන කොට ගිහිල්ලා ලයිට් එක දානවා. ලයිට් එක දාලා ඉඳගන්න කොටම නිවෙනවා. අයෙත් ගිහිල්ලා දාලා ඉඳගන්න කොටම නිවෙනවා. දැන් මේකෙන් අපි පෙලෙන්නේ නැහැ. ඒත් එයා පෙලෙනවා. ඇයි ඒයාගෙයි බලාපොරොත්තුව එයාගෙයි ඡන්ද රාගය. එයාගේ කැමැත්ත නිසා එයා පෙලෙනවා. දැන් මෙතන අපිට කිසි ප්‍රශ්නයක් නැහැ , අපි පෙලෙන්නේ නැහැ. මොකද අපි ලඟ හේතු ටික නැති නිසා.හැබැයි යම් වෙලාවක අපි අපේම ගෙදර අපි පත්තරේ බලන්න ලයිට් එක දාලා ගිහිල්ලා ඉඳගන්න කොටම ලයිට එක නිවෙනවා. අයෙත් කලින් වගේ උත්සාහ කළාම නිවෙනවා. දැන් මොකද වෙන්නේ? අපි පෙලෙනවා. *"පීළනට්ඨෙන අනිච්චා"* කියන ඔන්න ඔය පෙලීම් අර්ථයෙන් කැමැත්ත ඉෂ්ටනොවන අර්ථයෙන් සමහරු අනිත්‍ය කතා කරනවා. මේක තමයි ඉච්ඡාව ඉෂ්ට නොවන පෙලීම් අර්ථයෙන් පෙන්වන්න හදන අනිච්ඡ කියන වැරදි සංකල්පය. බුද්ධ දේශනාවේ කතා කරන අනිත්‍ය පෙලීම නැති කරගන්න ගිහිල්ලා ඔය ඉච්ඡාව නැති කර ගන්න තැන නෙමෙයි! ඔය ඉච්ඡාව ඇති කර තැනත් නෙමෙයි ප්‍රශ්නේ වුනේ. හැම වෙලාවකම අස්මි මානය ගොඩ නැගුන තැනයි ප්‍රශ්නේ වුනේ. අනිත්‍ය කියන තැන බුදු රජාණන් වහන්සේ කතා කලේ ඔබ ලයිට් එක දකිනකම් හැමදාම ලයිට් එක (කියලා සංකල්පයක්) තියෙනවා නම්, එම 'තියෙන' ලයිට් එක පත්තු කරන්න යනවාම තමයි. ඒ නිසා අද දවසේ ලයිට් එක නොහටගන්න බවට පත් කලොත්, එතකොට මොන ලයිට එකක් කියලා ඔබ දාන්නද? මොන ලයිට එකක් නොවුනා කියලාද ඔබට ජීවිතේ දුක එන්නේ? අන්න එතන්දී තමයි බුදුන් වහන්සේ අනිච්ච නැතිනම් අනිත්‍ය දේශනා

කරන්නට යෙදුනේ. ඒකයි කිව්වේ මේක නිවනද සසරද කියලා තේරුම් කරලා දෙන දර්ශනයක් බව. අනිච්ඡ කියලා වැරදි විදියට ගත්තොත් ඒ කෙනාට ආශ්වාදය ඉශ්ට කරන දෙයක් ලෝකයේ තියනවා කියල වැරදි විදියට හිතනවා. කෙනෙක් කියන්න පුළුවන් නෑ අපි අනිච්ඡ කියලා කියන්නෙ මේ විදියේ පංච උපාදානස්කන්ධයක් ගොඩනැගෙන මට්ටමක් කියලා.

<u>වැරදි කාරණාව මතු කිරීම</u>

මේ ලඟදි දවසක එක්තරා මහත්මයෙක් ඇවිල්ලා ඔය සම්බන්ධව අපෙන් ප්‍රශ්න කිරීමක් කළා. මේ සාකච්ඡා වෙලාවේදී අපට කියනවා , *"ස්වාමීනි අනිච්ච කියනවාට වඩා අනිච්ඡ කියන එක වඩා සාර්ථකයි ඒක වඩා හරි , දැන් අපි කිව්වොත් අපි දැන් මේ තියන තේ කෝප්පයට අකමැතියි, දැන් මේ අකමැති තේ කොප්පයට ගැටෙන බව අපගේ දුක්ඛ වේදනාව. වේදනා පච්චය තණ්හා ; වේදනාවට තමයි තණ්හා කරන්නේ, අපි අකමැති වේදනාව ලැබෙන තේ කෝප්පයන් එන අකමැති වේදනාවට කවදාවත් තණ්හා කරන්නේ නැහැ, ඒ නිසා අපි තණ්හාව හදා ගන්නේ ඒ වෙලාවට හදා ගත්ත ඉච්ඡාවට සාපේක්ෂවයි. අකමැති තේ කොප්පයට අපි කැමති නැති වුනාට , අපි ඒක හදා ගත්තේ (වෙනත්) කැමති තේ කෝප්පයකට සාපෙක්ෂව. තමාට කැමති තේ කෝප්පය ලොකේ නොලැබෙන බව ලෝකයේ දක්නට තිබෙන ඇත්තක්. අපි මෙසේ වෙවා! මෙසේ නොවේවා ! කියලා කිව්වත් ප්‍රර්ථනා කළත් ලෝකය පවතින විදියට ලෝකය පවතිනවා, ඒ ලෝකයේ පවතින දේ අවබෝධ කර ගත්තොත් අන්න ඒක තමයි අනිච්ඡ වශයෙන් ආශ්වාද වශයෙන් නොගෙන ජීවත් වනවාය කියන්නේ"* කියලා ඒ මහත්මයා වැරදි අර්ථයක් විග්‍රහ කරන්න උත්සාහයක් ගත්තා.

නමුත් අපි එවේලාවේ ප්‍රශ්නය සාකච්ඡා කරන වෙලාවේදී කිව්වේ, දැන් අකමැති තේ කෝප්පය නිර්මාණය කලේ කොතනක ද? පංච උපාදානස්කන්ධයක් පිළිබඳව. ස්ඛන්ධ ධර්ම අනුව පවත්වන තණ්හාව තමයි අපිට තියන ගැටළුව. දැන් අකමැති තේ කෝප්පයකට කියලා කරන තණ්හාව අයිති වෙන්නේ මොන ස්කන්ධයටද? එසේනම් මේ පංච උපාදානස්කන්ධය අකමැති තේ කෝප්පය නම්, තණ්හා කලේ ද කැමති තේ කෝප්පයකට නම් එම තණ්හාව තිබුනේ වර්ණ සටහන තුළ ද? නැහැ ඇස තුළ ද? නැහැ. එහෙනම් සංඥා/සංඛාර/විඤ්ඤාණය තුළ ද? ඒත් නැහැ. එහෙනම් අපිට හැම

විට පංච උපාදානස්කන්ධයෙන් වෙන්වුණ තවත් ස්කන්ධයක් තියෙනවාද? එහෙම නැත් නම් අපි කැමැති සේ පවතින්නේ නෑ කියන තේ කෝප්පය පනවන්න තැනක් නැනෙ. ස්ඛන්ධ ටික දකිනකොට තේකෝප්පය පනවන්න තැනක නැති වෙයි මිසක ලෝකෙ තියන තේ කෝප්පයක් කැමති සේ පවින්නේ නෑ කියල හිතල නිවන් දකින්න බෑ. එහෙම දකිනවා නම් ඒ නිවන සත්ව පුද්ගල බව මත පිහිටි නිවනක් වෙලා තියේවි.

ස්කන්ධයන්ගේ තොර ආශ්වාදය ගෙන දෙයක් පනවන්න කම නැති බවින්ම අර මහත්මයා ඉදිරිපත් කළ අර්ථය වැරදියි. අපිට බලන්න වෙන්නේ අකමැති තේ කෝප්පයට තණ්හා කරනවා කියන කාරණාව නෙමෙයි. අකමැති තේ කෝප්පය නෙමෙයි අපිට ප්‍රශ්නය වුනේ. තේ කෝපයට කැමැති හෝ අකැමැති වීම යන දෙකම එකම මානසික මට්ටම මත. කැමති අකැමති දෙකම ජීවත් වුනේ තේ කෝප්පය මත නිසා.

<u>දෙන්නම ඉන්නේ එකම දෙය මත</u>

අපි ගත්තොත් ලෝකයේ චරිත දෙකක්. කෙනෙක්ට බොහෝ ප්‍රියයි යම් වැඩක් කරලා ඉවර වෙලා 'මම යි මේක කලේ' කියලා ටිකක් ලොකුවට නම කියා ගන්න. අභාවලා තමයි මේ මහා වැඩේ කලේ කියලා අනිත් අය කතා වෙනවාට කැමතියි . ඒක ඇහෙන කොට 'ආ මම ගැන හැමෝම කතා වෙනවා! ' කියලා ආත්ම සංඥාව එයා විඳිනවා මොකද අනිත් අයත් කතා කරන්නේ මම ගැන තමයි කියලා මම ගැන හිත පැත්තේ ආත්ම සංඥාව විඳිනවා. තව කෙනෙක් ඉන්නවා. ඒයා කැමැති නැහැ තමා කරපු වැඩේට නම කියා ගන්න. ඒයා කල්පනා කරනවා 'මම කවදාවත් නම කියා ගන්නේ නැහැ, මම ඔය නම කියා ගන්න වර්ගයේ කෙනෙක් නෙමෙයි නේ! ඔය නම කියා ගන්න ජාතියට මම අයිති නැහැ'. දැන් අපිට හිතෙන්න පුළුවන් අනේ ඒ කෙනා බොහොම හොඳයි නම කියා ගන්නවත් කැමැති නැහැ තමා කරපු වැඩකට කියලා. නමුත් ඇත්තම කතාව අපිට ලෝකයේ කොටස් දෙකක් පෙනුනාට මේ දෙන්නම ඉන්නේ එකම දෙය මතනේ? කෙනෙක් නම කියාගෙන ආත්ම භාවය විඳින කොට කෙනෙක් නම නොකිය ගෙන ආත්ම භාවය විඳිනවා. ආත්ම භාවය විඳින පැත්තෙන් දෙන්නම එකම තැන නෙමෙයි ද? ආත්ම භාවය විඳින පැත්තෙන් දෙන්නම එකම් තැන. ඒක නිසා අපිට ඔය පැත්තෙන් යන්න පුළුවන්කමක් ඇත්තේ නැහැ.

ඒවාගේ තමයි මේ කාරණාව තුළත් අපිට හැම වෙලාවක අකමැති/කැමති තේ කෝප්පයක් නෙමෙයි ප්‍රශ්නයක් වුනේ. අකමැති තේ කෝප්පය හදලා තිබුන ස්කන්ධ ටික මත තේ කෝප්පය බාහිර තියෙනවා නම් තියෙන තේ කෝප්පය අරඹයා මෙහේ හදා ගත්ත ස්කන්ධ ටිකයි ප්‍රශ්නයක් වුනේ. ඒ ස්කන්ධ ටිකටයි අපි තණ්හා කලේ. අපි තේ කෝප්පයට නම් අකමැතියි, හැබැයි ඒ අකමැති තේ කෝප්පය හදපු ඇස රූප දෙකටයි අකමැති තේ කෝප්පය හදපු ස්කන්ධ ටිකටයි නම් කැමැතියි. මාව පවත්වන්න කැමතියි නේ. එතකොට මට නේ කැමති වෙලා තියෙන්නේ. කැමති මට අකමැති තේ කෝප්පය දුක වෙන්න පුළුවන්. හැබැයි ඔය මාව කියන දේ හැදුවේත් අකමැති තේ කෝප්පයේ ස්කන්ධ ටික නිසාමනේ!

එහෙනම් ඔය තණ්හා කලේ අකමැති තේ කෝප්පය හදපු ස්කන්ධ ටිකකටයි. කැමති තේ කෝප්පය දකින කෙනත් කැමැති තේ කෝප්පය කිව්වාට එයා කැමැති වුනේ තේ කෝප්ප හදපු ස්කන්ධ ටිකට. ඒ දෙන්නම ඉන්නේ නිකාණ්ති තණ්හා කියන තැන. බැස ගැනීම් වශයෙන් ඇති කර ගන්න තණ්හාව කියන තැන. තණ්හාව කියන තැන මේ දෙන්නම ඇසුරු කරන්නේ එකම විදියට.

ඒ විදියට ඇසුරු කරන කොට මේ දෙන්නම රැදෙන්නේ තේ කෝප්පය මත. කැමති/ අකමැති වුවත් ඇති දේ මත. තව විදියකින් කියනවා නම් අස්මිමානය මත. එනම් ස්කන්ධ ටික පිරිසිඳ දැක්කේ නෑ කියන මට්ටම. බුදුන් වහන්සේ අපිට දේශනා කලේ *"වක්ඛුං අනිච්චතො වවත්ථේති, නො නිච්චතො"* කියලා -ඇස අනිත්‍ය වශයෙන් දකින්න නිත්‍ය වශයෙන් දකින්න එපා . හැම වෙලාවකදීම දැන් අපිට ඇහේ අනිත්‍ය කතා කරන කොට තේ කෝප්පයක් ගැන කතා කිරීමක් තියෙන්න විදියක් නැහැ. අපිට ලයිට් එකක් ගැන කතා කරන්න විදියක් නැහැ.

ඒකෙන් කිව්වෙ උදාහරණය අවුස්සනවා කියන කාරණය නෙමෙයි. ඒකෙන් කියන්න උත්සහාවත් වුනේ හැම වෙලාවකදීම අපිට ආශ්වාදය ඉෂ්ට කරන්න හෝ නොකරන්න හෝ අපි යන්නේ පංච උපාදාන මට්ටම අවබෝධ කර ගෙනෙ පිලිසිඳ දකින්න නෙමෙයි. පංච උපාදානස්කන්ධය අනුප්පාදයට යන විදියට දුක්ඛ සත්‍යට පිලිසිඳ

දකින්න. පංච උපාදානස්කන්ධය කියන එකේ උදය වැය බලා එය කොහොමද හැදුනේ කියලා බැලීමට. ඇස රූප දෙක ඇති කල්හි මේ විදියටයි හැදුනේ කියලා දකින කොට අපිට ඇස රූප දෙකෙහි අනිත්‍ය සාක්ෂාත් වෙයි. පෙර නොතිබීම හට ගෙන ඉතුරු නැතුව නිරුද්ධ වුනා කියපු විදියටම. අපිට හමු වෙයි ඉතුරු නැතිව නිරුද්ධ වෙනවා කියන ධර්මතා ටික. ඉතුරු නැතිව නිරුද්ධ වෙනවා කියන කාරණා ටික අවබෝධ වෙන කොට දැන් අපිට දැන් ලෝකයේ ආශ්වාදයක් පනවන්න තැනක් නැති වෙනවා

<u>නිස්සරණය පමණයි ලෝකෝත්තර දර්ශනයකට අයිති</u>

ලෝකේ ලොකුම ප්‍රශ්නය ඇති වෙන්නේ එක තැනක් නොදන්නකම නිසා. ලෝකය තුළ අර්ථ හානිය වෙන්න ලොකුම හේතුව තමයි ආශ්වාද ,අදීනව, නිස්සරණ කියන කාරණා තුන තේරුම් ගන්න බැරි වුණ මනස නිසා. ඒ කාරණා තුන පනවන්න නේ කොතනින්ද කියලා තේරුම් ගන්න බැරි කම නිසා.ඒ කියන්නේ ඇතැමුන් හිතනවා අශ්වාදය දකින කමත් ආදීනව දකින කමත් ඒ දෙකම දකින බවම තමයි නිස්සරණය කියලා. ඒ වුනාට අශ්වාදය හා අදීනවය දකිනකම නිස්සරණය නෙමෙයි. ඒ දෙක දැක්ක කෙනාට නිස්සරණය අවශ්‍යය වෙන්නේ. ඒ කෙනාට තමයි අනිත්‍ය දැක්ක යුතු වෙන්නේ.

හැමවිටම අනිත්‍ය කියන දෙය තුළ අපිට සංග්‍රහ කරන්න කාරණා කීපයක් තියෙනවා. ආශ්වාදය ඉෂ්ට කරන්නේ නෑ කියන එක තමයි *"යංපිච්චං නලභති තම්පි දුක්ඛං"* - යමක් කැමති නම් කැමති සේ පවතින්නේ නැහැ, කැමති පරිදී වෙන්නේ නැහැ. ඒ දේ නොලැබීම ඒ දේ සිද්ධ නොවීම කියන දෙය දුකක්. ඒක දුක්ඛ සත්‍යයේ දුකට ව්‍යත් කොටසක් විතරයි.. ඒක තමයි ලෝකයේ අපිට එන දුක. ඒ දුක අපි පිරිසිඳ දකින්න යනකොට එතනිනුත් එහා ගිය දුක්ඛ සත්‍ය කියන මට්මම අපට අවබෝධ කර ගන්න වෙනවා. ඒ මටම අපට අවබෝධ වෙන කොට නිස්සරණය පනවන්නේ එතනදී. ආශ්වාදය ඉතාමත් ටිකයි ආදීනවය ඉතාමත් වැඩියි කියලා දකින ඔය ආශ්වාද ආදීනව කියන දෙකම අයිති ලෞකික දර්ශනයකට. නිස්සරණය පමණකි ලෝකෝත්තර දර්ශනයකට අයිති. අද ඇතැමුන් ආශ්වාදයත් ආදීනවයත් ලෝකෝත්තර මනසකින් කියලා දාන්න ගියාට පස්සේ ඔය දෙක ගැලපෙන් නැතුව යනවා. ආශ්වාදය ලෝකයා දකිනවා, ආදීනවය ලෝකයා දකිනවා. එම ආශ්වාදය හා ආදීනවය දැකපු කෙනාට

තමයි නිස්සරණය අවශ්‍ය වෙන්නේ. ලෝකයා වරද්ද ගන්න තැන තමයි මේ නිස්සරණය. ඔය නිස්සරණය තමයි අපි අද තේරුම් ගන්න අවශ්‍ය වෙන්නේ. නිස්සරණය කියන තැන පනවනවා නම් ආශ්වාදය කියන දෙය එතකොට අපිට හැමදාම ලෝකයේ ඉෂ්ට වෙන්නේ නැහැ කියලා දකින්න ආදීනවයම තමයි කෙනෙක් (වැරදි විදියට) නිස්සරණය කියලා පනවන්නේ. ඒක හරි යන්නේ නැහැ.

මොකද ආශ්වාදය අදීනව යන දෙකම සංඛතය මත පිහිටපු දෙකක්. ඒ දේ මත අසංඛතය පිහිටා සිටීමක නැහැ. නොහට ගැන්මේ අනුප්පාදය පිහිටා සිටින්නේ නැහැ. නිස්සරණය අවශ්‍ය නම් නිස්සරණය අපට ගන්න සිද්ධවෙන තැනක් තියෙනවා. ඒ නිස්සරණය ගන්න සිද්ධ වෙන තැන තමයි බුදුරජාණන් වහන්සේ අපිට පෙන්වුයේ අනිත්‍ය අනුව බලන්න- *"චක්ඛුං අනිච්චතො වවත්ථේත නො නිච්චතො"* අනිත්‍ය විදියට ව්‍යවස්ථාපනය කරන්න. නිත්‍ය විදියට ගන්න එපා.

එක දිගට පවතින ඇහැක් හමුවුනේ නැති වුනොත්? එවිට අපිට ඇහැක් හෝ ඇස අනුව ජීවත්වුනෙ පුද්ගලයෙක් ගැන කතා කරන්න පුළුවන් කමක් හමු වෙන්නේ නෑ. හැබැයි අපේ මනස රැදිලා තියෙන්නේ එකෙ දිගට ජීවත්වෙන එක දිගට පවතින ඇහැක් පිළිබඳව වුනොත් අපිට එතකොට කතා කරන්න පුළුවන් ඇහැට පස්සේ ඇහෙන් ආශ්වාදය ඉෂ්ට කළා ද නැද්ද කියන කාරණාව. නමුත් ඇහෙන් ආශ්වාදය ඉෂ්ට කිරීමක් හෝ නොකිරීමක් හෝ වත් ඇස කියන තැනින් වෙන්නේ නැහැ. මොකද ඇස කියන එක රූපය කියන එක *'පිය රූප සාත රූප'* වෙන්නේ නැහැ. ඒක අයිත් ඇස රූප දෙක ඉතුරු නැතුව නිරුද්ධ වුණ තැනකට. *"චක්ඛුං ලෝකේ පිය රූපං සාත රූපං"* කියන එක අයිති වෙන්නේ ඇස රූප දෙක ඉතුරු නැතිව නිරුද්ධ වුණ තැනකට.

<u>චරියානානත්තඤාණ</u>

පින්වතුන්ට මෙය හොඳට පරික්ෂා කරගන්න තැනක් තියෙනවා පටිසම්භිදාමග්ගේම එන චරියානානත්තඤාණ තැනදි. එතන්දී ඤාණ චරියාව, අඤ්ඤාණ චරියාව හා විඤ්ඤාණ චරියාව කියලා තුනක් පෙන්වන කොට හොඳට ඔය කාරණා ටික බලන්න පුළුවන්. අඤ්ඤාණ චරියාව පන්වන්නේ කොතනින්ද? ඤාණ චරියාව පන්වන්නේ

කොතනින්ද? විඤ්ඤාණ චරියාව පන්වන්නේ කොතනින්ද? කියන මේ ප්‍රශ්න එතනදී හොඳට විග්‍රහ වෙනවා.

බුදුරජාණන් වහන්සේ අපිට දේශනා කලේ පෙර නොතිබීම හට ගෙන ඉතුරු නැතිව නිරුද්ධවන ස්වාභාවයක් දකින්න. එතකොට අපිට ස්කන්ධ ටික මේ මොහොතේ හට ගෙනෙ ඉතුරු නැතිව නිරුද්ධ වෙන බව දැක්කා නම්, ස්කන්ධ ටිකේ ආශ්වාදයක් ඉෂ්ට කරනවාද නොකරනවාද කියලා කාරණාවක් අදාල වෙන්නේ නැහැ. එසේ කරන්නවත්, තණ්හාවක් ඇති කර ගන්න වත් දෙයක් හමු වුනේ නැහැ. මේක හරියට කෙනෙක් දැකළා ස්කන්ධ ටිකේ අනිත්‍ය සාක්ෂාත් කලොත් එයාට තණ්හා කරන්න වත් ආශ්වාදය බලාපොරොත්තු වෙන්නවත් ප්‍රනිධියක් වශයෙන් තියා ගන්න දෙයක් හමු වෙන්නේ නැහැ.

එයාට මුළු ලෝකයම ශුන්‍යත විදියට ප්‍රකට වෙනවා. අනිමිත්ත විදියට මුළු ලෝකයම ප්‍රකට වෙනවා, අපණිහිත ලෙස මුළු ලෝකයම ප්‍රකට වෙනවා. ශුන්‍යත ,අනිමිත්ත හා අපණිහිත කියන විවිද මට්ටම් වලින් එයාල ලෝකය හමු වෙනවා.මොකද ස්කන්ධ ටිකේ අනිත්‍ය, දුක්ඛ , අනාත්ම කියන මේ ත්‍රිලක්ෂණය වශයෙන් එයා සක්ෂාත් කරලා තියෙන නිසා. ඒක නිසා ඔතනින් අනිත්‍ය වරද්ද ගන්න එපා! කවරෙකු හෝ ඔතනින් අනිත්‍ය වරද්ද ගත්තොත් එයා මුළු නිවන් මඟම වරද්ද ගත්තා වෙනවා! ඔය අනිත්‍ය (අනිච්ච) කියන තැනට අනිච්ඡ කියලා (වැරදි විදියට විග්‍රහ කරලා) දලා ප්‍රතිපදාව වඩන්න ගිය හොත් එයා මුළු නිවනම වරද්ද ගෙන ඉවරයි.

<u>ධර්මතාවය වැරදුනොත් නිවන් අවබෝධ වෙන්නේ නැහැ</u>

මේ වැරදි අදහස ඇතිවුනේ නිකම්ම නෙමෙයි. ලෝකයා අතර තිබුනා වැරදි දර්ශනයක්. ඒ තමයි අනිත්‍ය කියන කොට (එතනින් ප්‍රතිපදාව වශයෙන් වඩන්න තියෙන්නේ) මේ රූපය කැඩී කැඩී බිඳිලා වෙනස් වෙලා යන ස්වාභාවයක් තියෙනෙ දෙයක්- රූප කළාප විදියට බිඳෙනවා කැඩෙනවා වෙනස්වෙනවා- රූපයක ආයුෂ චිත්තක්ෂණ 17යි, ඒ 17ක් මේ රූපයේ පවතිලා ඉතුරු නැතිව නැතිවෙනවා. දැන් එම විදියට අපිට රූපයේ පැවැත්ම ගැන කතා කරලා (ඒ අනුව ප්‍රතිපදාව පැනවූවා)

බුදුරජාණන් වහන්සේ රූපය ගැන පෙන්වපු දේ කතා කරන්නේ නැතුව. අපි අනිත්‍ය බලන්න පුරුදු වුනා මේ කය කැඩිලා බිඳිලා විනාස වෙලා යනවා කියලා බලමින්.

අපේ පින්වතුන් අනිත්‍ය බලන්න පුරුදුවෙලා ඉන්නේ ලෝකෙ ගස් ගල් ගෙවල් යාන වාහන ඔක්කොම කැඩිලා බිඳිලා විනාශ වෙලා යන එක අනිත්‍ය වීම ලෙස. නමුත් ඇත්තටම බුදුරජාණන් වහන්සේ දේශනා කරපු අනිත්‍ය ඒක නෙමෙයි. *"චක්ඛුං අනිච්චතො වවත්ථේති නෝ නිච්චතෝ"* - ඇස අනිත්‍ය වශයෙන් දකින්න. කොහොමද? *"අහුත්වා සම්භූතං හුත්වා නභවිස්සති"* පෙර නොතිබී හට ගෙන ඉතුරු නැතිව නිරුද්ධ වනවා කියන මේ දර්ශනයෙන්. මේ දර්ශනයෙන් ඇස ගැන අවබෝධ කර ගන්න කොට අපිට ලොකු ඥාණ දර්ශනක් ඇති වෙනවා.

ඇස මේ මොහොතේම හට ගත්තා, ඒ වාගේම මේ මොහොතේම ඉතුරු නැතිව නැති වෙනවා. මේ ධර්මතාව අනුව ඇහේ පැවැත්මක් ගැන කතා කරන්න බැහැ, නොපවතින දෙයකට කොහොමද අපි තණ්හා කරන්නේ? අපි හැම වෙලාවකදීම ලෝකයේ නොපවතින දෙයකට (කියලා දැක්කම අපිට) ලෝකයේ තණ්හා කරන්න දෙයක් හමු වෙන්නේ නෑ. මොකද තණ්හා කරන්නේ පවතින දෙයකට නිසා. ආශ්වාදය ඉෂ්ට කරන්න/නොකරන්න ලෝකයේ දෙයක් පවතිලා තියෙන්න ඕනේ. ආශ්වාදය ඉෂ්ට කරන්න/නොකරන්න බව මත අපි තණ්හා කළ ඒ සමුදය. සමුදය සත්‍ය වුනේ ආශ්වාද කරනවා ද නොකරනවාද බව මත රැඳුන තණ්හාවකට නොවෙයි. සමුදය සත්‍ය වුනේ බාහිරව භෞතිකව ඇත යන සංකල්පයක් එක්කම යන නිකාන්ති තණ්හාවකට.

ස්කන්ධ ටිකේ නිරෝධය සාක්ෂාත් නොකර මට්ටමේ තිබුන (ඉතුරු නැතිව නැතිවුනා කියලා නොදැකපු) ඒ මට්ටමේ තිබුන ලක්ෂණයකට තමයි අපිට අනිත්‍ය කියන තැන කතා කලේ. ස්කන්ධ ටික ඉතුරු නැතිව නිරුද්ධ වුනා කියන බව දැක්කා නම් අපිට ආයේත් ආශ්වාදය ඉෂ්ට කරන/නොකර බව හෝ කැමති බවට අනුව පවතින/නොපවතින බවක් ගැන කතා කරන්න දෙයක් හමු වෙලා නැහැ.

දැන් ඔය වගේ අපිට දාර්ශනික පැතිකඩකින් අපිට බලන්න වෙනවා ඔය අනිච්ච කියන දෙය. අපි පත්විය යුතු නිශ්ඨාවක් ගැන කරන කතාවක් මෙතන තියෙන්නේ. මේ ධර්මතාවය වැරදුනොත් කාටවත් නිවන් අවබෝධ වෙන්නේ නැහැ.

බුදුරජාණන් වහන්සේ අපිට එක තැනකදී දේශනා කරනවා මහණෙනි විනයේ ඇති වන ප්‍රශ්නයක් ලොකු ගැටළුවක් නෙමෙයි මොකද ඒක විනයේ ඇති වුණ නිසා. අද ලෝකේ ගොඩ දෙනෙක් කතා වෙනවා මේ (අනිච්ඡ කියන දුර්මත) කාරණය කතා කරන්න කලින් හාමුදුරුවෝ අතින් කොච්ච වැරදි කරනවාද? ඒවා ගැන නේ කතා කරන්න ඕනේ කියලා. නමුත් ඒ වරදවල් ගත්තොත් ලෝකය අඩු ගානේ ඒවා වැරදියි කියලාවත් දන්නවා. ඒ වුනාට අනිච්ච ද අනිච්ඡ ද කියන මේ ප්‍රතිපදාව පිලිබඳ ප්‍රශ්නය ඊට වාඩා බලවත්, ධර්මය පිළිබඳ ඇතිවන ප්‍රශ්න විනය පිළිබඳ ඇතිවන ප්‍රශ්න වලට වඩා බලවත්. මොකද? ඒක කාටවත් ලේසියෙන් වටහා ගන්න පුළුවන් කමක් නැහැ. ඒනිසයි අපිට මේ ගැඹුරු දාර්ශනික අවබෝධයකට යන්න වෙන්නේ. බුදුරජාණන් වහන්සේ මේ දේශනා කරපු හැම පරියායකින්ම බලලා අපිට ඔය නිවැරදි අර්ථය මතුකර ගන්න අවශ්‍යය වෙනවා. ඒ තුළ අපිට අනුප්පාදය නිවනයි, සලායතන නිරෝධය නිවනයි, භව නිරෝධය නිවනයි කියපු ඔය කාරණා ටික අපිට සංග්‍රහ වෙලා තියෙන්න ඕනේ.

එහෙම නැතුව අපි නිකම්ම නිකම් කාරණා ටිකක් ගොඩ නඟා ගත්තොත් අපි එකක් හිතමින් ඉඳලා තවකක් හිතමින් වඩලා තියෙයි. අර දෙන ගේ අඟින් කිරි දෙව්වා වාගේ. හිතුවට හරි තැනින් කිරි දොවන්නේ කියලා කිරි නම් ලැබෙන්නේ නැහැ. හැම විට හරි තැනින් කිරි දොවන්න අවශ්‍යය වෙනවා. කිරි ලැබෙයි කියලා හිතලා දෙව්වාට හරි යන්නේ නැහැ.

ලෝකයා දකින දෙයක් තමයි ඔය කතා කරන්න යන කොට ඔය කවුරුත් කියන්නේ නැහැ නේ මාර්ග ඵල ලැබුවා කියලා? කියන කතාව. අපිට මොකටද තව කෙනෙකුගේ ඵලය ගැන තියෙන දැක්මක්? ලෝකයා මාර්ගයක් ප්‍රකාශ කරන්න යන කොට කෙනෙක් කියනවා ආර්යෙක් ඉදිරි පිටම ඔබ බණ අහලා ඔබ සොතාපන්න ඵලයට පත් විය යුතුයි කියලා. හැබැයි එහෙම පනවනවා නම් ඔබ හැම දේටම කලින් බව

ආර්යෙක් හඳුන ගන්න වෙනවා? ඒ කියන්නේ පරචිත්ත විජානන ඥානය ලබා ගෙන අන් අයගේ හිත දැන ගන්න මට්ටමකට හරි ? මාර්ග ඵල මනින මටමකට හරි ? එවිට මීටරයක් හඳා ගන්න හරි ඔබට කර ගන්න සිද්ධ වෙනවා නේද? එහෙම් නැත්නම් ඔබ කොහොමද ආර්යයන් මනින්නේ? ඒ නිසා ඒ වාගේ වැරදි දර්ශන වලින් යන්නට එපා! හැම වෙලාවකම තම ජීවිතය මේ ධර්මය අවබෝධ කරගන්න පැත්තකට යන්න.

වැරදි තැනකට දා ගත්තොත් ගොඩක් වෙලාවට අපි මහ අකුසල් සිද්ධ කර ගෙන නතර වෙන්නේ! ඇයි අපි ලොකයේ ආර්යයෝ ඉන්නේ නැහැ කියලා මහ උපවාද කර ගන්නේ? මෙච්චර කළක් ආර්යයෝ හිටියෙ නැහැ කියලා ඇයි උපවාද කර ගන්න හදන්නේ? ඒ නිසා ඒ පිළිබඳව කතා කරනවාට වඩා හොඳයි මම නිවන් දැක්කා ද නැද්ද කියන කාරණාව බලාගන්න එක නේද? ඒ සඳහා කවුරුත් අප්‍රමාදීව උත්සහාවත් වෙන්න. ඒ කියන්නේ මේ සක්කාය දිට්ඨිය දුරු කරගන්න එක සඳහා මේ දර්ශනය තුළ තමන්ගේ ප්‍රතිපදාව මතු කර ගෙන ඒ සඳහා උත්සාහවත් වෙන්න. .ඒක තමයි වැදගත්ම දේ වෙන්නේ. අවශ්‍යම දේ වෙන්නෙත්.

පුණ්‍යානුමෝදනා !!!

සාධු ! සාධු !! සාධු !!!

7 පරිච්ඡේදය

දුක වශයෙන් මෙනෙහි කරන්නේ සැපවශයෙන් නොමෙනෙහි කරන්නේ කෙසේද?

නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස////

පින්වතුනි, අපි කලින්ම සාකච්ඡා කරගෙන ආවේ අභිධර්ම පිටකයේ ධම්මසංගණිප්‍රකරණය රූප කාණ්ඩයේ ධර්ම කාරණා. එතනදී චක්ඛායතන රූපය පිළිබඳව විග්‍රහ කරගන්න ගිහිල්ලා අපි පටිසම්භිදාමග්ග ප්‍රකරණය එන වත්ථුනානත්ත ඤාණ සහ ගොචරනානත්ත ඤාණ අදාල කරුණු සාකච්ඡා කරන්න ගියා. අපි හාත්පස ප්‍රදේශයක් ආවරණය කරගෙන යන්නේ. මේ එකිනෙකට කාරණා ටිකක් මාතෘකා /කාරණා විදිහට දරාගන්න නෙවෙයි අවශ්‍ය වෙන්නේ. අපිට අවශ්‍ය වෙන්නේ අපේ ජීවිතයේ යෙදෙන විදිහ පිළිබඳව. යථාර්ථයක් විදිහට අපි අවබෝධ කරගන්න වැදගත් වෙන විදිහට තමයි අපි මේක යොදාගන්නේ.

අපි කලින් ඇස පිළිබඳව කතා කරන කොට, ඇසයි රූපයයි කියන කොට මේ වෙලාවෙදී, රූපයෙන් තොරව, රූපයෙන් වෙන්වූ තමාගේ ඇහැක් හෝ, තමන්ට අයිති 'වෙනම පවතින ඇහැක්' හෝ, තමා වූ ඇහැක් පවතිනවා කියලා මෙබඳු දෘෂ්ටියකට පත් නොවීම පිණිස අපි කිව්වා ඇහැත් එක්කම/හටගැනීමම තමන් ඉපදුණු බව. ඇහේ නිරුද්ධවීමම තමන් කියන බව නිරුද්ධ වුනු බව අපි සාකච්ඡා කළා. ඒ නිසා මේ කරුණු ටික ආශ්‍රයෙන් අපිට හැම වෙලාවකදීම මේ සත්ව-පුද්ගල බව ඉක්මවා ගියපු උතුම් නුවණ ඇතිවෙන්නට අවශ්‍ය වෙනවා. ඒ තමයි මේ විදිහට සාකච්ඡා කිරීම තුළ අපිට සිද්ධවෙන වැදගත්ම දේ වෙන්නේ. අපි ගිය දේශනාව තුළ සාකච්ඡා කළා *"චක්ඛුං අනිච්චතො වවත්ථේති, නො නිච්චතො"* කියන මේ වාක්‍යා පිළිබඳව. ඇස අනිත්‍ය වශයෙන් හඳුනනවා, නිත්‍ය වශයෙන් ගන්නේ නැහැ කියන කාරණාව. මෙතන්දී අපි බොහොම දුරකට බාහිර කරුණු ඔස්සේ සහ දර්ශනය ඔස්සේ, සම්මා දිට්ඨිය පැත්තට යෙදෙන විදිහට පවා කතා කළා. මේක අනිච්ච විදිහට ගන්නේ, නැත්නම් අනිත්‍යය විදිහට යෙදෙන්නේ මොන අර්ථයෙන්ද කියන කාරණය පිළිබඳව.

අපිට බාහිර කාරණාවක් විදිහට මතක් කරන්න අවශ්‍ය වෙනවා ගොඩක් වෙලාවට ගොඩක් දෙනෙක් අදහස් කරන දෙයක් තමයි '*මේ ධර්ම විනය සංස්කෘත භාෂාවට නගන්න එපා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කළා. ඒතකොට මේ සංස්කෘත භාෂාවට නැගීම තුළ ධර්ම විනයෙහි අර්ථ හානියකට ලක් වෙනවා, ඒකයි බුදුරජාණන් වහන්සේ එපා කිව්වේ කියලා*' වැරදි අර්ථයක් අද සමාජය තුළ සමාජ ගත වෙනවා. නමුත් ඇත්තටම අපි ටිකක් විමසලා බැලුවොත් බුදුරජාණන් වහන්සේ අපිට දේශනා කලේ මොකද්ද කියලා, අපිට මේ කාරණාව විග්‍රහ කර ගැනීමට අවශ්‍යය වෙන තැන් කිහිපයක් තියෙනවා. ඒ තමයි මෙතනදී බුදුරජාණන් වහන්සේ දේශනා කලේ වෛධික භාෂාවට මේ ධර්මය නගන්නට එපා කියන තැන.

<u>සලායතන නිරෝධය නිවනයි</u>

මේ සිංහලෙන් අනිත්‍යය කියලා යෙදුවා කියන එක කිසිම ගැටලුවක් නොවෙන දෙයක්. මොකද ඒ සිංහලෙන් අනිත්‍යය කියන එක යෙදුවා කියලා ධර්මයේ අර්ථයට හානියක් වෙලා නැහැ. අපි කතා කළානේ කලින් දේශනාව තුළ *"ඛයධම්මං වයධම්මං විරාගධම්මං නිරොධධම්මන්ති වවත්ථේති"* කියන තැනත් අපි කතා කළා. එතකොට මේ ක්ෂය ස්වභාවයක්, වැය ස්වභාවයක්, විරාග ස්වභාවයක්, නිරෝධ ස්වභාවයක් මේ ඇහේ තියෙනවා. අන්න ඒ ක්ෂය ස්වභාවය, වැය ස්වභාවය, විරාග ස්වභාවය, නිරෝධ ස්වභාවය අපිට ඇස කියපු එක ව්‍යවස්ථාපනය කරගන්න පෙන්නපු නිර්ණායක ටික. ඒ නිර්ණායක ටික ඔස්සේ තමයි අපිට *"චක්ඛුං අනිච්චතො වවත්ථේති, නො නිච්චතො"* - ඇස අනිච්ච විදිහට දකින්න "*නො නිච්චතො*" නිච්ච විදිහට නෙවෙයි.

මේ ඇස අනිත්‍ය විදිහට දකින කොට, නිත්‍ය සංඥාවෙන් නොදකින කොට ඇස පිළිබඳව හදාගත්ත යම් කෙලෙස් ටිකක් (ඇස අනුව ගොඩනගා ගත් යම් පුද්ගල බවක්) මේ පැත්තේ තිබුනා ඒ ටිකට පැවැත්මක් ඇත්තේ නැහැ. ඒ ගොඩනගා ගත්ත පුද්ගලබව දුරුවෙලා යනවා මොකද ස්කන්ධ නිරෝධය දක්වා ඔහුගේ මනස අරගෙන යන්න නිසා. සලායතන නිරෝධය නිවනයි. සලායතන නිරෝධය නිවනයි කිව්ව මිසක ආශ්වාදය අනුව නොදක්නේ නිවනයි කියල බුදුරජාණන් වහන්සේ කිව්වේ නැහැ.

අකුසලය බොහොම බරපතලයි

එයාට අනිත්‍යය සාක්ෂාත් කරනවා කියන තැන සාලයතන නිරෝධය සාක්ෂාත් කිරීම දක්වා නුවණ වැඩෙන්න අවශ්‍ය වෙනවා. මෙතන අනිත්‍ය/අනිච්ච කියන එකේ සත්‍ය අර්ථය තමයි අපිට ගන්නට වෙන්නේ. අනිත්‍ය කියන වචනය ගන්නට බෑම කියලා හිතෙනවා නම් අනිච්ච කියන අර්ථය ගනීවා, නමුත් ඔතන ගැටළුව තියෙන්නේ "අනිච්ඡ" කියලා මහප්‍රාණ "ඡ" යන්න දාලා පෙළ වෙනස් කරගන්න මට්ටමට නොයාවා. මොකද "අනිච්ච" කියන අර්ථය බොහොම ගැඹුරු සලායතන නිරෝධය දක්වා දිවෙන අර්ථයක්. බුදුරජාණන් වහන්සේ දේශනා කරපු තැනක්. ඒ අර්ථයක් අද වරදවා ගත්තොත්, වැරදි විදිහට අල්ල ගත්තොත් අපි මේ නිවන තමයි වැරදි විදිහට අල්ල ගත්තා වෙන්නේ.

අපි නිවන තමයි මේ වැරදි දෘෂ්ඨිය ඔස්සේ අරගෙන තියෙන්නේ, මේක හරියට අලගද්ධූපම පරියායෙන් ධර්මය ගත්තා වගෙයි. සර්පයගේ වලිගයෙන් අල්ලගත්තා වගේයි. එතකොට සර්පයා දෂ්ඨ කරනවා. තමන් විතරක් තමන්ගේ මාර්ගය වරද්දා ගත්තා නම් ඒක ලොකු අකුසලයක් නෙවෙයි, හැබැයි අපි තව මහා පිරිසක් ඒ වරද තුළ සමාදන් කරවීමෙන් අපි සිද්ද කරගන්න අකුසලය බොහොම බරපතලයි. අපිට හිතෙන්න පුළුවන් අපි ඒ අය යහපතට යොමු කරන්න නේ හැදුවේ කියලා. හැබැයි මෙහෙම ගැටළුවක් තියෙනවා, අපි කෙනෙකුට හොඳක් කරන්නට කියලා පිපාසයි කියන කොට වස දුන්නොත් බොන්න කියලා? මම පිපාසය සංසිඳුවන්නනේ හැදුවේ කියලා හරියන්නේ නැහැ! අර කෙනා මැරෙනවාමයි. ඒ නිසා අපිට යම් විදිහකින් තව කෙනෙකුට බණ දහම් කියලාදෙන්න තමයි අපි මේ හැදුවේ කියලා, අපේ කළ්‍යාණ මිත්‍ර චේතනාව කියලා හරියන්නේ නැහැ! ඒ නොදන්න අවිද්‍යාව තුළ ඔහුට දුන්න වැරදි දෘෂ්ඨිය නිසා වැරදි දර්ශනය නිසා ඔහු ඔහුගේ මුළු නිර්වනාගාමිනී ප්‍රතිපාදාවම විනාශ කරගෙන තියෙනවා.

ඒ නිසා තමන් ප්‍රත්‍යක්ෂ නොකොට, තමන් අවබොධ නොකර ඔය කාරණා ටික තමන්ගේ ජීවිතයේ යොදාගන්න එපා! තව කෙනෙක් එක්ක තමන්ගේ වැරදි දෘෂ්ඨියක් බෙදනවානම් බොහොම පරිස්සම් වෙන්න. මොකද ඒක ඒ තරම් හොඳ දෙයක් නොවන නිසා.

අද දවසේදී අපිට කතාකරන්න අදාල කොටස තමයි *"දුක්ඛතො වවත්ථේති, නො සුඛතො"* මේ ඇස දුක් විදිහට දකින්න *"නෝ සුඛතො"* සැප විදිහට දකින්න එපා කියලා. දැන් ඇස දුක් විදිහට දකින්න සැප විදිහට දකින්න එපා කියනකොට මෙතන බොහොම වැදගත් අර්ථයක් අපිට මතුකරගන්න වෙනවා. ගොඩක් වෙලාවට අද සමාජගත වෙලා තියෙන වැරදි අදහස් ගැන මේ තුළ කතා කරන්න වෙනවා. ඒකයි මුලින්ම මතක්කලේ මේ කතාකරන්නේ පුද්ගල විවේචනයකට නොවෙයි, නමුත් මේ ධර්ම මාර්ගයේ අපිට දැනගන්නට අවශ්‍යය කාරණා ටිකක් පිළිබඳව කියලා.

අපිට නිතරම ඇහෙන වාක්‍යයක් තියෙනවා, ඒ තමයි *"යදනිච්චං තං දුක්ඛං; යං දුක්ඛං තදනත්තා."* කියන මේ වචන ටික. "*යදනිච්චං තං දුක්ඛං*" යමක් අනිත්‍ය නම් මේක දුකයි. "*යං දුක්ඛං තදනත්තා*" යමක් දුක නම් ඒක අනාත්මයි. යමක් අනිත්‍ය නම් ඒක දුකයි, යමක් දුක නම් ඒක අනාත්මයි. මේ අනිච්ච, දුක්ඛ, අනත්ත කියන කාරණා තුන ගොඩක් වෙලාවට අපේ සමාජය විසින් අරගෙන තියෙන දෙයක් තමයි අනිත්‍යයි නම් 'අනිත්‍යය නිසා' ජීවිතයට දුක ආවා, දුක නිසා තමයි ඒක අසාර වුනේ, අසාර නිසා ඒක අනත්තයි. මේක අපේ සමාජ ගත වෙලා තියෙන වැරදි අර්ථකතනයක්. අනිත්‍යය නිසා කොහොමද අපිට දුක එන්නේ? අපිට දුක එන්නේ හැම වෙලාවකදීම නිත්‍යය සංඥාව නිසා ! අනිත්‍යය නිසා නෙවෙයි අපිට දුක එන්නේ නිත්‍යය සංඥාව නිසා. අපිට දුක එන්නේ ප්‍රිය දෙයින්, අපිට දුක එන්නේ නිත්‍යය සංඥාවෙන්.

හොඳට තිබුන දේ කැඩුන නිසයි මට දුක ආවේ. දැන් හොඳට තිබුන දේත් නිත්‍යයි මට කැඩුනු දේත් නිත්‍යයි. දැන් මම දුක් විඳින්නේ සම්පූර්ණවම නිත්‍යය සංඥාව මත. දැන් "*යද නිච්චං තං දුක්ඛං*" කියන එකෙන් ගන්නට එපා කොයිම වෙලාවකවත් අනිත්‍යය නිසා දුකයි කියලා. ඒක අපි බොහොම සරළව බලලා ස්පර්ශ කරන්නේවත් නැතුව කියන්න හදන අර්ථයක්.

මේ රූපේ කැඩිලා බිඳිලා විනාශ වෙලා යනව, මේක දුකයි කියන්නේ අනිත්‍යය නිසා දුක ආවා කියන්නේ, මේක ධර්මය පැත්තෙන් ගැඹුරට බලන්නේ නැතුව කතාකරන දෙයක්. ඇත්තටම අනිත්‍යය නිසා දුකයි කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කලේ

නැහැ. "යද නිච්චං තං දුක්ඛං". "යං" "අනිච්චං" "තං දුක්ඛං". "යං" යමක්, "අනිච්චං" අනිත්‍යය නම්, "තං" එය, "දුක්ඛං" දුකයි.

යමක් අනිත්‍යය නම් ඒකම දුකයි කියපු එකත්, යමක් අනිත්‍යය නම් එය නිසා දුක ආවා කියන එකයි කාරණා දෙකක්. මං හිතනවා ඒක පැහැදිලි ඇති කියලා. "යං" යමක්, "අනිච්චං" අනිත්‍යය නම්, "තං" ඒක, "දුක්ඛං" දුකයි, එතකොට අනිත්‍යයවු දෙයම දුකයි. අනිත්‍යය නිසා දුක ආවා කියනකොට මේ දේ අනිත්‍යය වුණ නිසා දුක ආවා කියන එක වෙනම කාරණයක්. මේක අනිත්‍යය වුණ නිසා, මේක නැති වුණ නිසා දුක ආවා කියන එක වැරදි අර්ථයක්.

බුදුරජාණන් වහන්සේ දේශනාකලේ අනිත්‍යය නිසා එන දුකක් නෙවෙයි. දැන් අපි ඕකටම "අනිච්ඡ" කියන අර්ථය බහා බැලුවොත්, ආශ්වාදය ඉෂ්ඨ නොකරන අර්ථයෙන්, කැමැත්ත නොපුරන අර්ථයෙන් අපි ඕක බහාලල බැලුවොත් එහෙම අපිට හම්බවෙනවා, "අනිච්ඡ" කැමැත්ත ඉෂ්ඨ නොකරන දෙයක් තියෙනවා නම් කැමැත්ත ඉෂ්ඨ නොකරන බව නිසා පෙලීම හටගන්නවා. මේ පෙලීම තමයි දුක. දැන් කැමති දෙයින් දුක ආවා. මොකක් නිසාද කැමැත්ත ඉෂ්ඨ නොකළ නිසා. හැබැයි අපි අනිත් පැත්තට කියනවා, කැමැත්ත ඉෂ්ඨ කිරීම සැපයි කියලා. කැමති දේ ඉෂ්ඨ නොකිරීම දුකනන් කැමති දේ ඉෂ්ඨ කිරීම සැපයි. එතකොට අපිට මේ ලොකේ හැම වෙලාවකදීම ගන්න වෙන තැනක් තියෙනවා, ඒක තමයි *"යද නිච්චං තං දුක්ඛං"* කියන කොට යමක් අනිත්‍යයනන් ඒකම දුකයි කියපු තැන බුදුරජාණන් වහන්සේ විග්‍රහ කලේ බොහෝම ගැඹුරු ඉතාම සියුම් ධර්ම කාරණාවක්.

ඒකයි අනිත්‍යය, දුක්ඛ, අනාත්ම කියන දේ අපි සම්මතෙන් බලල බොහොම ලස්සනට *"මේ අනිත්‍යයි කියන්නේ නැතිවෙනවනේ, දුකයි කියන්නේ මේ දුක් වු ස්වභාවයෙන් යුක්තයි නේ, මේක අනාත්මයි කියන්නේ මෙතන සත්වයෙක් පුද්ගලයෙක් නැහැනේ"* කියලා සාමන්‍ය ව්‍යවහාරය තුළ කතා කළාට ඇත්තටම මෙතන තියෙන්නේ අනිත්‍යයයි, දුකයි, අනාත්මයි කියලා කියන්නේ මේ මහා ගැඹුරු ධර්ම ප්‍රදේශයක්.

මේ කතාකරන්නේ නිර්වානගාමිණී ප්‍රතිපදාව පිළිබඳව. මේ කතා කරන්නේ උතුම් වූ විමුක්ති මුඛයක් පිළිබඳව. මේක නිවනට යන්න තියෙන දොරක්. මේක අවබෝධ කරගත්තා නම් එයාට නිවන අත ලඟ. ඒ කෙනාට හොඳ අවබෝධයකට යන්න පුළුවන්කම තියෙනවා. යමක් අනිත්‍යය නම් එය දුකයි කියන කොට අනිත්‍යය නිසා දුක ආපු දර්ශනයක්, අනිත්‍යය නිසා දුක ආපු කතාවක් නෙවෙයි බුදුරජාණන් වහන්සේ අපිට දේශනා කලේ. බුදුරජාණන් වහන්සේ අපිට දේශනා කරන්නේ යමක් අනිත්‍යය නම් ඒ අනිත්‍යය වුනු ධර්මතාවයම දුක මත පිහිටපු දෙයක්.ඒ දුක මත පිහිටපු දෙයම තමයි අනිත්‍යය වුනේ.

උදාහරණයක් කිව්වොත් මේ පොත කියන දේ, මේ පොතම අනිත්‍යය ස්වභාවයෙන් යුක්ත නම් මේ පොතම තමයි දුක්ඛ ස්වභාවයෙන් යුක්ත. ඒකෙන් කියන්නේ මේ පොත නිසා දුක්ඛ ආවා කියලා නෙවෙයි, මේ පොතම දුකයි. දැන් මොකක්ද බුදුරජාණන් වහන්සේ අනිත්‍යයි කියලා කිව්වේ? කලින් කිව්ව "*චක්ඛුං අනිච්චතෝ වවත්ථේති නෝ නිච්චතෝ*" ඇස අනිත්‍යය වශයෙන් දකින්න නිත්‍යය වශයෙන් දකින්න එපා, එහෙනම් *"චක්ඛුං දුක්ඛතෝ වවත්ථේති, නෝ සුඛතෝ"* -ඇස දුක විදිහට දකින්න සැප විදිහට දකින්න එපා! දැන් ඇස දුක විදිහට දකින්න කියලා අපිට කිව්වේ ඇහේ දුක අනුව බලන්න කිව්වේ ඇත්තටම ඇස කියන කාරණාව දුක්ඛ සත්‍යයට අයිති කාරණාවක්.

<u>ඇස ප්‍රිය මධුර වෙන්නේ ඇස නොවන මට්ටමේදී</u>

මේ ඇස කියන එක දුක විදිහට දකින්න කියලා කිව්වෙ ඇස කියන එක අනිත්‍යය ස්වභාවයෙන් යුක්ත දෙයක්. මේ පෙර නොතිබීම හටගෙන ඉතුරු නැතුවම නිරුද්ධවෙන ස්වභාවයක්, රූපස්කන්ධය පැත්තේ පවතින ධර්මතාවයක්. ඒ වගේම ඒක දුක්ඛ සත්‍යයට අයිති ධර්මතාවයක්, ඒක "*දුක්ඛතෝ වවත්තේති*" දුක්ඛ සත්‍යය මත පිහිටපු දෙයක් කියලා දකින්න. "*නෝ සුඛතෝ*" ඒක සැප වශයෙන් ගන්න එපා.

අපි කතා කළා "*චක්ඛුං ලෝකේ පිය රූපං සාතරූපං එත්ථ සෝ තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති එත්ථ නිවිසමානා නිවිසති*" -ඇස මේ ලෝකයේ ප්‍රිය ස්වභාවයෙන් යුක්තයි. මධුර ස්වභාවයෙන් යුක්තයි කියලා අපි කතා කරන තැන මධුර වෙන්නේ මොන

මට්ටමෙන්ද කියලා. ඇස ප්‍රිය මධුර වෙන්නේ ඇස නොවන මට්ටමේදී. ඇස ඉතුරු නැතුව නිරුද්ධ වුනු මට්ටමකදී. මනස තුළ මනෝ විඤ්ඤාණ මට්ටම හදාගන්න තැනදී තමයි ඇස ප්‍රිය මධුර වෙන්නේ.

දැන් ප්‍රිය මධුර වෙන මට්ටම අපි හදාගන්න එක "*නෝ සුඛනෝ*" ඒ පැත්තෙන් දකින්න එපා ඇස සැප සහගත දෙයක් කියලා. මොකද ඇස *"දුක්ඛනෝ වවත්ථේති "* දුක්ඛ සත්‍යය මත පදනම් වූ දෙයක්. ඒක දුක්ඛ සත්‍යයට අයිති. අපි දුක්ඛ සත්‍යය විස්තර කරගෙන තියෙනවා යම් කායික දුකක් තියෙනවා නම්, චෛතසික දුකක් තියෙනවා නම් ඒ කායික දුකටයි චෛතසික දුකටයි, නැතිමන් කයට දැනෙන දුකට හිතට දැනෙන දුකට අපි කිව්ව දුක කියලා. මේ දුක මිසක දුක්ඛ සත්‍යය නෙවෙයි.

දුක්ඛ සත්යය කිව්ව මේ කායික දුකයි, චෛතසික දුකයි/හිතට දැනෙන දුකයි අයින් කරලා තවත් දුකක් තියෙනවානන් මේක තමයි දුක්ඛ සත්‍යය. හැබැයි මේ දුක්ඛ සත්‍යය, දුකත් වෙනවා දුක්ඛ සත්‍යයත් වෙනවා. හැබැයි දුක දුක්ඛ සත්‍යයත් වෙන්නේ නැහැ ඒක දුකමයි.

මොකද දුක කියන දේ පදනම් වෙන්නේ හැම වෙලාවකදීම ඇති දේ මත. දැන් ඇස දුකයි නම් , ආශ්වාදය ඉෂ්ඨ නොකරන හැමැ දෙයක්ම දුකයිද? ඒක දුකයි තමයි හැබැයි ඒ දුක පදනම් වෙලා තියෙන්නේ ඇති දේ මත.
ඒක දුක. ඒක කායික දුක එක්කො චෛතසික දුක. ඔය දෙකෙන් එකකට අපි අයිතිනන් අපි කියනවා අපි ඉන්නේ දුක පැත්තේ මිසක දුක්ඛ සත්‍යය අවබෝධ කරන මට්ටමක නෙවෙයි.

දැන් අපිට අනිත්‍යය කියන තැන අවබෝධ කරන කොට, දුක්ඛ කියන තැන අවබෝධ කරන කොට අපිට එන්නට අවශ්‍යයි නුවණ, කුමක් ගැනද? දුක්ඛ ආර්ය සත්‍යය ගැන අවබෝධයක්. අනිත්‍යය වුනේ යම් ධර්මතා ටිකක් නම්, අනිත්‍යය වුනේ යම් ස්කන්ධ ටිකක් නම් පෙර හටගෙන ඉතිරි නැතුවම නැතිවුනේ, ඒ අනිත්‍යය සාක්ෂාත් කරන කොටම අපිට ඒ ධර්මතාවයම තමයි බුදුරජාණන් වහන්සේ දුක හැටියට, දුක්ඛ සත්‍යය කියලා පෙන්නුවේ.

කෙනෙකුට අනිත්‍යය දකින්න පුළුවන්, අනිත්‍යය දකින්න කොටම එයාට දුක්ඛ ආර්ය සත්‍යය ප්‍රත්‍යක්ෂ වෙනවා. කෙනෙක් යන්න පුළුවන් දුක පිරිසිඳ දකින්න, දුක්ඛ ආර්ය සත්‍යය පිරිසිඳ දකින්න මොකද්ද? මේ දේශනා කරපු දුක්ඛ ආර්ය සත්‍යය කියලා, එයාට ස්කන්ධ පැත්තෙන් දකින්න පුළුවන්, ස්කන්ධ ටික දකින කොට එයාට අනිත්‍යය තාවය ප්‍රත්‍යක්ෂ වෙනවා. ඒ කෙනාට සම්පූර්ණවම දැන් *"දුක්ඛතෝ වවත්ථේති නෝ සුඛතෝ"* කියන කොට අපිට බලාගන්න වෙනවා කොහොමද සුඛය හදාගත්තේ. අපි හැම වෙලාවකදීම ඇහෙන් සැප විඳිනවා, රූපයෙන් සැප විඳිනවා. ඇහෙන් සැප විඳින්නේ, රූපයෙන් සැප විඳින්නේ මේ ඇස රූප දෙකෙන් සැප විඳින මට්ටමකදී ඇස රූප දෙක ගැන දැනුමක්වත් නැති තැනක. ඇස රූප දෙක ගැන කතා කරන්නේ ඇත්තටම විපාක අවස්ථාවක. විපාකයක් කියල කියන්නේ මොන වගේ ස්වභාවයක්ද? විපාකයක් හැම වෙලාවකදීම *"නේව කුසලං න අකුසලං"* කුසලත් නෙවෙයි, අකුසලත් නෙවෙයි. මේ විපාකය කුසල් අකුසල් වශයෙන් ගන්න පුළුවන් කමක් නැහැ. මේකට කියනවා අව්‍යාකෘතයි කියලා. කුසල් අකුසල් වශයෙන් ව්‍යාකෘත කරන්නේ නැහැ.

මෙන්න මේ විපාක මට්ටම හැම වෙලාවකදීම කුසල් අකුසල් විදිහට යෙදෙන්නේ නැත්තම් ලෝභ, ද්වේෂ, මෝහ, අලෝභ, අද්වේෂ, අමෝහ යෙදෙන්න පුළුවන් කමක් ඇත්තේ නැහැ. මෙතන තියෙන කාරණා ටික තමයි සම්පූර්ණවම කුසල් අකුසල් වලින් මිදුණු බව. අපි දන්නවා කැමැත්ත, අකමැත්ත සාථ, අසාථ බව යෙදෙන්නේ කුසලය පැත්තට හෝ අකුසලය පැත්තට යෙදෙන කොට.

<u>පටිච්චසමුප්පාදය</u>

බුදුරජාණන් වහන්සෙ පටිච්චසමුප්පාද විග්‍රහයේදී අපි දකින සූත්‍ර විග්‍රහයට අදාලව හම්බවෙන පටිච්චසමුප්පාද විග්‍රහය නෙවෙයි. බොහොම ගැඹුරෙන් පටිච්චසමුප්පාද විභංගය තුළ බුදුරජාණන් වහන්සේ විග්‍රහ කරලා දෙනවා. මෙතනදී අපිට පෙන්වනවා *"කුසල මූල පච්චයා"* කුසල මූල පැත්තෙන් ඇතිවෙන පටිච්චසමුප්පාදයත් නැතිනම් නව කර්ම මට්ටමක, කර්ම සිත් වල ඇතිවෙන කුසල අකුසල ආදී කර්ම සිත් වල ඇතිවෙන පටිච්චසමුප්පාද ක්‍රම දෙකක් පෙන්වනවා. මේ කුසල් අකුසල් සිත්වල

ඇතිවෙන මේ පටිච්චසමුප්පාදය පෙන්වන කොට, මේ කුසල් අකුසල් විදිහට පෙන්වන පටිච්චසමුප්පාදී සිත් වල *"වේදනා පච්චයා තණ්හා"* කියන තැනදී වේදනාව විස්තර කරන කොට ඒ වේදනාව පිළිබඳ විස්තර කරන්නේ *"යං චේතෝ සම්පස්සජං සාටං සුඛං වේදයිතං"* චේතෝ සම්පස්සයෙන් උපන් යම් සාටයක් තියෙනවා නම් සුඛයක් තියෙනවා නම්, චේතෝ සම්පස්සයෙන් උපන් සාට සුඛයක් වේදනාව. මේ :*වේදනා පච්චයා තණ්හා"* කියලා නැත්නම් *වේදනා පච්චයා පසාදො* කියලා හරි උපද්දන තැනක කතාකරන තැන තමයි මේ වේදනාව අරභයා ඇතිකරගන්න සැප සහගත හෝ සුඛ සහගතව හඟින බව කොහෙන්ද ඉපදුනේ? "*චේතෝ සම්පස්සජං*" චේතෝ සම්පස්සයෙන් ඉපදුනේ. දැන් අපි දන්නවා අපි ඉගෙන ගෙන තියෙනවා චක්ඛු සම්පස්සය කියන එක උපෙක්ෂා සහගතයි කියලා. එතකොට ඒකට තමයි අව්‍යාකෘත පටිච්චසමුප්පාදය පැත්තෙන් කතා කරන කොට එතන වේදනාව කිසිම කලෙක සැප දුක් උපේක්ෂා කියලා ඇති දේ මත යෙදෙන්නේ නැහැ. එතන වේදනාව උපේකෂා සහගතයි ඒක සැප දුක් හේතු පැත්තෙන් පෙන්වන උපේක්ෂාව නෙවෙයි.

හැම වෙලාවකදීම කියන්න උත්සහවත් උනේ පටිච්චසමුප්පාදය පිළිබඳව බුදුරජාණන් වහන්සේ, පටිච්චසමුප්පාද විග්‍රහයේදී පවා අපට දේශනා කරන්නට යෙදුනේ අපි දෙයකින් සැප විඳින තැනක තියෙන යථාර්ථය. සැප විඳින තැනක තියෙන යථාභූත ස්වභාවය පිළිබඳව. අපි යම් තැනක් සැප වශයෙන් ග්‍රහනය කරනවා නම්, ඒ මට්ටම අනිවාර්යයෙන් නව කර්ම සකස් කරන මට්ටම. කුසල් හෝ වේවා අකුසල් හෝ වේවා, රූපාවචර හෝ අරූපාවචර හෝ වේවා, ලෝකොත්තර හෝ වේවා අපි නව කර්ම සකස් කරන මට්ටමක තමයි අපිට සාට අසාට ආදී දේවල් දකින්න පුළුවන්කම තියෙන්නේ.

මේ සාත අසාත වේදනා , චේතෝ සම්ම්පස්සජා, සාත අසාත බව අපිට ලෝකොත්තර ප්‍රථම භූමියට පත්වන සිත ආදී මේ කාරණා ටික, අපිට විග්‍රහ කරන්නේ නව කර්ම සිතේදී. විපාක සිතේදී, විපාක පටිච්චසමුප්පාදය පෙන්වන කොට, විපාක සිතක යෙදෙන පටිච්චසමුප්පාදය පෙන්වන කොට එතනදී බුදුරජාණන් වහන්සේ වේදනාව විස්තර කරනකොට දේශනා කලේ නැහැ, ඒක "*චේතෝ සම්පස්සජං සාතං සුඛං වේදයිතං"* කියලා. " *නේව සාතං න සුඛං*" ඒක සාතයක් නෙවේ සැපත් නෙවෙයි.

"*අදුක්ඛම සුඛං*" අදුක්ඛම සුඛයි. එතකොට විපාක සිත හැම වෙලාවකදීම අදුක්ඛම සුඛයි. මේක ගඹුරු විග්‍රහයක් ඇත්තටම.

ඒකෙන් විග්‍රහ කරන්න බලාපොරොත්තු වුණ අර්ථය තමයි අපිට යමක් දුක් වශයෙන් ගන්නවා කියන කොට, මේ දුක්ඛ සත්‍යය කියන කාරණාව ඇතුළත සමුදය සත්‍යයේ ලක්ෂණ දකින්න එපා. දුක්ඛ සත්‍යය කියලා කිව්වේ බුදුරජාණන් වහන්සේ ස්කන්ධ ටික දුකයි, ස්කන්ධ ටික දුක්ඛ සත්‍යය මත පදනම් වෙච්ච දෙයක්. මේ දුක්ඛ සත්‍යය ඇත්ත නොදන්නා කම නිසා, දුකේ යථාර්තය නොදන්නා කම නිසා ඇතිකරගන්නා මට්ටම තමයි සමුදය සත්‍යය කියන්නේ. සමුදය සත්‍යය පිහිටා සිටින්නේ දුක්ඛ සත්‍යයේ ස්කන්ධ ටික ඉතිරි නැතුවම නිරුද්ධ වුනු බව නොදන්නා කම නිසා. අනිත්‍යය බව අවබොධ කර නොගන්නා නිසා. අපිට දුක්ඛ සත්‍යයේ පිළිබඳව අනවබොධය / අවිද්‍යාව හේතු කරගෙන අපිට උපදිනවා සමුදය සත්‍යය, ස්කන්ධ ටික පිළිබඳව පුද්ගලයෙක් විදිහට, දෙයක් විදිහට, ඇති දෙයක් විදිහට අපිට හමුවෙනවා.

<u>තවත් එක් විමුක්ති මුඛයක් මේ කතාකරන්නේ.</u>

අන්න එතනදී තමයි අපි ඇහෙන් සැප විඳින මට්ටමකට පත්වෙන්නේ. මිහිරි සැපයක් ඇහෙන් ලබන්න බලාපොරොත්තු වෙන්නේ. සුඛයක් අපි ඇහෙන් දැකළා අපි ලස්සන රූපයක් බලලා සැපයක් විඳින්නේ. ඇත්තටම නව කර්ම මට්ටමේ සිතකින්. ඒක තමයි ධර්මතා විදිහට බෙදලා ගත්තොත් අපිට ගන්න තියෙන තැන. අපි සාමන්‍යය විදිහට කතාකරනවනම් අපිට එතන කතාකරන්නේ මේ පංච උපාදානස්කන්ධ කියන මට්ටමෙන්. පංච උපාදානස්කන්ධය කියන එක අපි කලින් දේශනා වලදී කතා කළා ස්කන්ධ හතරක පැවැත්මක් ඇති තැනක ස්කන්ධ පහක් විඳින මනස කියලා. රූපය ගැන අපි විඳිනවා, රූපය ගැන අපි කතාකරනවා, රූපය ගැන අපි කතා කරන්නේ රූපය ඉතුරු නැතුවම නිරුද්ධ වුනු, රූපය පූර්ණ වශයෙන් නොපවතින තැනක. අන්න ඒ මට්ටමෙදී තමයි අපි ඇහෙන් සැප විඳින්නේ. ඇස පිනවන්නේ අපි අන්න අර හිතේ ඇති කරගත්ත සාථ සහගත බව, සුඛ සහගත බව, චේතෝ සම්පස්සයෙන් හටගත්ත සැපය හා සුවය අපි දකින්න පුරුදු වෙනවා ඇහැ-රූප පැත්තට දාලා.

හැබැයි ඇහැ-රූප දෙක ඒ සුවය හටගන්න මොහොත වෙනකොටත් ඉතුරු නැතුවම නැතිවෙලා. දැන් අපි දුකේ සැපයි කියන විපල්ලාස සංඥාවට පත්වෙනවා. දැන් "*දුක්ඛතෝ වවත්ථේති නෝ සුඛතෝ*" දුක් විදිහට දකිනවා සැප විදිහට දකින්නේ නැහැ. දුක් විදිහට දකිනවා සැප විදිහට දකින්නේ නැහැ. එයා දුක් විදිහට දැක්කේ දුක්ඛ සත්‍යය පිරිසිඳ දකින මට්ටම නිසා. එයා දුක අවබෝධ කරගත්තා. එයා දුක හැටියට දැක්කා, ඒ දුක, දුක්ඛ සත්‍යය තුළ එයාට සැපයි කියන පෙරලුනු සංඥාව හටගත්තේ නැහැ. එයා දුක අවබොධ කළ නිසා. දුක්ඛ සත්‍යය, දුක්ඛ සත්‍යය හැටියට දැක්ක නිසා.

දැන් අපිට දුක්ඛ සත්‍යය හැටියට නොදන්නා කම නිසා හදාගත්තා නම් යම් විදිහකින් සැප සහගත බවක ලක්ෂණ ටිකක්, සැපයි කියලා දෙයක්, අන්න ඒ මට්ටම උපදින්නේ නැහැ. මොකද දුක් වූ ස්කන්ධ ටිකක් හටගෙන ඉතුරු නැතුවම නිරුද්ධ වූ බව දකින කොට අපිට සැප සහගත බව හටගත්තේ මොන නිරුද්ධ වූ ස්කන්ධය අරඹයාද?

කොයි වෙලාවේ නිරුද්ධ වුනු, කොයි තත්පරයේ තිබුනු අර වැස්ස ගැන කතා කළා වගේ කොයි තත්පරයේ තිබුන ඇහැද අපි දුකයි කියලා කිව්වේ? කොයි තත්පරයේ තිබුන ඇහැද අපි සැපයි කියලා කිව්වේ? ඒ මොන තත්පරයේ යෙදුනු ඇස ගැනද අපි කතා කලේ? ඒක ඉතුරු නැතුව හේතු ටික හටගත්දී හටහෙන හේතු නිරෝධයෙන් නිරුද්ධ වුනා කියලා අපි දකිනවානම් අපිට දුක් වේදනාවක් ගෙනැල්ල දෙන හෝ සැප වේදනාවක් ගෙනැල්ල දෙන බව හෝ දෙවැනි පාර විඳින්න මට්ටමක් හම්බවෙන්නේ නැහැ.

අන්න ඒ කෙනා තමයි "*දුක්ඛතෝ වවත්ථේති* " දුක විදිහට අපි ඒක නිසා ව්‍යවස්ථාපනය කළ යුතුයි සැප හැටියට බලන බව දුරු වෙන්න නම්. දැන් මේ අනිත්‍යය දකිනවා වගේම තවත් එක පැතිකඩක්. තවත් එක් විමුක්ති මුඛයක් මේ කතාකරන්නේ. ඔබ දුක්ඛ සත්‍යය පිරිසිඳ දකින්න. කොහෙද දුක්ක සත්‍යය පිරිසිඳ දැකිය යුත්තේ? යම් ස්කන්ධ ටිකක් අපි අනිත්‍යයි කියලා කතා කරානම් අන්න ඒ අනිත්‍යය වූ ස්කන්ධ ටිකම දුකයි. ඒක දුක්ඛ සත්‍යයට අයිතියි. කල්පනා කරන්න එපා කොයි වෙලාවකදීවත් ස්කන්ධ ටික අනිත්‍යය වූ නිසානේ මට දුක ආවේ කියලා. අනිත්‍යය

වෙන නිසා දුක එනවනම් ජීවිතයේ අතරක් නැර දුක එනවා. ඇයි මොහොතක් මොහොතක් පාසා ඇහැ-රූප දෙක අනිත්‍ය වෙන නිසා. අනිත්‍ය වීම නිසා දුක ආවේ නැහැ. යමක් අනිත්‍ය නම් ඒක දුකයි. හැබැයි ඒකෙන් ගන්න එපා ලෝකයේ අනිත්‍ය වෙන එහෙමත් නැත්නම් මේ විදිහට විපරිණාමයට පත්වෙන සතර මහා ධාතුව පැත්තේ ආශ්වාදය ඉෂ්ට කරන එක බලාපොරොත්තු වුණ එක නිසා දුක ආව කියල.

ආශ්වාදය නිසා දුක එන බව, ඡන්දරාගය නිසා දුක එන බව අපිට තියෙන්නේ සමුදයට මිසක සමුදය සත්‍යයට නෙවෙයි. ලෝකයේ සමුදය දකින්න පුළුවන් කාටත්. හැබැයි සමුදය සත්‍යය අවබොධ කරගන්නවා කියන එක ලේසි නැහැ. ප්‍රහාණය කළ යුත්ත ඕන අපි දකින්න. අපි ප්‍රහාණය කරන්න ඕන ලෝකයේ දෙයකට තියෙන කැමැත්ත නෙවෙයි. යමක් මතනම් අපි කැමැත්ත ඇති කරගත්තේ, ඒ කැමැත්ත ඇතිකරගත්ත දේ ගැන අපි හොඳ අවබෝධයක් ඇතිකරගන්න ඕන. කැමැත්ත ඇතිකරගත්ත දේ ගැන අපි හොඳ අවබෝධයක් ඇතිකරගන්න ඕන කොහොමද? මේකේ පැවැත්ම සිද්ධවුනේ කියලා.

ඒක නිසා තමයි අපි අර ආශ්වාදය ඉෂ්ඨ නොකරන බවට පෙන්නන එක උදාහරණයක් අරගෙන අපි කතාකලේ. ඒ උදාහරණයක් තුළ, අල්ලපු ගෙදර කෙනා පත්තරේ කියවන්න ගිහිල්ල ලයිට් එක එහෙමත් නැතිනම් ස්විච් එක දානවා, ඇවිල්ල ඉඳගන්න ගියාම ආපහු ඕෆ් වෙනවා. දැන් අපි පෙලෙන්නේ නැහැ මොකද අපේ ඡන්දරාගයක් එතෙනට නැති නිසා, එහෙමත් නැති නම් අපේ ආශ්වාදය ඉෂ්ඨ නොකරන බවක් එතන යෙදෙන්නේ නැති නිසා. හැබැයි අපි පත්තරේ බලන්න ගිහිල්ල අපි ලයිට් එක දාලා ඇවිල්ල ඉඳගන්නවා, ඉඳගන්න යනකොටම ඕෆ් වෙනවා. ආපහු ගිහිල්ල දාලා එනවා දාලා ඇවිල්ල, ඉඳගන්න යනකොටම ඕෆ් වෙනවා. දැන් අපිට පෙලීමක් හටගන්නවා. ඇයි අපේ බලාපොරොත්තුව, අපේ කැමැත්ත ඉෂ්ඨ වෙන්නේ නැහැ. ඒක ලෝකයේ පවතින ස්වභාවය, හැබැයි ඒ ස්වභාවයට ලෝකය පැවතුනාට අපිට ඒ පැත්තේ තියෙන කැමැත්ත ඉෂ්ඨ වෙන්නේ නැහැ.

දැන් මෙන්න මේ කාරණාවෙන් අපි කැමැත්ත ඉෂ්ඨ වෙන්නේ නැති බව අවබෝධ කරගෙන අපේ සංසිඳීම ගැන අපි කතා කරනවා නම්, හික්මීම ගැන අපි කතා කරනවා

නම් ඔය උදාහරණයම අරගෙන මේ ත්‍රිලක්ෂණයට(මේ අනිත්‍යය විදිහට දකිනවා, දුක්ඛ විදිහට දකිනවා කියන කාරණාවට) බහාලුවොත්, ඔය උදාහරණය තුළම මේ දර්ශනය විග්‍රහ කරන්න මම බලාපොරොත්තු වෙන්න. ඒ විග්‍රහය තුළ මට කරන්න වෙන දේ තමයි ඔබට ලයිට් එකක් හම්බවෙනකන් එලියේ, බාහිර ඇති බවට, ඒ ලයිට් එක බාහිර ඇති බවට හම්බවෙන බල්බ් එක තියෙනකන් ඔබට තණ්හාවෙන් බැඳෙන්න නම් සිද්ධ වෙනවාමයි. ඒ බල්බ් එකේ ප්‍රශ්නයක් නිසා නෙවෙයි, බල්බ් එක හම්බවුනු ස්කන්ධ ටිකට බැඳුණු කම නිසා. ඒක නිසා ඔබ අද බල්බ් එක නොහටගන්න බවට පත්කරන්න. ආශ්වාදය දුරු කරන්න නෙවෙයි බල්බ් එක නොහටගන්නා බවට පත්කරන්න. ඒක නිසා ඔබ දුක්ඛ සත්‍යය පිරිසිඳ දකින්න. බල්බ් එක හදාගත්තේ යම් ස්කන්ධ ටිකක් ඇති තැනකනම් අන්න ඒ ස්කන්ධ ටික පිළිබඳව පිරිසිඳ දකින්න.

ඔබට ආශ්වාදයක් බලාපොරොත්තු වෙන්නත්, ආදීනවයක් විඳින්නවත් එලියෙන් බල්බ් එකක් හම්බවෙන්නේ නැති වෙයි. ඇස රූප දෙක ඉතුරු නැතුව නිරුද්ධ වුනු තැනක ආශ්වාදය ඉෂ්ඨ කරන්නත්/නොකරන බව දකින්නත් ඔබට බල්බ් එකක් හම්බවෙන්නේ නැතිවෙයි. ඒක නිසා දුක්ඛ සත්‍යය පිරිසිඳ දකින තැනට ඔබේ මනස ගන්න. මේ දර්ශනය තුළ කතා කරන්නේ ඔන්න ඔය කාරණය.

ජීවිතය තුළ හොඳට දකින්න මේ අනිත්‍යය, දුක්ඛ, අනාත්ම කියන ත්‍රිලක්ෂණය, අනිත්‍යය නිසා දුක ආවා, දුක නිසා අනාත්මයි කියනවා නොවෙයි. යමක් අනිත්‍යය නම් ඒ අනිත්‍යය වුනු දේම තමයි දුක හැටියට විග්‍රහ කලේ. ඒ වගේම ඒ අනිත්‍යය වුණ දේම තමයි අනාත්ම හැටියට පෙන්නුවේ. අනිත්‍යය වූ, දුක් වූ ඒ දේම අනාත්ම ස්වභාවයෙන් යුක්තයි. ඒක අනත්ත විදිහට අර්ථ වශයෙන් සාර වශයෙන් හර වශයෙන් ගන්න දෙයක් නෑ කියලා "*අසාරකට්ටේන අනත්තා*" කියල කෙනෙකුට කියන්න පුලුවන් කම තියෙනෙවා. "*අසාරකට්ටේන අනත්තා*" කියන එක යෙදෙනවා, නොයෙදෙනවා නොවෙයි. ඒක අසාර අර්ථයෙන් අනාත්මයි කියන කොට, අනාත්ම ධර්මතාවය නිසා තමයි ඒක අසාර වෙන්නේ, අසාර නිසාම අනත්මයි, අනාත්ම නිසාම අසාරයි.හේතුව ඇයි? කිසිම හරයක් නැහැ, සාරයක් නැහැ. සාරයක් නැත්තේ ඇයි? මේ විදිහට ඇස හටගෙන ඉතුරු නැතුවම නිරුද්ධ වෙනවා නම් එතන සත්ව පුද්ගල බවක් නැහැ පනවන්න.

සත්ව පුද්ගල බවක් නැත්නම් අපි ඒකට කියනවා අනාත්ම ස්වභාවයෙන් යුක්තයි. කුමක් නිසාද මේ අනාත්ම? සත්ව පුද්ගල වශයෙන් ගන්න දෙයක් හම්බ වෙන්නේ නැහැනේ අපිට. අනාත්ම ලක්ෂනයක් ගැන කතා කරන්නේ. දැන් අපි "*දුක්ඛතෝ වවත්ථේති නෝ සුඛතෝ, අනත්ථතෝ වවත්ථේති නෝ අත්ථතෝ*" දැන් අපිට සිද්ධවෙනවා අනාත්ම වශයෙන් දකින්න, "*නො අත්තතෝ*" ආත්ම වශයෙන් දකින්න එපා. මේක ආත්ම වශයෙන් දැක්කොත්, පුද්ගල වශයෙන් දකින කම තමයි අද අපිට තියෙන ප්‍රශ්නය. එතන පුද්ගල වශයෙන් දකිනව කියල කියන්නේ, ඔබට බැහැ නම් ස්කන්ධ ටික පිරිසිඳ දකින මට්ටමට යන්න, ඒ ස්කන්ධ ටික පිරිසිඳ දකින මට්ටමට නොයා මොන විදිහේ දෙයක් ඇති වුණත්, මොන විදිහේ මට්ටමකින් පැවතුනත් ඒ දේ ප්‍රයෝජනයක් වෙන්නේ නැහැ.

හේතුව? අපිට ස්කන්ධ මට්ටමේ පිරිසිඳ දකින මට්ටම හැම වෙලාවකදීම බොහොම සියුම්ම ධර්මතාවයක්. කෙනෙක් යනවා ස්කන්ධ ටික පිරිසිඳ දකින, එයා පටිච්චසමුප්පන්න වූ ස්කන්ධ ටිකක් දකිනවා හැබැයි එයා කතාකරනවා පටිච්චසමුප්පන්න වූ ධර්මතාවයක ඇතිබව කතාකරනවා. ඕකට කියනවා "*අත්තනාව අත්තානං සංජානීති*" කියලා. මේ අනාත්මවත්වූ ආත්මය හඳුනනවා කියලා. මේ මේ හේතූන් ටික නිසා හේතු ප්‍රත්‍යයෙන් හටගන්න බව නිසා අනාත්මයි තමයි , හැබැයි අනාත්මවත් වූ ආත්මයක් තියෙනවා කියලා. පටිච්චසමුප්පන්නයි කියලා කතාකරනවා, නමුත් පටිච්චසමුප්පන්න වූ බව ආත්ම වෙලා අපිට. ඒ පැත්තෙන් අපිට යන්න පුළුවන් කමක් ඇත්තේ නැහැ.

ඒක නිසා අනාත්මය කතා කරන්නේ ආත්ම වශයෙන් ගන්න දෙයක් නැත්තන්, මේ මේ ස්කන්ධ ටික මේ මේ තැන හටගෙන ඉතුරු නැතුවම නිරුද්ධ වෙලානම්, ඇස රූප දෙක හටගෙන ඒ මොහොතේම නිරුද්ධ වෙලා නම්, දැන් මොකේද ආත්ම බව පනවන්නේ? ආත්ම සංඥාව පවත්වන්න හේතුවක් නැතිවෙලානේ. ඒ ඒ මොහොතේ හේතුඵල දහමක්, පෙර නොතිබී හටගෙන ඉතුරු නැතුවම නැතිවුනා කියන ධර්මතාවයක් නිසා. දැන් ඔබට මේ දර්ශනය ගෙනාවේ, මේ ටික කතාකරන්නේ නිකන් නෙවෙයි, අපි කතාකළා *"චක්ඛුං අජ්ඣත්තං වවත්ථේති? චක්ඛු*

අවිජ්ජාසම්භූතන්ති වවත්ථේති, චක්ඛු තණ්හාසම්භූතන්ති වවත්ථේති, චක්ඛු කම්මසම්භූතන්ති වවත්ථේති, චක්ඛු ආහාරසම්භූතන්ති වවත්ථේති, චක්ඛු චතුන්නං මහාභූතානං උපාදායාති වවත්ථේති, චක්ඛු උප්පන්නන්ති වවත්ථේති, චක්ඛු සමුදාගතන්ති වවත්ථේති. චක්ඛු අහුත්වා සම්භූතං, හුත්වා න භවිස්සතීති වවත්ථේති. චක්ඛුං අන්තවන්තතො වවත්ථේති " ලොකු පරියායන් ගොඩකින් අපි කතාකළා මේ සම්බන්දව. ඒ විකෙන් ආපු දැනුම තමයි මේ අනිත්‍ය විදිහට දකිනවා එයා, *"චක්ඛුං අනිච්චතො වවත්ථේති, නො නිච්චතො; දුක්ඛතො වවත්ථේති, නො සුඛතො; අනත්තතො වවත්ථේති, නො අත්තතො"* ආත්ම වශයෙන් දකින්න එපා. "*නිබ්බින්දති*" එහෙම කරන කොට තමයි එයා නිබ්බිදාවට පත්වෙන්නේ, නිර්වේධයට පත්වෙන්නේ. "*නෝ නන්දති*" එයා සතුටු වෙන්නේ නැහැ, මොකද් වෙන්නේ "*විරජ්ජති*" එයා මේක රජනය කරන්න යන්නේ නැහැ. එතකොට දැන් විරාගයට පත්වෙනවා, ඒ වගේම "*නිරෝධෙති*" නිරෝධයට පත්කරනවා, "*නෝ සමුදේති*" සමුදයට පත්කරන්නේ නැහැ. "*පටිනිස්සජ්ජේති*" එයා මේක දුරලන ස්වභාවයට යනවා. ඒට පස්සේ "*නො ආදියති*" ඒක එයා ග්‍රහනය කරගන්නේ නැහැ. මේ බොහොම වැදගත් වචන ටිකක් වැදගත් ලක්ෂණ ටිකක් පෙන්නන්නේ.

දැන් "*නිබ්බින්දති*" කියන කොට එයා නිර්වේධයට පත්වෙනවා, මේ විදිහට එයගේ දර්ශනය නිසා "*නිබ්බින්දති*" එයා නිර්වේධයට පත්වෙනවා."*නෝ නන්දති*" සතුටු වෙන්නේ නැහැ. එයාට සතුට පවත්වන්න පුළුවන්කම තියෙනේ මොකේද? ඔබෙන් අහන්න වෙනවා ප්‍රශ්නයක්, ඔබ හය්යෙන් වහිනවා කියලා සතුටු වුනේ කොයි වැහි බිංදුව වැටුනටද? ඔබ වහිනවා කියලා සතුටු වුණ, වැස්ස කියලා සතුටු වුණ වැහි බිංදුව පෙන්නන්න පුළුවන් වුනොත් කිසි ගැටළුවක් නැහැ. හැබැයි ඔබට වැහි බිංදුව පෙන්නන්න බෑ නම්? එහෙනම් එතන ප්‍රශ්නයක් තියෙනවා

ඒ වගේම ඇහැට රූප වහිනවා, ඒ වැහැපු රූපය ගැන ඔබ හරී සතුටුයි කියලා සතුටු වෙනවා නම් ඔබට කියන්න වෙනවා, "*නන්දති*" කිව්වේ, සතුටු වුනේ කොයි වෙලාවේ ඇහැට පතිත වුනු වර්ණ සටහනකටද? ඒ වර්ණ සටහන එතනම ඉතුරු නැතුවම නිරුද්ධ නම් දැන් ඔබ සතුටු වෙන්නේ මොකක් ගැන හිතලද? වර්ණ සටහන නිරුද්ධ නම් වර්ණ සටහණ ගැන හිතලා සතුටු වෙන්න පුළුවන් කමක් තිබ්බේ නැහැ නේද

කියලා හිතන කොටම ඔබට සතරමහාධාතුව පැත්තෙන් තමගේ සතුට දකින්න පුළුවන් කමක් නැතිවෙයි. මිදෙන පැත්තට මනස පවත්වන්න පුළුවන් කම ඇතිවෙයි. ඒකයි, "*නෝ නන්දති*" එයා නන්දනය කරන්නේ නැහැ. "*විරජ්ජති*" එයා රජනය කරන්නේ නැහැ ඒකෙන් මිදෙන්න බලනවා එයා. විරාගයට පත්කරනවා "*නෝ රජ්ජති*" එයා මේකෙන් රජනයට පත්වෙන්නේ නැහැ. ඒ වගේම "*නිරෝධෙති*" එයා නිරෝධයට පත්කරනවා. මොකද්ද? ඇස නිරෝධයට පත්කරනව, ඇහේ නිරෝධය සාක්ෂාත් කරනවා. "*නෝ සමුදෙති*" ඇස ඇති බවට යන්නේ නැහැ. ඇස ඉතුරු නැතුව නිරුද්ධයි කියල දැකපු එයාට ඇස තියනවා කියන බවකට යන්නේ නැහැ.

රූපය ඉතුරු නැතුව නිරුද්ධයි කියලා දකින එයා රූපය තියෙනවා කියලා තර්ක කරන්න යන්නේ නැහැ. එතකොට එයා "*නෝ ආදියති*" මේ ඇස ගන්නේ නැහැ "*පටිනිස්සජ්ජති*" එයා දුරලනවා. දැන් මේ විදිහට එයාට ගොඩාක් ලක්ෂණ ටිකක් තියෙනවා. "*අනිච්චතො වවත්ථෙන්තො නිච්චසඤ්ඤං පජහති*" අනිත්‍යය විදිහට දකින කෙනා නිත්‍යය සංඥාව දුරුකරනවා. එයාට මේ ලෝකයේ නිත්‍යයයි කියලා යම් සංඥාවක් තිබුනා නම්, ඒ අනිත්‍යයි කියලා දකින බව නිසා ඔහුට නිත්‍යය සංඥාව දුරුවුනා. ලෝකයේ අනිත්යය සාක්ෂාත් කරන මේ මනස නිසා, අනිත්‍යය සාක්ෂාත් කරන මේ ලක්ෂණය නිසා යම් විදිහකින් තිබුනානම් නිත්‍ය සංඥාවක්, ඇතිබවට ගත්ත සංඥාවක් තිබුනානම් ඒ නිත්‍යය සංඥාව දුරුවෙනවා "*නිච්චසඤ්ඤං පජහති*".

මේ ලෝකයේ නිත්‍යය සංඥාව කියලා කියන්නේ, මහා ලොකුවට මේ ලෝකය තියෙනවාමයි කියල හිතාගෙන ඉන්නම අවශ්‍යය නැහැ, මේ බාහිර ඉඳිකටු තුඩක් ඇතිබවට හම්බුනත් ඒකම තමයි තියෙන නිත්‍යය සංඥාව. කලින් මොහොතේ දැකපු දේ ආපහු දකින්න පුළුවන් වුනොත් ඔබට මේ ගිය තත්පරයේ දැකපු ගහ ඊලඟ තත්පරයේ දකින්න පුළුවන් වුනොත්, ගිය ක්ෂණයේ දකින්න පුළුවන් වුනු දෙය මේ ක්ෂණයේ දකින්න පුළුවන් වුනොත්, ගිය චිත්තක්ෂණයේ දැනුනු දෙය මේ චිත්තක්ෂණයේ දැනුනොත් ඔබට, ඔබ අනිත්‍යය සාක්ෂාත් කරලා නැහැ නිත්‍යය සංඥාව තුළ ඉන්නේ. ඒ ඒ මොහොතේ අනිත්‍යය සාක්ෂාත් කලොත් ඔබට නිත්‍යය සංඥාව දුරුකරන්න පුළුවන්කම ලැබෙනවා.

සිහිපත් කරගන්න පහනේ උදාහරණයක්. පහනේ උදාහරණයක් කියලා කිව්වේ අපි කිව්වා, දැල්වෙන පහනක් පිළිබඳව. දැල්වෙන පහන, මේ තත්පරයේ තෙල් ටිකත්, මේ තත්පරයේ තිරෙත්, දැල්ලත් නිසා අපි කියනවා පහන දැල්වෙනවා කියලා. ඊලඟ තත්පරයට යනකොට මේ තෙල් ටිකද? නැහැ අලුතෙන්මයි. මේ තිරයද? නැහැ අලුතෙන්මයි. මේ දැල්ලද? නැහැ අලුතෙන්මයි. තුන්වෙනි තත්පරයට යනකොට? අලුතින්ම තිරයක්, අලුතින්ම දැල්ලක්, අලුතින්ම තෙල් ටිකක්. හතරවෙනි තත්පරයෙදී, අලුතින්ම ටිකක්. දැන් අපි කියනවා පහන නිවුනා කියලා. දැන් අපිට අහන්න වෙනවා මොන තත්පරයේ තිබුන පහනද නිවුනේ කියලා. අපිට මොන තත්පරයේ තිබුන පහනද නිවුනේ? නිවුනු පහනක් ගැන කතාකරන්න බැහැනේ. ඇයි නිවුනු පහනක් ගැන කතාකරන්න බැරි? පත්තු වුනු පහනක් නොතිබුන නිසා. අපි මේ වැය වෙන හේතු ටිකටනේ පහන කියලා කිව්වේ. මේ හේතු ටික ඇති කල්හී ඇතිවුණ ඵලයට පහන කිව්වේ, ඒ හේතු ටික නිරුද්ධ වෙන කොටම පහන කියපු බව නිරුද්ධයි. අපිට පත්තු වුණ පහනක් තිබුනේ නැහැ. අපි යම් මොහොතක දැක්කනම් මේ හේතුටික ඇති කල්හී හටගන්න බව සහ ඒ මොහොතේ නිරුද්ධ වුනු නිරෝධය, අපිට පත්තු වුණ පහනක් හම්බ වෙන්නේ නැහැ. ඒක නිසා තමයි කිව්වේ "*අනිච්චතො වවත්ථෙන්තො*" අනිත්‍යය විදිහට ව්‍යවස්ථාපනය කරන කොට ඒ කෙනාට මොකද වෙන්නේ? *"නිච්චසඤ්ඤං පජහති"* නිත්‍යය සංඥාව දුරුවෙනවා.

තව අමතර කාරණාවක් මම ඉදිරිපත් කරන්නන්. ඒ කියන්නේ අපිට වර්තමානසමාජයේ තියෙන දෘෂ්ඨි වාදත් එක්ක පදනම් කරගෙන විභජ්ජවාදීව කොහොමද අපි ප්‍රශ්නයකට පිලිතුරක් සපයන්නේ කියන කාරණාවත් එක්ක තමයි මේ කාරණාව අපි විග්‍රහ කරන්න යන්නේ. "විපල්ලාස කතා" වල බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා සොවාන් ඵලයට පත්වුණ කෙනාට අනිත්‍යයේ නිත්‍යයයි කියන විපල්ලාස සංඥාව දුරුවෙලා. අනාත්මයේ ආත්මයි කියන විපල්ලාස සංඥාව දුරුවෙලා. මේ විපල්ලාස දෙක සෝවාන් අරීයන් වහන්සේට දුරුයි. දැන් *"අනිච්චතො වවත්ථෙන්තො නිච්චසඤ්ඤං පජහති"* කියන කොට අනිත්‍යය විදිහට ව්‍යවස්ථාපනය කරන කෙනා, නිත්‍යය සංඥාව දුරු කරනව කියන කොට ව්‍යවස්ථාපනය කරගන්නේ කොහොමද? ඒ කෙනා වඩනවා, ඒ කෙනා බලනවා, ඒ කෙනා මේ විදිහට නිශ්චය කරනවා අනිත්‍යය විදිහට.

සෝවාන් වෙන්න අවශ්‍යය වෙන්නේ මේ දෙය නිශ්චය කිරීමෙන් මිසක අපිට බණ ඇහීමෙන් නෙවෙයි. අපි යම් අනිත්‍යයි කියනදේ පොතකින් හරි දැකලා ඒක තමයි පරතෝගෝෂ ප්‍රත්‍යයෙන් අපිට ලැබෙන දේ, පොතකින් කියෙව්වත් ලැබෙන්නේ ඒකම තමයි, ධර්ම සාකච්ඡාවක් කළත් ලැබෙන්නේ ඒකම තමයි, තව කෙනෙකුගෙන් ඇහුවත් ලැබෙන්නේ ඒකම තමයි. දැන් අපිට මේ දේ තුළින් ලැබුන කාරණාවක් මේ විදිහට හරියට අනිත්‍යය විදිහට බලන කොට, ඒ කෙනාට මොකද වෙන්නේ? නිත්‍යය සංඥාව දුරුවෙනවා.

සෝවාන් ඵලයට පත්වෙන්න අදාල කාරණා ටිකක් අපි මේ දැන් කතාකලේ. අනිත්‍යය සංඥාවෙන් අනිත්‍යය විදිහට බලනකොට එයාට නිත්‍යය සංඥාව දුරුවෙනවා. එයාට නිත්‍යය සංඥාව දුරුවෙනවෙන කොට යම් දෙයක් නිත්‍යය කරගැනීම නිසා යම් විදිහේ මනසිකාරයක් එයා වින්දනන් ඒ විදපු මනසිකාරය ගැන එයා ලැජ්ජා සහගත වෙනවා, පිළිකුල් වෙනවා.

හොඳම උදාහරණය ගිරිමානන්ද සූත්‍රය, අනිච්ච සංඥා දෙකක් තියෙනවා. ස්කන්ධයන්ගේ අනිත්‍යය බලන තැනකුත් තියනවා, *"සබ්බසඞ්ඛාරෙසු අට්ටීයති හරායති ජිගුච්ඡති"* කියන තැනකුත් තියෙනවා. *"සබ්බසඞ්ඛාරෙසු අට්ටීයති හරායති ජිගුච්ඡති"* කියන කොට සියළු සංස්කාරයන්ගේ පිළිකුල් වෙනවා, ලැජ්ජා සහගත වෙනවා. සියළු සංස්කාරයන්ගේ ලැජ්ජා වෙන්නේ, සංස්කාරයන්ගෙන් එයා අශ්වාදය ඉෂ්ට කරන පැත්ත බලලා නෙවෙයි. සංඛාරය අශ්වාදය ඉෂ්ට කරන පැත්ත නෙවෙයි, සංඛාරය නිත්‍යයි කියලා හිතාගෙන හිදීම තුළ, නිත්‍යා වූ සංඛාරයක් එයාට තිබුනා නම්, පුරාණ ආශ්‍රව ටිකක් මත හදාගත්ත පුද්ගලභාව විදින මානසික මට්ටම ගැන එයා කළකිරෙනවා.

ඒ මට්ටමේ එයා ලැජ්ජා සහගතවෙනවා, ඒ පුද්ගල බව ඇත්තකරගත්ත බව කෙරෙහි. එතකොට මේ සංකාරය ඇත්ත කරගත්ත බව, සංකාරය නිත්‍යය කරගත්ත කම ගැන එයා කළකිරෙනවා, එයා අනිත්‍යය විදිහට දකින කොට එයා සියළු සංකාරයෝ නිත්‍ය විදිහට ගත්ත සංකාරයන්ගේ කළකිරෙනවා. මේ ඔක්කොම එකම තැනකට

යොමුවෙන, එකම තැනකට යෙදෙන කරුණු කාරණා ටිකක්. ඒ නිසා අපේ නිර්වාණගාමිනී ප්‍රතිපදාව තෝරාගන්න කොට සමහර විට සුළු වචනයක් වෙන්න පුළුවන් හැබැයි ඒ සුළු වචනයෙන් වෙනස් වෙන අර්ථය මහා විශාලයි. මොකද ඒකෙන් ඔබේ මුළු ප්‍රතිපදාවම වෙනස් කරලා. මුළු ප්‍රතිපදාවම වෙනස් වුනොත් ඔබට යන්න වෙන්නේ නිවනට නෙවෙයි.න් ඒ නිසා ඒ කාරණාව හොඳට මතකයේ දරා ගෙන ඒ කාරණාව සිහිපත් කර ගන්න.

පුණ්‍යානුමෝදනා !!!

සාධු ! සාධු !! සාධු !!!

8 පරිච්ඡේදය

නො ඇලෙයි,නිරුද්ධ කරයි,නොඋපදවයි, අත්හරියි

නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස////

පින්වතුනි, බුදුරජාණන්වහන්සේ අපිට පන්සාලිස් වසක් මුළුල්ලෙහි එකදු හිස් වචනයක් වත් නැතිව නිවන් පිණිස පවතින වටිනා දහමක් දේශනා කළා. ඒ වටිනා ධර්මය "*ආදි කළ්‍යාණං*", මුල යහපත්, ඒ වගේම "*මජ්ඣ කළ්‍යාණං*" මැද යහපත් ඒ වගේම "*පරියොසාන කළ්‍යාණං*" පරියෝසානය, කෙලවර යහපත්. මේ මුල, මැද, අග යහපත් මේ ධර්මය මුලින් සඳහන් කරන කාරණා මැදින් දැක්වෙන දේට ගැලපෙන්න අවශ්‍යයි. මැදින් දැක්වෙන දේ කෙලවර දැක්වෙන දේට ගැලපෙන්න අවශ්‍යයි. ඒක අනුපූර්ව වශයෙන් යන ප්‍රතිපදාවක් සමග අපිට දැක්වෙන්න අවශ්‍යයි. මේ සියළු කාරණා මේ සද්ධර්මය තුළ දැක්වෙනවා.

අපි මේ විදිහට ධර්මසංගණී ප්‍රකරණයට අදාලව වටිනා දහම් පරියායක් සාකච්ඡා කරගෙන ආවා. රූප කාණ්ඩයට අදාල කොටස් ටික. කාමාවචර සත්වයෝ, කාම භූමියේ සත්වයෝ රූපය අනුව ගිහිල්ලා රූපය පරියාපන්නව ඉන්නවා. ඒ නිසා අපි රූපය පිළිබඳව අවබෝධ කරගන්න එක, රූපය පිළිබඳව දැනුම ඇති කරගන්න එක බොහොම වැදගත් වෙනවා. ඒ රූපය පිළිබඳව ඇති දැනුම තමයි අපිට විදර්ශනා නිශ්‍රිත මනසිකාරයකට උපකාර වෙන්නේ කියන එක අපි මුලින්ම මතක්කරන්නට යෙදුනා. එතනදී අපගේ විදර්ශනා මනසිකාරය දිවෙන්නට කෝච්චියක් යන්නට රේල් පීල්ලක් අවශ්‍යයි වගේම අපේ නුවන මේ විදර්ශනා මනසිකාරය දිවෙන්නට සත්‍යය ඥානයක් වශයෙන් මේ උතුම් ධර්ම කාරණා පිළිබඳව දැනුමක් අපිට අවශ්‍යය වෙනවා. ඒක නිසා මේක බොහෝම ප්‍රයෝජනවත් දෙයක් තමන්ගේ ජීවිතය තුළින් දකින්න උත්සහවත් වෙන කෙනෙකුට.

ඒ වගේම තමයි අපිට කරුණු කාරණා ටිකකින් ඔබ්බට ගිහිල්ලා තමන්ගේ ජීවිතය තුළින් ප්‍රත්‍යක්ෂ කරගනිමින් මේක අපි ශ්‍රවනය කරන කොට අපිට මේ මොහොතේදීත් භාවනාවක් සිද්ධවෙනවා හිතේ මනසිකාරයේ වැඩීමක්, මනසිකාරයේ දියුණුවීමක් සිද්ධවෙනවා. ඒ නිසා හොඳ සිහිකල්පනාවකින් යුක්තව අපි මේ කියන කාරනා ටික

ධාරණය කරගන්නට අවශ්‍යය වෙනවා. අපි රූප කාණ්ඩයේ ඒ කොටස් ටික සාකච්ඡා කර දුවිධෙන රූපසඞ්ගහො කොටස සාකච්ඡා කළා. ඒකෙදී "*අත්ථි රූපං උපාදා, අත්ථි රූපං නො උපාදා.*" කියන මේ කොටස සාකච්ඡා කරන්නට ගිහිල්ලා, උපාදා රූපයක් තියනවා කියලා උපාදා රූපය විස්තර කරන කොට, චක්ඛායතනය ආදී ආයතන ටික විස්තර කරගන්න යනකොට අපි එතනදී උපකාර කරගත්තා, පටිසම්භිදාමග්ග ප්‍රකරණයේ එන ඥාණ කථාවල ව්‍යවස්ථාපනය පිළිබඳව නැතිනම් ආධ්‍යාත්මික ධර්මතාවයන් හා බාහිර ධර්මයන් ව්‍යවස්ථාපනය කරන ප්‍රඥාව පිළිබඳව එන නුවණ. එතනදී වත්ථුනානත්තඤාණදී අපි ආධ්‍යාත්මික වස්තූන් ව්‍යවස්ථාපනය කරගන්නේ කොහොමද කියන එක පිළිබඳව පහුගිය දේශනාවන් තුළදී සාකච්ඡා කළා.

මේ රූපය "*අනිච්චතො වවත්ථේති, නො නිච්චතො; දුක්ඛතො වවත්ථේති, නො සුඛතො*" කාරණා ටික අපි කතා කළා. සාමන්‍යයෙන් දළ වශයෙන් කෙටියෙන් අපි මතක් කරගත්තොත් "*අනිච්චතො වවත්ථේති, නො නිච්චතො*" කියලා කියන කොට අනිත්‍යය වශයෙන් රූපය දකිනවා, රූපය මෙනෙහි කරනවා "*නො නිච්චතො*" නිච්ච වශයෙන් නෙවෙයි. අනිත්‍යය වශයෙන් රූපය මෙනෙහි කරන කොට, රූපය දකින කොට අපිට අනිත්‍යානු දර්ශනය කියල කියන කොට විමුක්ති මුඛයක් හැටියට. එහෙමත් නැතිනම් නිවනට බොහොමත්ම සමීපස්ථ ධර්මයක් විදිහට අපිට හොඳට ප්‍රකට වන්නට අවශ්‍යය වෙනවා මේ අනිත්‍යය කියන කාරණාව. අපිට හැම වෙලාවකදීම අපේ ජීවිතයේ නිත්‍යය සංඥාව මත පදනම් වෙලා. ඇති දේ මත පදනම් වෙලා තියෙනවා කියන අන්තය තුළ, ඇත කියන අන්තය තුළ ජීවත් වෙනවා.

මේ ඇත කියන අන්තය තුළ ජීවත් වෙන අපිට තියෙනවා කියන කාරණය තුළ පදනම් වෙලා මුළු දර්ශනයම හදාගත්ත අපිට මේ නිත්‍යය සංඥාව දුරලීම පිනිස තමයි අනිත්‍යය සංඥාව පෙන්නුවේ එහෙමත් නැතිනම් මේකේ යථාභූත ඥාන දර්ශනයක් ඇතිකරගන්නට අවශ්‍යය ක්‍රම වේදය අපිට දේශනා කලේ. "*අනිච්චතො වවත්ථෙන්තො නිච්චසඤ්ඤං පජහති*" යම් කිසි කෙනෙක් අනිත්‍යය වශයෙන් දකින කොට එයාගෙන් නිත්‍යය සංඥාව දුරුවෙනවා.

අපි එදත් මතක්කළා මේ "අනිච්ච" සහ "අනිච්ඡ" කියන මේ කාරණා දෙක පිළිබඳව අද ලෝකයේ බොහොම ප්‍රශ්නයක් තියෙනවා, මේක ඇත්තටම කිව්වොත් නිවන සම්බන්ඳව තියෙන ප්‍රශ්නයක් කියලා කියන්න පුළුවන්. මෙතනදී බුදුරජාණන්වහන්සේ අපිට දේශනා කරනවා "*අනිච්චතො වවත්ථෙන්තො නිච්චසඤ්ඤං පජහති*", අනිත්‍යය වශයෙන් දකින කොට "නිච්ච" කියන්නේ මේ කියන්නේ "නිච්ඡ" කියල කියන "ඉච්ඡ සංඥං පජහති" නෙවෙයි! කැමති සංඥාව දුරුකරනවා, ආශ්වාදය ඉෂ්ට කරන සංඥාව දුරුකරනවා කියන අර්ථයක් නෙවෙයි දේශනා කරන්නේ. අනිත්‍යය වශයෙන් බලන කොට ඒ කෙනාගේ නිත්‍යය වූ සංඥාව දුරුකරනවා, "*නිච්චසඤ්ඤං පජහති*" අනිත්‍යයි කියල තියෙන සංඥාව දුරුවෙනවා.

<u>තිබුන ලෝකයේ අපි ඉපදුනා?</u>

පින්වතුනි, අපි ලෝකයක් ඇති බවට අපි ගොඩනගා ගන්නේ පූර්ණ වශයෙන්ම අපේ තියෙන නිත්‍යය සංකළපනාව නිසා, නිත්‍ය සංඥාව නිසා. අපි කිව්වොත් අපේ දෘෂ්ටියක් තියෙනවා, අපේ දැක්මක් තියෙනවා අපි උපදින්නට කලින් මේ ලෝකය තිබුනා, තිබුන ලෝකයේ අපි ඉපදුනා, ඒ වගේම ඒ තියෙන ලෝකයේ අපි ජීවත් වෙනවා, ඒ වගේම ලෝකය තියෙන කොට අපි මැරිලා යනවා. මේක තමයිඅපේ සාමන්‍යය දර්ශනය, පොතුජ්ජනික නැතිනම් පෘතජ්ජනයාගේ තියන දර්ශනය තමයි ඔන්න ඔය ඇත කියන අන්තය තුළ පිහිටි, නිත්‍යය සංඥාව මත පදනම් වුණ දර්ශනය, දැක්ම. අපිට යම් විදිහකින් ඔය ධර්මතාවය පිළිබඳ ඔතන ඇති යථාර්ථය පිළිබඳ අවබෝදයක් කරනවා නම් අපිට පේනවා ඔය ලෝකය හැදුන තැන ඒ වගේම ලෝකය නැතිවුණ ආකාරයත් අපිට හොඳට දකින්න පුළුවන්කම තියෙනවා. ලෝකයත්, ලෝක සමුදයත්, ලෝක නිරෝධයත්, ලෝක නිරෝධගාමිණී ප්‍රටිපදාවත් මේ බඹයක් පමන වූ ශරීරයෙන් පනවනවා කියලා බුදුරජාණන්වහන්සේ ප්‍රකාශ කළා නම්, අපි මේ ලෝකය කියලා අපි දකින දැක්මට, අද තියෙනවා කියලා හිතාගෙන ඉන්න ලෝකයට වඩා එහා ගියපු, හොඳ දැක්මක්, නුවණ අපිට ඇතිකරගන්නට පුළුවන් වෙයි.

පින්වතුනි, අපි අද දවසේ ඇතිබවට ගන්න, නිත්යය සංඥාවෙන් ඇසුරු කරන ලෝකය දිහා නැවත හැරිලා බැලුවොත්, අපිට දකින්න තියෙනවා කාරණා කීපයක්. ඒ තමයි එක්කෝ අපි රූපය තියෙනවා කියලා හිතාගෙන ඉන්නවා වර්ණ සටහන පැත්තෙන්. ඒ

වගේම ශබ්දය, ගන්ධය, රසය, සපර්ශය කියන මේ දේවල් ටික තියෙනවා කියලා හිතාගෙන ඉන්නවා, මේ ටික මත පදනම් වෙලා තමයි මුළු ලෝකයම අපිට ඇතිබවට ගෙනැල්ලා දීල තියෙන්නේ. තව විදිහකින් කිව්වොත්, ඇස, කන, නාසය, දිව, ශරීරය කියන මෙන්න මේ කාරණා ටික පදනම් කරගෙන.

<u>රූප කළාප බිඳී බිඳී යන එක බලනවා?</u>

ඒ නිසාම තමයි බුදුරජාණන්වනහ්සේ අපිට අනිත්‍ය කියන දේ දේශනා කලේ, මෙතනදී අනිත්‍ය කියනකොට වරදවා ගන්න එපා. අනිත්‍ය කියන වචනයෙන් බුදුරජාණන්වනහ්සේ විග්‍රහ කරන්නේ ඇති දෙයක නැතිබව නෙවෙයි. තියෙන දෙයක් නැතිවෙලා යන බව, ඒකේ විපරිණාමයක් කියන කාරණාවට වැටෙනවා. සම්මුතිය තුළ ලෝකය තුළ ඒකත් අනිත්‍යයක් තමයි. හැබැයි බුදුරජාණන්වනහ්සේ විමුක්ති මුඛයක් කොට පෙන්නපු, ත්‍රිලක්ෂණයක් කොට පෙන්නපු, සම්මාසම්බුද්ධත්වය අවබොධකරගෙන දේශනා කළ විශේෂම ලක්ෂණය කොට පෙන්වපු අනිත්‍යයක් නෙවෙයි. ඒ අනිත්‍යය අපිට නිවන දක්වාම වැටෙන අනිත්‍යයක් වෙන්නේ නැහැ ලෝකයේ ඇති දෙයක නැතිවෙන බව. මොකද ඒක සම්මුතිය තුළ සම්මුති දර්ශනය තුළත් කෙනෙක් දකින්නට පුළුවන් දෙයක්, ඇති දෙයක නැතිවෙන බව. අපේ සමාජයේ සමහර වෙලාවකට මේ කාරණාව නොදකින කම නිසා අපි දකිනවා ඇතැම් වෙලාවට භාවනා ප්‍රතිපදාවන් පවා ඇතිවෙලා තියෙනවා, රූප කළාප බිඳී බිඳී යන එක දිහා බලනවා එහෙම නැතිනම් මේ කය නැසිලා වැනසිලා යනවා කියන එක පිළිබඳව බලනවා. මේ බලන එකේ වරදක් තියෙනවා කියනවා නෙවෙයි, නමුත් මේකෙන් නිවන් දකින්න පුළුවන් කමක් නැහැ. නිවන් දකිනවා නම් ඇති දෙයක නැතිබව කියන කාරණාව තුළ ඉඳලා අපිට නිවන් දකින්න පුළුවන් කමක් ඇත්තේ නැහැ.

අපි ඒ සාස්වත අන්තය තුළ ඉඳලා උච්ඡේද වාදයට යන්නේ, එහෙමත් නැතිනම්. අපි සාස්වත-උච්ඡේදයෙක් බවටයි පත්වන්නේ. එනිසා දැන් අපිට අනිත්‍යයක් කියන කාරණාව හරියටම තේරුම් ගන්නවා නම්, හරියටම වටහා ගන්නවානම් අපිට තියෙනවා එතනින් එහාට ගියපු තව දර්ශනයක් ඇතිකර ගන්නට. ඒ තමයි අපේ ජීවිත්යේ යතර්ථය කියන කාරණාව තේරුම් ගන්නට. අනිත්‍යය කියන පදය සංග්‍රහ කරන්නේ දුක්ඛ සත්‍යයට. මේ දුක්ඛ සත්‍යයට සංග්‍රහ කරන අනිත්‍යය කුමන

ධර්මතාවයක් නිසාද කියලා දැක්කොත් හැම වෙලාවකදීම අනිත්‍යය කියලා කියන්නේ නැතිවෙලා යන, ක්ෂය බවට පත්වෙන ස්කන්ධ ධර්මතා ටික පැත්තෙන් කතා කරන දර්ශනයක්.

බුදුරජාණන්වහන්සේ අනිත්‍යය කියලා කියන්නේ මොකද්ද කියලා ඇහුවොත් "*චක්ඛුං අනිච්චා ...රූපං අනිච්චා*" මේ විදිහට ඇස අනිත්‍යයි රූපය අනිත්‍යයි කියන පැත්තෙන් කරුණු ඉදිරිපත් කළා. ඒ වගේම රූපය අනිත්‍යයි, වේදනාව අනිත්‍යයි, සංඥාව අනිත්‍යයි, සංඛාරය අනිත්‍යයි, විඤ්ඤාණය අනිත්‍යයි කියලා ස්කන්ධ ධර්මතාවයන් පැත්තෙනුත් අනිත්‍යය සංග්‍රහ කළා අනිත්‍යය දේශනා කළා. දැන් මේ කියන කාරණාව තුළ අපිට අනිත්‍යය සංග්‍රහය ගත්තාම, අනිත්‍යයයි කියන දේ විමසලා බලන කොට අපිට දකින්න තියෙන දෙයක්, හැම වෙලාවකදීම දෙයක ඇති බවට වඩා අපිට "අනිත්‍යය" කියන වචනයෙන් බුදුරජාණන්වහන්සේ දේශනා කලේ තමන්ව හදාගන්න තැන, තමන්ව ඉතුරු නැතිව නිරුද්ධ වෙනවා කියන තැන පිළිබඳව තියෙන අවබෝධය. එහෙමත් නැතිනම් ස්කන්ධ ටිකක් පිළිබඳව, ස්කන්ධ ධර්මතාවය පිලිඹඳව ඇතිකරගන්න අවබෝධයම තමයි අනිත්‍යයානු දර්ශනය තුළ සිද්ධවෙන්නේ. අපිට අපේ ජීවිතය තුළට ඔය කියන කාරණය බහාලා ගත්තොත්, අපේ ජීවිතය ඇතුලෙන් ටිකක් විමසලා බැලුවොත්, හිතලා බැලුවොත් අපි හැම වෙලාවකදීම තියෙන දේ මත තියෙන දේ අල්ලන්න තමයි අත දාන්නේ. ඇහැට පේන දේ අල්ලන අදහසින් එලියට අත දාන කොට හැම වෙලාවකදීම අපිට තියෙන්නේ එතන තියන නිත්‍යය සංඥාවක්. ඒ නිත්‍යය සංඥාව මත තමයි භවය පදනම් වෙලා තියෙන්නේ, කීම් කිරීම් ආදී කටයුතු ටික ලෝකේ තුළ පේන්න දකින්න තියෙන්නේ. මේ පෙනීම කියන කාරණාවට අපි අනිත්‍යය කියන දේ බහාලා බැලුවොත් අපිට දකින්න තියෙනවා කවදාවත් ඇහැට පෙනෙන දේ අතින් අල්ලන්න පුළුවන් කමක් නැහැ කියන සිද්ධිය.

<u>කකුල ඔසවන්නේ නිත්‍යය සංඥාව පදනම් කරගෙන</u>

ඕකෙදි මම මෙහෙම කිව්වොත් උදාහරණයක් අපේ සේනාසණයේ බොහෝ වෙලාවට රාත්‍රී කාලයේදී ගමනක් යනකොට ස්වාමීන්වහන්සේලා කීප නමක් පේලියට වඩිනවා. වඩින කොට දවසක් මම කල්පනා කළා පිටිපස්සෙන්ම, අන්තිමට මේ රෑ වඩින ස්වාමීන් වහන්සේලාට විදුලි ආලොකයකින් නැත්නම් ටෝච් එකක් වගේ පත්තු

කරගෙන වඩිනකොට, මේ ඉස්සරහ ස්වාමීන් වහන්සේගේ ටෝච් එළිය දිහා බලාගෙන පිටිපස්සෙන් තව ස්වාමීන්වහන්සේ නමක් වැඩම කරනවා. හැම වෙලාවකදීම දැන් ඉස්සරහ බලාගෙන අපි මෙහෙ කකුල ඔසවන්නේ ඇති දේ මත ඇවිදිනවා කියන සංඥාවත් එක්ක. එහෙමත් නැත්තම් භවය කියන දේ මත පදනම් වෙලා භවය කියන දේ මත, භව සංඥාව මත පදනම් වෙලා තමයි අපි කකුලක් ඔසවන්නේ. ඉස්සරහට ටෝච් එක ගහනවා මිසක අපි කවුරුවත් කකුල් දෙක මුලට ටෝච් එක ගහගෙන ඇවිදින්නේ නැහැ. අපි ඇවිදින්නේ ඉස්සරහට ටෝච් එක ගහගෙන. ඉස්සරහට ටෝච් එලිය පත්තු කරගෙන අපි ඇවිදින කොට අපි හැම වෙලාවකම ඉදිරිපස බලාගෙන මේ පැත්තෙන් කකුල ඔසවනවා. ඇයි කකුල ඔසවන්නේ? අර ගත්ත අරමුණ පිළිබඳව මෙනෙහි කරන බව නිසා, නැතිනම් කිව්වොත් නිත්‍යය සංඥාව පදනම් කරගෙන. ඔය වගේ තමයි අපේ ජීවිතයේ හැම තැනකදීම සිද්දවෙන සිද්ධාන්තය. අපි දෙයක් ගැන කල්පනා කරනවා, ගෙදර, ළමයා, එහෙමත් නැතිනම් අපි ඉදිරිපස තියෙන දෙයක් වෙන්න පුළුවන් මේ දේ ගැන අපි කල්පනා කරනවා. කල්පනා කරන මොහොත වෙන කොට අපිට හැම වෙලාවකදීම ඇහැට පෙනුනු දේ, ඇහැට පෙනුනු දර්ශනය ඉතිරි නැතිව නැතිවෙලා, ඉතුරු නැතිව නිරෝධයට පත්වෙලා ඉවරයි. ඒ හේතු ටික ඇතිවෙලා, ආහාර ප්‍රත්‍යයෙන් හේතුටික ඇතිකල්හී හටගෙන ආහාර නිරෝධයෙන් නිරුද්ධ වුනු ධර්මතාවයක් ඇති කල්හී අපි හැම වෙලාවකදීම ඒ ඔසවලා ගත්ත අරමුණ ගැන හිතනවා, කල්පනා කරනව.

දැන් මේ හිතන්නේ, කල්පනා කරන්නේ අර ඔසවලා ගත්ත ආරම්මණය පිළිබඳව, ඔසවලා ගත්ත ටික පිළිබඳව. හැබැයි ඒ ඔසවලා ගත්ත කාරණාව අපේ ජීවිතය නෙවෙයි. ජීවිතය නෙවෙයි කියලා කිව්වේ අපි ඒ ටික දකින දේ නෙවෙයි. දකින දේ තුළ අපිට කවදාවත් ඔය හිතන දේ, දැනගන්න දේ තිබුනේ නැහැ. අපි රූපය ඉතුරු නැතුව වැය වුනු තැනක, රූපස්කන්ධය කියන දේ ඉතිරි නැතිව නැතිවුණ තැනක අපි කෙන කෙනාගේ මනස පැත්තෙන් විඳින විඳීමක් තමයි පවතින්නේ. කෙන කෙනාගේ මනස පැත්තෙන් විඳින මේ විඳීම බාහිර රූපය පැත්තට පතිත කරලා දකින ලක්ෂණය නිසා තමයි අපිට නිත්‍යය සංඥාව කියන දේ ඇතිවෙලා තියෙන්නේ. ඒ දැකපු දේ ගැනමයි අපිට හිතන්න පුළුවන්කම තියෙන්නේ කියන කාරණාව අපිට ඇතිවෙලා තියෙන්නේ ඔන්න ඔය හේතුව පදනම් කරගෙන.

ප්‍රතිබිම්බය කෙනෙක් පුද්ගලයෙක් කියලා රැවටුනා

ඕකට මම, මේ පිංවතුන් ගොඩක් අහලත් ඇති, කලින් කියපු උදාහරණයක් අපි කිව්වොත්, අපි කිව්වා අපේ සේනාසණය පටන් ගත්තු මුල් කාලයේදී මේ සේනාසණය පලවෙනියටම ජනෙල් වලට වීදුරු දැම්මට පස්සේ මේ කැලේ ඉන්න රිලවු ඇවිල්ල මේ වීදුරුව ලඟට එබෙන කොට ඒ ගොල්ලන්ගේ ඡායාව ඒගොල්ලන්ට බලාගන්න පුළුවන්කම තියෙනවා. මේ ඡායාව පේනකොට මේ සතා ඉස්සරහට පනිනවා, ආපස්සට පනිනවා, මෙතන මහා විසාල යුද්ධයක් එයාට මොකද රිලවා කල්පනා කරනවා තව සතෙක්, තව කෙනෙක් ඇතුලේ ඉන්නවා කියලා. එයා දන්නේ නැහැ තමන්ගේ ප්‍රතිබිම්බය තමන්ට පෙනෙන්නේ කියලා. මේ කාරණාව නොදන්න කම නිසාම ඉන්න සතෙක් ගැන හිතමින් ඉදිරිපසට, ආපස්සට පනිමින් කටයුතු කරනවා. දැන් බොහෝ අවුරුදු ගානක් ගතවෙලා නමුත් තාමත් ඒ ජනෙල් වීදුරු ලඟට ආවට පස්සේ තාමත් අර දේම තමයි. තාමත් ඉස්සරහට පනිනවා, ආපස්සට පනිනවා, අල්ලලා බලනවා, මේ විදිහට මෙයාගේ කටයුතු එයා සිද්ධකරගෙන යනවා. මොකද? එයාගේ දර්ශනය එයාගේ දැක්ම තියෙන්නේ හැමවෙලාවකදීම එලියේ මම ජීවත්වෙනකොට තව සතෙක් ඇතුලේ ජීවත් වෙනවා, ඒ වගේම මම මෙතන ඉන්න කොට තව කෙනෙක් ඇතුලේ ඉන්නවා වගේම මම මෙතනින් අයින්වෙලා යනකොට ඒ කෙනා ඇතුලේ ඉන්නවා, ඇතුලේ ඒ කෙනා ඉන්න කොටම තමයි මම අයින් වෙලා යන්නේ. එයා පිට ඉන්න කොට තව කෙනෙක් එහෙ ඉන්නවා දැන් බලන්න එන්න හේතුව තියනවා ඕනම වෙලාවක ඇවිල්ලා අර කණ්නාඩිය ඇතුලේ ඉන්න අනිත් රිලවාව බලන්න පුළුවන්කම ඕනම වෙලාවක තියෙනවා. මෙම දැක්ම නිසා ඒ සතාට කවදාවත් හීනෙකින්වත් හිතෙන්නේ නැහැ තමන්ගේම ඡායාවක් තමයි කණ්නාඩිය මත පතිත වෙන්නේ කියන කාරණාව. ඒ නිසා තමන් තුළ ඒ නුවණ නැතිකම නිසාම සත්වයා එතන කරයුතු කරගෙන යනවා. පින්වතුනි අපේ ජීවිතයත් අන්න ඒ විදියමයි.

රිලවා කණ්නාඩියට වැටුනු ප්‍රතිභිම්භය කෙනෙක් පුද්ගලයෙක් කියලා රැවටුනා වගේම අපි අපේ ජීවිතය තුළත් තියෙන ප්‍රතිභිම්භයට රැවටෙනවා. ඒ ප්‍රතිභිම්බය කියන එකෙන් අදහස් කලේ රූපය සම්බන්ධව තියෙන අපි දකින ප්‍රතිභිම්බය. ඇහැට වර්ණ සටහනක් පතිත වුනාට පස්සේ ඒ පතිතවූ වර්ණ සටහන අයේ පතිත වෙන්නේ නැහැ. අපි දැන්

දන්නවා හෙතු ටික එකතු වුනාට පස්සේ ඒ මොහොතේ හැදිලා පෙනෙන දෙයක් මිසක, හේතු ටික නැතුව කලින් තිබුන පාට ටික දැන් ඇවිල්ලා අපේ ඇහැට වැටුනා නෙමෙයි කියලා. කණ්නාඩිය ලඟට ගියාම ඔබ රැවටෙන්නේ නැත්තේ ඇයි කියලා ඇහුවොත්? හේතුව ඔබට නුවණ එනවා මම යන කොටම මේ හේතු ටික නිසාම ඇතුලේ ප්‍රතිබිම්භයක පේනවා මම කණ්නාඩිය ගාවින් අයින් වෙනකොටම ඒ ප්‍රතිබිම්භය නැතිවන බවට නුවණ තියෙනවා. ඒ නිසා ඇතුලේ ඉන්න කෙනා ගැන කීම් කිරීම් ඇති කර ගන්න, වෙන පුද්ගලයෙක් ගැන හිතනවා වාගේ තරහක් / කැමැත්තක් ඇති කර ගන්න පුළුවන් කමක් ඇති වෙන්නේ නැහැ. ඇයි ? තමන් දන්නවා මේ හේතු ටික ඇති කල්හි හදා ගත්ත වර්ණ සටහනක්/ප්‍රතිබිම්භයක් කියන එක. ඒක ජීවිතයේ එළඹ සිටි මට්ටමේ ඇති නුවණ. ඒ නිසා අපි ප්‍රතිබිම්බයේ රැවටෙන්නේ නැහැ. නමුත් තිරිසන්ගත සත්වයාට එතෙන නුවණ නැති නිසා එතන ඒ සතා මුලාවට පත්වෙනවා. අපේ ජීවිතය තුළත් ඒ තිරිසන් ගත සත්වයා හිටපු මට්ටමේම අපිත් ජීවත් වෙනවා. ඒ එකම ස්ථරය මත අපිත් ජීවත් වෙනවා.

ඇයි එහෙම කිව්වේ? පෙනෙන රූපේ මේ මොහොතේ පතිත වුණ වර්ණ සටහන, මේ මොහොතේ විතරයි. ඉතුරු නැතිව නිරුද්ධ වෙනවා. හැබැයි ඒ නිරුද්ධ වූ තැනක දැකපු ගහ කියන සංඥාව හිතට ගත්ත ඒ දේ අපිට තව දවසක ඇවිල්ලා බැලුවොත් එදාටත් ඒ ගහ දකින්න පුළුවන්කම තියෙනවා. ඔබට මේ මොහොතේ යම් දර්ශන තලයක් පෙනවා නම් මේ පැත්ත තුළ ඒ දර්ශන තලය යම් දවසක සේනාසනයට ඇවිල්ලා බැලුවොත් ඔබට එදාටත් මේ දර්ශන තලය නැවත බලා ගන්න පුළුවන්කමක් තියෙනවා. ඔබ හිතනවා මේ තියෙන්නේ අපි කලින් දැකපු දේම තමයි? හැබැයි යථාර්ථයක් විදියට ඔබට ඇතිවෙලා තියෙන්නේ මේ මොහොතේ ඇති වුණ ඇස රූප චක්ඛු විඤ්ඤාණ සිද්ධාන්තයකට අදාල වර්ණ සටහනකට එදා දැකපු දේමයි මේ තියෙන්නේ කියලා ඇති කළ ගත්ත මනෝමය වශයෙන් විඳින වින්දනයක් විතරයි. එළියේ තිබිලා ආපු දෙයක් නම් නොවෙයි.

එළියේ තිබිලා ආපු දෙයක් කියලා සටහනක් තියෙන්නේ හැම වෙලාවකම නිත්‍ය සංඥාව පදනම් කර ගෙන. නිත්‍ය සංඥාව කියලා අදහස් කලේ හේතු නිරොධ වුණ තැනක අපි කලින් ඉඳලාම දැකපු රූපයක් දැන ගනීම.කලින් ඉඳලාම දන්න

පුද්ගලයෙක්/වස්තුවක් කියලා මේ විදියට අපිට බාහිර ලෝකය තුළ කලින් දැකපු දෙයක් නැවත දකින්න පුළුවන් කමක් තියෙන්නේ. කලින් හැදුන ඇස ආපහු හට ගන්නේ නැහැ කියලා අපි හොඳින්ම දන්නවා.ඒ වාගේම කලින් මොහොතේ ඇති වුණ ආලෝක සටහනක් ආපසු ඇහැට පතිත වෙන්නේ නැහැ කියන එකත් අපි දන්නවා.

<u>කලින් විඳපු රස නැවත විඳින්න ?</u>

රළු විදියකට කියනවා නම් පහුගිය මොහොත නැවත ආයෙත් කවදාවත් උදා වෙන්නේ නැත්නම් ඒ මොහොතේ හේතු නිසා හට ගත්ත ඒ රූපය නැවත කවදා හට ගනීද? ඒක කල්ප සියක් කෝටි ගනනක් ගියත් හට ගන්න හේතුවක් නැහැ. එහෙනම් අපි කොහොමද කලින් දැකපු රූපය නැවත වතාවක් දකින්නේ? කලින් දැකපු කෙනාව අපහු අපිට දකින්න පුළුවන් කමක් නැහැ. අනිත්‍ය කියන වචනය බුදුන් වහන්සේ ගෙනාවේ බොහොම ගැඹුරු අර්ථයකින්! ඒ අනිච්චානුපස්සනාව විමුක්ති මුඛයක් කොට පැනවූයේ ඒ නිසා. යමෙක් මේ ස්කන්ධ පංචකය අනිත්‍ය වශයෙන් දකිනවා නම් ඔහුට නිත්‍ය සංඥාව දුරු වෙනවා. නිත්‍ය සංඥාව කියන්නේ කලින් අහපු සින්දුව නැවත අහන්න පුළුවන්, කලින් වින්දපු රස නැවත විඳින්න පුළුවන් කලින් විඳි ස්පර්ශයක් නැවත විඳින්න පුළුවන කියලා මේ ලෝකයේ ඇති බවට ගත්ත මේ වැරදි දැක්ම. අපි දැන ගන්න ඕනේ මේ හේතු ටික නැති කල්හි තමන් තුළ ගොඩනඟා ගත්ත ලෝකයක්.

පින්වතුනි විපාක හා නව කර්ම කියන මට්ටම් දෙක හොඳට වෙන්කරලා දකින්න පුරුදු වෙන්න. විපාකය කියලා කිව්වේ අපේ ජීවිතයේ ඇත්තටම සත්ව පුද්ගල බවක් නියෝජනය කරනවා නම් එනම් ඇස ප්‍රසාදවත් ආත්මභාවය අනුව ගිය දෙයක් කියලා කතා කරන කොට මේ හේතු ටික කෙලෙස් තියෙන දෙයක් නෙමෙයි. ඒකට කියනවා විඤ්ඤාණ චරියාව කියලා. විඤ්ඤාණ චරියාව කියන කොටසේ හැමැ විටම මේ රූපය දැකීම පිනිස ඒ සිත වැය වෙලා මිසක ඒ සිතේ කෙලෙස් ආශ්‍රව ඇත්තේ නැහැ. ඒ සිත ප්‍රකෘති පරිශුද්ධ සිතක්. "*පභස්සර මිදං භික්ඛවේ චිත්තං*" කියා බුදුරජාණන වහන්සේ අපට දේශනා කලේ මහණෙනි මේ සිත ප්‍රභාශ්වරයි කියලා අන්න ඒ කාරණාවට. ඒ ප්‍රභාශ්වර සිත කිලිටි කර ගන්න එක කෙන කෙනා සතු දෙය නිසා.

එසේ කිව්වේ කෙන කෙනාට පුළුවන් තම තමන්ගේ භූමියේ මට්ටමට සිත කිලිටි කර ගැනීමට. කෙනෙකුට පුළුවන් මේ විපාකය මේ පිරිසිදු සිත ඉතුරු නැතිව නිරුද්ධ වන තැනක එයට පුළුවන් සතර මහා ධාතුව නැවත ඇති හැටියට මෙනෙහි කර ගෙන, නැතිනම් මෙහි ගොඩනඟා ගන්න සංඥාව,චේතනා,මනසිකාරය, විඤ්ඤාණ කියන ධර්මතා නැවත එළියට දමලා ලෝකය පැත්තෙන් පතිත කරල බලන්න පුළුවන් කමක් වුනොත් එළියේ තියෙන දේයි මේ දැන ගත්තෙ කියලා අන්න එයාට නිත්‍ය සංඥාව නිසා සතර මහා ධාතුව නිත්‍ය බවට ගිහිල්ලා එයාට හමු වෙනවා එළියේ තියනා වූ රූපයක්. ඒ රූපය කියන කාරණාව මත ඔහුගේ කැමැත්ත අකමැත්ත හෝ අදුක්ඛමසුඛ බව හට ගන්න බව තියෙනවා ඒ නිසා ඔහුට කියනවා කාම භවය අනුව ජීවත් වෙන කෙනෙක් කියලා. කාම භවය අනුව ජීවත් වෙන ඔහුට ඒ කාම භවය අනුවම යන ධර්මතා ටික නිසාම නැවත නැවතම කාම භවය උරුම වෙන ස්වභාවය තියෙනවා.

හැබැයි මෙහෙම තියෙන කෙනෙකුට පුළුවන් ඒ විපාකය ගැනම, එතනින් එහා දැක්මක් උපදවාගෙන ඒ කියන්නේ හැම වෙලාවකදීම මේ සතර මහාධාතු රූපය පැත්තට තමන්ගේ මනස පතිත නොකර, එලියෙන් දැකපු දේ අරභයා තම තමන් තුළ පුද්ගලබව ගොඩනැගෙනවා, හැබැයි ඒක සතරමහාධාතු රූපයේ දකින්නේ නැහැ. අන්න ඒ මට්ටමට එයාගේ මනස අරගෙන කෙනෙක් රූප භූමිය උපදවා ගෙන වාසය කරනවා. හැබැයි අර විපාක ටික අරභයා කෙනෙක් කාම ධාතුව/කාම භූමිය උපදවා ගත්තා. කෙනෙක් රූප භූමිය උපදවා ගත්තා. ඒ වගේම ඒ විපාක ටික අරභයා කෙනෙක් හිත පැත්තේ ගොඩනගා ගන්න සංඥාව පිළිබඳව දැකළා එයා නානත්වය වහලා, ඒකත්වයක් පැත්තට මනස යොමු කරගෙන එයා අරූප භව මට්ටමේ සංඥාවක් ඇතිකරගෙන, චේතනාවක් ඇතිකරගෙන ඒ මට්ටමේ රැඳිලා ඉන්නවා.

දැන් මේ තුන් භවයම තීරණය වුනේ අර විපාකයේ ඇත්ත නොදන්නා කම නිසා, විපාකයේ ආශ්‍රව/කෙලෙස් තමතමන්ගේ විදිහට ඇතිකරගන්න බව අනුව. නිවන් දකින තැනදීත්, ඤාණ චරියාවෙදීත් එයාට කරන්න තියෙන්නේ වෙන කිසිම දෙයක් නෙවෙයි, ඒපාකය අරභයා එයා උපදවා ගත්ත නුවණින් වාසය කරනවා, මොකද්ද නුවණ? අනිත්‍යයානු දර්ශනය. එයා උපදවා ගත්ත ඒ නුවණින් වාසය කරන කොට ඔහුට ඒ අනුව යන කෙලේසයක් හදාගන්න හේතු ටික ඇත්තේ නැහැ. කාම භවය

අනුව ගියපු දේ හදා ගන්න එයාට බාහිර රූපායතනය හම්බවෙන්නේ නැහැ. ඒ වගේම රූප භවය අනුව ගියපු දේ හදා ගන්නට මනස තුළ ගොඩනගා ගත්ත පුද්ගල බවට පදනමක් නැති බව ඔහු සාක්ෂාත් කරගෙන. අරූප බව ගොඩ නගාගන්නට විදිහක් නැහැ ඔහු දන්නවා පෙර නොතිබීම හටගෙන ඉතුරු නැතුව නිරුද්ධවුනු නිරෝධය සාක්ෂාත් කරන බව නිසා.

දැන් මේ කෙනා සම්පූර්ණවම, පූර්ණ වශයෙන්ම සත්‍යාවබෝධයක් කරගෙන, තමන්ගේ ජීවිතය තුළ ප්‍රත්‍යක්ෂ කරගෙන වාසය කරනවා. මේ විදිහට ප්‍රත්‍යක්ෂ වශයෙන්ම උපදවගෙන වාසය කරන මේ කෙනාට සම්පූර්ණවම ඇතිවෙනවා එක්තරා නුවණක්, තමන්ගේ ජීවිතය බවට පත්වූ නුවණක් "*යං කිංචි සමුදය ධම්මං සබ්බං තං නිරෝධ ධම්මන්ති*" කියන කාරණාව පිරිසිඳ දැක්කාවූ නුවණ.

එයා දකිනවා යම් ධර්මතා ටිකක් හේතු නිසා හටගත්තානම්, හේතු නිරෝධයෙන් ඒ කාරණා ටික ඉතුරු නැතුව නිරුද්ධ වුනා කියන කාරණය. කොටින්ම කියනවා නම් විපාකයට විපාකයක්. කාම භූමියේ විපාකයක් තිබුනා, කාම භූමියේ විපාකය අරඹයා ඉතුරු නැතුවම නැතිවුණ ධර්මතාවය පිළිබඳව අවබෝධ කරගත්තා වූ නුවණ එලඹ සිටි, ජීවිතය බවට පත්වූ දෙයක් බවට පත්වුනා.

විපාක ධර්මතාවය අරඹයා ලෝකොත්තර විපාකයකින් රහතන් වහන්සේ වාසය කරනවා. නව කර්ම සකස් කරගැනීමක් ඇත්තේ නැහැ. දැන් මෙන්න මේවගේ තැනකින් තමයි බුදුරජාණන්වහන්සේ අනිත්‍යය කියන දේ කතාකලේ, අනිත්‍යය කියනදේ දේශනා කලේ අපිට. මේ අනිත්‍යය මේ විඩිහට දේශනා කරන කොට අපිට ලෝකයක් පනවන්න පුළුවන් කමක් ඇත්තේ නැහැ. අපි කැමති වශයෙන් පවතින හෝ කැමති වශයෙන් නොපවතින එහෙමත් නැතිනම් ඇති බවට යන හෝ නැතිබවට කතා කරන ලෝකයක් පනවන්න පුළුවන්කමක් ඇත්තේ නැහැ. මේකෙන් කියන්න උත්සහවත් වුනේ ලෝකය නැහැ කියලා නෙවෙයි, නෑ කියන අන්තය නෙවෙයි. හේතු ටික ඇති කල්හී හටගන්න නිසා කෙනෙකුට නෑ කියන්න පුළුවන් කමක් ඇත්තේ නැහැ මොකද මේ හේතු ටික ඇති කල්හී තිබුනා.

හැබැයි හේතු ටික නැතිවෙන කොට ඉතුරු නැතිවම නිරුද්ධ වුනා. ඒ නිසා තියනවා කියලා කියන්න පුළුවන් කමකුත් නැහැ. මෙන්න මේ පෙන්නපු දර්ශනය, මේ පෙන්නපු දේ අවබෝධ කරගන්න එක තමයි අනිත්‍යානු දර්ශනය. එයා අවබෝධ කරගත්තේ අනිත්‍යය වශයෙන් කුමක්ද? ස්කන්ධ ධර්මතා ටික. අනිත්‍යය දකිනවා කියලා දකින්න තිබුනේ වෙන මොකක්වත් නෙවෙයි, ස්කන්ධ ධර්මතා ටික ඉතුරු නැතුව නිරුද්ධ වුනු දර්ශනය. ස්කන්ධ ධර්මතා ටික ඉතුරු නැතුව නිරුද්ධ වුනාකියලා ඔහු දකින කොට ඔහුට පංච උපාදානස්කන්ධය කියන දේ නොහට ගන්න බවට යනවා. පංච උපාදානස්කන්ධය කියලා කිව්වේ, එලියේ බාහිර රූපය ඇති බවට, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ ඇතිබවට දෙවෙනි පාර මෙනෙහි කරලා ගන්න අන්න ඒ ලක්ෂණය ඔහුට නොහට ගන්න බවට යනවා.

හේතුව ස්කන්ධ ධර්මතා ටික ඇති කල්හි හට ගෙන ඉතුරු නැතුවම නිරුද්ධ වුනා කියලා දැක්කා නම්, ඒ අනිත්‍ය බව , ඒ නිරෝධය සාක්ෂාත් කරපු කෙනාට.ඒයාට නැවත පංච උපදාන ස්කන්ධ වශයෙන් නැවත ඇසුරු කරන්නට දෙයක් හමු වෙන්නේ නැහැ. ඒ නිසා කියනවා පංච උපාදාන් ස්කන්ධය නොහට ගන්න බවට ගියා. අනුප්පාදයට ගියා. අනුප්පාදය නිවනයි. ඒ දර්ශනයයි අපි අපේ ජීවිතයට ඇතුලු කර ගත යුතු වෙන්නේ. අනිත්‍ය කියන දෙය හැටියට. අනිත්‍ය කියන දෙය පිළිසිඳ නොදැක්ක නිසා අපි මෙතරම් කාලයක් මේ සසරේ යන්න හේතු වුනා. එනම් නිත්‍ය සංඥාව නිසා. එළියේ තියනවා එළියේ තියෙන දෙය නැවත විදිනවා කියලා වැරදි විදියට හිතාගෙන ඉඳලා නැවත ආයතන ටිකක් හදාගන්නවා. හදා ගත්ත ආයතනයට අලුතිනම ගැටෙනවා. අලුතිනම ගැටෙන බව නොදන්න නිසා නැවත තියෙන දෙයම ඇසුරු කරනවා.තියෙන දෙය ඇසුරු කරන අපු නැවත් හේතු ටික සකස් කර ගෙන.

මෙන්න මේ පැවැත්ම තුළ අපි සසර දිඟින් දිඟටම ඉපදිමින් මැරෙමින් මැරෙමින් උපදිමින් යන ගමනක්. අපිට මේ එකින් එකට ඇති කර ගන්න අපේ මෝඩකම නිසාම 'උපදින බව' දුරු කර ගැනීම සඳහා යම් මොහොතක දැක්කා නම් මේ හේතු ඇති කල්හි හට ගෙන හේතු නැති විට නිරුද්ධවන බව සාක්ෂාත් කළා නම් ඒකින් කියන්නේ මේක නිකම් තේරුනා හෝ කාරණාවක් විදියට දැන ගත්තා කියන දේ නෙමෙයි. එතනින් එහාට ගියපු ජීවිතයම බවට පත්වුණ දර්ශනයක්.

ඒ දර්ශනය තුළ ඔහු සාක්ෂාත් කරනවා පෙර නොතිබීම හට ගෙන ඉතුරු නැතිව නැතිවුනා කියන කොට එයාට කෙලෙස් වශයෙන් හැසිරෙන්නට ආශ්‍රව වශයෙන් ඇසුරු කරන්නට රූපායතනයක් හමු වෙන්නේ නැහැ. එළියේ තියෙන රූපයක් හමු වෙන්නේ නැති වෙන කොට, එයාට එළියේ ගන්න දෙයක් හමු වෙන්නේ නැති කොට එයාට කියනවා 'අනුපාදා විමුත්තෝ' උපාදාන වශයෙන් නොගෙන මිදුනා කියලා.කිසිවක් උපාදාන වශයෙන් ගත්තේ නැහැ. ඇයි? උපාදාන වශයෙන් ගන්නට දෙයක් නොතිබුණු නිසා. අනිත්‍ය දර්ශනය ඒ කියන දක්වාම ඔහුගේ මනස අරගෙන යනවා.

ඒක ගැඹුරු දෙයක්. සාමන්‍ය ලෝකය තුළ අපි දන්න ඒ දර්ශනට නෙමෙයි අනිත්‍ය කියලා කියන්නේ. ඇති දේක නැතිවන බව නෙමෙයි කියලා කිව්වේ ඒකයි. ඒවාගේම ලෝකයේ තියෙන දෙයක අපේ කැමැත්ත ඉෂ්ට කරලා දෙනවා කියලා දෙයකුත් නෙමෙයි. අපේ කැමැති සේ පවතින්නේ නැහැ කියල දැන ගත්තා කියලා එය වන්නේ අපිට ආදීනවය පිළිබඳ අවබෝධ කර ගැනීමක් මිසක නිස්සරණය සාක්ෂාත් කළ හැකි අනිත්‍යානුපස්සනාවක් නොව එය සාමන්‍ය ලෞකික දෙයක්. ඇයි කැමැත්ත/ආශ්වාදය ඉෂ්ට කරන්නේ නැති පෙලීම නම් ලෝකයේ තියෙන්නේ , පෙලෙනු ලබන වස්තුව - පෙලීම විඳිනු ලබන කෙනා මේ පැත්තේ ඉන්නවා හා පෙනෙන දේ බාහිර තියෙනවා එම වැරදි දෘෂ්ටිය නිසා.

මේ 'තියෙනවා' කියන අන්තය තුළ ජීවත් වෙනකම් එයාට ලෝකය තුළ 'තමන්ගේ ගෙදර' තමන්ගේ ආශ්වාදය කැමති සේ පවතින්නේ නැහැ කියලා දකින එක අවශ්‍ය වෙන්නේ කළකිරීමකට පමණයි. හැබැයි ඒ කළකිරුනා කියලා ඒ නිස්සරණය නෙමෙයි ! එයා එතනින් මත්තේ යමක් කළ යුතුයි. ඒ කළ යුතු දෙය තමයි මේ අනුච්චානුපස්සනාව. ඒ නිසා අපිට ලෝකයේ ආශ්වාදය ඉෂ්ට නොකරන බව , කැමැති සේ නොපවතින බව යම් කෙනෙක් ආදීනවය තේරුම් ගත්තා නම් ඔහුට නිස්සරණයක් අවශ්‍ය වෙනවා. ඒ නිස්සරණයක් අවශ්‍ය වන කෙනාට මේ අනිත්‍ය අනුව යන නුවණ ඇති කර ගත්තා නම් ඔහුට මේ හෙතු නිසා හට ගත්ත ස්කන්ධ ධර්මතා ටික මේ මොහොතේ ඉතුරු නැතුව නිරුද්ධ වෙලා යනවා. මේ නැතිවුණ තැනක නිත්‍ය සංඥාව

හදා ගෙන ජීවත් වෙන බව දකින කොටම ඒයාගේ යම් නිත්‍ය සංඥාවක් තියෙනවා නම් එය ඉතුරු නැතිව දුරු වෙනවා.

එයාට හේතු ඵල දහමක් දකින්න පුළුවන්කම තියෙනවා.ඒ දර්ශනය ගන්න කොට එයාට 'ඇති' බවට ගන්නට බාහිරය වෙන වෙන අරමුණු හමු වෙන්නේ නැහැ. කැමැති වශයෙන් ඇලෙන්නට , ඇකමැති වශයෙන් ගැටෙන්නට කැමැති/ඇකමැති නොවන අර්ථයෙන් මුලාවට බවට පත් නොවන්නට 'ඇත' කියන අර්ථය දුරු වෙලා , හැබැයි නැත කියන අර්ථය දුරු වී. මේක තමයි අපිට වැදගත්වන දර්ශනය. ඒ නිසා තමයි "*වක්ඛුං අනිච්චතො වවත්ථේති* " ඇස අනිත්‍ය වශයෙන් ව්‍යවස්ථාපනය කර ගන්න කිව්වේ. ඇස එසේ අනිත්‍ය වශයෙන් පිහිටුවා තබන කොට ඔබ කලින් දැකපු රූපය නැවත දකිනවා කියන මට්ටම සංඥා විපල්ලාසයක් ඇති වෙනවා නම් ඔබටම තේරුම් ගන්න පුළුවන් වෙයි කලින් දැකපු රූපය ආයෙත් කවදාවත් දකින්න පුළුවන්කමක් නැහැ කියලා.

ඒවාගේම හේතු නිරුද්ධ වෙලා ගියාට පස්සේ අපි මනසේ ගස් ගල් ගෙවල් දොරවල් කියලා විඳින මානසික මට්ටමකයි අපි ජීවත්වුනේ කියන එක ඔබට තේරුම් ගනන් පුළුවන්කම ලැබෙයි. හොඳට තමන් කියන තැන ගොඩනඟා ගත්ත සංකල්පමය ලෝකයෙන් මිදෙන්නට අවශ්‍ය වටිනා කාරණා ටිකක තමන්ගේ ජීවිතය පැත්තෙන් හමු වෙයි මේ දර්ශනය තේරුම් ගත්ත කෙනාට. ඒකයි අනිත්‍ය කියන එක තේරුම් ගන්න එක බොහොම වැදගත්. "*අනිච්චතෝ වවත්ථෙන්තො නිච්චසඤ්ඤං පජහති*" අනිත්‍ය කියන දෙයින් රූපයේ නිත්‍ය සංඥාවක් තිබුනා නම් එය දුරු වෙනවා.

ඒවාගේම තමයි "*දුක්ඛතො වවත්ථෙන්තො සුඛසඤ්ඤං පජහති*" රූපය දුක වශයෙන් බලන් විට සැප වශයෙන් තිබූ සංඥාව දුරු වෙනවා. "*දුක්ඛතො වවත්ථෙන්තො සුඛසඤ්ඤං පජහති*" කියන කොට අපේ ජීවිතයේ සාමන්‍ය දැක්ම තමයි සැපය කියන දෙය. ඒ සැප කියන දේ තමයි ලෝකය තුළ අපි බලාපොරොත්තු වෙන්නේ. ඇස ගැනම කිව්වොත් , ඇසෙන් බලන්න බලාපොරොත්තු වෙන්නේ සැප සහගත අරමුණු ගෙන දෙන ලස්සන දේවල් බලන්නට. අවලස්සන අක්මැති දේවල් බලන්නට අපි කවුරුත් කැමැති නැහැ. ඒ කැමැත්ත කියන දේ කොහේ තිබුණ දෙයක් ද? කියලා අපි

හිතුවොත් කිසි විටක වර්ණය කියන දෙය කැමැත්ත හෝ අකමැත්ත ජීවිතයට ගෙනාවේ නැහැ.

ඒවාගේම වර්ණය පතිත කළ ගත්ත ඇහැ පැත්තද කැමැත්ත හෝ අක්මැත්තද ඇති කරලා දුන්නේ නැහැ. රූපය පැත්තෙන් බලන කොට හිතේ තියන ගත් ස්වභාවයක් නිසා තමයි කැමැත්ත අකමැත්ත රූපයකට අයිති වෙලා එසේ කැමතියි අකමැතියි කියලා රූප අපිට හමු වුනේ. වර්ණ සටහන ඒකාන්තයෙන්ම සැප සහගත වෙන දෙයක් නම්, ඇහැට එන පාට ටික ඒකාන්තයෙන්ම දුක් සහගත දෙයක් නම් මේ ලෝකයේ කාටත් එය දුකක් වෙන්නෙ ඕනේ. සැපක් නම් සැප වෙන්නට අවශ්‍ය වෙනවා. නමුත් එහෙම නොවෙයි ලෝකයේ වෙන්නේ. උදාහරණයක් ලෙස දේශපාලන චරිතයක් ගත්තොත් කෙනෙක් බොහෝම ප්‍රියශීලීව ප්‍රිය මනාපවම ඒ රූපය ඇසුරු කරනවා. ඒවාගේම තව කෙනෙක් ඒක බොහොම අප්‍රිය අමනාප දෙයක් බවට පත් කරවනවා. ඔය අප්‍රිය අමනාප බව රූපයට අයිති දෙයක් නම් කෙනෙකුට ප්‍රිය වෙන්නත් තව කෙනෙකුට අප්‍රිය වෙන්නත් කිසිම හේතුවක් නැහැ. නමුත් ඒක රූපයෙන් ආපු දෙයක් නොවෙයි! ඒක රූපය අරඹයා අපි තමන්ගේ පැත්තෙන් උපදවා ගත්ත ලක්ෂණ ටිකක් විතරයි. රූපයේ වර්ණ සටහන ඉතුරු නැතිව නිරුද්ධ වන තැනක අපි කෙන කෙනාගේ දන්න මේක හොඳයි මේක නරකයි කියල අවබෝධ කර ගත්ත ඒ දැක්ම අනුව අපි කෙනෙක් නරක් කරලා තව කෙනෙක් හොඳ කරලා. අපි වැරදි ලෙස හොඳ නරක සම්පූර්ණයෙන්ම කතා කලේ වර්ණ සටහන පැත්තට දාලා. නමුත් අපි දැන ගත යුතු දෙය තමයි අපි හොඳ නරක් කියලා දෙයක් හදා ගන්න කොට වර්ණ සටහන නිරුද්ධ වෙලා ඉවරයි බවට. අපි වැරදි සේ ලෝකයේ සැප සහගත සංඥාව බලාපොරොත්තු වෙන්නේ නිත්‍ය සංඥාව මත. එනම් 'තියෙනවා' කියන අන්තය තුළ 'තියෙනවා කියලා හිතන' රූපයක සැප බලාපොරොත්තු වෙන්නේ. 'ලස්සන රූපයක්' කියලා ඇසට පෙනුන රූපයක් අරඹයා සැපයි කියා අපි වින්දනය කළා නම් ඒ රැස් කළ සංඥාවම අපි නැවත ප්‍රාර්ථනා වශයෙන් බලාපොරොත්තු වෙනවා.

ඇයි ඒ? අපි වැරදියට හිතනවා අපිට ඒ සැප සතුට ආවේ රූපය පැත්තෙන් කියලා. පස්සේ වැරදියට හිතනවා නැවත ඒ රූපයම බලලා අයෙත් එකෙන්ම සැප සතුට ලබා ගන්න පුළුවන් වේය කියලා. ඒනිසාම අපි රූපය පැත්ත අපි හොයනවා නේද? ඒක

තමයි අපේ වැරදි දැක්ම කියන්නේ. අපි සැප කියන සංඥාව දැන් බලාපොරොත්තු වෙන්නේ කොහින්ද? බාහිර සතර මහා ධාතු රූපය පැත්තෙන් නේද? මෙන්න මේ වැරදි දැක්ම දුරු කර ගන්න අවශ්‍ය නිසාම තමයි "*දුක්ඛතොවවත්ථෙන්තො සුඛසඤ්ඤං පජහති*" - මේ කෙනෙක් රූපය දුක් වශයෙන් දකින කොට එයාගේ සැප කියන සංඥාව දුරු වෙනවා.

දුක් වශයෙන් බලන්න කියලා කිව්වේ මේක දුක්ඛ ආර්ය සත්‍ය වශයෙන් අවබෝධ කර ගත යුත්තක් නිසා. දුක්ඛ ආර්ය සත්‍ය අපි ඉස්සර දේශනා වල කතා කරලා තියෙනවා සච්ච යමකයට අශ්‍රිතව දුක හා දුක්ඛ සත්‍ය කියලා කාරණා දෙකක්. මේ කාරණා දෙකේදී දුක තමයි යම් කායික වශයෙන් හෝ චෛතසික වශයෙන් ඇතිවන දෙයක් තියෙනවා නම් මේ කයට/සිතට දැනෙන දුක තමයි අතන 'දුක' කියලා සඳහන් වුනේ. දුක්ඛ සත්‍ය කියන එක විමසල බැලුවොත් ඒ කියන්නේ 'දුක' කියලා කලින් කී කොටස අතහැරලා තවත් වෙන දුකක් තියෙනවා නම් **(** කායිකා හා චෛතසික නොවූ**)** අන්න ඒකට කියනවා 'දුක්ඛ ආර්ය සත්‍ය' කියලා**.** හැබැයි ඒක කයට දැනෙන්නේත් නැහැ ! හිතට දැනෙන්නෙත් නැහැ! කයත් නොදැනෙන හිතටත් නොදැනෙන මේ දුක මොකද්ද? ඒක තමයි අපි අවබෝධ කර ගත යුතු දේ, මේ දුක්ඛ ආර්ය සත්‍ය. රූපස්කන්ධය කියන දෙය දුක්ඛ ආර්ය සත්‍ය පදනම් කරගත්ත දේ. ඒ රූපස්කන්ධයක දුක අපේ කයටවත් හිතටවත් දැනෙන්නේ නැහැ. වර්ණ සටහනක් කියන දෙය දුක්ඛ ආර්ය සත්‍ය මත පදනම් වෙන දෙයක් වෙනකොට ඒ වර්ණ සටහනක් ඇසට පතිත වුනා කියලා ඒ දුක කයටවත් හිතටවත් දැනුනේ නැහැ. නමුත් ඒක දුක්ඛ ආර්ය සත්‍ය පිහිටපු දෙයක්.

ඒ දුක්ඛ ආර්ය සත්‍ය මත අම්මා තාත්තා ගෙවල් දොරවල් සේ අපි රූපයක් හදා ගත්තාට පස්සේ අපි හදා ගත්තා කායික වශයෙන් හෝ මානසික වශයෙන් හෝ දුක ලැබීමක් බවට. කායික/මානසික වශයෙන් දුක නැති තැනක ('දුක' නැති තැනක) දුක්ඛ ආර්ය සත්‍යයක් පමණක් පැවතුන තැනක අපි අලුත් දුකක් හදා ගෙන විඳින මට්ටමකට ආවා. කෙනෙක් හැම විට දුක් වෙන්නේ 'දරුවා' කියන මට්ටමකින් මිස ස්කන්ධ මට්ටමකින් නොවේ. දරුවා ලෙඩ වුනොත් දුක මිසක අපිට ස්කන්ධ ටික හට ගෙන නිරුද්ධ වීම දුකක් වුනේ නැහැ. දුක්ඛ ආර්ය සත්‍ය බවට අවබෝධ කර ගත යුතු වුනේ ස්කන්ධ

ටිකක හට ගැනීම කියන කාරණාව. මෙන්න මේ දුක දකිනවා නම් ඒ කෙනාට මේ දුක අවබෝධ කර ගන්න කොට එයාට සැප සහගත වශයෙන් ඇසුරු කරන්නට බලාපොරොත්තු වන්නට ලෝකය තුළ ප්‍රණිධි වශයෙන් දෙයක් ගන්න නැති වෙනවා. ප්‍රාර්ථනා වශයෙන් බලාපොරොත්තු වෙන ලෝකයෙන් ඒයා මිදුනා කියලා කියනවා.

ඒනිසා තමයි "*දුක්ඛතො වවත්ථෙන්තො සුඛ සඤ්ඤං පජහති*" - දුක වශයෙන් ව්‍යවස්ථාපනය කරලා තබන කොට එනම් රූප ස්කන්ධය දුක වශයෙන් ව්‍යවස්ථාපනය කරන කොට රූප ස්කන්ධය දුක්ඛ ආර්ය සත්‍ය පැත්තෙන් අවබෝධ කර ගන්න කොට සුඛ සංඥාව නොහට ගන්න බවට යනවා. හේතු නිරුද්ධ වුණ තැනක ප්‍රිය සාත රූප හදා ගන්න එක දුරු වන මට්ටමට යනවා මේ තුළ අපිට බොහොම වටිනා දර්ශනයක් අපේ ජීවිතයට පේනවා. සම්පූර්ණව අපේ භාවනා ප්‍රතිපදාව පැත්තෙන් හා දර්ශනය පැත්තෙන් අපිට ඇති කර ගත යුතු උතුම් කාරණා ටිකක්. මේ පිළිබඳව අප්‍රමාදීව තමන්ගේ ජීවිතය තුළටම බහලා බලමින් ස්කන්ධ ටිකක විතරක් ඇති තැනක අපි උපාදානස්කන්ධ ටිකක් හදා ගෙන දුක් විඳින මට්ටමක් කියලා කිව්වේ මොකද්ද කියන දේ අපි ටිකක් අවබෝධ කර ගන්නට හා තේරුම් ගන්නට උත්සාහවත් වෙනවා නම් ඒක බොහොම වටිනවා.

පුණ්‍යානුමෝදනා !!!

සාධු ! සාධු !! සාධු !!!

පසුවදන

සඞ්ඛායනයට සුදුසුයි, ධාරණයට සුදුසුයි.

<u>වත්ථුනානත්තඤාණනිද්දෙසො</u>

කථං අජ්ඣත්තවවත්ථානෙ පඤ්ඤා වත්ථුනානත්තෙ ඤාණං? කථං අජ්ඣත්තධම්මෙ *වවත්ථේති?* චක්ඛුං අජ්ඣත්තං වවත්ථෙති, සොතං අජ්ඣත්තං වවත්ථෙති, ඝානං අජ්ඣත්තං වවත්ථෙති, ජිව්හං අජ්ඣත්තං වවත්ථෙති, කායං අජ්ඣත්තං වවත්ථෙති, මනං අජ්ඣත්තං වවත්ථෙති. කථං චක්ඛුං අජ්ඣත්තං වවත්ථෙති? චක්ඛු අවිජ්ජාසම්භූතන්ති වවත්ථෙති, චක්ඛු තණ්හාසම්භූතන්ති වවත්ථෙති, චක්ඛු කම්මසම්භූතන්ති වවත්ථෙති, චක්ඛු ආහාරසම්භූතන්ති වවත්ථෙති, චක්ඛු චතුන්නං මහාභූතානං උපාදායාති වවත්ථෙති, චක්ඛු උප්පන්නන්ති වවත්ථෙති, චක්ඛු සමුදාගතන්ති වවත්ථෙති. චක්ඛු අහුත්වා සම්භූතං, හුත්වා න භවිස්සතීති වවත්ථෙති. චක්ඛුං අන්තවන්තතො වවත්ථෙති, චක්ඛු අද්ධුවං අසස්සතං විපරිණාමධම්මන්ති වවත්ථෙති, චක්ඛු අනිච්චං සඞ්ඛතං පටිච්චසමුප්පන්නං ඛයධම්මං වයධම්මං විරාගධම්මං නිරොධධම්මන්ති වවත්ථෙති . චක්ඛුං අනිච්චතො වවත්ථෙති, නො නිච්චතො; දුක්ඛතො වවත්ථෙති, නො සුඛතො; අනත්තතො වවත්ථෙති, නො අත්තතො; නිබ්බින්දති, නො නන්දති; විරජ්ජති, නො රජ්ජති; නිරොධෙති, නො සමුදෙති; පටිනිස්සජ්ජති, නො ආදියති. අනිච්චතො වවත්ථෙන්තො නිච්චසඤ්ඤං පජහති, දුක්ඛතො වවත්ථෙන්තො සුඛසඤ්ඤං පජහති, අනත්තතො වවත්ථෙන්තො අත්තසඤ්ඤං පජහති, නිබ්බින්දන්තො නන්දිං පජහති, විරජ්ජන්තො රාගං පජහති, නිරොධෙන්තො සමුදයං පජහති, පටිනිස්සජ්ජන්තො ආදානං පජහති. එවං චක්ඛුං අජ්ඣත්තං වවත්ථෙති.

<u>ගොචරනානත්තඤාණනිද්දෙසො</u>

කථං බහිද්ධා වවත්ථානෙ පඤ්ඤා ගොචරනානත්තෙ ඤාණං? කථං බහිද්ධා ධම්මෙ වවත්ථේති? රූපෙ බහිද්ධා වවත්ථේති, සද්දෙ බහිද්ධා වවත්ථේති, ගන්ධෙ බහිද්ධා වවත්ථේති, රසෙ බහිද්ධා වවත්ථේති, ඵොට්ඨබ්බෙ බහිද්ධා වවත්ථේති, ධම්මෙ බහිද්ධා වවත්ථේති . කථං රූපෙ බහිද්ධා වවත්ථේති? රූපා අවිජ්ජාසම්භූතාති වවත්ථේති රූපා තණ්හාසම්භූතාති වවත්ථේති, රූපා කම්මසම්භූතාති වවත්ථේති, රූපා ආහාරසම්භූතාති වවත්ථේති, රූපා චතුන්නං මහාභූතානං උපාදායාති වවත්ථේති, රූපා උප්පන්නාති වවත්ථේති, රූපා සමුදාගතාති වවත්ථේති. රූපා අහුත්වා සම්භූතා, හුත්වා න භවිස්සන්තීති වවත්ථේති. රූපෙ අන්තවන්තතො වවත්ථේති, රූපා අද්ධුවා අසස්සතා විපරිණාමධම්මාති වවත්ථේති . රූපා අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා ඛයධම්මා වයධම්මා විරාගධම්මා නිරොධධම්මාති වවත්ථේති. රූපෙ අනිච්චතො වවත්ථේති, නො නිච්චතො; දුක්ඛතො වවත්ථේති, නො සුඛතො; අනත්තතො වවත්ථේති, නො අත්තතො; නිබ්බින්දති, නො නන්දති ; විරජ්ජති, නො රජ්ජති; නිරොධෙති, නො සමුදෙති; පටිනිස්සජ්ජති, නො ආදියති. අනිච්චතො වවත්ථෙන්තො නිච්චසඤ්ඤං පජහති, දුක්ඛතො වවත්ථෙන්තො සුඛසඤ්ඤං පජහති, අනත්තතො වවත්ථෙන්තො අත්තසඤ්ඤං පජහති, නිබ්බින්දන්තො නන්දිං පජහති, විරජ්ජන්තො රාගං පජහති, නිරොධෙන්තො සමුදයං පජහති, පටිනිස්සජ්ජන්තො ආදානං පජහති. එවං රූපෙ බහිද්ධා වවත්ථේති.